206 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 206 - இல. 5
**Volume 206 - No. 5**

2012 පෙබරවාරි 08 වන බදාදා
2012 பெப்ரவரி, 08 புதன்கிழமை
**Wednesday, 08th February, 2012**



# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්තාව

"ඒ "සහ "බී" ස්ථාවර කාරක සභා : අතිරේක සාමාජිකයන්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ශ්‍රී ලාංකික ධීවරයින් සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් පැහැර ගැනීම

**වරප්‍රසාද:**

2012 ජනවාරි මස 18 වැනි දින “දි අයිලන්ඩ්” පුවත් පතේ පළ වූ වාර්තාව

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

සෙය්යිද් ෂේඛ් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු ෆයිසාල් කාසිම් මහතා] - පළමුවන වර කියවන ලදී

පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) - [ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය] පළමුවන වර කියවන ලදී

**කල්තැබීම**

යුරෝපයේ අයහපත් ආර්ථික තත්ත්වය මත ඇති විය හැකි ගැටලු වළක්වා ගැනීමට පියවර

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவினது இரண்டாவது அறிக்கை தொடர்பான இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினது முன்னேற்ற அறிக்கை

நிலைக் குழு "ஏ" மற்றும் "பி" : மேலதிக உறுப்பினர்கள்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

சோமாலியக் கடற்கொள்ளையர்களால் கடத்தப்பட்ட இலங்கை மீனவர்கள்

**சிறப்புரிமை:**

2012 சனவரி 18ஆந் திகதிய "த ஐலண்ட்" அறிக்கை

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

செய்யது சேஹுகோயா தங்கள் மௌலானா மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு பைஸால் காசிம்] - முதன்முறை மதிப்பிடப்பட்டது

பிலிப் குணவர்தன ஞாபகார்த்த சங்கம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம]- முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

மோசமடைந்துவரும் ஐரோப்பிய பொருளாதாரத்தினால் எழக்கூடிய பிரச்சினைகளுக்கான பரிகார நடவடிக்கைகள்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Report on the Progress of Investigations carried out by the Commission to Investigate Allegations of Bribery or Corruption on the Second Report of the Committee on Public Enterprises

Standing Committees “A” and “B”: Additional Members

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Sri Lankan Fishermen Abducted by Somali Pirates

PRIVILEGE:

“The Island” Report of 18th January, 2012

PRIVATE MEMBERS’ BILLS:

Seyyed Sheikh Koya Thangal Mowlana Foundation (Incorporation) - [The Hon. Faizal Cassim] - Read the First time

Philip Gunawardena Commemorative Society (Incorporation) – [The Hon. (Mrs.) Sriyani Wijewickrama] - Read the First time

ADJOURNMENT MOTION:

Measures to forestall expected problems due to worsening economic situation in Europe

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2012 පෙබරවාරි 08 වන බදාදා***
*2012 பெப்ரவரி, 08 புதன்கிழமை*
*Wednesday, 08th February, 2012*

---

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්තාව
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவினது இரண்டாவது அறிக்கை தொடர்பான இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினது முன்னேற்ற அறிக்கை
REPORT ON THE PROGRESS OF INVESTIGATIONS CARRIED OUT BY THE COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION ON THE SECOND REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හයවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ලැබී ඇති බව දැන්වීමට කැමැත්තෙමි.

මෙම වාර්තාව අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.

*වාර්තාව:*
*அறிக்கை*
*Report:*

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சாத்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. ● த.பெ.1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7.● P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2559923, 2596360 ෆැක්ස් / தொலைநகல் / Fax: 2596014

මගේ අංකය: බිසි/1972/08 II

2012.01.27

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ 2009.01.15 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

2008.09.22 වන දින මෙම කොමිෂන් සභාව වෙත එවන ලද පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාවේ රුහුණු සංවර්ධන බැංකුව සම්බන්ධයෙන් සඳහන්ව තිබූ රුපියල් මිලියන 100 ක ආයෝජනයට අදාළ කරන ලද විමර්ශනය අවසන් කර ඇති අතර, එකී විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව 2011.11.21 දින තීරණය කර ඇති බව කොමිෂන් සභාවේ නියෝග පරිදි දන්වමි.

තවද, එකී වාර්තාවේ සඳහන් වූ බැංකු පාස් පොත් මුද්‍රණය සම්බන්ධයෙන් 2006 වර්ෂයේ දී මෙම කොමිෂම වෙත ලද පෙත්සමකට අනුව විමර්ශණ පවත්වා දැනට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 56796 යටතේ නඩු පවරා ඇති අතර, එය වැඩිදුර විභාගය සඳහා 2012.03.12 දිනට නියමිතව ඇත.

තවද, ඉහත ආයතනය සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේ සංක්ෂිප්ත වාර්තාවක් මේ සමග ඉදිරිපත් කරමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක. 36, මලලසේකර මාවත,
කොළඹ 07.

[ගරු කථානායකතුමා]

**රුහුණු සංවර්ධන බැංකුව**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තා II**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් රුහුණු සංවර්ධන බැංකුවට අදාළව සඳහන් කර ඇති කරුණු සම්බන්ධව සිදුකරන ලද විමර්ශනයයි**

**01. රුහුණු සංවර්ධන බැංකුව සතු මුදල් රුපියල් මිලියන 100 ක් VANIK INCORPORATION LIMITED ආයතනයේ ආයෝජනය කිරීම**

අල්ලස් පනත යටතේ ගැනෙන ආකාරයේ දූෂණයක් සිදු වූ බවට විමර්ශනයේදී කරුණු අනාවරණය නොවුණි. බැංකුව සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීම 1998 වසරේ සිට සිදුව ඇත. " නිවේදනීය හැන්පතුවල " සහ " වෙළඳපළ ණය ගැනීම් " ( Money Market Borrowing) වල ආයෝජනය කර ඇත. කෙටි දින ගණනකින් මුදල් ලැබෙන ආකාරයට ආයෝජනය කර ඉන් ලැබෙන පොළියද සමග මුළු මුදලම දිගින් දිගටම ආයෝජනය කිරීම සිදුකර ඇත. එසේ ආයෝජනය කරන ලද මුදල් ප්‍රමාණයක් වරින් වර රුහුණු සංවර්ධන බැංකුව විසින් ආපසු ලබාගෙන ඇති අතර 2001.01.31 දින වන විට රු: 28,300,000/= මුදලක් Vanik Incorporation Limited ආයතනයෙන් රුහුණු සංවර්ධන බැංකුව වෙත ලැබිය යුතු බවට කරුණු අනාවරණය වන ලදී.

**02. ඉහත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යාංශයේ රෙගුලාසි වලට සහ චක්‍රලේඛ වලට අනුකූලව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්ට අනුව සිදු නොකිරීම**

බැංකු සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ මුදල් අමාත්‍යාංශය විසින් රෙගුලාසි මෙතෙක් පනවා නැති බව විමර්ශනයේදී අනාවරණය විය.

**03. 2005 වසරේදී රු: 6.50 කට මුද්‍රණය කරන ලද බැංකු පාස් පොතක් සඳහා 2000 වසරේදී රු: 10.35 ක් වියදම් කිරීම**

මෙම චෝදනාව සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මෙම කොමිෂන් සභාව වෙත දැනුම් දෙන අවස්ථාව වන විට බීසී 967/2006 යටතේ විමර්ශනයක් සිදු කරමින් පැවති අතර, එම විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ කියැවෙන " දූෂණය " නැමති වරද සිදුකිරීම සම්බන්ධයෙන් එවකට හිටපු සාමාන්‍යාධිකාරි ටී.පී. විමලරත්න මහතාට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 56796 දරන නඩුව පවරා ඇති අතර 2012-03-12 දිනට වැඩිදුර විභාගයට දින නියම කර ඇත.

## II

## "ඒ" සහ "බී" ස්ථාවර කාරක සභා : අතිරේක සාමාජිකයන්

## நிலைக்குழு "ஏ" மற்றும் "பி" : மேலதிக உறுப்பினர்கள்

## STANDING COMMITTEES "A" and "B" : ADDITIONAL MEMBERS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"එස්.බී. නාවින්න පදනම (සංස්ථාගත කිරීමේ), කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ), ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම (සංස්ථාගත කිරීමේ), කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ), ටී.බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ), ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ), හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) නමැති පනත් කෙටුම්පත් සලකා බැලීම පිණිස 139 වැනි ස්ථාවර නියෝගය යටතේ "ඒ" සහ "බී" ස්ථාවර කාරක සභාවල සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, එකී "ඒ" සහ "බී" ස්ථාවර කාරක සභාවලට අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද ගරු මන්ත්‍රීවරුන්ගේ නම් සියල්ලම ඇතුළත් නිවේදන හතක් වෙන් වෙන් වශයෙන් **සභාගත*** කරන බවත් දන්වනු කැමැත්තෙමි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය :**
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப் பட்டியல் :*
** List of Names tabled:*

### "ඒ" ස්ථාවර කාරක සභාව
### நிலைக் குழு "ஏ"
### STANDING COMMITTEE "A"

**එස්.බී. නාවින්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු එස්.බී. නාවින්න මහතා
ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු එම්.එස්. තව්ෆික් මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු ටිරාන් අලස් මහතා
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු රුවන් රණතුංග මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය

**எஸ். பி. நாவின்ன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ எஸ்.பீ. நாவின்ன
கௌரவ சீ.பி.டி. பண்டாரநாயக்க
கௌரவ லசந்த அலகியவன்ன
கௌரவ ரோஹன திசாநாயக்க
கௌரவ எம்.எஸ். தௌபீக்
கௌரவ பா. அரியநேத்திரன்
கௌரவ அசோக் அபேசிங்க
கௌரவ டிரான் அலஸ்
கௌரவ பாலித தெவரப்பெரும
கௌரவ நிரோஷன் பெரேரா
கௌரவ ஹரின் பர்னாந்து
கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன்
கௌரவ ருவன் ரணதுங்க
கௌரவ (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம
கௌரவ (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி

**S. B. Nawinna Foundation (Incorporation) Bill**

Hon. S.B. Nawinne
Hon. C.P.D. Bandaranaike
Hon. Lasantha Alagiyawanna
Hon. Rohana Dissanayake
Hon. M.S. Thowfeek
Hon. P. Ariyanethran
Hon. Ashok Abeysinghe
Hon. Tiran Alles

Hon. Palitha Thewarapperuma
Hon. Niroshan Perera
Hon. Harin Fernando
Hon. Seeniththamby Yoheswaran
Hon. Ruwan Ranatunga
Hon. (Mrs.) Sriyani Wijewickrama
Hon. (Mrs.) Upeksha Swarnamali

**කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු එස්.බී. නාවින්න මහතා
ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු ලලිත් දිසානායක මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු අජිත් කුමාර මහතා
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු වසන්ත අලුවිහාරේ මහතා
ගරු වික්ටර් ඇන්ටනි මහතා
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
ගරු මනුෂ නානායක්කාර මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා

**குமாரசிறி ஹெட்டிகே மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ எஸ்.பீ. நாவின்ன
கௌரவ சீ.பி.டி. பண்டாரநாயக்க
கௌரவ ஜயரத்ன ஹேரத்
கௌரவ லலித் திசாநாயக்க
கௌரவ கயந்த கருணாதிலக்க
கௌரவ அஜித் குமார
கௌரவ துனேஷ் கங்கந்த
கௌரவ பா. அரியநேத்திரன்
கௌரவ வசந்த அலுவிஹாரே
கௌரவ விக்டர் அந்தனீ
கௌரவ பாலித தெவரப்பெரும
கௌரவ மனுஷ நாணாயக்கார
கௌரவ தாராநாத் பஸ்நாயக்க
கௌரவ விஜித பேருகொட
கௌரவ சி. சிறீதரன்

**Kumarasiri Hettige Foundation (Incorporation) Bill**

Hon. S.B. Nawinne
Hon. C.P.D. Bandaranaike
Hon. Jayarathna Herath
Hon. Lalith Dissanayake
Hon. Gayantha Karunatileka
Hon. Ajith Kumara
Hon. Dunesh Gankanda
Hon. P. Ariyanethran
Hon. Wasantha Aluwihare
Hon. Victor Antony
Hon Palitha Thewarapperuma
Hon. Manusha Nanayakkara
Hon. Tharanath Basnayaka
Hon. Vijitha Berugoda
Hon. S. Shritharan

**ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
ගරු නවින් දිසානායක මහතා
ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා
ගරු මුත්තු සිවලිංගම් මහතා
ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
ගරු අචල ජාගොඩගේ මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
ගරු එම්.එස්. තව්ෆික් මහතා
ගරු සිවශක්ති ආනන්දන් මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු ඊ. සරවනපවන් මහතා

**ஸ்ரீ பியரத்தன சமூக அபிவிருத்தி மற்றும் சமூக அடிப்படை மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ பீலிக்ஸ் பெரேரா
கௌரவ நவின் திசாநாயக்க
கௌரவ ஏ.ஆர்.எம். அப்துல் காதர்
கௌரவ முத்து சிவலிங்கம்
கௌரவ எச்.ஆர். மித்ரபால
கௌரவ அச்சல ஜாகொடகே
கௌரவ ஆர். எம். ரன்ஜித் மத்துமபண்டார
கௌரவ சுனில் ஹந்துன்னெத்தி
கௌரவ (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க
கௌரவ எம்.எஸ். தௌபீக்
கௌரவ சிவசக்தி ஆனந்தன்
கௌரவ அசோக் அபேசிங்க
கௌரவ அஜித் பி. பெரேரா
கௌரவ ஜானக வக்கும்புர
கௌரவ ஈ. சரவணபவன்

**Sri Piyarathana Community Development and Social Foundation (Incorporation) Bill**

Hon. Felix Perera
Hon. Navin Dissanayake
Hon. A.R.M. Abdul Cader
Hon. Muthu Sivalingam
Hon. H.R. Mithrapala
Hon. Achala Jagodage
Hon. R.M. Ranjith Madduma Bandara
Hon. Sunil Handunnetti
Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe
Hon. M.S. Thowfeek
Hon. Sivasakthy Ananthan
Hon. Ashok Abeysinghe
Hon. Ajith P. Perera
Hon. Janaka Wakkumbura
Hon. E. Saravanapavan

## "බී" ස්ථාවර කාරක සභාව
## நிலைக்குழு "பி"
## STANDING COMMITTEE "B"

**කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු රත්නසිරි වික්‍රමනායක මහතා
ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු විජය දහනායක මහතා
ගරු පී. හැරිසන් මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
ගරු සිවශක්ති ආනන්දන් මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා

**கொடசர பியங்கல ரஜமகா விஹாரஸ்த அபிவிருத்தி சபை (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ ரத்னசிறி விக்கிரமநாயக்க
கௌரவ (திருமதி) சுமேதா ஜீ. ஜயசேன
கௌரவ மஹிந்த யாப்பா அபேவர்தன

[ගරු කථානායකතුමා]

கௌரவ விஜய தஹநாயக்க
கௌரவ பி. ஹரிசன்
கௌரவ சுனில் ஹந்துன்னெத்தி
கௌரவ பாலித ரங்கே பண்டார
கௌரவ சிவசக்தி ஆனந்தன்
கௌரவ அகில விராஜ் காரியவசம்
கௌரவ (வண.) எல்லாவல மேதானந்த தேரர்
கௌரவ பா. அரியநேத்திரன்
கௌரவ மொஹான் பிரியதர்ஷன த சில்வா
கௌரவ அஜித் பி. பெரேரா
கௌரவ விஜித பேருகொட
கௌரவ ஜானக வக்கும்புர

**Kotasara Piyangala Rajamaha Viharastha Development Society (Incorporation) Bill**

Hon. Ratnasiri Wickramanayaka
Hon. (Mrs.) Sumedha G. Jayasena
Hon. Mahinda Yapa Abeywardena
Hon. Wijaya Dahanayake
Hon. P. Harrison
Hon. Sunil Handunnetti
Hon. Palitha Range Bandara
Hon. Sivasakthy Ananthan
Hon. Akila Viraj Kariyawasam
Hon. (Ven.) Ellawala Medhananda Thero
Hon. P. Ariyanethran
Hon. Mohan Priyadarshana De Silva
Hon. Ajith P. Perera
Hon. Vijitha Berugoda
Hon. Janaka Wakkumbura

**ටී.බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
ගරු ටී. බී. ඒකනායක මහතා
ගරු නියෝමාල් පෙරේරා මහතා
ගරු ඩුලිප් විජේසේකර මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු වී.කේ. ඉන්දික මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රුවන් විජයවර්ධන මහතා
ගරු කනක හේරත් මහතා

**ரீ. பி. ஏக்கநாயக்க மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ திஸ்ஸ கரல்லியத்த
கௌரவ சந்திரசிறி கஜதீர
கௌரவ ரீ.பி. ஏக்கநாயக்க
கௌரவ நியோமால் பெரேரா
கௌரவ துலீப் விஜேசேக்கர
கௌரவ விஜித ஹேரத்
கௌரவ செல்வம் அடைக்கலநாதன்
கௌரவ அப்துல் ஹலீம்
கௌரவ வி.கே. இந்திக
கௌரவ நிரோஷன் பெரேரா
கௌரவ தாராநாத் பஸ்நாயக்க
கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன்
கௌரவ இரான் விக்கிரமரத்ன
கௌரவ ருவன் விஜேவர்தன
கௌரவ கனக ஹேரத்

**T.B. Ekanayake Foundation (Incorporation) Bill**

Hon. Tissa Karalliyadda
Hon. Chandrasiri Gajadeera
Hon. T.B. Ekanayake
Hon. Neomal Perera
Hon. Duleep Wijesekera
Hon. Vijitha Herath
Hon. Selvam Adaikkalanathan
Hon. Abdul Haleem
Hon. V.K. Indika
Hon. Niroshan Perera
Hon. Tharanath Basnayaka
Hon. Seeniththamby Yoheswaran
Hon. Eran Wickramaratne
Hon.RuwanWijayawardhana
Hon. Kanaka Herath

**ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු ඩිව් ගුණසේකර මහතා
ගරු ජගත් බාලසූරිය මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු එම්.ටී. හසන් අලි මහතා
ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු වසන්ත සේනානායක මහතා

**இலங்கை புவிச்சரிதவியல் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ (பேராசிரியர்) திஸ்ஸ விதாரண
கௌரவ டியூ குணசேக்கர
கௌரவ ஜகத் பாலசூரிய
கௌரவ ரவி கருணாநாயக்க
கௌரவ (டாக்டர்) ஜயலத் ஜயவர்தன
கௌரவ சுனில் ஹந்துன்னெத்தி
கௌரவ எம்.ரி. ஹஸன் அலி
கௌரவ மாவை. சோ. சேனாதிராசா
கௌரவ அகில விராஜ் காரியவசம்
கௌரவ ஹரின் பர்னாந்து
கௌரவ (டாக்டர்) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே
கௌரவ நெரன்ஜன் விக்கிரமசிங்க
கௌரவ தேனுக விதானகமகே
கௌரவ எம்.ஏ. சுமந்திரன்
கௌரவ வசந்த சேணாநாயக்க

**Institute of Geology, Sri Lanka (Incorporation) Bill**

Hon. (Prof) Tissa Vitarana
Hon. Dew Gunasekara
Hon. Jagath Balasuriya
Hon. Ravi Karunanayake
Hon. (Dr.) Jayalath Jayawardana
Hon. Sunil Handunnetti
Hon. M.T. Hasen Ali
Hon. Mavai S. Senathirajah
Hon. Akila Viraj Kariyawasam
Hon. Harin Fernando
Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle
Hon. Neranjan Wickremasinghe
Hon. Thenuka Vidanagamage
Hon. M.A. Sumanthiran
Hon. Vasantha Senanayake

**හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා
ගරු නිර්මල කොතලාවල මහතා
ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු එස්. විනෝ මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කමලා රණතුංග මෙනෙවිය

**ஹந்தகல வலகம்பா புராண கல்லென் ரஜமகா விஹாரஸ்த அபிவிருத்தி சபை (கூட்டிணைத்தல்) சட்டமூலம்**

கௌரவ திஸ்ஸ கரல்லியத்த
கௌரவ மஹிந்த யாப்பா அபேவர்தன
கௌரவ ரீ.பி. ஏக்கநாயக்க
கௌரவ நிர்மல கொத்தலாவல
கௌரவ டபிள்யூ. பி. ஏக்கநாயக்க
கௌரவ காமினி ஜயவிக்கிரம பெரேரா
கௌரவ அநுர திஸாநாயக்க
கௌரவ அர்ஜுன ரணதுங்க
கௌரவ ஏ.டி. சம்பிக பிரேமதாச
கௌரவ திலிப் வெதஆரச்சி
கௌரவ எஸ். வினோ
கௌரவ (திருமதி) தலதா அத்துகோரல
கௌரவ அருந்திக்க பர்னாந்து
கௌரவ சாந்த பண்டார
கௌரவ (செல்வி) கமலா ரணதுங்க

**Handagala Walagamba Purana Gallen Rajamaha Viharastha Development Council (Incorporation) Bill**

Hon. Tissa Karalliyadda
Hon. Mahinda Yapa Abeywardena
Hon. T.B. Ekanayake
Hon. Nirmala Kotalawala
Hon. W.B. Ekanayake
Hon. Gamini Jayawickrama Perera
Hon. Anura Dissanayake
Hon. Arjuna Ranatunga
Hon. A.D. Champika Premadasa
Hon. Dilip Wedaarachchi
Hon. S. Vino
Hon. (Mrs.) Thalatha Atukorale
Hon. Arundika Fernando
Hon. Shantha Bandara
Hon. (Ms.) Kamala Ranathunga

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(1) 2010 වර්ෂය සඳහා ජනාධිපතිවරයාගේ අරමුදල පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව; සහ
(2) 2009 වර්ෂය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව -

[අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2010 වර්ෂය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව - [සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය හා ප්‍රචාරක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 123, 133අ සහ 139ඉ වගන්ති, 213ඇ වගන්තිය සහ 19 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ඔක්තෝබර් 05 දිනැති අංක 1726/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග -[ප්‍රවාහන අමාත්‍ය ගරු කුමාර වෙල්ගම මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009-2010 වර්ෂය සඳහා සී/ස ලංකා ෆොස්ෆේට් සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මුල්ලේගම සහ නෙල්ලියද්ද ගම්මාන : විදුලිය
### முல்லேகம மற்றும் நெல்லியத்த கிராமங்கள்: மின்சாரம்
### MULLEGAMA AND NELLIYADDA VILLAGES : ELECTRICITY

1399/'11

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මුල්ලේගම හා නෙල්ලියද්ද ගම්මානවල පදිංචි පවුල් දෙදහසක් පමණ විදුලිය නොමැති වීමෙන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවල බොහෝ නිවෙස්වලට ඉන්දියානු රජයේ ආධාර මත සූර්ය කෝෂ ලබා දී තිබුණද, ඒවා අක්‍රීය තත්ත්වයේ පවතින බවත්;

(ii) ඌව උදානය වැඩසටහන යටතේ මෙම ප්‍රදේශයට විදුලිය ලබා දීම සඳහා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණද මේ දක්වා ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ගම්මානවල ජනතාවට කඩිනමින් විදුලිය ලබාදීමට පියවර ගන්නේද;

(ii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) විදුලිය ලබා දීමේ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மொனறாகல மாவட்டத்தின் மடுல்ல பிரதேச செயலாளர் பிரிவைச் சேர்ந்த முல்லேகம மற்றும் நெல்லியத்த கிராமங்களில் குடியமர்ந்துள்ள ஏறக்குறைய இரண்டாயிரம் குடும்பங்கள் மின்சாரம் இன்மையால் கடும் சிரமங்களை எதிர்நோக்கியுள்ளன ரென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கிராமங்களில் பெரும்பாலான வீடுகளுக்கு இந்திய அரசாங்கத்தின் உதவியுடன் சூரியக் கலங்கள் வழங்கப்பட்டுள்ளபோதிலும் அவை செயலிழந்த நிலையில் உள்ளன வென்பதையும்;

(ii) ஊவா உதானய நிகழ்ச்சித்திட்டத்தின்கீழ் இப்பிரதேசத்திற்கு மின்சாரம் வழங்கும்பொருட்டு மடுல்ல பிரதேச செயலகத்தினால் மதிப்பீடுகள் சமர்ப்பிக்கப்பட்டிருந்தபோதிலும் இற்றைவரை அமுலாக்கப்படவில்லை என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) மேற்படி கிராமங்களிலுள்ள மக்களுக்குத் துரித மாக மின்சாரம் வழங்க நடவடிக்கை எடுப்பாரா;

(ii) அதற்குத் தேவையான நிதியேற்பாடுகள் ஒதுக் கப்பட்டுள்ளனவா;

(iii) ஆமெனில், அப்பணத்தொகை யாது;

(iv) மின்சாரம் வழங்கும் நடவடிக்கைகள் ஆரம்பிக்கப் படுமெனில் அத்திகதி யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is he aware that about 2,000 families residing in Mullegama and Nelliyadda villages which come under the Madulla Divisional Secretary's Division in Monaragala District have faced immense difficulties as they have not been provided with electricity?

(b) Will he admit that-

(i) most houses in the villages mentioned above have been provided with solar cells, under aid given by Indian Government, those solar cells have become defunct; and

(ii) even though the Madulla Divisional Secretariat has submitted estimates for providing electricity to this area under the "Uva Udanaya" (Uva Re-awakening) Programme, action has not been taken to provide electricity to this area up to now?

(c) Will he inform this House-

(i) whether he will take steps to provide electricity to the people in those villages expeditiously;

(ii) whether provisions required for that purpose have been allocated;

(iii) if so, the amount of money that has been allocated; and

(iv) of the date of commencement, if the activities connected to providing electricity are to be commenced?

(d) If not, why?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්. මුල්ලේගම හා නෙල්ලියද්ද ගම්මානවල විදුලිය නොමැති පවුල් සංඛ්‍යාව දෙදහසක් නොව 279කි.

(ආ) (i) ඔව්. ඉන්දියානු ආධාර යටතේ සූර්ය කෝෂ ඉහත ගම්මානවල නිවාස වෙත ලබා දී ඇත.

මෙම සූර්ය කෝෂ පද්ධතියන්හි සවි කර ඇති බැටරිවල ආයු කාලය වසර 02කි. දැනට මෙම පද්ධති ස්ථාපනය කර වසර 02ක කාලයක් ඉක්ම ගොස් ඇති බැවින් බැටරිවල ආයු කාලය ඉක්ම වීම හේතුවෙන් සමහර පද්ධති අක්‍රිය තත්ත්වයේ පවතී.

මෙහි කාලීන නඩත්තු කටයුතු කර ගෙන යාම සඳහා ගමේ සමිතියක් පිහිටුවා එය මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියා පදිංචි කර එයට පවරන ලද අතර අදාළ අලුත්වැඩියාවන් එම සමිතිවල මෙහෙයවීමෙන් සිදු කළ යුතු වේ.

(ii) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුල්ලේගම හා නෙල්ලියද්ද ගම්මානවල විදුලිය ලබා දීම සඳහා පහත සඳහන් පරිදි ඇස්තමේන්තු කර ඇත.

| අනු අංකය | යෝජනා ක්‍රමය | ඇ / ගත මුදල රු: |
|---|---|---|
| 01 | නෙල්ලියද්ද ගම්මානය | 12,677.700 |
| 02 | මුල්ලේගම | 13,422.300 |
| | එකතුව | 26,100.000 |

මෙම ගම්මාන දෙකෙහි යෝජනා ක්‍රම දෙකක ඉදි කිරීම් කටයුතු සඳහා යොමු කර ඇතත් රැහැන් මාර්ගයට බාධක වන ගස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් කපා ඉවත් නොකිරීම නිසා ඉදි කිරීම් කටයුතු ප්‍රමාද වී ඇත.

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) රු. 26,100,000.00

(iv) දැනටමත් ආරම්භ කර ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ විදුලි යෝජනා ක්‍රමයේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරලා ජනතා අයිතියට පත් කිරීමට කොපමණ කාල වකවානුවක් ගත වෙනවාද කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියන්න පුළුවන්ද?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගස් කපා නොතිබීම නිසා තමයි මේ ගැටලුව මතු වුණේ. නමුත් මේ වෙන කොට ඒ සියලුම ගස් කපලා අවසන් කරලා, වැඩ ආරම්භ කරලා ඒ වැඩ කටයුතු කරගෙන යනවා. තව මාසයක් පමණ ගත වෙන කොට ඒ වැඩ අවසන් කරලා ජනතා අයිතියට පවරන්න පුළුවන් වෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුල්ලේගම හා නෙල්ලියද්ද කියන ගම්මානවල විතරක් නොවෙයි, තවත් බොහෝ ස්ථානවල ඇති විදුලි යෝජනා ක්‍රම අතරමඟ නතර වෙන්න බලපාන එක හේතුවක් තමයි transformers සහ අවශ්‍ය විදුලි රැහැන් ලැබීමේ ප්‍රමාදය. මේ තත්ත්වය බොහෝ ප්‍රදේශවලට බලපා තිබෙනවා; මාතර දිස්ත්‍රික්කයටත් බලපා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රමාදය අවම කර ගන්න මොකක්ද අමාත්‍යාංශයට තිබෙන වැඩ පිළිවෙළ?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ගරු මන්ත්‍රීතුමනි, අපට ඉරාන ආධාර යටතේ ලැබුණු ඒ විදුලි රැහැන් ප්‍රමිතියෙන් තොරයි. කලින් ඉදිරිපත් කරපු සාම්පල් අනුව නොවෙයි අපට ඒවා ලබා දීලා තිබුණේ. ඒවා ප්‍රමිතියෙන් තොර නිසා නැවත මිල ගණන් කැඳවලා ගෙන්වන්න කටයුතු කර තිබෙනවා. මේ මාසය අවසන් වෙන කොට අපට ඒ අවශ්‍ය කරන ද්‍රව්‍ය සියල්ලම ලබා ගෙන ඒ වැඩ කටයුතු ආරම්භ කරන්න පුළුවන්. මේ විධියේ දුෂ්කර ගම්මාන කීපයකට විතරක් නොවෙයි, කඩිනමින් විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළක් අද ලංකාවේම ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ සඳහා අවශ්‍ය විදුලි රැහැන් ප්‍රමාණය අපේ රටේ නිෂ්පාදනය කරන්නේ නැහැ. ඒවා වෙනත් රටවලින් ආනයනය කරන්න වෙනවා. එතැනදී යම් ප්‍රමාදයක් ඇති වෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. මා හිතනවා ලබන මාසය අවසන් වෙන කොට ඒ සියල්ලම ගෙන්වා ගෙන වැඩ ආරම්භ කරන්න අපට පුළුවන් වෙයි කියලා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, ඉරාන ආධාර යටතේ ලැබුණු විදුලි රැහැන් සහ transformersවල තත්ත්ව පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියලා. තත්ත්වයෙන් බාල transformers සහ විදුලි රැහැන් ලැබීම නිසා, ඒ වෙනුවට විකල්ප විදුලි රැහැන් සහ transformers ගෙන්වන්න සිද්ධ වුණා කියලාත් එතුමා කිව්වා.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ට්‍රාන්ස්ෆෝමර්ස්වල ගැටලුවක් මතු වෙලා නැහැ. විදුලි රැහැන්වල පමණක් ගැටලුවක් මතු වෙලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

හොඳයි, අපි විදුලි රැහැන්වල කියලා කියමුකෝ. ගරු කථානායකතුමනි, බාල විදුලි රැහැන් ලැබීම නිසා සහ ඒවා නැවත ගෙන්වීමට සිදු වීම තුළ රජයට යම් පාඩුවක් දරන්නට සිද්ධ වෙලා තිබෙනවාද? එහෙමත් නැත්නම් මොකක්ද ඇති වෙලා තිබෙන තත්ත්වය?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

කිසිම පාඩුවක් ඇති වෙලා නැහැ. මොකද, ඒවා ඉරාන ආධාර යටතේ අපට ලැබෙන දේවල් නිසා. නමුත් ඒ ගොල්ලන් සැපයූ ඒ දේවල්වල ප්‍රමිතිය නැති නිසා, ඒ ගැන සෑහීමකට පත් වන්න බැරි නිසා තමයි අපි ඒවා-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ කියන්නේ ආධාරයක් විධියට විදුලි කම්බිද ලැබිලා තිබෙන්නේ? ආධාරයක් විධියට ලැබුණේ විදුලි රැහැන්ද නැත්නම් මුදල් ලැබිලා ඒකෙන්-

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

මුදල් ලැබුණා නොවෙයි. ඒ අය තමයි අවශ්‍ය කරන ඒ material සියල්ලම ලබා දෙන්නේ.

## ජනාධිපති උපදේශක "එලියන්ත වයිට්" : ගෙවා ඇති මුදල
## சனாதிபதி ஆலோசகர் `எலியந்த வயிட்' : செலுத்திய பணம்
## PRESIDENT'S ADVISER ELIYANTHA WHITE : MONEY PAID

1595/'11

5. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) "එලියන්ත වයිට්" නමැති අයෙකු ජනාධිපති උපදේශකවරයකු වශයෙන් කටයුතු කර තිබේද;

(ii) එම පුද්ගලයා රජයේ වෙනත් කිසියම් තනතුරක් දරා තිබේද;

(iii) "එලියන්ත වයිට්" නමැති අය වෙත රජය විසින් ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "එලියන්ත වයිට්" නමැති අයට විරුද්ධව මුදල් අක්‍රමිකතා පිළිබඳව චෝදනා ඉදිරිපත්කර තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) `எலியந்த வயிட்' என்ற நபரொருவர் சனாதிபதி ஆலோசகராக பணியாற்றியுள்ளாரா என்பதை யும்;

(ii) மேற்படி நபர் வேறேதேனும் அரசாங்க பதவியை வகித்துள்ளாரா என்பதையும்;

(iii) `எலியந்த வயிட்' என்பவருக்கு அரசாங்கத்தி னால் செலுத்தப்பட்டுள்ள பணத்தொகை எவ்வள வென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) `எலியந்த வயிட்' என்பவருக்கு எதிராக பண மோசடி தொடர்பான குற்றச்சாட்டுகள் சுமத்தப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பாக சட்ட நடவடிக்கை களை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுப் பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) whether a person by the name of "Eliyantha White" has functioned as an adviser to the President;

(ii) whether the aforesaid person has held any other post in the Government; and

(iii) the amount of money paid by the Government to the person by the name of "Eliyantha White"?

(b) Will he inform this House-

(i) whether allegations of financial malpractices have been levelled against the person by the name of "Eliyantha White"; and

(ii) if so, whether legal action will be taken regarding those allegations?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි.

එලියන්ත වයිට් නමැති පුද්ගලයෙක් වෛද්‍යවරයකු ලෙසත්, ජනාධිපතිවරයාගේ වෛද්‍යවරයා ලෙසත් පෙනී සිටිමින් කටයුතු කළා විතරක් නොවෙයි, සචින් තෙන්ඩුල්කාර් වැනි ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩකයන් ලංකාවට විශේෂ ගුවන් යානයකින් ගෙන්වලා ප්‍රතිකාර ලබා දෙන්නත් කටයුතු කළා. ඔහු රජයේ ධුර දරන තැනැත්තන් සමඟ ගත්ත ඡායාරූපත් අපි දැක්කා. එලියන්ත වයිට් කියන ඒ පුද්ගලයාගේ නම වෙන එකක්ද? දොස්තරකම වාගේම ඔහුගේ නමත් බොරු එකක්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ප්‍රචාරය සඳහා එතුමා ප්‍රශ්න දහයක් විතර අහනවා. ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා, ඔබතුමා ළඟ ඉඳ ගෙන ඉන්න විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු නිතර දෙවේලේ මේ කියන පුද්ගලයා ළඟට ගිහින් බෙහෙත් ගන්නා බව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ පුද්ගලයා හොර දොස්තර කෙනෙක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙයා බෙහෙත් කරනවාද නැත්නම් වෙන මොනවාද කරන්නේ කියලා ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් ඇහුවා නම් වඩා හොඳයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මා අහන ප්‍රශ්නයට උත්තර දෙන්න කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ රටේ ජනතාවගේ විවිධ කොටස් නොයෙක් පුද්ගලයන්ගෙන් බෙහෙත් ගන්නවා. මරියකඩේ කියලා තැනක් තිබෙනවා, කොළඹ. එතැන ඉන්නේ නීත්‍යානුකූල දොස්තරලා නොවෙයි. නමුත් Royal College Rugby Team එක, Royal College Football Team එක, Royal College Cricket Team එක ගිහිල්ලා එතැනින් බෙහෙත් ගන්නවා. ඒ අය තෙල් ගානවා, exercises කරවනවා. දොස්තරලා පවා යනවා. මම දවසක් මේ ගැන කිව්වා ගරු විපක්ෂ නායකතුමාටත්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ ප්‍රශ්නයට උත්තරය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ කියන්නේ මේ රටේ තිබෙන විවිධ වෛද්‍ය ක්‍රම භාවිත කරන්න එපා කියලාද? ඒකද කියන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය ඒක නොවෙයි නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මරියකඩේ තිබෙන්නේ පෘතුගීසි කාලයේ ඉඳලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජනාධිපතිතුමාගේ නාමය පාවිච්චි කරලා, ජනාධිපතිතුමාගේ වෛද්‍යවරයකු ලෙස පෙනී ඉඳලා, මේ රටේ මිනිස්සුත්, ජාත්‍යන්තර ප්‍රජාවත්, ඒ වාගේම ජාත්‍යන්තර ක්‍රීඩකයනුත් රවටන එකයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා මේ රටේ අභිමානය ගැන, රටේ ගෞරවය ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුරු හරි ක්‍රීඩකයකු රැවටිලා තිබෙනවා නම්, ඒ ක්‍රීඩකයා කියයි "මම රැවටුණා" කියලා. ඒ ක්‍රීඩකයා ගිහින් බෙහෙත් කර ගන්නවා නම්, වියදම් කරනවා නම්, plane වලින් ඇවිල්ලා බෙහෙත් අර ගෙන යනවා නම් ඒකට ඊර්ෂ්‍යා වන්නේ මොකටද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අප ඇහුවේ ගරු ජනාධිපතිතුමා සචින් තෙන්ඩුල්කාර් ලංකාවට ගෙන්වලා ප්‍රතිකාර කෙරෙව්වාද කියලා නේ. ඒක අසත්‍ය නම් ජනාධිපතිතුමා මැදිහත් වෙලා, පරීක්ෂණයක් පවත්වලා, ලියා පදිංචි නැති හොර වෛද්‍යවරයකු වශයෙන් හැසිරිච්ච මේ පුද්ගලයාට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ. නැත්නම් ආණ්ඩුවට අගෞරවයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැති ලු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උපදේශකවරයකු ගැන අහන්නේ. අපි පිළිතුරු දීලා තිබෙනවා එහෙම උපදේශකවරයකු නැහැ කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අමාරුවේ වැටුණු කෙනෙක් ඉන්නවා නම් නඩු මාර්ගයකට යන්න කියන්න. [බාධා කිරීමක්]

ප්‍රශ්න අංක 8-1726/'11 - (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9-1803/'11 - (1), ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-1859/'11 - (1), ගරු සිවශක්ති ආනන්දන් මහතා.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, on behalf of the Hon. Minister of Local Government and Provincial Councils, I ask for one month's time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-1872/'11 - (1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හිස්වූ සහකාර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ තනතුර : ක්‍රියා මාර්ග

## இணைந்த சேவைகள் உதவிப் பணிப்பாளர் பதவி வெற்றிடம்: நடவடிக்கை

## VACANT POST OF ASSISTANT DIRECTOR OF COMBINED SERVICES : ACTION TAKEN

1900/'11

13. **ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) පුස්තකාලයාධිපති සේවය, භාෂා පරිවර්තන සේවය, රියදුරු සේවය යන සේවාවල කටයුතු කිරීම සඳහා පත්කර සිටි සහකාර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරිය 2010.11.30 දින සිට ස්ථාන මාරු ලබා ගොස් ඇති අතර මෙතෙක් එම තනතුරට කිසිවෙකු පත් නොකිරීම නිසා ඉහත සේවාවල බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවා ව්‍යවස්ථා සෑදීම සහ සංශෝධනය කිරීම් යන කටයුතු ප්‍රමාද වී ඇති බව සහ ඇතැම් සේවාවල කටයුතු ඇනහිට ඇති බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) සහකාර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයාගේ හිස්වූ තනතුර සඳහා මේ වන විට කිසිවෙකු පත් කර තිබේද;

(ii) එසේ නම්, එම තනතුරට පත් කරන ලද නිලධාරියා කවුරුන්ද;

(iii) එම පත්වීම සිදු කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත තනතුර සඳහා මෙතෙක් කිසිවකු පත් කර නොමැති නම්, ඒ සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) நூலகர் சேவை, மொழிபெயர்ப்பாளர் சேவை, சாரதி சேவை ஆகிய சேவைகள் தொடர்பாக செயலாற்று வதற்கு நியமிக்கப்பட்டிருந்த இணைந்த சேவைகள் உதவிப் பணிப்பாளர் 2010.11.30ஆம் திகதி தொடக்கம் இடமாற்றம் பெற்றுச் சென்றுள்ளார் என்பதுடன், இதுவரை மேற்படி பதவிக்கு ஒருவரும் நியமிக்கப்படாமையின் காரணமாக மேற்படி சேவை களுக்கான ஆட்சேர்ப்புகள், பதவி உயர்வுகள், இடமாற்றம், சேவைப் பிரமாணக் குறிப்புகளை தயார் செய்தல் மற்றும் திருத்தியமைத்தில் ஆகிய நடவடிக்கைகள் தாமதமடைவதையும், சில சேவைகளின் நடவடிக்கைகள் தடைப்பட்டிருப்ப தையும் அவர் அறிவாரா?

(ஆ) (i) இணைந்த சேவைகள் உதவிப் பணிப்பாளரின் வெற்றிடமான பதவிக்கு தற்போது எவரேனும் நியமிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், மேற்படி பதவிக்கு நியமிக்கப்பட்டுள்ள அலுவலர் யார் என்பதையும்;

(iii) மேற்படி நியமனம் மேற்கொள்ளப்பட்ட திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பதவிக்கு இதுவரை எவரும் நியமிக்கப் படவில்லையாயின் அதற்கான நடவடிக் கைகளை மேற்கொள்வாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், அத்திகதி யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that the Assistant Directress of Combined Services appointed to execute the functions of the Librarians' Service, the Translators' Service and the Drivers' Service was transferred on 30.11.2010 and activities such as recruitment, promotions, transfers, drafting and amending service minutes of the above services have been delayed and activities of some services have come to a standstill since nobody has so far been appointed to the said post?

(b) Will he state-

(i) whether anyone has been appointed by now to the vacant post of the Assistant Director of Combined Services;

(ii) if so, the officer appointed to the said post; and

(iii) the date on which the aforesaid appointment was made?

(c) Will he state-

(i) whether action will be taken if no one has so far been appointed to the above post; and

(ii) if so, the date for same?

(d) If not, why?

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்ட லுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) 2010.11.30 දින සිට ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂවරිය ස්ථාන මාරු ලබා ගිය නමුත්, 2011.10.25 දින නිලධාරියෙකු පත් කරන තුරුම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ (II) එස්. ආලෝකබණ්ඩාර මහතා විසින් මෙම තනතුරෙහි වැඩ ආවරණය කරනු ලැබිණි. එබැවින්, බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවා ව්‍යවස්ථා සෑදීම සහ සංශෝධනය කිරීම යන කටයුතුවල කිසිදු ප්‍රමාදයක් සිදු වී නොමැත.

(ආ) (i) ඔව්.

(ii) සී.බී. නවරත්න මිය (ශ්‍රී ලං.ප.සේ.III)

(iii) 2011.10.25

(ඇ) (i) (ආ) පිළිතුර අනුව පැන නොනඟී.

(ii) ඉහත (ආ) පිළිතුර අනුව පැන නොනඟී.

(ඈ) ඉහත (ආ) පිළිතුර අනුව පැන නොනඟී.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එසේ පත් කළත්, මේ අමාත්‍යාංශ තුළ ඒ තනතුරුවල කටයුතු පිළිබඳව අද වන තුරු විශාල ප්‍රමාදයක් තිබෙනවා. එහෙම පත් කරලා තිබෙනවා නම් ඇයි එහෙම වෙන්නේ?

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු කථානායකතුමනි, 2010.11.30 දින සිට සහකාර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂතුමිය ස්ථාන මාරු ලැබ ගිය නමුත් 2011.10.25 වන දින නිලධාරියෙකු පත් කරන තුරුම එස්. ආලෝක බණ්ඩාර මහතා මෙම තනතුරේ වැඩ ආවරණය කළා. ගරු කථානායකතුමනි, එබැවින් බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ සේවා ව්‍යවස්ථා සෑදීම සම්බන්ධව හා සංශෝධන සම්බන්ධව ප්‍රමාදයක් සිදු වුණේ නැහැ කියලා තමයි අපි විශ්වාස කරන්නේ. ඒ වැඩ කටයුතු ඒ ආකාරයෙන් කර ගෙන ගියා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

දැන් නිලධාරියෙකු පත් කරලා තිබෙනවාද?

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ඔව්. නවරත්න මිය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

කරුණාකරලා බලන්න, මේ ප්‍රමාදය මොකක්ද කියලා. එහෙම ප්‍රමාදයක් තිබෙනවා නම් ඒක නිවැරදි කරන්න කටයුතු කරන්න.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

හොඳයි, ගරු මන්ත්‍රීතුමනි.

## හොරොව්පතාන, ගලෙන්බිඳුනවැව ගම්මානය : විදුලිය
### ஹொரவப்பொத்தானை - கலென்பிந்துனுவெவ கிராமம்: மின்சாரம்
### GALENBINDUNUWEWA VILLAGE IN HORAWPATANA : ELECTRICITY

1901/'11

14. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) හොරොව්පතාන, ගලෙන්බිඳුනුවැව ග්‍රාමයට විදුලිය ලබා දෙන ලෙස ගම්වාසීන් ඉල්ලා සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ගලෙන්බිඳුනවැව ගම්මානයේ සිට කිලෝ මීටරයක් දුරින් ඇද ඇති අධිබල විදුලි රැහැන් වෙතින් එම ගමටද විදුලිය සපයා දීමටත්;

(ii) ඊට අදාළව නව ට්‍රාන්ස්පෝමරයක් පිහිටුවීමේ අවශ්‍යතාව අනුව එය ස්ථාපිත කිරීමටත්;

එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஹொரவப்பொத்தானை - கலென்பிந்துனுவெவ கிராமத்துக்கு மின்சாரம் பெற்றுத் தருமாறு அக்கிராம வாசிகள் கோரிவருவதை அவர் அறிவாரா?

(ஆ) (i) கலென்பிந்துனுவெவ கிராமத்திலிருந்து ஒரு கிலோ மீற்றர் தூரத்தில் அமைக்கப்பட்டுள்ள உயர் அழுத்த மின்கம்பிகளிலிருந்து அக்கிராமத்துக்கு மின்சாரம் வழங்குவதற்கும்;

(ii) அதற்குரிய புதிய மின்மாற்றியை தாபிக்க வேண்டியதன் தேவையின் அடிப்படையில் அதனைத் தாபிப்பதற்கும்;

அவர் நடவடிக்கை எடுப்பாரா ?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is he aware that the residents of Galenbindunuwewa, in Horawpatana are requesting the supply of electricity to that village?

(b) Will he take steps to-

(i) supply electricity to that village from the high-tension power lines drawn at a distance of one kilometre from Galenbindunuwewa; and

(ii) install a new transformer for the requirements of that purpose?

(c) If not, why?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) හොරොව්පතාන, ගලෙන්බිඳුණුවැව ග්‍රාමයට විදුලිය ලබා දී ඇති අතර, එහි එක නිවසකට පමණක් විදුලිය ලබා දීමට ඇත. මිහින්තලේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට අයදුම්පතක් ඉදිරිපත් කර එම නිවසට විදුලිය ලබා ගැනීමට හැකියාව ඇත.

(ආ) (i) හා (ii)

හොරොව්පතාන, ගලෙන්බිඳුණුවැව ග්‍රාමයට දැනටමත් විදුලිය ලබා දී ඇති බැවින් ඒ සඳහා අධිබල විදුලි රැහැන් ඇදීම හා නව තාරාපැවියක් ස්ථාපිත කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ගමේ සියලු දෙනාටම විදුලිය දීලා තිබෙද්දී මේ අයට පමණක් විදුලිය නොදෙන්න හේතුව මොකක්ද?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
ඇත්තෙන්ම විදුලිබල මණ්ඩලයෙන් තනි පුද්ගලයෙකුට විදුලිය ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. මුදල් ගෙවලා තමයි ඒ අයට විදුලිය ලබා ගන්නට සිදු වන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එහෙම නම් සෑම ගෙයකටම විදුලිය ලබා දී තිබෙන්නේ ඒ අයගේ ඉල්ලීම අනුවද, නැත්නම් රජය විසින්ද?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
සෑම නිවසක්ම ආවරණය වන පරිදි සෑම ගමකටම අපි විදුලිය ලබා දෙනවා. නමුත් පෞද්ගලිකව මුදල් ගෙවලා තමයි විදුලි සම්බන්ධතාව ලබා ගන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අධිබල විදුලි රැහැන් මඟින් අනෙක් ගම්වලටත් විදුලිය ලබා දෙන්න පුළුවන්ද? මොකද, ගරු චන්ද්‍රසේන ඇමතිතුමාත් මේ පිළිබඳව උනන්දුවක් දක්වන බව කියන්නට ඕනෑ.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
ඔව්, පැහැදිලිවම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 -1911/'11 - (1), ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. මාස හයකට පමණ පෙර ඉදිරිපත් කරපු ප්‍රශ්නයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1 -1065/'11 - (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2 -1167/'11 - (1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ උපදේශකයන් : විස්තර
## அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
## ADVISERS UNDER MINISTRY OF PUBLIC MANAGEMENT REFORMS : DETAILS

1491/'11

**4. ගරු අනුර දිසානායක මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. Anura Dissanayake on behalf of the Hon. Ajith Kumara)
රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, මේ වන විට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දූරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දූරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දූරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

[ගරු අනුර දිසානායක මහතා]

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப் பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவை யென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங் கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப்பன வுத் தொகை தனித்தனியாக எவ்வளவென்ப தையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Management Reforms:

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Public Management Reforms at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them;

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles;

(ii) separately the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them;

(ii) separately the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) එකයි (01)

(ii) නම - එම්.එම්.ජේ.පී. ගවරම්මාන මහතා.

අධ්‍යාපන සුදුසුකම - සහකාර වෛද්‍ය නිලධාරි ප්‍රවීණතා සහතිකය.

වගකීම් - ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය කළමනාකරණ යන්ත්‍රණය නවීකරණයට විශේෂයෙන්ම ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ගරු රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.

(iii) වැටුප - රුපියල් 29,410/-

දීමනා - ඉන්ධන දීමනාව - රුපියල් 19,180/-

වාහන දීමනාව - රුපියල් 30,000/-

(iv) රුපියල් 49,180/-

(ආ) (i) නොමැත.

(ii) පැන නොනඟී.

(ඇ) (i) නොමැත.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -1714/'11- (1), ගරු තිස්ස අත්තනායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන : සභාපතිවරු

## நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் அமைச்சின்கீழான நிறுவனங்கள் : தலைவர்கள்

## INSTITUTIONS UNDER MINISTRY OF CONSTRUCTION, ENGINEERING SERVICES, HOUSING AND COMMON AMENITIES : CHAIRMEN

1718/'11

7. **ගරු රවි කරුණානායක මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Dayasiri Jayasekara)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා කවරේද;

(ii) එම එක් එක් ආයතන වෙනුවෙන් පත්කොට ඇති සභාපතිවරුන් කවුරුන්ද;

(iii) එම සභාපතිවරුන් පත් කරන ලද බලධාරියා කවුරුන්ද;

(iv) එම සභාපතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද කවරේද;

(v) එම එක් එක් සභාපතිවරයා වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හෝ දීමනා, ලබා දී ඇති වාහන, දුරකතන ඇතුළු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் அமைச்சுக்கு சொந்தமான நியதிச்சட்ட சபைகள் மற்றும் கூட்டுத்தாபனங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு நிறுவனத்திற்கு நியமிக்கப் பட்டுள்ள தலைவர்கள் யாவரென்பதையும்;

(iii) மேற்படி தலைவர்களை நியமித்துள்ள அதிகாரி யாரென்பதையும்;

(iv) மேற்படி தலைவர்களின் கல்வித் தகைமைகள் மற்றும் தொழில்சார் அனுபவம் யாவை யென்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு தலைவருக்கும் செலுத்தப் படுகின்ற சம்பளம், அல்லது கொடுப்பனவுகள் வழங்கப்பட்டுள்ள வாகனங்கள், தொலைபேசிகள் உள்ளிட்ட வசதிகள் வெவ்வேறாக யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he inform this House-

(i) as to what the statutory Boards and Corporations belonging to the Ministry of Construction, Engineering Services, Housing and Common Amenities are;

(ii) the Chairmen appointed to each of those institutions;

(iii) the person in authority who appointed the said Chairmen;

(iv) the educational qualifications and professional experience of the said Chairmen; and

(v) the salaries or allowances that are paid, vehicles, telephones and other facilities that are given to each of those Chairmen separately?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
රාජ්‍ය සංවර්ධන නිර්මාණ නීතිගත සංස්ථාව
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

(ii) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය - උදුල බණ්ඩාර අවුසදහාමි මහතා

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - නීතිඥ කපිල ගමගේ මහතා

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - එස්.ඒ. ජයන්ත සමරවීර මහතා

රාජ්‍ය සංවර්ධන නිර්මාණ නීතිගත සංස්ථාව - ඒ.පී.පී. විජිත පණ්ඩිතසේකර මහතා

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය - නීතිඥ පාලිත ගමගේ මහතා

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - බී.කේ. ජගත් කුමාර පෙරේරා මහතා

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(iii) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යතුමා.

(iv) ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(v) ඇමුණුමෙහි සඳහන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

MJ 1

***ඇමුණුම***

| අනු අංකය | ආයතනය/ සභාපතිගේ නම | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තිය සුදුසුකම් | වැටුප්, දුරකථන පහසුකම් හා වාහන සංඛ්‍යාව (මාසිකව) |
|---|---|---|---|---|
| 01 | උදුල බණ්ඩාර අවුසදහාමි මහතා<br><br>ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය | විද්‍යාවේදී (ගෞරව)<br>වාස්තු විද්‍යා දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය - මොරටුව විශ්ව විද්‍යාලය | ප්‍රලේඛණ ශිල්පී - මධ්‍යම සංස්කෘතික අරමුදල 1984-1985<br><br>ගෘහ අලංකරණ ශිල්පී සරත් සුරසේන සමාගම 1985-1987<br><br>ව්‍යාපෘති වාස්තු විද්‍යාඥ සුචිත් මෙහොට්ටි ඇසොසියේට්ස් 1993-1996<br><br>ප්‍රධාන වාස්තු විද්‍යාඥ දකුණු පළාත් සංවර්ධන අධිකාරිය 1996 -1998<br><br>ව්‍යාපෘති වාස්තු විද්‍යාඥ ෆොරස්ට් පුද්ගලික සමාගම 1993-1996<br><br>වාස්තු විද්‍යාඥ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය 2000 සිට | වැටුප - රු. 50,000/-<br>ඉන්ධන දීමනාව - රු. 20445/-<br>දුරකථන දීමනාව - රු. 9,520/-<br>නිල වාහන- 01 |
| 02 | නීතිඥ කපිල ගමගේ මහතා<br><br>සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | දර්ශන ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය කැළණිය විශ්ව විද්‍යාලය | නීතිඥ සහ නොතාරිස් වසර 11 ක පළපුරුද්ද හා ජනතා පොහොර ව්‍යවසාය, ජාතික පශු සම්පත් මණ්ඩලය හා ඩෙකොෂෝව පුද්ගලික සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයෙකු කටයුතු කර ඇත. | වැටුප - රු. 60,000/-<br>ඉන්ධන දීමනාව -රු. 30,825/-<br>දුරකථන දීමනාව - 6,750/-<br>නිවාස කුලී - රු. 30,000/-<br>නිල රථ - 01 |
| 03 | ජයන්ත සමරවීර මහතා<br><br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) 1985<br>අ.පො.ස( උසස් පෙළ) 1988<br><br>ලේඛකත්ව හා සන්නිවේදන පිළිබඳ ඩිප්ලෝමාව ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලය | ව්‍යාපෘති අධ්‍යක්ෂ මධ්‍යසාර සහ ඖෂධ තොරතුරු මධ්‍යස්ථානය<br><br>සභාපති ජාතික තරුණ සේවා සභාව, කලුතර දිස්ත්‍රික්කය<br><br>භාණ්ඩාගාරික තරුණ සේවා සභාව<br><br>නිෂ්පාදක ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br><br>සභික බස්නාහිර පළාත් සභාව<br><br>සභික ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | වැටුප - රු. 50,000/-<br>ඉන්ධන දීමනාව - රු. 20,000/-<br>දුරකථන දීමනාව - 8750/-<br>නිල වාහන- 01 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | ඒ.වී.පී.වී.පණ්ඩිතසේකර මහතා<br><br>රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව | විද්‍යාපති (ඉංජිනේරු ) නෝර්වේ<br><br>පශ්චාත් උපාධි ඩිප්ලෝමා(Deep Sea Mining)) ජර්මනිය<br><br>පශ්චාත් උපාධි ඩිප්ලෝමා<br>( Computer Modeling) ඕස්ට්‍රේලියාව<br><br>විද්‍යාවේදී (Mining & Mineral Processing)<br>ශ්‍රී ලංකාව | කථිකාචාර්ය<br>ඉංජිනේරු උපදේශක | වැටුප - රු. 70,000/-<br>නිල වාහන - 01<br>ඉන්ධන - රු. 14,000/-<br>දූරකථන සීමාව - රු. 6750/- |
| 05 | නිතීඥ පාලිත ගමගේ මහතා | නීතිවේදී උපාධිය<br>කොළඹ විශ්ව විද්‍යාලය | 1994 සිට මේ දක්වා වසර 18 ක කාලයක් නිතීඥ වෘත්තියේ යෙදී සිටීම | වැටුප - රු. 50,000/-<br>ඉන්ධන දීමනාව - රු. 17,400/-<br>දූරකථන සීමාව - රු. 12,500/-<br>නිල වාහන - 01 |
| 06 | බී.කේ.ජගත් කුමාර මහතා<br><br>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | වාණිජවේදී උපාධිය (අලෙවිකරණය)<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ<br>ඕෂන්විව් සංවර්ධන පුද්ගලික සමාගම<br><br>සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ<br>නිව් ෆ්ලවර්ස් හෝම් ඩිසයිනර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගම | වැටුප - රු. 70,000/-<br>දූරකථන දිමනාව දැනට ලබාගන්නේ නැත<br><br>නිල ගමන් සඳහා ඉන්ධන සපයනු ලැබේ. |
| 07 | බී.කේ.ජගත් කුමාර මහතා<br><br>ඕෂන් විව් පුද්ගලික සමාගම | වාණිජවේදී උපාධිය (අලෙවිකරණය)<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | | නිල වාහන 01 ක් සපයා ඇත.<br><br>දැනට ජගත් කුමාර මහතා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති ලෙස කටයුතු කරන බැවින් ඕෂන් විව් ආයතනයෙන් වැටුප් , දූරකථන, ඉන්ධන දිමනා ලබා ගන්නේ නැත. |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-1862/'11- (1), ගරු වසන්ත අලුවිහාරේ මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු වසන්ත අලුවිහාරේ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් ශ්‍රී ලාංකික ධීවරයින් පැහැර ගැනීම
### சோமாலியக் கடற்கொள்ளையர்களால் கடத்தப்பட்ட இலங்கை மீனவர்கள்
### SRI LANKAN FISHERMEN ABDUCTED BY SOMALI PIRATES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23. (2) යටතේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමි.

ගරු කථානායකතුමනි, සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් විසින් පැහැර ගන්නා ලද ධීවරයින් කෙරෙහි මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි. අප රටේ ජාතික නිෂ්පාදනය සඳහා ධීවර

[ගරු අනුර දිසානායක මහතා]

ක්ෂේත්‍රය විශාල දායකත්වයක් සපයයි. ඔවුන් රටේ ආර්ථිකය කෙරෙහිත්, ජනතාවගේ පෝෂණ අවශ්‍යතාව සඳහාත් කරනු ලබන මෙහෙවර සුවිශේෂයි. එම කාර්ය ඔවුන් විසින් ඉටු කරනු ලබන්නේ විශාල දුෂ්කරතාවන්ට හා අභියෝගයන්ට මුහුණ දෙමිනි. ඒ අතර ප්‍රධාන වශයෙන්ම වර්තමානයේ ඉන්දියානු රජයේ මැදිහත් වීම හා ඉන්දියානු ධීවරයින්ගේ ධීවර කටයුතු ලාංකීය ධීවරයන් කෙරෙහි විශාල බලපෑමක් සිදු කරමින් තිබේ. විවිධ අවස්ථාවලදී ඉන්දියානු රජය විසින් ලාංකීය ධීවරයින් අත් අඩංගුවට ගැනීම, සිරගත කිරීම සිදු කර ඇත.

එමෙන්ම ලංකාවේ මුහුදු සීමාව තුළ නිදහසේ ඉන්දීය ධීවර කටයුතු කිරීමට ඉඩ ලබා දීම හා ඔවුන්ගේ විශාල ට්‍රෝලර් යාත්‍රා හේතුවෙන් අප ධීවරයින්ගේ දැල්, ආම්පන්න පවා විනාශ වීමේ තත්ත්වයක් උදාවී ඇත. විවිධ අවස්ථාවල සිදු වන කාලගුණ විපර්යාස හේතුවෙන්ද ධීවර ජනතාවගේ ජීවිත පවා අහිමි වී ඇත. මෑත කාලයේ දකුණු මුහුදු තීරයේ සිදු වූ ව්‍යසනය හේතුවෙන් ධීවරයින් පිරිසකගේ ජීවිත අහිමි වූ අතර තවත් ධීවරයින් පිරිසක් අතුරුදන්ව ඇත. දැල්, ආම්පන්න, බෝට්ටු ඇතුළු ධීවර ජනතාවගේ විශාල සම්පත් ප්‍රමාණයක්ද විනාශ විය. ධීවර ජනතාව තම රැකියාවේ නිරත වීමේදී මුහුණ දීමට සිදු වන මේ ආකාරයේ දුෂ්කරතා රැසකි. ඔවුන්ගේ ජීවිත, දේපළ පවා අහිමි වූ අවස්ථා බොහෝ ප්‍රමාණයක් ඇත.

ගරු කථානායකතුමනි, මෙම ගැටලු මෙසේ පවතිද්දී ධීවරයින් පිරිසක් සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගේ ග්‍රහණයට ගෙන ඇත. පසු ගිය වසරේ සැප්තැම්බර් මාසයේ 27 වනදා මුහුදු ගිය කටානේ ඩබ්ලිව්. ශාන්ත සෙබස්තියන් ප්‍රනාන්දු, කළුතර දකුණු මෝදර පදිංචි තිදරු පියෙකු වන එස්.කේ. වීරසේන සිල්වා, මොත්තුකුඩාව මදුරන්කුලියේ එස්. දිනේෂ් සුසන්ත ප්‍රනාන්දු, මීගමුව උතුරු පිටිපන දූපත් අංක 01 හි ඩබ්ලිව්.ජේ. ලෙයොන් රොද්‍රිගු, මීගමුව උතුරු පිටිපන දූපත් අංක 02 හි පී. සෙල්වරාජන් සහ මීගමුව පිටිපන බසියාවත්ත පල්ලිය අසල ඩී. ජූඩ් නිහාල් ප්‍රනාන්දු යන මෙම ධීවරයින් පිරිස හා බහුදින යාත්‍රාව සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් විසින් පැහැර ගෙන මාස 05කට ආසන්න කාලයක් රඳවා ගෙන සිටිති. ඔවුන් මුදා හැරීම සඳහා විශාල කප්පම් මුදලක් ඉල්ලා සිටින බව මාධ්‍ය තුළින් වාර්තා විය. ඔවුන්ගේ ඥාතීන් සහ බහුදින යාත්‍රාවේ හිමිකරු මෙම ධීවරයින් පිරිස නිදහස් කර ගැනීම සඳහා එවැනි කප්පම් මුදලක් ගෙවීමට හැකියාවක් නැතැයිද ප්‍රකාශ කළ බව වාර්තා වේ. එම හේතුවෙන් මෙම ධීවරයින්ගේ පවුලේ උදවියත්, අනෙකුත් ධීවර ජනතාවත් විශාල මානසික පීඩාවකට ලක්ව සිටිති. මොවුන් මෙසේ දුෂ්කරතා විඳිමින් මුහුදු රැකියාව තෝරා ගනු ලැබුවේ ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමට වුවත් ඔවුන් අපේ රටේ පුරවැසියන්ය. මෙරටෙහි දළ දේශීය නිෂ්පාදිතය ශක්තිමත් කිරීමට උර දෙන්නේ ඔවුන්ය. ඔවුන් නීති විරෝධී ලෙස මුහුදු සීමාව උල්ලංඝනය කර ඇතැයි පවසමින් ඉවත බලා සිටීමට අපට සදාචාරාත්මක අයිතියක් නැත.

එහෙයින් වහාම රජය මේ කෙරෙහි අවධානය යොමු කොට මෙම ධීවර පිරිස නිදහස් කර ගැනීම සඳහා කටයුතු සැලසිය යුතුය. මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කරන අතර පහත ප්‍රශ්න කෙරෙහි ගරු ධීවර අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

1. මෙම ධීවර පිරිස නිදහස් කර ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික ලෙස ගෙන ඇති පියවර කවරේද?

2. මෙයට පෙර මෙවැනි කප්පම්කරුවන් විසින් පැහැර ගන්නා ලද ධීවරයින් නිදහස් කර ගෙන තිබේද?

3. ඒ සඳහා ගන්නා ලද පියවර කවරේ ද?

4. මීට පෙර ගන්නා ලද පියවරඅනුගමනය කරමින් මෙම ධීවර පිරිස නිදහස් කර ගැනීමට කටයුතු කරනවාද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ධීවර අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවත්, රටේ ජනතාවත් දැනුවත් කිරීම සඳහා මේ ප්‍රශ්නය ඇසීම ගැන මා මුලින්ම ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

එතුමාගේ පළමුවන ප්‍රශ්නය හැටියට තිබෙන්නේ, මෙම ධීවර පිරිස නිදහස් කර ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික ලෙස ගෙන ඇති පියවර කවරේද යන්නයි. ඔවුන් නිදහස් කර ගැනීම සඳහා අප රාජ්‍ය තාන්ත්‍රික විධියට කර තිබෙන මූලික කටයුතු ටික මා කියන්නම්.

"නිමේෂා දුව" ධීවර යාත්‍රාව පිළිබඳ කිසිදු තොරතුරක් නොමැති බව එම ධීවර යාත්‍රාවේ අයිතිකරු සහ ගැණියන්ගේ ඥාතීන්ගේ දැනුම් දීම මත ඒ පිළිබඳව සොයා බැලීම සඳහා 2011 නොවැම්බර් 08 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සෝමාලියාව, සීෂෙල්ස්, දියාගෝ ගාෂියා, මැඩගස්කර්, ඉන්දියාව සහ මාලදිවයින් බලධාරීන් වෙත දන්වා ඇත.

පසුව මෙම ධීවර පිරිස රැගත් ධීවර යාත්‍රාව සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගේ අත් අඩංගුවට පත් වී ඇති බව එම යාත්‍රාවේ අයිතිකරු විසින් 2012 ජනවාරි 09 වන දින අමාත්‍යාංශයට වාර්තා කර ඇති අතර, එදිනම මේ සම්බන්ධව යාත්‍රාව හිමිකරුගේ ලිඛිත ප්‍රකාශයක් ද සමඟින් යාත්‍රාව සහ ධීවර කාර්මිකයින් බේරා ගැනීමට මැදිහත්ව අවශ්‍ය කටයුතු කරන ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව 2012.01.10 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්වාලාලම්පූර්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මඟින් මුහුදු මංකොල්ලකරුවන් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු ඉටු කරනු ලබන ජාත්‍යන්තර නාවික කාර්යාංශය වෙත යාත්‍රාව සහ ගැණියන් පිළිබඳව සියලු තොරතුරු යවා ඇත.

2012 පෙබරවාරි 01වන දින මේ සම්බන්ධයෙන් නැවත සිහි කැඳවීමක් ද කර තිබෙනවා. මෙයට අමතරව මැදිහත්කරුවකු මාර්ගයෙන් මෙම පිරිස මුදා ගැනීම සඳහා මා පෞද්ගලිකව කටයුතු කරනවා. ඊට අදාළ රාජ්‍ය තාන්ත්‍රික ලිපි මා සතුව තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය කවදාවත් රාජ්‍ය තාන්ත්‍රිකව විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මොකද, කොල්ලකරුවන් කොහේ ඉන්නවාද, කවුද, කිම්ද මන්ද මොනවත් දන්නේ නැහැ. අපි රාජ්‍ය තාන්ත්‍රිකයෝය කිව්වත් ඒ ගොල්ලන් පිළිගන්නත් කැමැති නැහැ ඒ ගොල්ලන්ගේ සම්බන්ධතා තිබෙනවාය කියා.

ගරු මන්ත්‍රීතුමාගේ දෙවන ප්‍රශ්නය වන "මීට පෙර කොල්ලකරුවන් විසින් පැහැර ගන්නා ලද ධීවරයන් නිදහස් කර ගෙන තිබේද, ඒ සම්බන්ධයෙන් ගන්නා ලද පියවර කවරේද?" යන්නට පිළිතුර මේකයි. ගිය අවුරුද්දේත් මෙවැනිම දෙයක් සිදු වුණා. ගිය අවුරුද්දේ ඒ සිද්ධිය වුණු වෙලාවේ අපි රාජ්‍ය තාන්ත්‍රිකව කටයුතු කළා. ඒ වෙලාවේ යාත්‍රා දෙකක් සහ ධීවරයන්

12දෙනෙක් අත් අඩංගුවට අරගෙන තිබුණා. වාසනාවකට වාගේ ඒ වෙලාවේ ඒ රටේ ධීවර අමාත්‍යාංශයේ උපදේශකවරයෙක් සහ තවත් පුද්ගලයෙක් ලංකාවට ආවා. ඒ වාගේම සීනෝර් ආයතනයෙන් යාත්‍රාවක් ගන්න නෙදර්ලන්ත ජාතිකයෙකුත් ආවා. ඒ ගොල්ලන් ලංකාවත් එක්ක තිබෙන ධීවර කටයුතු ගැන කතා කරන්න මාව හම්බ වෙන්න ආවා. එතකොට මේ ප්‍රශ්නය මතු වෙලා තිබුණා. ඒ ගොල්ලන් සෝමාලියාවෙන්ය කියා දැන ගත්තාම මම ඇහුවා, මේකට මැදිහත් වෙලා උදවු කරන්න පුළුවන්ද කියා. ඒ කණ්ඩායමේ සිටි තුන්වන පුද්ගලයා කිව්වා, මම ගිහින් try කරන්නම් කියා. එයා ගිහින් ඊට පසුව අර පුද්ගලයන්ගේ ඡායාරූප ඉල්ලා එව්වා. අපි ඡායාරූප ටිකත් සමඟ පුද්ගලයෙකුත් යැව්වා. ඊට පසුව කිසිම කප්පමක් නැතුව ඒ 12 දෙනාම අපට නිදහස් කර දුන්නා. එදා අපේ යාත්‍රාවට සියයට 90කුත් සල්ලි ගෙවා යාත්‍රාව ගන්න ආවේ නැහැ. අපි ඒ යාත්‍රාව හදලාත් ඉවරයි. ඒක වෙන්දේසි කරනවාය කියා පසු ගිය කාලයේදී අපි කතා කළා. දැනට සති දෙකකට පෙර ඔවුන්ගෙන් ඊ-මේල් එකක් ආවා, ඉතුරු මිලියන 1 1/2 ගෙවා ඒ යාත්‍රාව ගන්න ඒ ගොල්ලන් ලංකාවට එනවාය; ඒ නිසා ඒක ලෑස්ති කරලා තියන්නය කියා.

අපි වහාම ක්‍රියාත්මක වෙලා එතැන ඉඳලා කථා කළාම -ඒ ගොල්ලෝ නෙදර්ලන්තයේ ඉන්නේ, අර නෙදර්ලන්ත ජාතිකයාත් එක්ක- ඒ ගොල්ලෝ එතැන ඉඳලා ක්‍රියා කළා. ඒ ගොල්ලෝ එක්ක ගනුදෙනු කරපු e-mails ඔක්කොම මා ළඟ තිබෙනවා. ඒවායෙන් වැදගත් ලිපියක් මා කියවන්නම්. ඔවුන් ඔවුන්ගේ රජය ලවා අපේ රජයට -ආරක්ෂක අමාත්‍යවරයාට- මේ ලිපිය එව්වා. එම ලිපිය ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ. මම එය කියවන්නම්:

"To the Minister of Defence, Public Security, Law & Order of the Democratic Socialist Republic of Sri Lanka"

Dear Colleague,

As Minister of Public Security I am responsible for the security situation in Puntland, State of Somalia. Despite a well trained police force in main cities as Bosaso and Qardho, we are facing an increasing number of piracy acts in our waters and beyond our economic coastal zones. Although born out of frustration due to a large number of illegal fishing boats and dumping of dangerous waste in our waters a few years back, the piracy is more and more controlled by people with a criminal and/or extremists background.

Although there is a large number of warships from the international community patrolling in our waters, we do see this only as a temporary solution. Therefore we like to discuss with you about the possibility of creating a more permanent solution for this problem.

It has been calculated that the total costs involved with the presence of the international naval force is around US $ 300 million annually with no guarantee that they can solve this problem within 5 to 6 years. According to sources at the UN the total costs caused by Somalian pirates is over 3 billion US $ annually. This is why especially the countries with large interest in sea-cargo transport are now desperately looking for sustainable and cheaper solutions.

The government of Puntland therefore wants to present a comprehensive plan acceptable not only for the international community, but also for the Somalian community. Within the scope of the plan is the set-up of a MCS (Monitoring, Control, Surveillance) system parallel to the economic development of our region at a fraction of the costs involved.

Before we will present the plan to the international community I like to discuss this plan with you on confidential bases.

Sri Lanka's experience in securing the safety in its waters during the war against the Tamil Tigers would be of great value to us.

Respectfully yours,
Abdirizak M. Ahmed (Ducaysane),
Director General, Counter-Piracy Directorate
Ministry of Maritime Transport, Ports and Counter-Piracy,
Government of Puntland, Somalia."

මේ ලිපියෙන් තේරෙනවා මේකේ බැරෑරුම්කම. මේකට වියදම ලෙස අවුරුද්දකට ඩොලර් මිලියන 300ක් ඉල්ලනවා. නමුත් ඒක දරා ගන්නට බැරි එකක්. මේ මංකොල්ලකරුවන් නිසා අවුරුද්දකට ඇති වන අලාභය ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක්. සියලුම යුරෝපා යාත්‍රාවලටත් මේ ප්‍රශ්නය තිබෙනවා. මේ අනුව අපි දිගටම කථා කළාම ඔවුන් අපට එක කාරණයක් දන්වලා තිබෙනවා. ඔවුන් අපට දන්වලා තිබෙනවා, ඔවුන් මේ මංකොල්ලකරුවන්ට කථා කරලා කියලා තිබෙනවා, මේ සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගන්නා තුරු මේ කට්ටියට කිසිදු හානියක් සිදු කරන්න එපා කියලා. ගිය සැරේට වඩා මේ සැරේ ප්‍රශ්නය සම්ප්‍රයුක්තයි. ගිය සැරේ එක කල්ලියක් විධියට සිටිය අය දැන් කල්ලිවලට කැඩිලා. ඒ මොකද, විශේෂයෙන්ම දැන් යුරෝපා සංගමයේ යාත්‍රා එහාට එන්නේ නැහැ. ඒ නිසා දැන් ඒ ගොල්ලන් අතරේ තරගය වැඩි වෙලා තිබෙනවා. මොකද, අපේ කට්ටියත් කියන්නේ පිටින් ධීවර යාත්‍රා ගිහිල්ලා මේ අයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා කියලායි. එහෙම වැඩ කළාම තවත් කට්ටියක් ඇවිල්ලා ඒ කට්ටියට ගහනවා. ගහලා ඒ කට්ටියව උස්සා ගෙන යනවා. ඒ වාගේ දේවල් වෙනවා.

ගරු කථානායකතුමනි, ඔවුන් අවසාන e-mail එක එවලා තිබෙන්නේ පෙබරවාරි 07 වන දා. එනම් ඊයේ. ඒකේදී ඒ අය කියලා තිබෙනවා, "We assure that we will increase the pressure and we will try to come into contact directly." කියලා. ඒ කියන්නේ ඒ අය සම්පූර්ණ ක්‍රියා මාර්ගය ගන්නවා කියලා තිබෙනවා. මෙච්චරයි අපට ගන්න පුළුවන් එකම ක්‍රියා මාර්ගය.

"මීට පෙර ගන්නා ලද පියවර අනුගමනය කරමින් මෙම ධීවර පිරිස නිදහස් කර ගැනීමට කටයුතු කරනවාද" කියා ගරු මන්ත්‍රීතුමා ඊළඟ ප්‍රශ්නයෙන් අසා තිබෙනවා. ඇත්තටම මේකම තමයි අපි ගත්තා වූ ක්‍රියා මාර්ගය වන්නේ. මේකට අමතරව අපට කරන්නට වෙනත් කිසිදු දෙයක් නැහැ. මොකද, අපි රාජ්‍යයන් පහකට දැන්වූවා. ඒ පහෙනුත් කියන්නේ ඒ ගොල්ලන්ට වෙන කරන්නට දෙයක් නැහැ කියලායි. සෝමාලියානු රජය අපට දන්වා තිබෙන්නේත් ඒ ගොල්ලන්ටත් රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් එක පාරටම කරන්නට දෙයක් නැහැ, මේක ජාත්‍යන්තර මට්ටමේ ප්‍රශ්නයක් කියලායි.

ගරු මන්ත්‍රීතුමා ඉන්දියානු ධීවර ප්‍රශ්නය ගැනත් කිව්වා. මේ ඉන්දියානු ධීවර ප්‍රශ්නය මමත් පිළිගන්නවා. අපට ඒක ඉතාමත් අවාසිදායක ප්‍රශ්නයක්. මම ඒ කාරණය සම්බන්ධයෙන් ඉතා තදින් ඉන්නවා. උතුරේ ධීවර සංවිධානත් ඒ වාගේම තදින් ඉන්නවා. ඇත්තටම මේ ප්‍රශ්නය ඔඩු දුවන්න හේතු වුණු කාරණාව මා කියන්නම්. උතුර නිදහස් කර ගත්ත හැටියේම එක්තරා රාජ්‍ය නොවන සංවිධානයක නියෝජිතයකු, ධීවර සංවිධාන නියෝජිතයෝයි කියලා ධීවර පිරිසක් අරගෙන ගිහිල්ලා ඉන්දියාවත් එක්ක කථා කරලා දවස් 70කට එකඟ වුණා. නමුත් එතැනදී මා දැඩිව හිටියා, මේක රාජ්‍ය තාන්ත්‍රික ප්‍රශ්නයක් මිස ධීවරයන්ට කථා කර විසඳා ගන්න බැහැ; දවස් 70ද, කීයද කියන එක ධීවරයින්ට කථා කරලා තීන්දු කරන්න බැහැ කියන එක සම්බන්ධයෙන්. එතැන ඉඳලා අපි කිව්වේ ජාත්‍යන්තර මුහුදු සීමාව පිළිපැදිය යුතුයි කියන එකයි. ඉන්දියාවත් පිළිගන්න ඕනෑ; අපිත් පිළිගන්න ඕනෑ. ජාත්‍යන්තර සාගර නීතිය කියන ස්ථාවරයේයි මම ඉන්නේ. ඒක තමයි ඒ ගොල්ලන්ට අපි දන්වා තිබෙන්නේ. නමුත් ගිය වතාවේ ඉන්දියාවත් එක්ක පැවති Joint Working Group එකේ සාකච්ඡාවේදී අපේ ධීවරයින් ගැන හොඳ තීන්දු

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

කිහිපයක් ගත්තා. ඒ කියන්නේ අපේ රටින් ගිහිල්ලා අත් අඩංගුවට ගන්නා අය සම්බන්ධව හොඳ තීන්දු කිහිපයක් ගත්තා. හැම ප්‍රාන්තයක්ම ගත්තොත් ඒ ඒ ප්‍රාන්තවල ක්‍රම, විධි වෙනස්. දැන් තමිල්නාඩුව ධීවරයින් අත් අඩංගුවට ගත්තාම ඒ අය නිදහස් කරන්නේ උසාවියට ඉදිරිපත් නොකරයි. ඒ ගොල්ලන්ගේ වෙනත් ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුව මාසයකින් විතර අපට අපේ ධීවරයින් නිදහස් කර ගන්න පුළුවන්. ආන්ද්‍ර ප්‍රදේශය, ඔරිස්සා සහ මහාණ්ඩුව එහෙම නොවෙයි. මහාණ්ඩුවේ අවුරුද්ද දෙක යනවා. අනෙක් ප්‍රාන්ත ගත්තොත් මාස හතක් විතර යනවා. මොකද, එක එක ප්‍රාන්ත එක එක විධියටයි ක්‍රියා කරන්නේ. ඒ ගොල්ලන්ගේ සියලුම නියෝජිතයෝ මගේ ඉල්ලීම පිට මේ වතාවේ ගෙනාවා කථා කරන්න. ඒ අනුව මහාණ්ඩුවයි ඒ ගොල්ලනුයි පොරොන්දු වුණා තමිල්නාඩුවේ ක්‍රමවේදයම ඒ ගොල්ලනුත් අනුගමනය කරන්න. අන්දමන් සහ නිකොබාර් කියන දූපත් දෙක අයත්ව තිබෙන්නේ මහාණ්ඩුවට. ඒ ගොල්ලන් ගිය හැටියේම මහාණ්ඩුව යටතේ තිබෙන අන්දමන් දූපතෙන් අත් අඩංගුවට ගත්ත ධීවරයින්, අන්දමන් දූපතේ හිර වෙලා හිටපු ධීවරයින් සම්බන්ධ සියලුම නඩු වහාම ඉල්ලා අස් කර ගන්න පොරොන්දු වුණා. අනෙක් ප්‍රාන්තත් පොරොන්දු වුණා. ඒ අනුව ඒක අපට සංකේතවත් වෙන්නට මහාණ්ඩුව ඒ නඩු ඉල්ලා අස් කර ගත්තා. ඒ අනුව වහාම නිදහස් කළා. එතකොට භික්ෂූන් වහන්සේ කෙනකු කියනවා, උන් වහන්සේගේ උපවාසය හින්දායි නිදහස් කළේ කියලා.

දැන් ඊයේ වන කොට ආන්ද්‍ර ප්‍රදේශ ප්‍රාන්ත ආණ්ඩුව යටතේ හිටපු ධීවරයන් සම්බන්ධ නඩුත් ඉල්ලා අස් කර ගෙන ඒ අය නිදහස් කර තිබෙනවා. දැන් අපට තව ඉතිරිව ඉන්නේ හය දෙනයි. ඒ හය දෙනා විතරයි අපට නිදහස් කර ගන්න තිබෙන්නේ. අනෙක් කිසි කෙනෙක් අද අත් අඩංගුවේ නැහැ. ඔබතුමා මතක තියා ගන්න, 2009 අවුරුද්දේ මම එනකොට ධීවරයින් 779ක් අත් අඩංගුවේ හිටියා. මේක අඩු වෙලා, අඩු වෙලා ගිය අවුරුද්ද වන කොට විසි ගණනයි හිටියේ. ඒ අයවත් අපි නිදහස් කර ගත්තා. අනික තමිල්නාඩුවෙන් ආපු නියෝජිතයෝ මට පොරොන්දු වුණා, ඒ ගොල්ලන්ගේ මාසයේ ක්‍රම වේදය දවස් හතර පහකට සීමා කරන්න. අපි පෙන්නුවා අත් අඩංගුවට ගන්න කට්ටිය අපි ජාත්‍යන්තර සාගර නීතිය අනුව වහාම නිදහස් කරනවා කියලා; ජාත්‍යන්තර සාගර නීතිය අනුව අත් අඩංගුවට ගන්න පුළුවන්, නමුත් දඬුවම් දෙන්න බැහැ, අපි ඒක පිළිපදිනවා, ඔයගොල්ලෝපිළිපදින්නේ නැහැ කියලා. නමුත් ඒ විධියටම නිදහස් කරන්න ඒ ගොල්ලෝ පොරොන්දු වුණා. ඉතිරි ටික කථා කරන්න තිබෙන්නේ මීට එහා තිබෙන රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙනුයි.

අනෙක් කරුණ, මුහුදු කුණාටුව නිසා දකුණේ ධීවරයෝ අසරණ වුණා. ඒ අයට අපි පුළුවන් තරම් කිව්වා රක්ෂණයට බැඳෙන්න කියලා. නමුත් බැඳිලා නැහැ. ඒක මේකට හේතුවක් කියලා මම කියන්නේ නැහැ. දැන් මම කැබිනට් පත්‍රිකාවක් දමලා තිබෙනවා. භාණ්ඩාගාරයේ නිර්දේශ ලැබෙනවා. මම හිතන්නේ හෙට කැබිනට් මණ්ඩලයේ දී ඒ ගැන තීන්දුවක් ලැබෙයි කියලායි. ඒ අනාථ වුණු දරු පවුල්වලට රුපියල් ලක්ෂයක් බැගින් ගෙවන්න කියලා මම යෝජනා කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ එක්කම මේ කාරණය කියන්න මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. BBC "සන්දේශය"ට අපේ එක්තරා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් මේ විධියට කියලා තිබෙනවා.

I quote:

"......the release can be secured 'only with the mediation of powerful states'."

සෝමාලියානු ආරක්ෂක අමාත්‍යවරයා පෙන්වලා තිබෙනවා powerful Statesවලට සිදු වන්නේ මොකක්ද කියලා. මේවා නිකම් බොරුවට කියනවා. Powerful States එක්ක කථා කර කරන්න පුළුවන් නම් අපි ලෙහෙසියෙන් කරනවා. ඒ ගොල්ලොත් අනාථ වෙලා; ඒ ගොල්ලොත් දඟලනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කවුද, නියෝජ්‍ය ඇමතිවරයා?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
BBC සන්දේශයෙන් බලා ගන්න. It further states, I quote:

"Rights activists have urged the Government of Sri Lanka to intervene without delay to save the fishermen lives"

කථා කරන්නේ කවුරු එක්කද? තවත් එකක් තිබෙනවා World Forum of Fisher Peoples කියා. ඒ ගොල්ලන් තමයි මේ කථා කරන්නේ. මේ නියෝජ්‍ය අමාත්‍යවරයාත් ඒ INGO කාරයාත් දැන් එකතු වෙලා. ඒ ගොල්ලන්ට තිබෙන්නේ ඩොලර්. අපට තිබෙන්නේ කොහොම හරි මේ මිනිස්සුන්ගේ ජීවිත බේරා ගන්න එකයි. ඒ වාගේම තමයි ඔබතුමන්ලාත් දකිනවා ඇති, මට "හිරු එෆ්එම්" එකෙන් ගහනවා. මම පාතාලයටත්, කුඩුවලටත් විරුද්ධව කථා කරනවා. මම ඒක නවත්වන්නේ නැහැ. මම දේශපාලනයට ආවේ එක පරමාර්ථයකින්. කොයි පැත්තේ හිටියත් මම ඒ පරමාර්ථය වෙනස් කරන්නේ නැහැ. මම පාතාලයටත් විරුද්ධයි; කුඩුවලටත් විරුද්ධයි. ඒ ගැටීමේ දී දේශපාලනයේ දී මා එක්ක උරෙනුර ගැටුණු සහෝදරයෙක් තමයි ඝාතනය වුණේ. භාරත ලක්ෂ්මන් කියන්නේ අපිත් එක්ක මරණයට මුහුණ දුන්න මිනිහෙක්. එතැනදී මම ප්‍රකාශයක් කළා. ඒ අදාළ මන්ත්‍රීවරයාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව මම ප්‍රකාශයක් කළා. එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව මම දන්නා දේ තමයි කිව්වේ. විශේෂඥ වෛද්‍යවරු, ශල්‍ය වෛද්‍යවරු මට කියාපු තත්ත්වය තමයි මම කිව්වේ. එහෙම කියලා මම රජය බේරා ගත්තා. මොකද ජනාධිපතිතුමා මෙයා අත් අඩංගුවට ගන්නේ නැත්තේ ඇයි, එයාට පොලිස් ආරක්ෂාව දෙන්නේ ඇයි කියලා රජයට ලොකු චෝදනාවක් තිබුණා. මෙන්න මේකයි තත්ත්වය කියලා මම කිව්වා. එතුමාගේ මානසික තත්ත්වය ගැන දැන් උසාවියටම වාර්තා කරලා තිබෙනවා. ඉතින් මම අසත්‍යයක් කියලා නැහැ. නමුත් ඒවායින් වැදුණාම තමන්ගේ පෞද්ගලික මාධ්‍ය ආයතන එකතු වෙලා ඒවා පාවිච්චි කරලා ඒවායින් මට ගහනවා. ඒකට මට ප්‍රශ්නයක් නැහැ. ඊට වඩා කට්ටිය මට ගහන්න ආවා. හැබැයි, මම එකක් කියනවා. කොහේ හිටියත් එක එක "කුඩු එෆ්එම්"වලට බයේ මගේ දේශපාලන ගමන මම නවත්වන්නේ නැහැ. ඒක මතක තියා ගන්න. අපි රජයට බැඳුණා, රටක් බේරා ගන්න. ඒ ගොල්ලන් රජයට බැඳුණා, ලයිසන් බේරා ගන්න. ඔය දෙකේ වෙනසක් තිබෙනවා. ඉන්දියානු නිදහස් අරගලයේදී මහත්මා ගාන්ධිගේ ප්‍රධානත්වයෙන් තිබුණු ඔක්කොම සත්‍යග්‍රහ ව්‍යාපාර බ්‍රිතාන්‍ය ආණ්ඩුව ගත්තා. ඒ වෙලාවේ එක මනුස්සයෙක් වැසිකිළි යන්න රේල් පාරට ගියා. ඒ වැසිකිළි යන එකාවත් උස්සා ගෙන ගියා. ඌත් ජවහර්ලාල් නේරුලාත් එක්ක මල් මාලා දා ගෙන තමයි එළියට ආවේ. ඒ මිනිහා වැසිකිළියට කක්කා දාන්න ගියේ. වැසිකිළි ගිය එකායි, නිදහස් අරගලයේ හිටි එකායි කියන දෙක මේ රටේ ජනතාව වෙන් කර ගන්න ඕනෑ. එච්චරයි මා ඒ ගොල්ලෝ ගැන කියන්නේ.

ඒ එක්කම මා "රිවිර" මාධ්‍යවේදියාට ස්තුතිවන්ත වෙනවා. කුණු මාධ්‍යවේදය සලකන්නේ නැතිව එතුමාත් මේ කට්ටියත් එක්ක කථා කරලා තිබෙනවා. එතැනට ගිහිල්ලා ඒ පවුල්වලට

කථා කර ඒ මනුස්සයා මට ඒ සියලු විස්තර ගෙනැල්ලා දීලා කිව්වා "ඇමතිතුමා, මේ අහිංසක මිනිස්සු ගැන මට තියෙන විස්තරත් දෙන්නම්, ඇමතිතුමාගේ මාර්ගයෙන් ඒ අවශ්‍ය කටයුතු ටික කරන්න" කියලා. ඒ එක මාධ්‍යවේදියෙක්. අර වාගේ කුණු මාධ්‍යවේදියෝ නොවෙයි. ඒ නිසා මා ඒ ගැනත් දැනුවත් කරනවා. මෙම ප්‍රශ්නය නැඟුවාට සහ මට මේ සියලු විස්තර කියන්න අවස්ථාව ලබා දුන්නාට මා ගරු අනුර දිසානායක මහතාට ස්තුතිවන්ත වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද: 2012 ජනවාරි මස 18 වැනි දින "දි අයිලන්ඩ්" පුවත් පතේ පළ වූ වාර්තාව
## சிறப்புரிமை: 2012 சனவரி 18ஆந் திகதிய "த ஐலண்ட்" அறிக்கை
## PRIVILEGE : "THE ISLAND" REPORT OF 18TH JANUARY, 2012

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"Cabraal blames AG for delay in auditing EPF Accounts" ශීර්ෂය යටතේ "දි අයිලන්ඩ්" පුවත්පතේ පළවූ වාර්තාව මගින් තම වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා විසින් 2012 ජනවාරි මස 18 වැනි දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### සෙය්යිද් ෂේක් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### செய்யது சேஹு கோயா தங்கள் மௌலானா மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SEYYED SHEIKH KOYA THANGAL MOWLANA FOUNDATION (INCORPORATION) BILL

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
Sir, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Seyyed Sheikh Koya Thangal Mowlana Foundation."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

### පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பிலிப் குணவர்தன ஞாபகார்த்த சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### PHILIP GUNAWARDENA COMMEMORATIVE SOCIETY (INCORPORATION) BILL

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs) Malani Fonseka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## යුරෝපයේ අයහපත් ආර්ථික තත්ත්වය මත ඇති විය හැකි ගැටලු වළක්වා ගැනීමට පියවර
## மோசமடைந்துவரும் ஐரோப்பிய பொருளாதாரத் தினால் எழக்கூடிய பிரச்சினைகளுக்கான பரிகார நடவடிக்கைகள்
## MEASURES TO FORESTALL EXPECTED PROBLEMS DUE TO WORSENING ECONOMIC SITUATION IN EUROPE

[අ. භා. 1.41]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"ආනයන සහ අපනයන පාලන පනත යටතේ රජය විසින් මෑතකදී නව රෙගුලාසි මාලාවක් ප්‍රකාශයට පත් කළ හෙයින්, සහ යුරෝපා සංගමයේ ආර්ථික තත්ත්වය බෙහෙවින් අයහපත් අතට හැරෙමින් පවතින බව සියලුම වාර්තා මඟින් පෙන්වා දෙන හෙයින්, සහ යුරෝපයේ පවතින ගැටලුකාරී තත්ත්වයේ අහිතකර ප්‍රතිඵල ලෝකයේ අනෙකුත් ප්‍රදේශවලට පැතිර යාම සිදු වීමට ඉඩ ඇති හෙයින්, සහ එමගින් ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් ඉතා අහිතකර ලෙස බලපෑම් ඇති විය හැකි හෙයින්, එහි ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි ගැටලු වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට රජය ක්‍රියා කළ යුතු යැයි මෙම සභාව යෝජනා කර සිටියි."

ගරු කථානායකතුමනි, කාලයකදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය යුරෝපයේ ආර්ථිකය මත යැපුණා. අපේ නිෂ්පාදනවලට, අපේ අපනයනවලට ඉලක්ක කර ගත්තේ යුරෝපයයි. නමුත් යුරෝපයේ ආර්ථිකය වැටෙන කොට, යුරෝපයේ ආර්ථික ශක්තිය පහළට යන කොට, යුරෝපයේ මිලදී ගැනීමේ හැකියාව අඩු වෙන කොට එහි සෘජු බලපෑම ශ්‍රී ලංකාවට ඇති වෙන එක වළක්වන්න බැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ වර්තමාන ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ග පිළිබඳව අවධානය යොමු කරන විට විවිධ පැතිකඩ රාශියක් තිබෙන බව පෙනෙනවා. මගෙන් පසුව, මේ යෝජනාවට අදාළව කථා කිරීමට බලාපොරොත්තු වන, මේ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥතාව තිබෙන ගරු මන්ත්‍රීතුමන්ලාට එම විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳව කථා කිරීමට ඉඩ සලසමින්, වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා මේ රටේ සාමාන්‍ය ජනතාවට ඇති වෙන්න පුළුවන් අගතිදායක විපාක පිළිබඳව මගේ කථාවේදී කරුණු දක්වන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, පසු ගිය වසරේ මේ රටේ ආනයන සහ අපනයන අතර පරතරය -වෙළෙඳ පරතරය- ඉතාම බරපතළ විධියට වැඩි වෙලා තිබෙනවා. 2011 වසරේ පළමුවන මාස එකොළහ සලකා බැලුවොත්, ඇමෙරිකානු ඩොලර් බිලියන දහඅටයි දශම හතරක් ආනයන සඳහා වැය වෙන කොට, එම කාල සීමාවට අදාළව අපනයන මඟින් අපට ලැබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන නවයයි දශම හයක ප්‍රමාණයක් පමණයි. මේ වෙළෙඳ පරතරය දිගින් දිගට, දිගින් දිගට වැඩි වෙමින් තිබෙනවා. මේ පරතරය වැඩි වීම පිළිබඳ ප්‍රශ්නය යථාර්ථවාදීව දැකලා එයට පිළිතුරක් සොයන්නට උනන්දුවක් හෝ නැති බව ආණ්ඩුවේ මූල්‍ය උපාය මාර්ග දිහා බැලුවාම අපට පෙනී යනවා. එහෙම නැත්නම් ආණ්ඩුවට සාර්ථක උපාය මාර්ග සොයා ගන්න හැකියාවක් නැති බව පෙනී යනවා.

පසු ගිය කාලයේ මේ ආණ්ඩුව බලයට පත් කරන්න මහන්සි වෙච්ච ආණ්ඩුවේ කථිකයෝ කිව්වේ, "මේ ලෝකයේ තිබෙන හැම ප්‍රශ්නයකටම මුල් වෙලා තිබෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවයි. ඒ වාගේම මේ රටේ තිබෙන හැම ප්‍රශ්නයකටමත් මුල් වෙලා තිබෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවයි. අපි දේශ ප්‍රේමී රාජපක්ෂ පාලනයක් ඇති කළාම මේ රටට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගහලා තිබෙන ප්ලග් එක ගලවනවා" කියලායි. හැබැයි, අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කවරදාකවත් නැති විධියට අතිවිශාල නිශ්චිත බැඳීම්වලට මේ ආණ්ඩුව ඇතුළත් වෙලා තිබෙනවා. අද මේ රටේ අය වැය ප්‍රතිපත්තිය පාලනය කරන්නේ, මේ රටේ මූල්‍ය ප්‍රතිපත්තිය පාලනය කරන්නේ මේ රටේ ස්වදේශික ආණ්ඩුවද එහෙම නැත්නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂඥයන්ද කියන තත්ත්වයට මේ රට පත් වෙලා තිබෙනවා.

ඊයේ-පෙරේදා ලංකාවට ආවා, ආචාර්ය බ්‍රයන් ඇට්කින්. ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වලා ඔහු කියනවා, "ශ්‍රී ලංකාවේ ආණ්ඩුවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් අතර ඇති කර ගෙන තිබෙන ඒ ගිවිසුමේ තිබෙන සමහර කොන්දේසිවලට අනුව ශ්‍රී ලංකාව කටයුතු කරලා තිබෙනවා, සමහර කොන්දේසි අනුව කටයුතු කරලා නැහැ" කියලා. හැබැයි ආණ්ඩුව මොකක්ද කියන්නේ? ආණ්ඩුව කියනවා එහෙම ගිවිසුමක් නැහැ කියලා. පුන පුනා කියනවා, නැහැයි කියලා. ඒ කඩදාසිය පෙන්වද්දී කියනවා එහෙම එකක් නැහැ කියලා. ඊට පස්සේ කියනවා, "නැහැ, ඕක මහ ලොකු දෙයක් නොවෙයි" කියලා. හැබැයි, අපි

කියන විධියට වැඩේ කරනවාද කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයෝ කාලයෙන් කාලයට ලංකාවට ඇවිල්ලා සොයා බලනවා. ඔවුන් මොකක්ද කියන්නේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රමිතීන් අනුවත් අපේ රටේ වෙළෙඳ පරතරය වැඩි වෙලා තිබෙන බවයි ඔවුන් කියන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තවත් වැදගත්ම කරුණක් තිබෙනවා. සංවර්ධනයේ මුවාවෙන්, සංවර්ධනයේ නාමයෙන් අතිවිශාල ණය ප්‍රමාණයක් මේ ආණ්ඩුව දේශීයව සහ විදේශීයව ලබා ගෙන තිබෙනවා. බරපතළ කොන්දේසිවලට යටත්ව, මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍යය පාවා දීලා, මේ රටේ අනාගතය උකස් කරලා, බිලියන ගණනක ණය මේ ආණ්ඩුව අරගෙන තිබෙනවා. එහෙම ලබා ගන්නා මුදල් කළමනාකරණය කිරීමට මේ ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා.

එක අතකින් මේ රටේ ජනතාව අමාරුවෙන්, දුක් මහන්සියෙන් රට ඇතුළේ කරන නිෂ්පාදන මඟින් හම්බ කරන මුදල් වාගේම, අනෙක් අතින් විදේශික ශ්‍රමිකයන් හැටියට දුක් මහන්සියෙන්, ලේ, දහඩිය කැප කරලා අර ගෙන එන වටිනා විදේශ විනිමය මේ රජය නාස්ති කරන්නේ කිසිම වග කීමක් නැතිවයි. "මහින්ද චින්තන ඉදිරි දැක්ම" මඟින් ආණ්ඩුව පොරොන්දුවක් වුණා, අල්ලස, දූෂණය මේ රටේ මුල් බැස ගෙන තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් නිසා, මුල් බැස ගෙන තිබෙන ඒ අල්ලස හා දූෂණය නැති කරන්න රජයේ පළමු පනත් කෙටුම්පත ලෙස පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙන එනවා, ඒ පිළිබඳ අවශ්‍ය රෙගුලාසි මාස තුනක් ඇතුළත හදනවා කියලා. හැබැයි මෙච්චර කාලයක් ගත වෙලාත් රටට අවශ්‍ය කරන ඒ අලුත් නීති පනවලාත් නැහැ. අල්ලස, දූෂණය මැඩලීමට එලදායි ක්‍රියා මාර්ගයක් අර ගෙනත් නැහැ. ඒ නිසා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" යටතේ වෙච්ච පොරොන්දුව ඉටු කරන්න ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. මේ රටේ ජනතාව දුක් මහන්සියෙන් හම්බ කරන මුදල් අල්ලසට, දූෂණයට, නාස්තියට යට කරන්න වර්තමාන පාලනය ඉඩ දීලා තිබෙනවා. මේක මහා අපරාධයක්; මහා විනාශයක්.

ගරු කථානායකතුමනි, මේ රටේ මූල්‍ය කළමනාකරණය පිළිබඳව ආණ්ඩුව දැවැන්ත පරස්පර ස්ථාවරවල ඉන්නවා. ඒ ගැන මුදල් අමාත්‍යාංශයේ මතය එකක්; මහ බැංකුවේ මතය තවත් එකක්. අපි ඒක හොඳටම දැක්කා පසු ගිය විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී. ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, රුපියලේ අගය සියයට තුනකින් බාල්දු කරනවා කියලා. හැබැයි, රුපියලේ අගය එහෙම බාල්දු කරනවාය කියන කාරණය ඒ මොහොත වන තෙක් මහ බැංකුව දැන ගෙන සිටියේ නැහැ. මේ රටේ මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගන්න පුළුවන්, ඒ තීරණවලට දායක විය යුතු, එකඟතාවෙන් කටයුතු කළ යුතු ආයතන දෙකක් අතර වැදගත්ම කාරණා පිළිබඳව එකඟතාවක් නැති බව අපට ඒකෙන් එළිදරව් වුණා. ඒ අපට පෙනෙන දේවල්. හැබැයි, එහෙම නොපෙනෙන මොන තරම් ප්‍රශ්න ඇති වෙනවා ඇත්ද? අපට පෙනෙන්නේ ඒවායේ නරක ප්‍රතිඵලය විතරයි. බැලූ බැල්මට පරස්පරතා පෙනෙන්න තිබෙනවාය කියන කාරණය පෙන්වන්න ඒ වාගේ තවත් බොහෝ උදාහරණ අපට තිබෙනවා.

මේ රටේ ආර්ථිකය පිළිබඳව ඉදිරි දැක්මක් ඇති කරන්න නම්, මේ රට උපයා ගන්නා වටිනා මුදල් නාස්තියෙන් සහ දූෂණයෙන් වළක්වා ගන්න සුදුසු ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍යයි. යුරෝපා හවුලේ රටවල ප්‍රශ්න ඇති වෙන කොට, ඒ රටවල ආර්ථික කඩා වැටෙන කොට, අපට අපේ වෙළඳ පොළ අහිමි වන කොට, අපේ රටේ ආර්ථිකය ආරක්ෂා කර ගන්න අප වෙනදාටත් වඩා පරෙස්සම් විය යුතුයි; වෙනදාටත් වඩා පිළිවෙළට වැඩ කළ යුතුයි. ඒ අලුත් තත්ත්වයට මුහුණ දෙන්න ආණ්ඩුව ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියලා මේ ගෞරවනීය පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. මොකද, රටේ මූල්‍ය පාලනය පිළිබඳව සියයට සියයක සම්පූර්ණ වගකීම තිබෙන්නේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පමණක් වන නිසා. ඒ නිසා ඒ ගැන පිරිසිදු, පැහැදිලි උත්තරයක් දීමේ වගකීම රජයට තිබෙනවා.

ගරු කථානායකතුමනි, මාලදිවයිනේ ජනාධිපති මොහොමඩ් නෂීඩ්ට හිටපු ගමන් ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණ හැටි අපි දැක්කා. මීට සුමාන දෙකකට කලින් ඒ විධියේ ලකුණක්වත් ඒ රටේ තිබුණේ නැහැ. හැබැයි, ජනතාවගේ අභිප්‍රායයන්ට එරෙහිව ඉන්න, අධිකරණයේ කටයුතුවලට, අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගහන, විනිශ්චයකාරවරුන්ව පාලනය කරන්න උත්සාහ කරන, රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් යටපත් කරන පාලකයන්ට විරුද්ධව ජනතාව නැඟී සිටින බවත්, බැලූ බැල්මට ආණ්ඩුවත් එක්ක ඉන්නවාය කියන පොලීසිය, හමුදාව සුදුසු අවස්ථාවලදී ජනතාවගේ පැත්ත ගන්නා බවත් පෙන්වන අසල්වැසි රටක වූ ඒ සිද්ධිය අපේ රටේ පාලකයන්ටත්, අපේ රටේ ජනතාවටත් කදිම උදාහරණයක් කියන කාරණය මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි.

අපි 64 වන නිදහස් දිනය සැමරුවා. අපි අවුරුදු 64කට කලින් ඉංග්‍රීසීන්ගෙන් මේ රට නිදහස් කර ගත්තාට, මේ රට ආර්ථික වශයෙන් චීනයට යටත් කරලා, චීනයේ යටත් විජිතයක් කරන්න අවශ්‍ය කරන වටපිටාව මේ ආණ්ඩුව දැනුවත්ව හෝ නොදැනුවත්ව සකස් කරලා තිබෙනවා. නොදැනුවත්ව කියන්නත් බැහැ. මේ ආණ්ඩුවේ ඉන්න ආර්ථික පණ්ඩිතයන්ට බොහෝ දේවල් තේරෙනවා. හැබැයි, අධික පොලියට ගන්නා ණයවලට ලැබෙන කොමිස් මුදල්වල රසට, ඒ වාගේම ඒ අදාළ කොන්දේසි ඒ ඒ සමාගම්වලට, බැංකුවලට වාසිදායක ආකාරයට සකස් කරන කොට අත යට ලැබෙන කොමිස් පංගුවට යට වෙලා මේ රටේ ආර්ථිකය, මේ ආදරණීය මාතෘ භූමිය චීනයට පාවලා දෙන ආර්ථික ප්‍රතිපත්තියකට රජය යොමු වෙමින් තිබෙනවා. මේක ඉතා අවාසනාවන්ත තත්ත්වයක්.

ගරු කථානායකතුමනි, අද යුරෝපයේ ඇති වෙලා තිබෙන විශේෂිත ප්‍රශ්නයට මුහුණ දෙන්නත්, ඒ වාගේම මේ රටේ ආර්ථික නිදහස චීනයට පාවලා දෙන ප්‍රවණතාව නතර කරන්නත් අපි කටයුතු කරන්න අවශ්‍යයි කියන කාරණය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 1.53]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර කරන්න කැමැයිති. ඒ ගමන්ම විනාඩි කිහිපයක් අරගෙන ඒ ගැන මගේ අදහස් දක්වන්නත් කැමැතියි.

2012.01.20 වැනි දින අනුමත කළ ආනයන සහ අපනයන (පාලන) පනතේ තිබෙන නියෝග පිළිබඳව තමයි එතුමා මෙම යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම වැඩිය දත්ත ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අද සිදු වන ආර්ථික කළමනාකරණය තුළින් "මහින්ද චින්තන ඉදිරි දැක්ම" මඟින් රටට වෙච්ච පොරොන්දුව සම්පූර්ණයෙන්ම කණපිට ගහන හැටි උදාහරණ දෙකක් අරගෙන පෙන්වන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ඊට කලින් ගණන් හිලව් වගයක් ගැන කථා කරලා මේ තත්ත්වයේ භයානකකම මේ සභාව ඉදිරියට ගෙනෙන්න මම කැමැතියි. මගේ මිත්‍ර අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කියපු විධියට 2011 ජනවාරි ඉඳන් නොවැම්බර් වෙන

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

කල් අපි ඇඟලුම්, තේ, රබර්, පොල් ආදී සියලුම දේ අපනයනය කරලා -පිට රට ඇරලා- ලබා ගෙන තිබෙන ආදායම ඇමෙරිකන් ඩොලර් මිලියන 9,581කුයි. ඒකෙන් තේවලින් අපට ලැබිලා තිබෙන්නේ, ඩොලර් මිලියන 1,344කුයි. ඇඟලුම්වලින් ලැබිලා තිබෙනවා, ඩොලර් මිලියන 3,817ක්. දැන් මෙහෙම තිබෙද්දී අපි ආනයනය කරනවා. අපි යාන-වාහන ගේනවා; සීනි ගේනවා; කෑම ජාති ගේනවා; බෙහෙත් ගේනවා; අවශ්‍ය දේවල්, අනවශ්‍ය දේවල් ඔක්කෝම ගේනවා. ගරු කථානායකතුමනි, අපි ආනයනය කරන්න වියදම් කරලා තිබෙනවා, ඇමෙරිකන් ඩොලර් මිලියන 18,417ක්. මේ මුදලින් ආහාරවලට පමණක් අපි වැය කරලා තිබෙනවා, ඇමෙරිකන් ඩොලර් බිලියන දෙකක්. අපි පළමුවැනි මාස එකොළහට මේ රටට ඩොලර් බිලියන දෙකක කෑම ගෙනැල්ලා තිබෙනවා. නමුත් අපට කියන්නේ මොකක්ද? මේ රටේ දේශීය ආර්ථිකයක් ගොඩ නඟන්න ඕනෑ, ගම නඟන්න ඕනෑ, රට හදන්න ඕනෑ, පැළ වවන්න ඕනෑ කියලා කියනවා. මම දැක්කා, roundaboutවලත් තක්කාලි, බණ්ඩක්කා, බෝංචි වවලා තිබෙනවා. නමුත් මේ රටට ඩොලර් බිලියන දෙකක ආහාර ගෙනැල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඩොලර් බිලියන හතරක ඉන්ධන ගෙනැල්ලා තිබෙනවා. රටක් සංවර්ධනය වෙන කොට යන්ත්‍රෝපකරණ තමයි ගෙනෙන්නේ. මොකක් හරි project එකක් කරන කොට caterpillar යන්ත්‍ර වාගේ දේවල් අරගන්න අපට අවශ්‍ය වෙනවා. අපට අවශ්‍ය වෙන caterpillar යන්ත්‍ර වාගේ දේවල් අරන් එනවා. ගරු කථානායකතුමනි, මේක ඇහුවාම ඔබතුමාත් පුදුම වෙයි. යන්ත්‍රෝපකරණවලට වියදම් කරලා තිබෙන්නේ, ඩොලර් බිලියන 1.9යි. කෑමවලට වියදම් කරලා තිබෙනවා, ඩොලර් බිලියන දෙකක්. එහෙම නම් කොහොමද ආණ්ඩුව තර්ක කරන්නේ අපි ආනයනය කරන්නේ සංවර්ධනය සඳහාය කියලා. ඉතින් මා ඔබතුමාට මේ කාරණය මතක් කර දෙනවා. මේක තමයි යථාර්ථය. කාටවත් බැහැ, මා මෙතැන අසත්‍යයක් කියනවා කියලා කියන්න. මේක තමයි ඇත්ත. ගරු කථානායකතුමනි, ඒ නිසා වෙළෙඳ ශේෂය -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
ගරු මන්ත්‍රීතුමා, ඒ ආහාර මොනවාද කියලා කියන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි. ආහාර මොනවාද කියන එක මට වෙලාව තිබුණොත් මගේ තර්කය ඉවර වුණාම කියන්නම්. නැත්නම් ඔබතුමාගේ වේලාවේ කියන්නම්. ආහාර කියන්නේ, ආහාර; කන බොන දේවල්. තක්කාලි, බෝංචි, බටර්, කිරි, බිත්තර, ඔක්කොම ආහාර.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පිටි කිරි කොච්චරද කියලා කියන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි, මම එන්නම් එතැනට. පිටි කිරි, ඒ ඔක්කොම. මම කිව්වේ නැහැ නේ පිටි කිරි ආහාර නොවෙයි කියලා. පිටි කිරිත් එක්ක ඒ ආහාර.

ගරු කථානායකතුමනි, එතකොට වෙළෙඳ ශේෂය ඩොලර් බිලියන 8.8ක්. ඒ කියන්නේ අපි සියලුම දේ පිට රට යවලා හම්බ කරලා තිබෙන්නේ ඩොලර් බිලියන 9.5යි. ශේෂය විතරක්, ආනයන අපනයන පරතරය විතරක් ඩොලර් බිලියන 8.8ක්. මා ඉතාමත්ම වග කීමෙන් කියන්නේ. අතීතයේ කිසිම දවසක මේ රටේ මෙච්චර වෙළෙඳ හිඟයක් තිබිලා නැහැ. මෙහෙම වෙළෙඳ හිඟ තිබෙනවා. එතකොට සාමාන්‍යයෙන් වෙන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? ඒ වුණාට ඒවා ප්‍රේෂණවලින් - හැමදාමත් පත්තර බැලුවොත් අපිට දකින්නට තිබෙනවා, දූෂණය කළා, තුන්වැනි තට්ටුවෙන් වැටිලා මළා, කන්න දුන්නේ නැහැ, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මළේ නැහැ, කකුල් කැඩිලා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කකුල් කැඩුණා, එහෙම කියනවා. ඒ කට්ටිය එහෙම මහන්සියෙන් හම්බ කරලා එවන මුදල්. අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඒ කට්ටිය ගැන සොයා බලනවා. එහෙම සිදු වෙලා හරි ඒ වෙළෙඳ ශේෂය පියවා ගන්න එකයි අපි සාමාන්‍යයෙන් කරන්නේ.

ගරු කථානායකතුමනි, පසු ගිය අවුරුද්ද අරගෙන බැලුවොත්, පසු ගිය අවුරුද්දේ පළමුවැනි මාස එකොළහට තිබුණු වෙළෙඳ ශේෂය ඩොලර් බිලියන 4.2යි. නමුත් අපට ප්‍රේෂණවලිනුයි, සංචාරකයන්ගේ ආදායමෙනුයි ඩොලර් බිලියන 4.3ක් ලැබුණා. ගරු කථානායකතුමනි, එතකොට අර ශේෂය සම්පූර්ණයෙන්ම පියවා ගන්න පුළුවන් වුණා. එතකොට අපට ඩොලර් මිලියන 141ක අතිරික්තයක් තිබුණා. ගරු කථානායකතුමනි, මා නැවතත් කියනවා, නමුත් මේ අවුරුද්දේ කවදාවත් වෙච්ච නැති විධියට ප්‍රේෂණවලින් ලැබෙන්නේ ඩොලර් මිලියන 4.6යි. සංචාරකයන්ගෙන් ඩොලර් මිලියන 830යි. මේ මාස එකොළහට මුළු එකතුව ඩොලර් බිලියන 5.4යි. එහෙම නම් සියයට 38ක්, එහෙමත් නැත්නම් ඩොලර් බිලියන 3.4ක් පියවා ගන්න අපට බැරි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඉතින් ඔන්න ඕක තමයි ගැටලුව.

පසු ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ වෙළෙඳ ශේෂයේ හිඟය සියයට 111.3කින් වැඩි වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමනි, සියයට 10කින්, 15කින් නොවෙයි, සියයට 111.3කින් වෙළෙඳ ශේෂයේ පරතරය වැඩි වෙලා තිබෙනවා. දැන් බලන්න. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, "අපි ඇමෙරිකාවට, යුරෝපීය සංගමයට අපනයනය කරනවා. ඒවායේ ගැටලු තිබෙනවා. එම නිසා අපටත් ඉදිරියේදී මේ ප්‍රශ්නවලට මුහුණ පාන්න සිද්ධ වනවා"යි කියලා. දැන් අපි පොඩ්ඩක් කල්පනා කරලා බලමු. ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමා මේ ළඟදී කථාවක් පවත්වා තිබෙනවා. ඒ කථාව මුළුමනින්ම පත්‍රවල පළ වුණා. චීනයේ ෂෙං හී කියන Admiralවරයා බෝට්ටු 300ක් සහ නාවිකයෝ 2,800ක් එක්ක වර්ෂ 1411 දී ලංකාවට ඇවිත් ශ්‍රී පාදයට ගිය බවට කළුගලේ ලියපු එකක් දකුණේ තිබී හම්බ වෙලා තිබෙන කථාවක් ඔහු කියා තිබෙනවා. එතැනදී ආචාර්ය නාලක ගොඩහේවා මගේ මිත්‍රයා කියනවා, ලංකාවේ ප්‍රධානම ජාත්‍යන්තර ගනුදෙනුකරුවා චීනය කියලා. ඒක වැරැදියි. ඒක නොවෙයි සත්‍යය. අපේ ප්‍රධානම ආනයන සහකරු හෝ අපනයන සහකරු චීනය නොවෙයි. ඇත්ත වශයෙන්ම ඉන්දියාව තමයි අපේ ප්‍රධානම ආනයන සහකරු. ගරු කථානායකතුමනි, මේ රටට ආනයනය කරන දේවල්වලින් සියයට 23.8ක් ගෙනෙන්නේ ඉන්දියාවෙන්. ඊ ළඟට තමයි චීනයෙන් ගෙනෙන්නේ, එම ප්‍රමාණයෙන් භාගයක්. ඒ කියන්නේ සියයට 14.4ක්. යුරෝපයෙන්

ගෙනෙනවා, සියයට 11.3ක්. සිංගප්පූරුව වාගේ පොඩි රටකින් ගෙනෙනවා, සියයට 8.6ක්. අපි ඉරානයෙන් තෙල් ගෙනෙනවා, සියයට 6.6ක්.

අපනයන තමයි ඊට වඩා වැදගත් වන්නේ. දැන් අපි බලමු, චීනය කොහේද තිබෙන්නේ කියලා. අපේ බඩු අපි මේ රටේ හදලා පිට රට යවන්න ඕනෑ. ආනයනයට ගෙවන්න අපි මුදල් එකතු කරන්නේ එහෙම තමයි. අපි වැඩිපුරම අපනයනය කරන්නේ European Union එකටයි. ඒකට සියයට 36.1ක් අපනයනය කරනවා. ඇමෙරිකාවට සියයට 20ක් අපනයනය කරනවා. ඉන්දියාවට සියයට 5.6ක්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයට සියයට 3.4ක් හා රුසියාවට සියයට 3.4ක් අපනයනය කරනවා. චීනයත් එක්ක මගේ පෞද්ගලික අමනාපයක් නැහැ, ගරු කථානායකතුමනි. මා කියන්නේ සත්‍යයයි. චීනය ලංකාවේ අපනයනවලින් කොපමණ ලබා ගන්නවාද?

අපේ අපනයනවලින් චීනයට අපි කොච්චර අපනයනය කරනවාද? ගරු කථානායකතුමනි, සියයට 1.1යි. ඒ කියන්නේ, කිසිම වැදගැම්මකට නැති ප්‍රමාණයක්. එහෙම නම් අපි කළ යුත්තේ මොකක්ද? අපි මහා බ්‍රිතාන්‍ය, ඇමෙරිකාව, European Union රටවල් එක්ක සම්බන්ධතා තව වැඩි කරලා අපනයන වැඩි කරනවා වාගේම අපි බලන්න ඕනෑ අනෙක් රටවල් එක්කත් අපනයන සංවර්ධනය කරන්න. නමුත් ඒ ඔක්කෝටම වඩා ගරු කථානායකතුමනි, අපිට අපනයනය පිළිබඳව විශ්වාසයක් තිබෙන්න ඕනෑ. We have to be export-oriented. We talk about creating an export-oriented economy so that all our resources will be moved towards the export sector. දැන් බලන්න ගරු කථානායකතුමනි, අවුරුදු 10කට කලින් මේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 35ක් අපි අපනයනය කළා. නමුත් අද වන කොට ගරු අගමැතිතුමනි, ඒක සියයට 17ට අඩු වෙලා තිබෙනවා. හරි, අපි අපනයනය කරන ප්‍රමාණය නාමිකව වැඩි වෙලා තිබෙනවා. නමුත් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ අපනයනය සියයට 35 ඉඳලා සියයට 17ට අඩු වෙලා තිබෙනවා. ඒකෙන් මොකක්ද පෙන්නුම් කරන්නේ? මේ දත්තයේ අන්තර්ගතය මොකක්ද? ඒකෙන් කියන්නේ අපේ ආයෝජකයෝ, අපේ ව්‍යාපාරිකයෝ අපේ රටේ තිබෙන සම්පත් අපනයන ක්ෂේත්‍රයට නොවෙයි වෙන වෙන ක්ෂේත්‍රවලටයි යොදා ගන්නේ. ඒකයි එතැන හරය. ඒ කියන්නේ අපනයන ක්ෂේත්‍රයේ හිතපු විධියේ ලාභයක් ලබා ගන්න බැරි වෙනවා. අපි කවුරුත් බලන්නේ රුපියල් 100ක් තිබෙනවා නම් ඒ රුපියල් 100 ආයෝජනය කරලා වැඩි ප්‍රතිලාභයක් ලබා ගන්න. ඒ කාලයේ ආයෝජනය කළා අපනයනවලට. ප්‍රතිලාභ ලැබුණා. දැන් ඒ ආයෝජනවලට ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපිට මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ඊට වඩා හොඳයි පාරක් හදනවා. එහෙමත් නැත්නම් බෙහෙත් ටිකක් ගෙනෙනවා වාගේ මොකක් හෝ trading වැඩක් කරන එක.

දැන් බලන්න, අපේ රටේ තිබෙන්නේ මිලියන 20ක කුඩා වෙළෙඳ පොළක්. මම ගරු කරන ගරු සරත් අමුණුගම ඇමතිතුමාත් මේක පිළිගන්නවා ඇති. දේශීය ආර්ථිකය ගොඩ නඟන්න නම් අපි කළ යුත්තේ විදේශයත් එක්ක එකතු වීමයි. ගරු කථානායකතුමනි, විදේශයත් එක්ක එකතු වෙන්නේ නැතුව දේශීය ආර්ථිකය ගොඩ නඟන්න බැහැ. අපේ මිලියන 20න් අපිට යන්න පුළුවන් සීමාවක් තිබෙනවා.

අපි බත්තරමුල්ලේ කඩයක් දාලා කියනවා නම්, කෝට්ටේ ඡන්ද බල ප්‍රදේශයේ විතරයි අපේ බඩු විකුණන්නේ කියා, අපට කොච්චර දුරකට දියුණු වන්නට පුළුවන් ද? අප කියනවා නම් මුළු කොළඹ දිස්ත්‍රික්කයේ ම, ඒ කියන්නේ අපේ කලාපයේ ම, මුළු රටේ ම වෙළඳාම කරනවාය කියා, එහෙම නම් අපට අර බත්තරමුල්ල කඩයෙන් වැඩිපුර ලාභයක් ලබා ගන්නට පුළුවන්. මේ කතාවත් එහෙම කතාවක්. සමහරු කියනවා, "නැහැ, නැහැ, අපේ සම්බාධක දමා අපේ දේශීය වෙළඳ පොළ ආරක්ෂා කර ගන්න ඕනෑ"ය කියා. මේක අපට හැම තැනම ඇහෙන කථාවක්.

අපේ අතිගරු ජනාධිපතිතුමා 2008 වර්ෂයේ සිට අත්සන් කරන්න හදනවා, පූර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම; CEPA ගිවිසුම; ඉන්දියාවත් එක්ක අත්සන් කරන Comprehensive Economic Partnership Agreement එක. ඒක translate කරලායි "පූර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම" කියා මම කිව්වේ. නමුත් මේක සමහරු block කරනවා. Block කරලා මේ දේ කරන්නට දෙන්නේ නැහැ. කියන්නේ මොකක් ද? අප ඉන්දියාවත් එක්ක මේක අත්සන් කළොතින් ඉන්දියන්කාරයෝ ඇවිත් අපේ රට අල්ලා ගන්නවා; අපට බාබර් සාප්පුවක්වත් දාන්න වෙන්නේ නැහැ කියනවා. ඇත්ත වශයෙන්ම ඉන්දියාවේ ලංකා බාබර් සාප්පු තිබෙනවා, ලංකාවේ ඉන්දියන් බාබර් සාප්පු තිබෙනවාට වඩා. රමණී ප්‍රනාන්දුගේ බාබර් සාප්පු තිබෙනවා. රම්සිගේ බාබර් සාප්පු තිබෙනවා. නයනාගේ බාබර් සාප්පු තිබෙනවා. එහෙම බැලුවාම ඉන්දියන් බාබර් සාප්පු එකක්වත් ලංකාවේ නැහැ. අඩු ගණනේ බාබර් සාප්පුවලින් හෝ ඒ කට්ටිය පරද්දන්නට අපට හැකි වී තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, කෙටි දේශපාලන වාසිවලට පමණක් අප මේක කොටු කර ගන්නට නරකයි. අප දීර්ඝව කල්පනා කර බලන්නට ඕනෑ. අපේ අපනයන වැඩි කර ගන්නට පුළුවන් වෙයි ද, බැරි වෙයි ද?

ගරු කථානායකතුමනි, CEPA එක ගැන මෙච්චර කල් කථා කරනවා. අද වන තුරු අවම වශයෙන් මේ පාර්ලිමේන්තුවට නැත්නම් කාරක සභාවකට මේක ඉදිරිපත් කර තිබෙනවා ද? අප මේ ගිවිසුම දැකලා තිබෙනවා ද? දැකලා නැහැ නේ ගරු කථානායකතුමනි. ඔබතුමා දැකලාත් නැහැ; මම දැකලාත් නැහැ. මම දන්නේ නැහැ, අපේ ගරු ඇමතිතුමන්ලා දැකලා තිබෙනවා ද කියා. අපි මීට වඩා මේක විද්වත් සාකච්ඡාවකට භාජනය කරන්නට ඕනෑ.

දැන් බලන්න, යුරෝපයා වෙළඳ පොළ, ඇමෙරිකා වෙළඳ පොළ එපාය කියා අප බණිනවා. මම අර කලින් කිව්වා වාගේ කාටද මේවා අපනයනය කරන්නේ? ගරු අගමැතිතුමා කාටද අප අපනයනය කරන්නේ? චීනය ගන්නේ සියයට එකයි දශම එකයි. ඉරානය ගන්නේ දශම පහයි. යුක්රේනය ගන්නේ දශම හයයි.ලෙබනනය ගන්නේ දශම දෙකයි. හරි, ඒ ගොල්ලන්ට අපේ දේවල්වලින් වැඩක් නැහැ. අපේ දේවල් අපි අවුරුදු සිය ගණනක් අපනයනය කළේ මේ යුරෝපයේ සහ ඇමෙරිකාවේ වෙළඳ පොළට. දැන් බලන්න අප අපනයනය කරනවා වාගේ පහළොස් ගුණයක් ඉන්දියාව යුරෝපයට අපනයනය කරනවා. අප අපනයනය කරනවා වාගේ එකොළොස් ගුණයක් තායිවානය අපනයනය කරනවා. තයිවානයයි, අපේ රටයි එක size රටවල් දෙකක් ගරු අගමැතිතුමනි. තායිවානයයි අපේ රටයි එක size රටවල් දෙකක්. අප අපනයනය කරනවා වාගේ එකොළොස් ගුණයක් තායිවානය අපනයනය කරනවා.

මැලේසියාව අප වාගේ නවගුණයක් අපනයනය කරනවා. සිංගප්පූරුව අප වාගේ නවගුණයක් අපනයනය කරනවා. තායිලන්තය අපි වාගේ අටගුණයක් අපනයනය කරනවා. වියට්නාමය පවා අපි වාගේ හතරගුණයක් අපනයනය කරනවා. ඉතින් මම මීට වඩා මේ ගැන කතා කරන්න කැමැති නැහැ. මම කියන දෙය පැහැදිලි ඇතිය කියා මම හිතනවා. ආනයන සම්බාධක දමනවාට වඩා ගරු කථානායකතුමනි, අපේ අපනයන වැඩිදියුණු කළොත් තමයි අපේ ආර්ථික වර්ධනයට රුකුලක් වෙන්නේ. ඒ නිසා වෙළඳ ශේෂය අඩු කර ගන්න නම් අපනයනය වැඩිදියුණු කරන්නයි බලන්න ඕනෑ. ඒ සඳහා අපේ අපනයන භාණ්ඩවලට තරගකාරී වෙන්න සිද්ධ වෙනවා. අපේ විනිමයට තරගකාරී වෙන්න සිද්ධ වෙනවා. අපේ විනිමය පිළිබඳව අද කතා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ, ජාත්‍යන්තර මූල්‍ය

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

අරමුදල පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෙට තිබෙන නිසා. නමුත් ඕනෑම කෙනකුට බැලුබැල්මට පෙනෙනවා, ඒ වාගේම දත්තවලිනුත් අපට ඔප්පු කරන්න පුළුවන් ගරු කථානායකතුමනි, අපේ රුපියලේ තරගකාරිත්වය අඩු වෙලා තිබෙන බව. ඒ නිසා තමයි අපේ අපනයනවලට මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි මම උදාහරණ දෙකක් දෙනවාය කිව්වා, මහින්ද චින්තනයේ ඉදිරි දැක්මෙන් දේශීය ආර්ථිකය ගොඩනැඟීම පිළිබඳව කනපිට ගහලා තිබෙන්නේ කොහොමද කියන එක ගැන. ගරු කථානායකතුමනි, මම දැන් ඒ උදාහරණ දෙක දෙන්න සූදානම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! .මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හරියටම අවුරුද්දකට කලින් වෙච්ච කථාවක් මම කියන්නම්. හරියටම අවුරුද්දකුත් සුමානයකට කලින් 'විස්කම් ණය ක්‍රමය' යටතේ හාල්පිටි ෆැක්ටරියක් ඇරියා. මොකක්ද ඒකෙන් කරන්නේ? බේකරිවල පාන් හදන්න හාල් පිටි මිශ්‍ර කිරීම තමයි ඒකෙන් සිදු කෙරෙන්නේ. මිනිස්සු කියනවා නේ, පාන් පිටි කනවාය කියා. ගරු ඇමතිතුමා මගෙන් ඇහුවා, මොනවාද ගෙනාවේ කියා කියන්නය කියා. මහ ලොකු ප්‍රමාණයක් පිටිත් ගෙන්වලා තිබෙනවා. යුද්දෙන් පසුව අපට වී අතිරික්තයක් තිබෙනවා. දැන් මේ වීවලට අපි මොකද කරන්නේ? කට්ටියක් කිව්වා හාල් පිටි සියයට 80ක් මිශ්‍ර කරලා පාන් හදමුය කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සියයට 80ක් හාල් පිටි මිශ්‍ර කරලා පාන් හදන ක්‍රමවේදයක් සොයා ගත්තා. ඒකට 'විස්කම් ණය ක්‍රමය' යටතේ ණය දුන්නා. අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා අවුරුද්දකුත් සතියකට කලින් වේයන්ගොඩ පළමුවැනි කර්මාන්තශාලාව විවෘත කළා. ඒ සම්බන්ධයෙන් මාධ්‍ය නිවේදනයකුත් කරමින් මොකක්ද කිව්වේ? පාන් හදන්න අපි රට වටේ මේ වාගේ හාල් පිටි කර්මාන්තශාලා 25ක් හදනවාය කිව්වා. වී ගොවීන්ට කිව්වා, "භය වන්න එපා, අපි සාධාරණ මිලට ඔය ගොල්ලන්ගේ වී අරගෙන ඒවා හාල් කරලා, හාල්වලින් පිටි හදලා, ඒවායින් පාන්, බනිස්, මාළු පාන්, කේක් හදන්නම්" කියා. රට වටේ හාල් පිටි කර්මාන්තශාලා 25ක් හදනවාය කිව්වා. මොකද වෙලා තිබෙන්නේ? ඒ පළවෙනි කර්මාන්තශාලාවත් වැහිලා. කර්මාන්තශාලා 25 කෙසේ වෙතත් ඇරපු එක කර්මාන්තශාලාවත් වැහිලා. මොකද ඒ? අපේ හාල්වල තියෙන ප්‍රශ්නයක් නිසා නොවෙයි. ප්‍රතිපත්තියේ තිබෙන ප්‍රශ්නයක් නිසායි එහෙම වුණේ. තිබුණාට වඩා ඉතාමත්ම අඩු මිලට පාන් පිටි ගෙනෙනවා. රුපියල එන්න එන්න අධි ප්‍රමාණය වන විට පාන් පිටිවල මිල අඩු වනවා. පකිස්තානයෙන් අඩු මිලට පාන් පිටි ගෙනෙනවා.

පසු ගිය අවුරුද්දේ ගං වතුරත් එක්ක මහ කන්නයේ වී මෙට්‍රික් ටොන් මිලියන 2ක් නිෂ්පාදනය වුණා. ඒක විශාල පසු බෑමක්. ඊට කලින් අවුරුද්දේ වී මෙට්‍රික් ටොන් මිලියන 2.6ක් නිෂ්පාදනය වුණා. කොහොම නමුත් මේ අවුරුද්දේ මේ මහ කන්නයේ වී මෙට්‍රික් ටොන් මිලියන 2.8ක් නිෂ්පාදනය කරන්න බලාපොරොත්තු වනවා. ගොවීන්ට කියනවා, අපි සම්බා හාල්වලට රුපියල් 36ක් දෙන්නම්, නාඩු හාල්වලට රුපියල් 31ක් දෙන්නම් කියා. මම අභියෝග කරනවා. ඒක කරන්න ක්‍රමයක් නැහැ. මේ අතිරික්තයත් එක්ක අඩුම ගණනේ රුපියල් 30ට 28ට දෙන්නත් ක්‍රමයක් නැහැ. මේක කඩා ගෙන වැටෙනවා. එතකොට අර වී ගොවීන්ට මොකද වන්නේ? ඒ ගොවීන්ට අතිරික්තයක් තිබෙනවා. දැන් කිව්වා, සෝමාලියාවට අරිනවා කියා. සෝමාලියාවට අරින්නේ වී මෙට්‍රික් ටොන් 7,500යි. නමුත් ටොන් මිලියන 3ක් නිෂ්පාදනය කරනවා. සෝමාලියාවට හැමෝටම කන්න දුන්නත් අපිට මේ ගොවීන්ගේ ප්‍රශ්නය විසඳන්න ක්‍රමයක් නැහැ, ආණ්ඩුව හරි තීරණ ගත්තේ නැත්නම්. ඒක තමයි මා දිගින් දිගටම කියන්නේ. ආනයනය සහ අපනයනය කියන දෙක අතර යම්කිසි සමතුලිතභාවයක් තියෙන්න ඕනෑ. අපේ ප්‍රතිපත්තිවලින් අපි උත්සාහ කරන්න ඕනෑ, අපනයන වැඩි කරන්න; ආනයන අඩු කරන්න.

මම දෙවන උදාහරණයට එන්නම්. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙතැන හිටියා නම් හොඳයි කියා මට හිතෙනවා. ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා යන්නේ නැතුව පොඩ්ඩක් හිටියොත් මා හොඳ කථාවක් කියන්නම්. උක් ගොවියා ගැන අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කියපු දෙයක් කියලා තමයි මම ඒ කාරණය පටන් ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 නොවැම්බර් මස 09 වන දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1034හි ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා මෙහෙම කියා තිබෙනවා:

"ගරු කථානායකතුමනි, මම දන්නේ නැහැ, මේක ගත්තේ එක දෙයකටයි. හැබැයි සමහරු කිව්වා, මේ කර්මාන්තශාලාවේ සීනි හදන කොට molasses හැදෙනවා කියලා. [බාධා කිරීමක්] ඔව්, ඉතින් ඒක හරි. හදන්න පුළුවන්. හැබැයි මේ අය සුරාබදු කොමසාරිස්ට ලිපියක් යවනවා, requesting permission to import 250 metric tons of cane molasses. මේ උක් වවන කර්මාන්තය පැත්තක දමලා පිට රටින් molasses ගෙනෙන්න අවසර ඉල්ලුවා. සුරාබදු කොමසාරිස් ඒක උක් පර්යේෂණ ආයතනයට දන්වා යැව්වාම ඒ අය කිව්වා මේක සම්පූර්ණයෙන්ම වැරදියි, මේකෙන් අපේ රටේ අහිංසක උක් ගොවීන් විනාශ වෙනවා, මේකට කොහෙත්ම එකඟ නැහැ, කොන්දේසි අනුව මේ ඉඩම් දීලා තිබෙන්නේ උක් වවන්නයි, molasses පිට රටින් ගෙන්වලා අරක්කු හදන්න නොවෙයි කියලා"

කවුද මේක කියන්නේ? ගරු බැසිල් රාජපක්ෂ ඇමතිවරයා. ඉන් පසුව තමයි හොඳම කථාව කියන්නේ.

එතුමා තවදුරටත් මෙහෙම කියනවා:

"මේ අය අධිකරණයට ගිහිල්ලා සුරාබදු කොමසාරිස්ට ඒ හරහා බලපෑම් කරන්න උත්සාහ කරලා තිබෙනවා. නඩු දැම්මා. ඒ නඩුව Appeal Court එකේ තිබෙනවා. [බාධා කිරීම්] ඉතින් මේකේ එහෙම අයිතියක් නැහැ. පිට රටින් molasses ගෙනැල්ලා අරක්කු හදන්න නොවෙයි මේක දුන්නේ. මේක මේ රටේ දහස් ගණනක් උක් වගා කරන ගොවි ජනතාව වෙනුවෙන් ඇති කරපු ආයතනයක්. [බාධා කිරීම්] ඒකට අයිතියක් නැහැ- [බාධා කිරීම්] මේක පොදු දේපොළක්. [බාධා කිරීම්] ගරුතර සංඝරත්නය දැන ගන්න ඕනෑ, මේකෙන් කරන්නේ උක් වගා කිරීම නොවෙයි, කසිප්පු පෙරන එකයි කියලා. ගරුතර සංඝරත්නය ඇවිල්ලා කථා කරන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. [බාධා කිරීම්] මේ කොන්දේසි ඔක්කොම කඩ කරලා. එකක්වත් ඉෂ්ට කරලා නැහැ."

මොකක්ද මේ කියන්නේ? එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව සමාගම් බලෙන් පවරා ගත් වෙලාවේ සීනි කර්මාන්තශාලා දෙකක් ගැනයි කථා කළේ. ඒ, සෙවනගල සහ පැල්වත්ත කර්මාන්තශාලා දෙක. එදා කිව්වා, molasses පිට රටින් ගෙනැල්ලා අරක්කු හදන්න හදනවා, ඒ නිසා ඒකෙන් උක් ගොවීන්ට අවාසියක් වෙනවා, ගරුතර මහ සංඝරත්නයටත් එදා කිව්වා මේ දේ කරන්න දෙන්න බැහැ කියලා. අනේ, මිනිසුන් හිතනවා ඇති "කොච්චර හොඳද අපේ ආණ්ඩුව. දේශීය උක් ගොවියා බේරා ගන්න මේ කරන සටන -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Can somebody give me two minutes?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Sir, I will give him two minutes.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේක තමයි හොඳම කොටස. දැන් බලන්න අති විශේෂ ගැසට් පත්‍රය. 2012 ජනවාරි 02 වන සඳුදා ඉදිරිපත් කළ 1739/3 ගැසට් පත්‍රයේ 16A පිටුව බලන්න. HS Code 1703හි මොනවාද තිබෙන්නේ? මේකෙන් කියන්නේ මොකක්ද? මේ HS Codesවල තිබෙන ඒවා licence එකකින් ලංකාවට ගේන්න පුළුවන් කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගැසට් පත්‍රයේ මෙසේ සඳහන් වනවා:

"මෙම නියෝගවල 1 වන උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ, 1969 අංක 1 දරන ආනයන පාලන පනතේ විධිවිධාන ප්‍රකාරව ආනයනය කිරීම සඳහා බලය ලබාදෙන ආනයන සහ අපනයන පාලක විසින් නිකුත් කරන ලද, ආනයන බලපත්‍රය අවශ්‍ය වන්නා වූ භාණ්ඩ වේ."

දැන් මොනවාද මේකේ තිබෙන්නේ? හොඳට අහ ගන්න. මේකේ 23 වන අයිතමයේ 17.03 යටතේ මෙසේ සඳහන් වනවා :

"සීනි පිරිසිදු කිරීමෙන් හෝ නිස්සාරණයෙන් ලබා ගන්නා ඉක්ෂුපාක .."

මොන කෙහෙල්මලක්ද මේ "ඉක්ෂුපාක" කියන්නේ? "ඉක්ෂුපාක" කියන්නේ molasses. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිවරයා කිව්වා, "molasses ගෙනෙන්න තහනම්; molasses ගෙනැල්ලා උක් ගොවියාව විනාශ කරනවා; molasses ගෙනැල්ලා අරක්කු හදනවා" කියලා. එහෙම කියලා මොකක්ද කිව්වේ? "මේ අය molasses හදන නිසා අපි මේවා ගන්නවා" කිව්වා. නමුත් දැන් මේකෙන් මොකක්ද කරන්නේ? මේකෙන් කරන්නේ molasses ගෙනෙන්න නීතියෙන් ඉඩ දෙන එකයි. Molasses හදන නිසා පවරා ගන්නවාය කියලා නොවැම්බර් මාසයේ මේ ආයතන පවරා ගෙන ජනවාරි මාසයේ molasses ගෙනෙන්න නීත්‍යානුකූලව ඉඩ දෙනවා. කාටද ඉඩ දෙන්නේ? කාටද මේ ඉඩ දෙන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
රාජපක්ෂලාට.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සෙවනගල සහ පැල්වත්ත කර්මාන්තශාලා ගත්තා ආණ්ඩුවට. දැන් ඒවා ආණ්ඩුවේ තිබෙන්නේ. තව ආයතන දෙකක් තිබෙනවා. [බාධා කිරීමක්] අහගෙන ඉන්න. තව ආයතන දෙකක් තිබෙනවා, ඒ තමයි, ගල්ඔය සහ කන්තලේ තිබෙන ආයතන දෙක. 2006 ඉඳලා 2011 නොවැම්බර් මාසයේ පනත් කෙටුම්පත ගෙනෙන දවස වනකම් ගල්ඔය කර්මාන්තශාලාවේ එක සීනි කිලෝග්‍රෑම් එකක් හදලා තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒත් ඒක ඌන උපයෝජන කියලා පවරා ගත්තේ නැහැ. ඒ වෙනුවට, මොකක්ද වුණේ? 2006 ජුනි මාසයේ මේක කොළඹ කොටස් වෙළෙඳ පොළ තුළින් පෞද්ගලීකරණය කරන්න කැබිනට් තීරණයක් අරගෙනයි තිබුණේ. මම අසත්‍ය කියනවා නම් මේවා check කරලා බලන්න. ඊට පස්සේ 2006 අගෝස්තු මාසයේ හදිසියේම මේකට unsolicited proposal එකක් ගෙනාවා. කවුද ගෙනාවේ? මේක ගෙනාවේ LOLC සමාගම සහ බ්‍රවුන්ස් සමාගම කියන ආයතන දෙක එකතු වෙලායි. ඒ කට්ටියට හිඟුරාන සීනි කම්හලේ හෙක්ටෙයාර් 7,700කුත් ඒකට අයිති යාන වාහන ඇතුළු කෝටි ගණනක දේපළත්, නාරාහේන්පිට අරක්කු බෝතල් කරන ස්ථානයකුත් - bottling plant එකකුත් - ශත පහක්වත් ගන්නේ නැතිව සියයට 49ක් පවරා දුන්නා. එක ශත පහක්වත් ගෙව්වේ නැහැ ආණ්ඩුවට. අභාවප්‍රාප්ත ගරු ශ්‍රීපති සූරියආරච්චි මැතිතුමා මේකට තදින්ම විරුද්ධ වුණා. මා හිතන විධියට ඒ කාලයේ මේ සිද්ධිය හැමෝටම මතකයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is over. Please wind up now.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Can somebody give me two more minutes?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have already taken two minutes extra.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Sir, I will give him two minutes.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දැන් එහෙම නම් මොකක්ද මේ කරන්න යන්නේ? සීනි කිලෝ එකක්වත් හදන්නේ නැති හිඟුරාන සීනි කම්හලට molasses ගෙනැල්ලා අරක්කු හදන්නද මේ මතට තිත ආණ්ඩුව මේ රෙගුලාසි ගෙනැල්ලා තිබෙන්නේ කියලා මා අහනවා. ඒක අහන්න අපට සාධාරණ අයිතියක් තිබෙනවා.

ඊළඟට හොඳ කථාවක් කියන්න තිබෙනවා. මම බැලුවා, හිඟුරාන Galoya Plantations (Pvt.) Limited එකේ website එක. ඒකේ සඳහන් වන විධියට, ප්‍රංශයේ "Lapage Urbain and Cie" කියන වෙළඳ සමාගමෙන් ගෙන්වන molassesවලින් දවසකට molasses මෙට්‍රික් ටොන් 30ක් අඹරලා ස්ප්‍රීතු ලීටර් 9,000ක් හදන්න පුළුවන්ලු. එහෙනම් කාටද මේ molasses ගෙනෙන්න licences දීලා තිබෙන්නේ කියලා අහන්න සාධාරණ අයිතියක් අපට තිබෙනවා. අවසාන වශයෙන් මම අහන්න කැමතියි, කන්තලේට මොකද වුණේ කියලා? 1960 මා හිතන්නේ සිරිමාවෝ බණ්ඩාරනායක ගරු අගමැතිතුමියගේ කාලයේයි මේක ඇරියේ. අන්තිමට ඒක වහලා දැම්මා. මේ ළඟදී අපේ ඇමතිතුමා කිව්වා, "මේක අපි British company එකකට අවුරුදු තිස් ගණනකට බදු දුන්නා" කියලා. British company එකක්; ඒකේ නම "Penfield Group Limited" කියලා එතුමා කිව්වා. අපි හොයලා බැලුවා. "Penfield Group Limited" කියලා British company එකක් නැහැ. එහි තිබෙන්නේ, British Virgin Islands කියන එක. "British Virgin Islands" කියන එකෙයි "British company"

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

කියන එකෙයි ලොකු වෙනසක් තිබෙනවා. British Virgin Islands කියන්නේ මොකක්ද? අපි හොයලා බැලුවා. ඒ ගොල්ලන්ගේ websitesවල මේ සියලු දේ දමා තිබෙනවා. මම මේ ලියවිල්ල සභාගත කරනවා. ඔක්කෝම operations තිබෙන්නේ ශ්‍රී ලංකාව තුළයි. එහි සඳහන් වෙන්නේ මෙසේයි:

Penfield Trading Limited - Import/Export Activities: sugar/molasses.

නැවත සඳහන් වෙනවා, Penfield Heavy Industries Limited - Industrial Commodity Production: sugar, ethanol and spirit කියලා. මේකෙන් කෙළින්ම කියලා තිබෙනවා, molasses ආනයනය කරන්නයි මේක හදලා තිබෙන්නේ කියන එක. මම මේ ලියවිල්ල **සභාගත*** කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ ලියවිල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථාව අවසන් කරනවා. මේ ආයතනය අනුරුද්ධ දෙල්ගොඩ කියන මහත්මයකුගේයි. British Penfield Group Limited කිව්වාට ඒක අනුරුද්ධ දෙල්ගොඩ කියන මහත්මයාගේ ආයතනය. මේ කන්තලේ කර්මාන්තශාලාව අර ගෙන තිබෙන්නේ molasses ආනයනය කර ඊට පස්සේ ස්ප්‍රීතු හදන්නයි කියලා එතුමාගේම ලියකියවිලිවල සඳහන්ව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්න කැමැතියි මෙතැන කරලා තිබෙන්නේ මහා ලොකු විජ්ජාවක් කියලා. Molasses හදන නිසා මේ ආයතනය පවරා ගන්නවා කියලා අපට කිව්වා. නමුත් මේවා තමන්ගේ මිනිස්සුන්ට molasses හදන්න, අරක්කු පෙරන්න දෙන්න තමයි මේ පනත සහ විධිවිධාන ගෙනැල්ලා තිබෙන්නේ.

අවසාන වශයෙන් මම කියනවා මහින්ද චින්තනයෙන් ජනතාවට ඉදිරිපත් කළේ මේක නොවෙයි; ජනතාවට දුන්න පොරොන්දුව මේක නොවෙයි කියලා. කරුණාකරලා සිද්ධ වෙලා තිබෙන වැරදි හදා ගන්න. එහෙම නැතිව මේ යන විධියට ගියොත් රට ඉදිරියට නොවෙයි, සෞභාග්‍යයට නොවෙයි, වලටම තමයි යන්නේ. බොහොම ස්තුතියි.

[අ. භා. 2.25]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයෙන් ඉදිරිපත් කර තිබෙන මේ සභාව කල් තැබීමේ යෝජනාව මේ ගොල්ලන් පටලවා ගෙන. මේ ගොල්ලන් මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ 2012.01.20වැනි දින සම්මත කළ ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ නියෝග අනුවයි. ඒ අනුව ඒ අය කථා කළේ ආහාර ගැනයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගෙනාපු නියෝග -[බාධා කිරීමක්] තමුන්නාන්සේ කථා කළා නේ. දැන් නිශ්ශබ්දව ඉන්න. 2012 ජනවාරි 20වැනි දා මේ නියෝග ගෙනාවේ වාණිජ කටයුතු සඳහා ආනයනය කරන භාණ්ඩ සඳහා කරන ගෙවීම් ක්‍රමය සරල කිරීමටයි. ඒ ක්‍රමවේදයන් පහක් තිබුණා. ඒ ක්‍රමවේදයන් පහ වෙනුවට ක්‍රමවේදයන් තුනකට ගෙනාවා. [බාධා කිරීම්] විපක්ෂයට කල් තැබීමේ යෝජනාවක් ගේන්නවත් හැකියාවක් නැහැ; දන්නේ නැහැ කියලා අපි පැහැදිලිව කියනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අසත්‍ය කියන්න එපා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මහ ලොකුවට ආර්ථිකය ගැන කථා කරන්න ආවාට තමුන්නාන්සේ ආර්ථික පුස්සෙක්. [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා කියන්නේ - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩිවෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව පැහැදිලිව ගේන්න බැරි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයට හැම වෙලාවේම වරදින්නේ ඒක නිසායි. ඕනෑ දේ නොවෙයි කියන්නේ. යෝජනාව පෙන්වලා කියන්නේ වෙනත් දෙයක්. අර අක්කා පෙන්වලා නංගි දෙන්න යනවා වාගේ වැඩ තමයි මේ අය කරන්නේ. විපක්ෂයට වරදින්නේත් ඒකයි. අක්කා පෙන්වලා නංගි දෙන්න යනවා වාගේ තමුන්නාන්සේලා මේ විධියට වැරදි කල් තැබීමේ යෝජනාවක් ගෙනැල්ලා අද වරද්දා ගෙන තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අක්කා පෙන්නලා නංගි දෙනවා නොවෙයි, නංගි පෙන්නලා අක්කා දෙනවා වාගේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හරි , හරි, නංගි පෙන්නලා අක්කා දෙනවා වාගේ තමයි. නමුත් මේක වෙනස්. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට ගැළපෙන්නේ ඒකයි. [බාධා කිරීම්] මම තමුන්නාන්සේලාට කියන්නේ ඒකයි.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කථාවට උත්තර දෙන්න. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේලාට මම කියන්නේ ඒකයි. අර නංගි පෙන්නලා අක්කා දෙනවා වාගේ කියන එක නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ නිසා අපි පැහැදිලිව-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Ajith P. Perera.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එතුමාට කථා කරන්න පුළුවන්. එතුමාට ඕනෑ වෙලාවක මේ ගැන කථා කරන්න පුළුවන්. දැන් මගේ වෙලාව. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා සම්පූර්ණයෙන්ම-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ස්ථාවර නියෝගය මොකක්ද කියන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේ මගේ වෙලාව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා මූලාසනාරූඪ මන්ත්‍රීතුමාද? මෙතුමාට අක්කයි නංගියි මාරු වෙලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is the point of Order?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් කියන්නේ නංගි පෙන්නලා අක්කා දෙනවා කියලායි. නමුත් මෙතුමා කියන්නේ අක්කා පෙන්නලා නංගි දෙනවා කියලායි. එතුමාට උඩ යට මාරු වෙලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Lalith Dissanayake, you carry on.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මම - [බාධා කිරීමක්] තමුන්නාන්සේ වාඩි වන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ගොල්ලන්ට යන්න තැනක් නැහැ; කියන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව කියනවා අද මේ රටේ කෘෂිකර්මාන්ත අංශය ගත්තාම අද මේ රටේ සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම යුද්ධය දිනා ගැනීම නිසා උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල ඉඩම්වල වී වගාව ආරම්භ කර, 2010-2011 මහ කන්නයේ වගා කර තිබෙන බිම් ප්‍රමාණය හෙක්ටෙයාර් 51,790කින් ඉහළ ගිහිල්ලා හෙක්ටෙයාර් 6,97,827ක් වෙලා තිබෙනවා. ඒ වාගේම 2010-2011 මහ කන්නයේ දී උතුරු සහ නැඟෙනහිර පළාත්වල අලුතින් වී වගාව සඳහා වෙන් කළ බිම් ප්‍රමාණය හෙක්ටෙයාර් 40,669යි. අපි කියනවා තමුන්නාන්සේලාගේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාගේ කාලයේ ගිවිසුම් ගහලා උතුර භාර දෙන කොට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මහින්ද චින්තනය යටතේ -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Molasses ගැන කථා කරන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Molasses නොවෙයි. Molasses පෙරන්න මේ රටේ ජීවත් වන්න අයිතියක් තිබුණේ නැහැ.

එදා තමුන්නාන්සේලාගේ නායකතුමා නුඹුටු ප්‍රභාකරන්ට උතුරු ප්‍රදේශය සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කරලා දුන්නා. අද අපේ නායකතුමාට පුළුවන්කම ලැබිලා තිබෙනවා, ප්‍රභාකරන් එළවා දාලා උතුරු ප්‍රදේශය දක්වා හෙක්ටෙයාර් 51,790කින් වී වගා කරන බිම් ප්‍රමාණය ඉහළ දැමීමට. 2010-2011 මහ

[ගරු ලලිත් දිසානායක මහතා]

කන්නයේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල අලුතින් වී වගාව සඳහා එක් කළ බිම් ප්‍රමාණය පිළිවෙළින් හෙක්ටෙයාර් 40,669ක් සහ හෙක්ටෙයාර් 7,252ක් වෙලා තිබෙනවා. ඒ අනුව කෘෂි කර්මාන්තයේ පිබිදීමක් ඇති කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එක දෙයක් කියන්න ඕනෑ. මේ අය ආනයන ගැන කථා කරනවා. ඔවුන් ඒ ආනයන ගැන කථා කරනවා එක්කම එක පැත්තයි පෙන්වන්නේ. මේ අය හැම වෙලාවේම එක පැත්තක් පෙන්වන්නයි යන්නේ. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහත්තයා එදා ගල්ඔය ව්‍යාපාරය ආරම්භ කළා. ඩඩ්ලි සේනානායක මහත්තයා එදා වගා ව්‍යාපාරය ආරම්භ කළා. 1970-77 කාලයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමගි පෙරමුණු රජයක් යටතේ පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කළා. ඒ වාගේ මේ සියලු රාජ්‍ය නායකයන්ම උත්සාහ කළේ මේ රට සහලින් පෝෂණය කරන්නයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පොහොර සහනාධාරය දීම තුළින් අද වී නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අද අපි කියනවා 2005 ඉඳන් අද වන තුරු ලෝකයේ කිසිම රජයක් මෙවැනි සහනාධාරයක් දීලා නැහැ කියලා. පුළුවන් නම් අභියෝග කරන්න නැහැයි කියලා. තමුන්නාන්සේලා පුළුවන් නම් කියන්න. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවක් යටතේ අද මේ රට සහලින් ස්වයංපෝෂණය කරලා තිබෙනවා. ඒක කාටවත් නැහැයි කියලා කියන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවැනි දේ තමයි අපි කන බත. එහෙම නම් මේ රටේ අපි කන බත් ටික සමහර විට- [බාධා කිරීමක්] කොළඹ ජීවත් වන තමුන්නාන්සේ බත් කන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් අද ගමේ වී නිෂ්පාදනය වැඩි කරලා මේ රට සහලින් ස්වයංපෝෂණය කරලා තිබෙනවා. [බාධා කිරීමක්] මේ රටේ ඉන්නේ බත් කන මිනිස්සු. Courses කන මිනිස්සු නොවෙයි. අන්න ඒ කටයුත්ත අද කරලා තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ වතුකරයේ ජනතාව ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආනයනවලින් වැඩි හරියක් ගෙනැල්ලා තිබෙන්නේ තිරිඟු පිටි, පිටි කිරි සහ සීනි. මේවා ගෙන්වන්නේ නැතිව මේ රටේ ජනතාව හාමතේ තියන්න; පුංචි දරුවාට කිරි පැකට් එක ගෙන්වන්න එපා කියලා තමයි අද අපේ ගරු හර්ෂ මන්ත්‍රීතුමා කථා කරලා කියන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පෞද්ගලිකව කන්න නොවෙයි මේවා ගෙනැල්ලා තියෙන්නේ. මේ රටේ වතුකරයේ ජනතාව ඉන්නවා. අපි ඔවුන්ට බත් ටික කන්න කියලා කිව්වාට ඔවුන් රොටිය පුච්චා ගෙන කන්න ඕනෑ. අන්න ඒ නිසා අද තිරිඟු පිටි ගෙන්වන්න අපට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මේ දේවල් අපි ප්‍රායෝගිකව හිතන්න ඕනෑ. මේ රටේ පිටි කිරි ටික ගෙන්වන්නේ නැතිව, තිරිඟු පිටි ටික ගෙන්වන්නේ නැතිව, සීනි ටික ගෙන්වන්නේ නැතිව තිබුණාම මොකද වෙන්නේ? එහෙම නම් ජනතාවට කන්න බොන්න නැති වේවි. එතකොට මොකද වෙන්නේ? මේ ගොල්ලෝ හර්තාල් කරයි. මොකද අද අලුත් ක්‍රමයක් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද බලා ගෙන ඉන්නවා, හර්තාල් කරලා මේ ආණ්ඩුව වට්ටවන්න. අද මොකක්ද මේ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිය? මොකක්ද තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි නොවෙයි මේ අයගේ සිරිකොතට ගහන්නේ. සිරිකොතට ගහන්නේ කවුද? සිරිකොතට ගහන්නේත් යූඑන්පීකාරයෝ. මොකක්ද තමුන්නාන්සේලාගේ විපක්ෂය? අද රනිල් වික්‍රමසිංහ මහත්තයා පිං කැටයක් අරගෙන යනවා. පිං කැටයක් අරගෙන ගිහිල්ලා මොකක්ද කියන්නේ? "මගේ සිරිකොතට ගැහුවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයවත්, ජේවීපීකාරයෝවත් නොවෙයි. මගේ සිරිකොතට ගැහුවේ යූඑන්පීකාරයෝ" කියලායි කියන්නේ. [බාධා කිරීම්] පිං කැටයක් අරගෙන යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා -බලය ගන්න ඉන්න නායකතුමා- ගිහිල්ලා කියනවා අපේ පක්ෂය බෙදිලා, අපේ පක්ෂයේ අය මට ගැහුවා, ඌ මට ගැහුවා, මම ඌට ගැහුවා, අපි බංකොලොත් කියලා. මේ වාගේ යෝජනා ගෙනාවා කියලා බංකොලොත් පක්ෂයකට ජනතාව ඡන්දය දෙන්නේ නැහැ. ඒ නිසා මේක වෙන පැත්තකට යන්න බලනවා. අද ජනතාවට විහිළු දෙන්නේ. අපේ නායකතුමා විපක්ෂ නායක වෙලා සිටියදී එහෙම නොවෙයි. පාද යාත්‍රා ගියා; රෝද යාත්‍රා ගියා; ආණ්ඩුවට විරුද්ධව ජනතා බලවේග ඒක රාශි කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද යූඑන්පීයට ගහන්නේ අපි නොවෙයි; ජේවීපීකාරයෝ නොවෙයි. යූඑන්පීයට ගහන්නේත් යූඑන්පීකාරයෝමයි. මේක අද පැහැදිලියි. වීඩියෝ එක අරගෙන ගිහිල්ලා අස්ගිරියේ නායක හාමුදුරුවන්ට පෙන්වනවා. මේවා නොවෙයි විපක්ෂයෙන් වෙන්න ඕනෑ. ඒ ගොල්ලෝ ගහගන්න එක ගිහිල්ලා අස්ගිරියේ නායක හාමුදුරුවන්ට පෙන්වන එක නොවෙයි කරන්න ඕනෑ. ජනතාව වෙනුවෙන් වැඩසටහනක් දෙන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරලා මොකක්ද කියන්නේ? ජන අරගලවලින් එන්න තමයි මේ ගොල්ලෝ උත්සාහ කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලන්න. මේ රටේ පසු ගිය කාලයේ pension එක ගැන කථා කළා.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මේ රටේ පෞද්ගලික අංශයේ වැඩ කරන ඇඟලුම් ක්ෂේත්‍රයේ අයටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ගේන්නයි හැදුවේ. ඒක වැරැදි විධියට අර්ථ නිරූපණය කරලා ඔබතුමන්ලා මොකක්ද කළේ? අහිංසක තරුණයෙක් මරා දැම්මා. එහෙම කරලා මේ රටේ අහිංසක ජනතාවට ප්‍රයෝජනයක් ගන්න තිබුණු අවස්ථාව නැති කරලා දැම්මා. මේ වාගේ දේවල් තමයි අද ඔබතුමන්ලා කරන්නේ. ඒ යෝජනාව එපා කිව්වා නම් ඉවරයි. ඒ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සාකච්ඡා කරන්න තිබුණා. එතකොට එපා කිව්වා නම් ඒ යෝජනාව ගේන්නේ නැහැ. අද යූඑන්පී එකට ආණ්ඩුවට ගහන්න කරුණු නැහැ.

ඊළඟට මෙතුමන්ලා කුඩ ප්‍රශ්නය ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එළවලු ප්‍රවාහනය කරන්න කුඩ යොදා ගන්න එක හොඳද, නැද්ද? ඒක හොඳයි. කාටවත් ඒක හොඳ නැහැ කියලා කියන්න බැහැනේ. නමුත් මෙතුමන්ලා දඹුල්ලට ගිහිල්ලා ඒ කුඩ ටික පුච්චලා විශාල අරගලයක් කළා. ජනතාව මේවා දිහා අවබෝධයෙන් බලන්න ඕනෑ. රජය ඒ යෝජනාව ගෙනාවේ ගොවියාව pavement එකට දමලා කුඩ ටික පුළුස්සන්න නොවෙයි. රජය ඒ යෝජනාව ගෙනාවේ ප්‍රයෝජනයක් තිබෙන නිසායි. කුඩ පාවිච්චි නොකිරීම නිසා ගොවියාගේ නිෂ්පාදන යම් ප්‍රමාණයක් අපතේ යනවා. එහෙනම් අපි ඒකට පිළියමක් හොයන්න ඕනෑ. ඒ පිළියම හොඳ නැත්නම් ඒ සඳහා අලුත් යෝජනාවක් ගේන්න ඕනෑ. එහෙම නැතිව අහිංසක, නොදැනුවත් ගොවියා පාරට රැස් කරලා කලබල කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා විපක්ෂයක් හැටියට යා යුතු හරි මාර්ගය දන්නේ නැහැ.

අපි කොටින්ගෙන් මේ රට නිදහස් කර ගත්තා. ඒ ගැන විපක්ෂයට කියන්න දෙයක් නැහැ. මෙතුමන්ලා යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නවත් දන්නේ නැහැ. වෙන මාතෘකාවක් යටතේ යෝජනාවක් ගෙනැල්ලා කථා කරන්නේ තිරිඟු පිටි ආනයනය ගැන. එහෙම නැත්නම්, අපේ ආනයන අපනයනවල ලොකු පරතරයක් තිබෙනවාය කියනවා.

අපි තිරිඟු පිටි ආනයනය අඩු කරන්න ඕනෑ. ඒ වාගේම අපි කිරි පිටි ආනයනය කරන එකත් අඩු කරන්න ඕනෑ. සීනි ආනයනය

කරන එකත් අඩු කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය අණපනත් ගෙනැල්ලා එදා සීනි නිෂ්පාදනය කරන්න මේ රටේ ආරම්භ කරපු ඒ කර්මාන්තශාලාව තුළ සීනි නිෂ්පාදනය වන්නේ නැත්නම්, ඒක තුළ molasses නිෂ්පාදනය කරනවා නම් වැරැදියි. රජයේ ව්‍යාපාර, මහ ජනතාවගේ දේපොළ යම් කොන්දේසි අනුව මිලට අරගෙන, ඒවා වෙනත් කටයුතු සඳහා යොදා ගන්නවා නම් ඒ දේපොළ නැවත මහ ජනතාවට අයිති කර දීමේ වගකීම රජයට තිබෙනවා. ඒ නිසා තමයි අපි ඒ පනත ගෙනාවේ. අපි ඒක නැහැ කියලා කියන්නේ නැති බව ජනතාවට කියනවා. අපි ජනතාවගේ දේපොළ කොල්ල කාපු අය නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එහෙම නම් තමුන්නාන්සේලා molasses ගෙන්වන්නේ ඇයි?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේ ඕවා කිව්වාට ජනතාව අහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි ජනතාවට කියන පළමුවෙනි දේ මේකයි. මෙතුමන්ලා කොච්චර කෑ ගැහුවත්, අද දන්නවා අපට මේ රටේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් බව. මේ කථා කරන මටවත්, අඩු ගණනේ විපක්ෂයේ මෙතුමන්ලාටවත් එදා ප්‍රභාකරන්ගෙන් නිදහසක් තිබුණේ නැහැ නේ. එදා හිටපු අපේ විදේශ කටයුතු ඇමතිතුමා හවස swimming pool එකේ නාන කොට තමයි වෙඩි තියලා මැරුවේ. හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මැයි 1වැනි දා පෙළපාළියට සහභාගි වෙමින් ඉන්න කොට එතුමාගේ ළඟ හිටිය බාබු කියන පුද්ගලයා තමයි බෝම්බය තියලා එතුමාව pavement එකේදී මැරුවේ. අපේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා මිය යන්න දවසකට කලින් මගේ රැස්වීමක කථා කරලා ගියා. පහුවදා, ඉරිදා දවසේ එතුමාව මැරුවා. ඒ වාගේම ගාමිණී දිසානායක මහත්මයා වාගේ මේ රටට වැඩක් කරන්න පුළුවන් මිනිස්සු මැරුවා; අහිංසක මිනිස්සු මැරුවා. කැබිතිගොල්ලෑවේ කොයි තරම් දරුණු ඛේදවාචකයක්ද සිදු වුණේ? ඊයේ-පෙරේදා ඒ පින්තූර දැකලා මට දුක හිතුණා. එක තාත්තා කෙනෙක් තමන්ගේ ඒ පුංචි දරුවා අත් දෙකේ තියා ගෙන ජනාධිපතිතුමාට පෙන්වනවා, "මෙන්න මගේ පුංචි දරුවා මැරුණා" කියලා. ඒ වාගේ අහිංසක මිනිස්සු තමයි කොටි ත්‍රස්තවාදින් මැරුවේ; කැති ගෑවේ. ඒ තත්ත්වය නැති කරලා අද මේ රටේ නිදහස ඇති කර තිබෙනවා. ඒක බලා ගෙන ඉන්න බැරුව ජනතාවට වැරැදි පැති පෙන්වන්න විපක්ෂය උත්සාහ කළාට ජනතාව ඒ පැත්තට යන්නේ නැහැ.

හැම දාම හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන්නේ "චීනය, චීනය, චීනය" කියලා. එතුමා චීනය ගැන කියලා හීනෙනුත් කෑ ගහනවා. එදා අපි ණයක් ගන්න යන කොට මෙතුමන්ලා ගිහිල්ලා අපේ ජනාධිපතිතුමාට විරුද්ධව පිකටිං කළා. යුද්ධය උග්‍රව තිබෙන වෙලාවේ, ප්‍රභාකරන් ගහන වෙලාවේ, ත්‍රස්තවාදින් මේ රටට විනා කරන වෙලාවේ, අපට සල්ලි නැති වෙලාවේ, අපි සල්ලි ගන්න යන කොට මේ ගොල්ලෝ බැංකු ඉස්සරහට ගිහින් කිව්වේ, "මේ ණය ගත්තාට අපේ ආණ්ඩුවක් ආවොත් ආපහු ගෙවන්නේ නැහැ" කියලායි. මේ ගොල්ලෝ බැංකු ඉස්සරහට ගිහින් පිකටිං කළා. මෙතුමන්ලා ඒ ණය ගන්න එක නවත්තන්න හැදුවා. අපට බටහිර රටවලින් ණය ආධාර දෙන්නේ නැත්නම්, ඇමෙරිකාවෙන් ආධාර දෙන්නේ නැත්නම් අපි චීනයෙන් ආධාර ගන්න ඕනෑ. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට චීනයෙන් නිකම් හදලා දුන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිවේගී මාර්ගය හොඳයි කියලා අද හැම දෙනාම පිළිගන්නවා. තමුන්නාන්සේලා ඒ ගැන මොනවා කියලා කෑ ගැහුවත් වැඩක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු මන්ත්‍රීතුමක් කියලා තිබුණා අධිවේගී මාර්ගයේ ආරම්භයේ ඉඳලා අවසානය දක්වා යන කොට දඩ මස් හොද්දක් හදා ගන්නත් පුළුවන් කියලා. ඒ මාර්ගයේ යන බල්ලෝ, වෙනත් සත්තු වාහනවලට අහු වෙනවා ලු. එදා පැය දෙකහමාරක්, තුනක් තිස්සේ කොළඹ ඉඳන් ගාල්ලට ගිය ගමන අද විනාඩි 45කින් යන්න පුළුවන් විධියට අපි අධිවේගී මාර්ගයක් හදලා දුන්නාම මෙතුමන්ලා ඒ ගැනත් වැරැදි විධියකට නේ කථා කරන්නේ. ඒ ගැන වැරැදි විධියටනේ කථා කරන්නේ. හෙට අනිද්දා වන කොට ඒ අධිවේගී මාර්ගය මාතර දක්වා දීර්ඝ වෙනවා. ඒක මේ ගොල්ලන්ට නවත්වන්න බැහැ. චීනයේ ආධාර අරගෙන තමයි අපි ඒ මාර්ගය හැදුවේ. වරායත් ඒ විධියට හදලා තිබෙනවා. අපි ඒකත් කියනවා. හදලා දවසකින් දෙකකින් වරායකට නැව් එන්නේ නැහැ. අපිට ඒ ගැන සැලැස්මක් තිබෙනවා. ඒ අනුව විදේශ ආයෝජන යොදවා හම්බන්තොට කර්මාන්ත ආරම්භ කරනවා. එතකොට ඒ කර්මාන්ත වෙනුවෙන් එන නැව් ටික ආපුවාම අපට ඇති. වෙනත් නැව් එන්න ඕනෑ නැහැ. ඒක අපි පැහැදිලිව කියනවා. ඒ වරාය හදන කොටත් කිව්වා ගලක් තිබෙනවා කියලා.

අද අපි කොළඹ වරායත් සංවර්ධනය කරලා තිබෙනවා. ඒ වාගේම නැඟෙනහිර පළාතේ ඔලුවිල් වරාය ඇතුළු වරායවල් පහක් සංවර්ධනය වනවා. මේ සංවර්ධනය මේ අයට දකින්න බැරි නිසා ඒක වහන්න වෙනත් දේවල් කියනවා. චීනයෙන් ණය අරගෙන තමයි මේවා හැදුවේ කියනවා. ඒක ඇත්ත. අද අපට තිබෙන මුළු ආදායම ප්‍රාග්ධන වියදමට ප්‍රමාණවත් නොවනවා නම් අපි ණය ගන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුත් ණය ගත්තා. අපේ ආණ්ඩුවත් ණය ගන්නවා. නමුත් නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව කියනවා, දළ දේශීය නිෂ්පාදනයත් එක්ක ගත්තාම අපේ ණය ප්‍රතිශතය සියයට 87ක් බව. ඒක සියයට 90ක් හැටියට තිබුණු කාලයකුත් තිබුණා. නමුත් අද ඒ ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. අපි කවදාවත් ඒක වැඩි කරලා නැහැ. දළ දේශීය නිෂ්පාදනයත් එක්ක ගත්තාම අද අපේ ණය අනුපාතය අඩු තත්ත්වයක තිබෙන්නේ. ජාතිකවත්, ජාත්‍යන්තරවත් පිළිගන්න දෙයක් තමයි ඒක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේ කරුණ අපි හිතට ගන්න ඕනෑ. අපි මේ රටේ ජනතාව ණය බරින් පීඩිත තත්ත්වයකට පත් කරලා නැහැ කියන එක හිතට ගන්න ඕනෑ. ජනතාව දන්නවා, අද සිදු වන සංවර්ධනය ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද මත්තල ගුවන් තොටු පොළ හැදෙනවා. අද ඒ හරහා විශාල සංවර්ධනයක් ඇති වනවා. ඒක නැහැ කියලා කාටවත් කියන්න බැහැ. මේ දේවල් කෙරෙන්න ඕනෑ; මේ වෙනස්කම් ඇති කරන්න ඕනෑ. එදා ඩී.එස්. සේනානායක මහත්තයා ගල් ඔය ව්‍යාපාරය ඇති කරනකොටත් හුඟක් අය කිව්වා, එහාට ගිහිල්ලා දමන්නේ මදුරුවෝ කාලා මැලේරියාව හැදෙන්නයි කියලා. නමුත් ඒක එහෙම වුණේ නැහැ.

අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රටේ වෙනසක් ඇති කරලා තිබෙනවා. මේ රට සහලින් ස්වයංපෝෂණය කරලා තිබෙනවා. පොහොර සහනාධාරය ලබා දීලා තිබෙනවා. ඒ අනුව පැහැදිලිවම මේ රටේ වෙනසක් ඇති කරලා තිබෙනවා.

විදේශ සංචාරකයන්ගේ පැමිණීම දසලක්ෂය දක්වා වැඩි කර ගන්නට අද හැකි වෙලා තිබෙනවා. මේ සංචාරකයන් ගෙනෙන්නේ ඩොලර් නොවෙයිද? මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු වුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ත්‍රස්තවාදය නැති කරපු නිසා නොවෙයිද? හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙන් මම අහනවා, තමුන්නාන්සේ චීනය ගැන කථා කරනවා නම්, වෙළෙඳ ශේෂය වැඩි වෙලා තිබෙනවාය කියනවා නම්, ඒ විධියටම අද

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අපේ රටට එන සංචාරකයන්ගේ ප්‍රමාණයත් වැඩි වෙලා නැද්ද කියලා. ඒ අය වියදම් කරන ප්‍රමාණය වැඩි වෙලා නැද්ද? ඒ නිසා පිට රටින් අපට එන ආදායම වැඩි වෙලා නැද්ද? ඇයි මේ දේවල් ගැන කථා කරන්නේ නැත්තේ? ඔබතුමා මේ දේවල් ගැනත් කථා කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සංචාරකයන් විධියට චීනයේ හිරකාරයන්ව-

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගමේ පාර කාපට් කරලා හදලා තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
චීන්නුන්ට රස්සා ටික දීලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
හැම වසරකටම, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම, සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ජාතික සවිය - ගම නැඟුම වැඩසටහන යටතේ රුපියල් ලක්ෂ 10ක් දෙනවා. "දිවි නැඟුම" යටතේ මේ රටේ එළවලු වගා කරන බිම් ප්‍රමාණය වැඩි කරලා එළවලු මිල පහතට ගෙනෙන්නට අද පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඉතින් මේවා ගැන අපි කථා කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය පළාත් පාලන මැතිවරණ කාලයේ මේ ගොල්ලෝ කිව්වා, පොල් ගෙඩිය රුපියල් 65යි කියලා. පළාත් පාලන මැතිවරණයේදී ජනතාවට කිව්වා, "පොල් ගෙඩිය රුපියල් 65ට ගිහින් තිබෙනවා, ඒ නිසා එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඡන්දය දෙන්න එපා" කියලා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාව පොල් ගෙඩිය නොවෙයි, තමන්ගේ ඔළු ගෙඩිය නැත්නම් තමන්ගේ පණ බේරලා දුන්න එක්සත් ජනතා නිදහස් සන්ධානයට කතිරය ගහලා ඒ පළාත් පාලන ආයතන සියල්ලේ දිනුම අපට ලබා දුන්නා. ඒ නිසා ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට මොනවා කිව්වත් හරි යන්නේ නැහැ. පළමුව කරන්න තිබෙන්නේ තමුන්නාන්සේලාගේ පක්ෂය ඇතුළේ තිබෙන ආරාවුල බේරා ගන්න එකයි. අද නායකතුමා කැටේ අරගෙන යනවා, "සිරිකොතට අපේ මිනිස්සු ගැහුවා" කියලා. "මට ගහනවා, මගේ මිනිස්සු" කියලා එතුමා කියන කොට මේ රටේ ජනතාව එවැනි නායකයකුට ඡන්දයක් දෙන්නේ නැහැ. ඒ නිසා මම පැහැදිලිව කියනවා, තමුන්නාන්සේලා කොච්චර කෑ ගැහුවත් තමුන්නාන්සේලා විපක්ෂයේ - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Sunil Handunnetti.

[අ. භා. 2.42]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ රජය ඉදිරිපත් කළ නියෝග පිළිබඳවත්, ඒ වාගේම මේ වන කොට ලෝක ආර්ථික අර්බුදය ලංකාවට බලපාන අන්දම පිළිබඳවත් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කල් තැබීමේ යෝජනාව ගැන කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මම අදහස් කරනවා.

අපේ ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා මේ ගැන කරුණු ඉදිරිපත් කළා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ එන නියෝග පිළිබඳව පාර්ලිමේන්තුවේ මීට කලින් විවාද කරලා නැහැ. පෙබරවාරි පළමු වන දින වන කොට මේ නියෝග සම්මත කර ගන්න ඕනෑ නිසා, ඒ පිළිබඳව එකඟතාවක් පක්ෂ නායක රැස්වීමේදී ඇති කර ගෙන, ඒ එකඟතාවට අනුවම තමයි අද මේ කල්තැබීමේ විවාදය සිද්ධ වන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැනුත් අහ ගෙන ඉන්නේ නැහැ, අපි මොකක්ද කියන්නේ කියලා. මේ රෙගුලාසි පිළිබඳව මීට කලින් වෙන වෙන අවස්ථාවල සංවාදයක් ඇති වුණා. නමුත් ඇත්තටම මේ නිසා පාරිභෝගික භාණ්ඩවල මිල ඉහළ ගිහින් තිබෙනවා. එය ජනතාවට බරපතළ විධියට දැනිලා තිබෙනවා. මේක, රජයේ කළමනාකරණයක් නැතිකමේ ප්‍රතිඵලයක් හැටියට, ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය වශයෙන් තිබෙන අකාර්යක්ෂමතාවේම ප්‍රතිඵලයක් හැටියට කඩිමුඩියේ ගෙනෙන්න සිද්ධ වෙච්ච රෙගුලාසියක්. පෙබරවාරි පළමුවැනි දාට කලින් සම්මත කර ගන්න ඕනෑ නිසා තමයි පසු ගිය පාර්ලිමේන්තු වාරයේදී මෙය එකඟතාවෙන් සම්මත වුණේ. නමුත් මේ පිළිබඳ විවාදයක් අද ඇති කර ගෙන තිබෙන්නේ, ඒ එකඟතාවෙන් සම්මත කර ගැනීම නිසයි. ඒ නිසා තමයි මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අවශ්‍ය වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුවට අද තිබෙන ආර්ථික දැක්ම මොකක්ද? අද තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද? මේ රට ලෝක සිතියමේ තිබෙන තවත් එක රටක් විතරක් නොවෙයි. අපේ රට ලෝක ආර්ථික අර්බුදයත් එක්ක, යුරෝපය පුරා අද සිදු වන අර්බුදයත් එක්ක ගැට ගැහිලා තිබෙන රටක්. මොකද, අපි කවුරුත් දන්නවා අධිරාජ්‍යවාදී වුවමනාවට අනුව ගෙන යන නව ලිබරල්වාදී, ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියම තමයි මේ ආණ්ඩුවත් ගෙන යන්නේ කියලා. ඒ නිසා අද ලෝකය ආර්ථික අර්බුදයකට මුහුණ දෙන කොට, යුරෝපය ආර්ථික අර්බුදයකට මුහුණ දෙන කොට ඒ ආර්ථික අර්බුදයෙන් ගැලවෙන්න, මේ ආණ්ඩුවටත් බැහැ, මේ රටටත් බැහැ. ආණ්ඩුවට ගැලවෙන්න බැරි එක පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ රටේ දුක් විඳින ජනතාව -කෝටි දෙකක ජනතාව- ඒ ආර්ථික අර්බුදයට මුහුණ දෙනවා; විරැකියා ප්‍රශ්නයට මුහුණ දෙනවා; සහන කැපීමට මුහුණ දෙනවා; පඩි වැඩි නොකිරීමට මුහුණ දෙනවා; දුප්පත්කමේ, දරිද්‍රතාවේ, මන්ද පෝෂණයේ පීඩනයේ පතුලට ඇද වැටෙන ජනතාව බවට පත් වෙනවා. ජනතාව එයින් ගලවා ගන්න ආණ්ඩුවට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

මේ ආණ්ඩුවේ ප්‍රධාන ආර්ථික මාර්ග ටික මොනවාද කියලා අපි සොයා බලමු. රජයේ ආදායමෙන් සියයට 89ක් බදු ආදායමයි; තව කොටසක් දඩ ගැහිල්ලයි; ඉතිරි කොටස ණය ගැනිල්ලයි. ණය ගන්නවා කියන්නේ අලුතින් ආදායම් මාර්ග උපදවන ක්‍රමයක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රටේ පතුලේ නිෂ්පාදනයෙන් -තේ කර්මාන්තයෙන් හරි, රබර් කර්මාන්තයෙන්

හරි, පොල් කර්මාන්තයෙන් හරි, ධීවර කර්මාන්තයෙන් හරි, සුළු අපනයන බෝග කර්මාන්තයෙන් හරි- ආදායමක් ජනිත කරන ආදායම් මාර්ගයක් නොවෙයි ණය ගන්නා එක. ආදායම් මාර්ගයක් ජනිත කරන ආදායම් ක්‍රමයක් නොවෙයි බදු ගහන එක. අලුත් වටිනාකමක් එකතු කරන ආදායමක් නොවෙයි දඩ ගහන එක. ඔබතුමා ළඟ තිබෙන මුදලක් ආණ්ඩුව දඩ ගහලා අර ගෙන වියදම් කරනවා කියන්නේ, අලුත් ආදායම් මාර්ගයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක එදා වේලට ආණ්ඩුවට පවතින්න ආදායම් මාර්ගයක්. මේ ලෝක ආර්ථික අර්බුදය අපට පාඩමක් උගන්නලා තිබෙන්නේ ඔන්න ඕක නිසයි.

අපි දන්නවා 2008 දී පටන් ගත්තු ලෝක ආර්ථික අර්බුදය ඉදිරි පිට මුලින්ම උකස් සමාගම් වැටුණු බව. මූල්‍ය සමාගම් වැටුණා. ලෝකයේ කොටස් වෙළඳ පොළ වැටුණා. ඇයි එහෙම වැටුණේ? ලෝකය පුරාම ඒකාධිකාරි සමාගම්වල, ඒකාධිකාරි ආර්ථික රාජ්‍යයන්වල සිද්ධ වුණේ මොකක්ද? අලුතින් ආර්ථික වටිනාකම් නිෂ්පාදනය කරන්නේ නැතිව, අලුතින් නිෂ්පාදනයක් හදන්නේ නැතිව ඒ වෙනුවට සූරා ගෙන කාලා; අපේ රට වාගේ දුප්පත් රටවලින් සූරා ගෙන කාලා එකතු කර ගත්තු වටිනාකම් ටික තමයි හුවමාරු කර ගත්තේ.

ඇත්තටම 2008 දී ඇති වෙච්ච ලෝක ආර්ථික අර්බුදය කියන්නේ අලුතින් ආදායම් හදන්නේ නැතිව සූරා ගෙන කාපු ආදායම බෙදා ගන්න ඇති වෙච්ච තරගයයි. ඒ තරගයේ ප්‍රතිඵල නිසා කුඩා කුඩා කර්මාන්ත වැහුණා; පුංචි පුංචි සමාගම් වැහුණා. ලෝකයේ රටවල වැඩ කරන ජනතාව ලක්ෂ ගණනක් මහ පාරට වැටුණා. පුංචි රටවල නොවෙයි. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය, ග්‍රීසිය, බ්‍රිතාන්‍යය, ජපානය වාගේ රටවල ජනතාව. ඊට පස්සේ ඒකට උත්තරය හෙව්වේ කොහොමද? ඇමෙරිකා එක්සත් ජනපදය ඒ සමාගම්වලට දුන්නා ඩොලර් බිලියන 7.5ක dole එකක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බිලියන 750ක් මුදා හැරියා. අවසානයේ මෙන්න මේ සල්ලි මුදා හැරපු නිසා එයින් පුංචි කාලයකට අර්බුදය සමනයට පත් වුණත් ඒ මුදා හැරපු මුදල්වත් නැවත නිෂ්පාදන ආර්ථිකයට යෙදෙව්වේ නැහැ. නැවත නිෂ්පාදන කර්මාන්තවල යෙදෙව්වේ නැහැ. ඒවා ජනතාවට ආදායම් ලැබෙන මාර්ගවල යෙදෙව්වේ නැති නිසා නැවත අර්බුදය ඇවිල්ලා තිබෙනවා. අද ග්‍රීසිය පුරා සිද්ධ වන්නේ ඒකයි. අද ග්‍රීසියේ වැටුප් කප්පාදු කරනවාට එරෙහිවයි, සහන කපනවාට එරෙහිවයි, විරැකියාවට එරෙහිවයි වැඩ කරන ජනතාව පාරට බැහැලා ඉන්නේ. යුරෝපයේ රටවල ඒ අර්බුදය ඇවිල්ලා තිබෙන්නේ ඒ නිසයි.

අද ඇමෙරිකා එක්සත් ජනපදයේ "සියයට 99 ව්‍යාපාර" නිර්මාණය වෙලා තිබෙන්නේ ඒක නිසායි. සියයට 99ක් ජනතාව අසරණභාවයට පත් කරලා සියයට 1ක් ප්‍රතිලාභ ලබන නිසායි. ඒ ආර්ථික ආර්බුදය නිසා තමයි, ඒ ආර්ථික අර්බුදය පතුලේ තිබෙන හේතු නිසා තමයි අද මාලදිවයින වාගේ රටවල පැය 24න් ආණ්ඩු මාරු වෙන්නේ. අද රුමේනියාවේ ජනාධිපතිවරයාට ඉල්ලා අස් වෙන්නය කියලා ඒ රටේ උද්ඝෝෂණ කරනවා. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරිපත් කරන කොන්දේසිවලට ඒ රටේ විපක්ෂය සහ ජනතාව විරුද්ධ නිසා. ඔවුන් මොකක්ද ඉදිරිපත් කරන්නේ? අද ලෝකයේ අධිරාජ්‍යවාදී රටවල් අපේ රට වාගේ රටවල්වලට යෝජනා කරනවා, ජනතාවට දෙන සහන කපන්න ඕනෑ, ණය දෙන්නේ රට ඇතුළේ තිබෙන අරමුදල්වලින් සල්ලි ගත්තොත් විතරයි කියලා.

අර්ථ සාධක අරමුදලේ රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා. රුපියල් කෝටි ලක්ෂයක් සල්ලි තිබෙන අර්ථ සාධක අරමුදල පරිහරණය කරන්න ආණ්ඩුව නීති හදන්නේ ඒ නිසායි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා තමයි "රට ඇතුළේ අරමුදල් තිබියදී අපි ණය දෙන්නේ නැහැ, රට ඇතුළේ තිබෙන අරමුදල් නිදහස් කරන්න ඕනෑ, අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන යෝජනා ගෙනෙන්න ඕනෑ, සහන කපන්න ඕනෑ, ගොවි විශ්‍රාම වැටුප කපන්න ඕනෑ" කියන ඒවා. එහෙම නැත්නම් "දැයට කිරුළ" සන්දර්ශනය පවත්වද්දී ගොවීන්ගෙන් ප්‍රතිලාභ අරගන්න, ගොවීන්ගෙන් වාරික එකතු කරලා තිබෙන ගොවි විශ්‍රාම අරමුදලින් ගොවි විශ්‍රාම වැටුප දෙන්න පුළුවන් නේ. ගොවි ජනතාවට ඒක දෙන්නේ නැත්තේ ඇයි? ආණ්ඩුව අද අධිරාජ්‍යවාදී ආයතනත් එක්ක, රටවල් එක්ක එකඟතාවකට ඇවිල්ලා තිබෙන්නේ කොහොමද? ජනතාවට දෙන සහන කපලා, ජනතාව පිට පීඩනය පටවලා ආර්ථිකය පවත්වාගෙන යන්නයි. ඒ විධියට ගෙනියන්න පුළුවන් වන්නේ ටික කාලයයි. කකුළුවා දිය කෙළින්නේ හැළියේ වතුර රත් වෙනකල් විතරයි. ඒ වාගේ තමයි මේ ආණ්ඩුවත් කටයුතු කරන්නේ. "දැයට කිරුළ" වාගේ සන්දර්ශන සඳහා යන වියදම පිළිබඳව අපි මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළා. ඒ දිය කෙළිය තමයි මේ තිබෙන්නේ. හැළිය රත් වෙනකල් මේ දිය කෙළිය කරන්න පුළුවන්. හැබැයි, මේ ලෝක අර්බුදය, අද යුරෝපය පුරා හමන අර්බුදය ලංකාවට එන එක වළක්වන්න බැහැ. ඉරානයට ආර්ථික සම්බාධක පැනවෙන කොට ඒ අර්බුදය ලංකාවට එන එක වළක්වන්න බැහැ. අපි ලංකාවට ගෙනෙන බොර තෙල්වලින් සියයට 90ක්ම ගෙනෙන්නේ ඉරානයෙන් නම්, අපට ඒ ආර්ථික අර්බුදය එන්නේ නැතෙයි කියලා සහතිකයක් දෙන්න කාටවත් බැහැ. දැන් තිබෙන ප්‍රශ්නය ඒකයි.

රටක් හැටියට ගත්තොත් මේ ආණ්ඩුවට මේ රටේ ජනතාවත් එක්ක තිබෙන සංවාදය මොකක්ද? මේ ආණ්ඩුවට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? මේ එන ආර්ථික අර්බුදය, ලෝකය පුරා රටවල ආණ්ඩු පෙරළෙන, රටවල් වෙනස් වන, මහා දැවැන්ත උද්ඝෝෂණ කෙරෙන, යුරෝපයේ පවා ජනතාව වීදි බැහැලා තිබෙන ආර්ථික අර්බුදය ඉස්සරහා මේ ආණ්ඩුවට මේ රටේ ජනතාවත් එක්ක තිබෙන සංවාදය, සාකච්ඡාව මොකක්ද? තමුන්නාන්සේලාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? තමුන්නාන්සේලාට තිබෙන සැලැස්ම මොකක්ද? අපට පෙනෙනවා, ඒ විධියේ කිසිම සැලැස්මක් නැහැ. ඒ වෙනුවට කරන්නේ එකම දෙයයි. ටිකක් වැඩි වෙන කොට බර පටවනවා.

මේ ආණ්ඩුවේ විදේශ වත්කම් සංචිතය කලින් ඇමරිකානු ඩොලර් බිලියන 8ක් තිබුණා. අද වෙන කොට එය ඇමරිකානු ඩොලර් බිලියන 6ට බැහැලා තිබෙනවා. මේක බරපතළ කඩා වැටීමක්. මම මීට කලිනුත් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, අද කොටස් වෙළෙඳ පොළට විදේශකයින්ගේ ආයෝජන එන්නේ නැහැයි කියලා. අද ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ විදේශ ආයෝජන තත්ත්වය තිබෙන්නේ ඍණ මට්ටමේ. ඇයි ඒ? රුපියල බාල්දු කිරීමත් එක්ක විදේශිකයෝ කොටස් වෙළෙඳ පොළේ තිබෙන තමන්ගේ ආයෝජන නිදහස් කර ගෙන යනවා. ඒ වෙනුවෙන් ආණ්ඩුවට තිබෙන සැලැස්ම මොකක්ද? ආණ්ඩුවට එහෙම සැලැස්මක් නැහැ. එදා වේල පවතින, එදා වේල පවත්වාගෙන යන ආර්ථික ක්‍රමෝපායයන් විතරයි ආණ්ඩුවට තිබෙන්නේ. ඒකේ ප්‍රධාන දේවල් හැටියට තිබෙන්නේ ජනතාව සම්බන්ධ වෙච්ච, නැවත නිෂ්පාදනය පණ ගහන, නිෂ්පාදනයට ජනතාව හවුල් කර ගන්නා, ජනතාවට ප්‍රතිලාභ ලබා දෙන ක්‍රමයක් නොවෙයි. දඩයි, බදුයි, ණයයි. දඩ ගහනවා, බදු ගහනවා, ණය ගන්නවා. ණය ගන්නවා, දඩ ගහනවා, බදු ගහනවා. එච්චරයි. තමුන්නාන්සේලා මුළු අවුරුද්ද පුරාම ඔය ටික කරනවා. අවුරුද්ද අවසාන වෙන කොට අමාත්‍යාංශවල ඉතුරු වෙලා තිබෙන සල්ලි ටික ඔක්කෝම එකතු කරලා "දැයට කිරුළ" කරනවා. "දැයට කිරුළ" කරලා ඊ ළඟ අවුරුද්දේ ඉඳලා ආයෙත් පරිපූරක ඇස්තමේන්තු දානවා. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් පරිපූරක ඇස්තමේන්තුවක් දානවා, "දැයට කිරුළ"ට ගිය වියදම් නැවත ආවරණය කර ගන්න කියලා. මේක තමයි ප්‍රතිපත්තිය. මුළු අවුරුද්දේම ක්‍රමය ඒකයි. අවසානයේ මුළු රටම අගාධයට, අර්බුදයට ගෙනිහිල්ලා තමයි මේක කෙළවර

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කරන්නේ. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියන්නේ ආනයන අපනයන ප්‍රතිපත්තියක් නැතිකම නිසාම, හිතෙන හිතෙන වෙලාවට බදු ගහන, දඩ ගහන, ණය ගන්න ප්‍රතිපත්තිය නිසාම මේ රට අගාධයට යන එක වළක්වන්න බැහැ කියන එකයි. ඒක වළක්වන ක්‍රමයක් ආණ්ඩුවට නැහැ. ඒ නිසා ඊයේ මාලදිවයිනේ ජනතාව නැඟිට්ටා නම් හෙට ලංකාවේ ජනතාව නැඟිටින එක වළක්වන්න බැහැයි කියන එක අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Akila Viraj Kariyawasam. You have eight minutes.

[අ. භා. 2.53]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව මඟින් ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ නියෝග පැනවීම සම්බන්ධයෙන් විශේෂ කරුණු කාරණා කිහිපයක් මතු වුණා. ආණ්ඩු පක්ෂයෙන් මේවාට උත්තර දෙන්නවත්, මේවා පිළිබඳව සාවධානව අසා සිටින්නවත් සැලකිය යුතු පිරිසක් නොමැති වීම ගැන එක්සත් ජාතික පක්ෂය විධියටත්, විපක්ෂය විධියටත් අපි කනගාටු වෙනවා. අඩුම ගණනේ විෂයභාර ඇමතිවරයාවත් නැහැ. මුදල් ඇමතිවරයාත් නැහැ; වෙළෙඳ ඇමතිවරයාත් නැහැ; නියෝජ්‍ය ඇමතිවරයාත් නැහැ; ඒ කවුරුත් නැහැ. මේ රටට වැදගත් ඒ වාගේම මේ රටේ ජනතාවට බලපාන ප්‍රශ්න පිළිබඳව අපි පාර්ලිමේන්තුව තුළ හඬ නඟාවට ඒවාට ඇහුම් කන් දෙන ප්‍රමාණය, ඒවා පිළිබඳව අවධානය යොමු කරන ප්‍රමාණය පිළිබඳව මේකෙන්ම තේරෙනවා. ඒ බව අද මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයේ හැසිරීමෙන්ම ඔක්කෝටම පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පාසල් යන කාලයේත්, විශ්වවිද්‍යාලයේදීත් ආර්ථික විද්‍යාව ඉගෙන ගනිද්දී අපි ඉගෙන ගත්තු එකක් තමයි රුපියල අවප්‍රමාණය කිරීමෙන් රටවල් බලාපොරොත්තු වෙන දේවල් ටිකක් තිබෙනවාය කියන එක. සාමාන්‍යයෙන් ජපානය "යෙන්" එක අවප්‍රමාණය කිරීමෙන් විශාල ආදායමක් ලබා ගත්තා. ජපානයේ විශාල මෝටර් රථ නිෂ්පාදනයක් තිබුණා. ඒ වාගේම කාර්මික නිෂ්පාදන තිබුණා. ඒ කාර්මික නිෂ්පාදන, මෝටර් රථ අමතර කොටස් ඇතුළු ඒ සියලු දේවල් ජපානය අපනයන කිරීම තුළින් විශාල ආදායමක් ලබා ගත්තා. අපේ රටේ මහ බැංකුව, අපේ වර්තමාන ආණ්ඩුව රුපියල අවප්‍රමාණය කිරීමෙන් බලාපොරොත්තු වුණේ අපනයනය දිරි ගන්වන්න සහ ආනයන අධෛර්යවත් කරන්නයි. නමුත් මේක සැබෑ යථාර්ථයක්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය ක්‍රියාත්මක වෙනවාද? මේ සම්බන්ධයෙන් ඇත්තම කාරණාව මොකක්ද? අපි දන්නවා, අපට තවමත් තිබෙන්නේ ආනයන මත රඳා පවතින ආර්ථිකයක් බව. අපි කොහොම කිව්වත්, අපේ ප්‍රධාන අපනයන වශයෙන් තවම තිබෙන්නේ තේ, රබර්, පොල් සහ ඇඟලුම් නිෂ්පාදන පමණයි. අපි ඇඟලුම් නිෂ්පාදන අපනයනය කළත් ඇත්ත වශයෙන්ම ඇඟලුම් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යවලින් සියයට 40ක් පමණ වූ ප්‍රමාණයක් අපි ආනයනය කරනවා. සියයට 40ක් පමණ අමු ද්‍රව්‍ය ආනයනය කරලා ඒකෙන් ඇඟලුම් නිෂ්පාදනය කරලා තමයි අපි ආපසු අපනයනය කරන්නේ. මේක පැහැදිලිව බැලූ බැල්මට පේනවා. විවිධ රෙගුලාසි දානවා. විවිධ අණ පනත් ගේනවා. විවිධ දේවල් කළාට මේවායින් අපේ රටට ඇති වන යහපතක් නැති බවයි අපට පෙනෙන්නේ. අපේ රට තවමත් විශාල වශයෙන් ආනයන මත රැඳිලායි තිබෙන්නේ. අපි කන බොන දේවල්, අඳින පළඳින දේවල් ආදී බොහෝ දේවල් ආනයන මත රැඳිලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2009 වෙළෙඳ ශේෂය සෘණ 3,04,402යි. 2010 වෙළෙඳ ශේෂය සෘණ 4,45,352යි. 2011 වෙළෙඳ ශේෂය සෘණ 10,75,870යි. එන්න, එන්නම අපි ගෙවන්න ඕනෑ ණය ප්‍රමාණය -වෙළෙඳ ශේෂයේ හිඟයක්- සෘණ අගයක් අරගෙන තිබෙනවා; විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම 2009 දී ආනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන10,207ක් වෙද්දී 2010 දී එය ඇමෙරිකානු ඩොලර් මිලියන 13,512ට වැඩි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේකෙන් මොකක්ද පෙනෙන්නේ? එන්න, එන්නම ආනයන වියදම වැඩි වෙනවා. අපට හොඳ තත්ත්වයක් නොවෙයි තිබෙන්නේ.

අද කියනවා, "අපි වවමු - රට නඟමු" කියලා. දේශීය නිෂ්පාදන දිරි ගැන්වීමට, දේශීය නිෂ්පාදන වැඩි කිරීමට කටයුතු කරන එක සම්බන්ධයෙන් අපි බොහොම සන්තෝෂ වෙනවා. හැබැයි මේවා යථාර්ථයක්ද කියලා අපි හොයලා බලන්න ඕනෑ. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු කරන බව පසු ගිය කාලයේ පැහැදිලිව "මහින්ද චින්තනය" තුළිනුත් පැවසුවා. නමුත් එය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වෙලා නැහැ.

මම උදාහරණයක් විධියට මේ කාරණය කියන්නම්. එප්පාවල කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ කිරි ගොවීන් දාහක් පමණ සිටින අතර 384 දක්වා අඩු වී ඇති බව සභාපතිවරයා පවසනවා. කිරි ගොවීන් දාහක් ඉඳලා දැන් 384ට අඩු වෙලා. එමෙන්ම මුල් යුගයේ කිරි ලීටර් 6,000ක් පමණ මෙම සමිතියට එකතු වුවත් අද කිරි ලීටර් 400ක් පමණයි එකතු වෙන්නේ කියලාත් සභාපතිවරයා කියනවා. ඒ නිෂ්පාදනය අපි බලාපොරොත්තු වූ ප්‍රමාණයෙන්, බලාපොරොත්තු වුණු විධියට වැඩි වෙලා නැහැ. සමහර අංශවල අඩු වීමක් වෙලා තිබෙනවා. ප්‍රමාණාත්මකව යම් ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙන්න පුළුවන්. නමුත් "අපි වවමු - රට නඟමු" කියලා විශාල වෙළෙඳ දැන්වීම් දැම්මට, විශාල වශයෙන් මාධ්‍ය ව්‍යාපාර ගෙන ගියාට මේවා වැඩි වෙලා නැති බවයි පෙනෙන්නේ. මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කරන කොට ආණ්ඩුවේ ඇමතිවරු හැම තිස්සේම පෙන්වන්නේ යුද්ධය නිසා බවයි. හැම දාම යුද්ධය. යුද්ධය පෙන්වලා හැමදාම ප්‍රශ්නවලින් මඟ අරින්න කටයුතු කරනවා.

අපට කියන්න කනගාටුයි, යුද්ධයේ නියමුවා වන සරත් ෆොන්සේකා මැතිතුමාත් අද සිර ගෙදර දුක් විඳිනවා කියන එක. පසු ගිය නිදහස් දවසේ සිර ගෙවල්වල සිටි දහස් ගණනක් සිරකරුවන් ජනාධිපතිවරයා විසින් එළියට දැම්මා. කාටවත් මේ සම්බන්ධයෙන් හිතක් පපුවක් නැද්ද? එහෙම නැත්නම් මේ තිබෙන කුහකකම, බලයට තිබෙන කෑදරකම, නැත්නම් පළි ගැනීමේ චේතනාව නොවෙයිද මේ පෙන්වන්නේ කියලා මා අහන්න කැමැතියි. සමහර ඇමතිවරුන්ගේ බිරින්දෑවරුන් විවිධ අයව මරණයට පත් කරලා, මරණීය දණ්ඩනය නියම වුණාම මොකද කරන්නේ? මේ ආණ්ඩුවට පුළුවන්, ජනාධිපතිතුමාට පුළුවන්, ජනාධිපති සමාව දීලා ඒ අයව එළියට ගන්න. එහෙනම් සරත් ෆොන්සේකා මැතිතුමාට මේ වාගේ සලකන්නේ ඇයි කියලාත් මේ අවස්ථාවේ දී අපි අහන්න කැමැතියි.

අද විශාල වශයෙන් විවිධ සංකල්ප, යෝජනා ගෙනෙනවා. අර පැත්තෙන් "දැයට කිරුළ" කියලා කෝටි ගණන් වියදම් කරනවා.

හැබැයි අපේ අහිංසක ගම්වල සිටින මිනිසුන්ට මේ කොළඹ රෝහලෙන් හෘදය සැත්කමක් කර ගන්න දවස් ගණන්, මාස ගණන් පොරොත්තු ලේඛනයේ - waiting list එකේ - ඉන්නට ඕනෑ. සමහර විට ඒ අතරතුර කාලයේ ලෙඩුන් මැරිලා යනවා. ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. බෙහෙත් ටික ගන්න chit එකක් දෙනවා, ගිහින් ෆාමසියෙන් ගන්න කියලා. හැබැයි "දැයට කිරුළ" සඳහා කෝටි ගණන් වියදම් කරනවා. ආණ්ඩුවේ කයිවාරුව පෙන්වන්න, ආණ්ඩුව විශාල වැඩ කොටසක් කරනවා කියලා පෙන්වන්න විශාල වශයෙන් මුදල් වැය කරනවා. අද රටේ නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා කියලා කියනවා.

මා අහනවා, මොන අංශයෙන්ද අද රටේ නිෂ්පාදනය වැඩි වෙලා තිබෙන්නේ කියලා. සමහර අංශවල නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා කියලා කියන්න පුළුවන්. නමුත් අද විශේෂයෙන්ම සැර මත් ද්‍රව්‍ය නිෂ්පාදනය නම් වැඩි වෙලා තිබෙනවා. "මතට තිත" කියලා කිව්වාට, සැර මත් ද්‍රව්‍ය නිෂ්පාදනය ලීටර් දස ලක්ෂ ගණනකින් වැඩි වෙලා තිබෙනවා. මේක නොවෙයි සංවර්ධනය. රට සංවර්ධනය වනවා නම්, රැකියා බිහි වනවා නම්, මාර්ග හැදෙනවා නම්, ආයෝජකයන් එනවා නම් අපි කැමැතියි. අපේ රටට ආයෝජකයන් එනවාද? ඇත්ත වශයෙන්ම අපේ රටට ආයෝජකයන් එනවාද කියලා අපි ප්‍රශ්න කරන්නට ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, wind up please.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Then, I have to deduct that from your Party's time.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඇත්ත වශයෙන්ම අපේ රටේ පෞද්ගලික ව්‍යාපාර රජයට පවරා ගනිද්දී, සෙවනගල සීනි කම්හල පවරා ගනිද්දී, පෞද්ගලික ආයෝජකයන් මේ රටට එනවාද කියලා අපි ප්‍රශ්න කරන්නට ඕනෑ. ඒ වාගේම අපේ රටේ නීතිය හා සාමය නැතිවෙද්දී, නීතිය හා සාමය නැහැ කියලා නීතිපතිවරයාම කියද්දී, මේ රටේ දේශපාලනඥයෝ, විවිධ අය තමන්ට බලපෑම් කරනවා ඒ නිසා මේක හරියට ගෙන යන්න බැහැ කියලා නීතිපතිවරයාම කියද්දී, මේ රටේ නීතිය හා සාමය නැති වෙද්දී මේ රටට ආයෝජකයන් එයිද කියලා මම අහන්න කැමැතියි. ඒ වාගේම පසු ගිය කාලයේ අපි දැක්කා, මේ රටේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ඉවත් වුණා, මානව හිමිකම් සම්බන්ධයෙන් සිටි සභාපතිවරයා ඉවත් වුණා. මේකයි අද රටේ තත්ත්වය. නීතිය හා සාමය බරපතළ විධියට විනාශ වෙලා තිබෙනවා. එහෙනම් මේ රටට ආයෝජකයන් එන්නට ඕනෑ නම්, අපනයන වැඩි කරන්නට ඕනෑ නම්, විශේෂයෙන්ම පැහැදිලි සැලැස්මක් අනුව, ජාතික ප්‍රතිපත්තියක් අනුව මේ රට ගෙන යන්නට ඕනෑ. එසේ නොවුණොත් මේ එකක්වත් ක්‍රියාත්මක වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

විවිධ ගිවිසුම් ඇති කර ගන්නවා. CEPA ගිවිසුම වන්නට පුළුවන්. ඉන්දියාව එක්ක ගිවිසුම් ඇති කර ගන්නවා; තවත් රටවල් එක්ක ගිවිසුම් ඇති කර ගන්නවා. මා දන්නේ නැහැ, ඒ ගිවිසුම් හරියාකාරව කියවලාවත් තිබෙනවාද කියලා. ඉන්දියාව එක්ක ගහපු ඒ ගිවිසුම්වලිනුත් ඉන්දියාවට තමයි වැඩි වාසිය තිබෙන්නේ. හරියාකාරව කියවා බලද්දී ඒ සමස්ත වාසිය තිබෙන්නේ ලංකාවට නොවෙයි.

අපට වෙන් කර තිබෙන කාලය අඩු නිසා මා වැඩි දෙයක් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා පැහැදිලිව කියනවා, මේ යන ක්‍රමය වැරදියි කියලා. මානව හිමිකම් උල්ලංඝනය කරමින්, නීතියේ ආධිපත්‍ය විනාශ කරමින්, මාධ්‍යවලට තර්ජනය කරමින්, මාධ්‍යවේදීන් උස්සමින්, ඒ වාගේම කොමිස් ගනිමින්, මුදල් ගසාකමින් මේ යන ක්‍රමය නොවෙයි සංවර්ධනය. අපේ කාලයේ අපි බියගම කර්මාන්තශාලා ආරම්භ කළා; කටුනායක කර්මාන්තශාලා ආරම්භ කළා. ඒ විශාල කර්මාන්තශාලා ආරම්භ කරලා තමයි අපි යටිතල පහසුකම් දුන්නෙත්, මාර්ග සංවර්ධනය කළෙත්. අද ආණ්ඩුව කරන්නේ හම්බන්තොට ඇතුළු රටේ නොයෙක් ප්‍රදේශවල පාරවල් හදලා බලාගෙන ඉන්නවා; යටිතල පහසුකම් දීලා බලාගෙන ඉන්නවා, ආයෝජකයන් කර්මාන්තශාලා ආරම්භ කරන්න එනකන්. හෝටල් හදලා බලාගෙන ඉන්නවා, ඒවායේ නවතින්න සංචාරකයෝ එනකන්. ඒ නිසා මේක නොවෙයි සංවර්ධනය, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි කියන ටික කියමින් මම නිහඬ වනවා, බොහොම ස්තුතියි.

[අ. භා. 3.03]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි විවාද කරන්නේ භාණ්ඩ කිහිපයකට පනවපු බදු සම්බන්ධයෙන් ගෙනාපු කල් තැබීමේ යෝජනාව පිළිබඳවයි. නමුත් මේ විවාදය වෙනත් පැතිවලට ඇද ගෙන ගිහිල්ලා බොහෝ දේවල් කිව්වා. මා කියන්න කැමැතියි, 2010 දී සෙවනගල Sevanagala Sugar Factory එකට molasses ටොන් 21ක් ගෙනෙන්න බලපත්‍රයක් දීලා තිබෙන බව. HS Code 1703 යටතේ තමයි මේවා ගෙනල්ලා තිබෙන්නේ. මේ ආනයන බලපත්‍ර දීලා තිබෙන්නේ 1977.11.15 වැනිදායි. නිෂ්පාදනය කරනවා නම් නැවත වරක් ආනයනය කරන්නේත් ඇයි කියන ප්‍රශ්නයක් තිබෙනවා. මා ඒ ගැන මීට වඩා කථා කරන්නේ නැහැ. ඒකට විතරයි ආනයන බලපත්‍රය දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියන්න කැමැතියි, පසු ගිය සතියේ භාණ්ඩාගාරය 1740/20 දරන ගැසට් නිවේදනය නිකුත් කළ බව. එයින් බඩු වර්ග කිහිපයකට බදු පනවා තිබෙනවා. විශේෂයෙන්ම කඩල, පරිප්පු, සීනි, සුදු ලූනු, එළවළු තෙල් ආදියට තමයි ආනයන බදු වැඩි කරලා තිබෙන්නේ. ආනයනය කරන මාළුවලටත් බදු වැඩි කරලා තිබෙනවා. ආනයනය කරන භාණ්ඩවලට බදු පැනවීමේ මූලික පරමාර්ථය තමයි නිෂ්පාදකයා ආරක්ෂා කර ගැනීම. අය වැය ලේඛනයක වියදම් සහ ආදායම් අතර පරතරය පියවා ගන්න වෙන්නේ බදුවලින් තමයි. නමුත් කනගාටුයි කියන්න, පසු ගිය කාලයේ එල්ටීටීඊ එක ඒ ප්‍රදේශවල බදු අය කළාය කියන එක. ඒ ගැන මේ අයට මතක් කරන්න ඕනෑ. බදු අය කළා විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් බදු අය කරන්න ඕනෑ, රටට පොදු විධියටයි. නමුත් එල්ටීටීඊ එක පුද්ගලයන් බලා තමයි බදු අය කළේ. මේ පුද්ගලයාට මෙච්චරයි, මේ පුද්ගලයාට මෙච්චරයි කියා පුද්ගලයා බලා තමයි බදු අය කළේ. එහෙම බදු අය කළා විතරක් නොවෙයි. පිට රට ඉන්න මිනිසුන්ගෙන් කප්පම් පවා ගත්තා. අද ඒ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා. ඉතින් රජයට සොච්චමක් ගෙවීම සම්බන්ධයෙන් ඒ අයගේ කිසිම කැමැත්තක් නැහැ. මොකද, අර මූලික දේවල්වලින් නිදහස් වෙලා තිබෙන නිසා.

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

මට මතකයි, මා ධීවර ඇමති වශයෙන් සිටියදී එක්තරා කප්පම්කාරයෙක් -ප්‍රින්ස් කොලම්ස් කියන එක්කෙනා- හැම මාළු කිලෝග්‍රෑම් එකකටම රුපියල් 20 බැගින් ගත්ත බව. ඒ විතරක් නොවෙයි, පහර දුන්නා. දැන් ඒ යුගය නැති කරලා තිබෙනවා. එම නිසා දේශීය ව්‍යාපාරිකයා රජයට බදු ගෙවනවා. රජයේ ආරක්ෂාව ලබා ගැනීමටත් එය එක්තරා විධියක හොඳක් වෙලා තිබෙනවා.

අනික් පැත්තෙන් තවත් කාරණයක් තිබෙනවා. මේ බදු ගෙවන කෙනාට සහන රැසක් තිබෙනවා. ඔවුන්ට loans ගන්න පුළුවන්; ණය ආධාර ගන්න පුළුවන්. ඒ බදු ගෙවීමේ විශ්වාසය මත ණය ආධාර ගන්න පුළුවන්. ඒ ණය ආධාර බැංකුවෙන් දෙන්නේ කොහොමද? ආයෝජනය කරන්න දන්නේ නැති කොටසක් ගිහින් බැංකුවේ සල්ලි තැන්පත් කරනවා. ඒ අයට ව්‍යාපාර ක්ෂේත්‍රයේ මූලික දැනීම නැහැ. එම නිසා ඒ අය  බැංකුවේ මුදල් තැන්පත් කරනවා. ආයෝජනය කරන්න දක්ෂ අයට ඒ මුදල් ලබා දීලා තමයි බැංකුව සල්ලි සොයන්නේ. එහෙම නැත්නම් බැංකුව සල්ලි අච්චු ගහන්නේ නැහැ. මේ කාරණය අපි තේරුම් ගන්න ඕනෑ. බැංකුව සල්ලි අච්චු ගහන්නේත් නැහැ; සල්ලි නිෂ්පාදනය කරන්නේත් නැහැ. [බාධා කිරීමක්] තත්ත්පරයක් ඉන්න කෝ, ඉතින්. කොහෙන් හෝ බැංකුවකින් ණයක් දෙන්නේ හේතුවක් නිසා නේ. ගෙවන්න පුළුවන් හැකියාව - feasibility එක - බලා, project එක බලා තමයි ණය මුදල දෙන්නේ. සාමාන්‍යයෙන් මුදල්වලට අදහසක් නැහැ. අදහස්වල තමයි මුදල් තිබෙන්නේ. රුපියල් ලක්ෂ දහයකටවත්, ඩොලර් දහයකටවත් යමක් කරන්න බැහැ. අදහස්වල තමයි මුදල් තිබෙන්නේ. අදහස් තිබෙන එක් කෙනාට මුදල් හම්බ කරන්න පුළුවන්. අදහස් නැති එක් කෙනාට මුදල් හම්බ කරන්න බැහැ. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ මූල ධර්මය ඒකයි. ඒකට අත් වැලක් දෙන්න බැංකුව ඉන්නවා. මූලික දේ තමයි බැංකුව එසේ අත් වැල දෙද්දී අපි බදු ගෙවන්න ඕනෑය කියන එක. සීසර්ගේ දේ සීසර්ට දෙන්න ඕනෑ. ඒක ඇත්තයි. නමුත් ඒ බදුවලින් ගන්න මුදල් ටික මේ රටේ පැවැත්ම වෙනුවෙන් වියදම් කරන්න ඕනෑය කියන එක සාධාරණ ලෙස අපි කවුරුත් පිළිගන්නවා. විපක්ෂය ඇතුළු අපි සියල්ලම ඒක පිළිගන්නවා. ඒක නාස්ති කරන්නේ නැතුව, දූෂණයට යටත් කරන්නේ නැතිව වියදම් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැනදී මොකක්ද වෙලා තිබෙන්නේ කියා අපි බලමු. මෙතැනදී පරිප්පු, සීනි, සුදු ලූනු, එළවලු තෙල්වලට තමයි මේ බද්ද පනවා තිබෙන්නේ. අපේ රටේ ජනගහනය මිලියන 20ක් ඉන්නවා. අද කෘෂිකර්මය කරන්න ඉන්නේ මිලියන 2යි. සාමාන්‍යයෙන් යැපුම් ආර්ථිකයක් තමයි කෘෂිකර්මය කරන බොහෝ දෙනකුට තිබෙන්නේ. ඇමෙරිකාව වාගේ විශාල ඉඩකඩම් මේ රටේ නැහැ. වෙනත් රටවල වාගේ විශාල ඉඩකඩම් මේ රටේ නැහැ. අපි කෘෂිකර්මය වෙනුවෙන් සහනාධාරයක් දීලා තිබෙනවා. එම නිසා වී නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. ඒ යැපුම් ආර්ථිකයට අමතරව යමක් හරිහම්බ කර ගන්න පුළුවන් අය ඉන්නවා. ඒ කොටසට මිලියන 20ක් වන පාරිභෝගිකයා ගැන බලන්න වෙනවා. පාරිභෝගිකයා ගැන බලද්දී අපේ ආණ්ඩුව කරන්න ඕනෑ කුමක්ද කියලා කවුරුත් කියන්නේ නැහැ. මොකද, අපේ නිෂ්පාදන තිබෙනවා. තේ ටික තිබෙනවා. රබර් ටික තිබෙනවා; කුරුඳු තිබෙනවා. මේ හැම එකක්ම අපි අමු ද්‍රව්‍ය වශයෙන් තමයි පිට රට යවන්නේ. අමු ද්‍රව්‍ය වශයෙන් යවලා හරි යන්නේ නැහැ. අපි value-added product එකක් කරන්න ඕනෑ. ඒ නිෂ්පාදනයට වටිනාකම එකතු කරන්න ඕනෑ. දැන් උදාහරණයක් වශයෙන්, මා ධීවර ඇමතිවරයා වශයෙන් සිටියදී මාළු අපනයනයෙන් ඩොලර් මිලියන 175ක්  හම්බ කර ගත්තා. කොහොමද හම්බ කර ගත්තේ? Loins විධියට කපලා සකස් කරලා, fillets හදලා, value addition එකක් දීලා හම්බ කර ගත්තා. Value addition එකට සියයට 50ක් යද්දී සියයට 50ක් මෙහෙට ඉතුරු වෙනවා. ඒ සියයට 50 අපේ පරිභෝජනය සඳහා යනවා. නමුත් අර සියයට 50ට ලැබෙන අතිරික්ත මුදල බලද්දී අනෙක් සියයට 50 නිකම් දුන්නත් කමක් නැහැ. ඒක තමයි යථාර්ථය. අපි බොරුවට අරවා මේවා කියලා හරි යන්නේ නැහැ. අපි හැම විටම හිතන්න ඕනෑ අපේ නිෂ්පාදනය උපරිම මිලකට විකුණා ගන්න. උදාහරණයක් හැටියට චීනය ගනිමු. චීනය දැන් සම්පූර්ණයෙන්ම ඇඟලුම් කර්මාන්තයෙන් අයින් වෙලා. ඒ ගොල්ලෝ ඒ වෙනුවට මොනවාද කරන්නේ? තාක්ෂණික උපකරණ නිෂ්පාදනය කරනවා.

අපිට GSP Plus නැතුව ගියා. ඒක ඇත්ත. නමුත් දැන් GSP Plus තිබුණත් එකයි, නැතත් එකයි කියන තත්ත්වයට අපි පත් වෙලා තිබෙනවා. මොකද, අපේ ගුණාත්මකභාවය වැඩියි. අපේ සාක්ෂරතාව වැඩි නිසා අපේ ඇඟලුම් නිෂ්පාදනවල quality එක වැඩියි. ඒ නිසා quality එකට ගෙවන්න කැමැතියි. සමහර අය මිල අනුව බඩු ගන්නවා. සමහර අය quality එක අනුව බඩු ගන්නවා. අපි මේ රටේ quality products හැදුවොත් විතරයි අපිට ආදායම වැඩි කර ගන්න පුළුවන් වන්නේ.

අපි 2009 දී ලොකු ලූනු සියයට 75ක් ආනයනය කරලා තිබෙනවා. වියළි මිරිස් සියයට 73ක් ආනයනය කරලා තිබෙනවා. අන්න එතැනදී අපි විරුද්ධ වෙනවා. මේ මිරිස් අපට ඕනෑම තැනක වවන්න පුළුවන්. මිරිස් වවලා, වේලා ගෙන, පාවිච්චි කරන්න අපේ අයව පුහුණු කරන්න ඕනෑ. එතකොට මිල වැඩි වීම තුළ තමුන් විසින්ම නිෂ්පාදනය කර ගැනීමට පාරිභෝගිකයා පෙළඹෙනවා. ඒක එක් අරමුණක් විය යුතුයි.

මහා භාණ්ඩාගාරයේ පී.බී. ජයසුන්දර මහත්මයා ගමේ කෙනෙක්. එතුමාට හොඳ දැනීමක් තිබෙනවා. කවුරු නැහැයි කිව්වත් එතුමා මම දැක්ක අවංක, හොඳම නිලධාරියෙක්. එතුමාගේ අවංකභාවය කොච්චරද කියන එක මම පෞද්ගලිකව දන්නවා. ගැමි ආර්ථිකයකට උරුමකම් කියන එතුමා කිසි දවසක මේ රටේ ආර්ථිකය වට්ටවන්න කැමැති වන එකක් නැහැ. එහෙම වෙන්නෙත් නැහැ. අනෙක් පැත්තෙන් අපේ ජනාධිපතිතුමා නිතරම ග්‍රාමීය ආර්ථිකය ගැන තමයි කල්පනා කරන්නේ. එතුමා එහෙම කල්පනා කරනවා විතරක් නොවෙයි ආර්ථිකය ගමට අරගෙන ගියා.

මම පෙරේදා "දැයට කිරුළ" ප්‍රදර්ශනය බලන්න ගියා. එදා ඒ ප්‍රදර්ශනය බලන්න ලක්ෂ 10ක් ඇවිල්ලා තිබෙනවා. ඒ ගොල්ලන්ට දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි හිතුවෙත් නැහැ ඒ ප්‍රදේශයට එච්චර සෙනගක් එයි කියලා. සෙනග විශාල ප්‍රමාණයක් ඇවිල්ලා නිදහසේ සැරිසරනවා. නිදහසේ සැරිසැරීමත් එක්තරා විධියක ආර්ථික වර්ධනයක්. මානසික ආතතිය නැත්නම් සන්තෝෂයෙන් තමයි ඉන්නේ. සන්තෝෂය මනින්න මිනුම් දණ්ඩක් නැහැ නේ. අපට උස මනින්න මිනුම් දණ්ඩක් තිබෙනවා. දිග මනින්න මිනුම් දණ්ඩක් තිබෙනවා. මූල්‍යකරණය පිළිබඳව නොයෙකුත් මිනුම් දඬු තිබෙනවා. නමුත් නිදහස නැත්නම් සන්තෝෂය මනින්න මිනුම් දණ්ඩක් නැහැ. සන්තෝෂය මනින්න මිනුම් දණ්ඩ අපි දීලා තිබෙනවා. අපි කවුරුත් මැරෙන කොට කිසි දෙයක් අරගෙන යන්නේ නැහැ. මේ ඉන්න කාලයේ කාලා බීලා, යමක් ඉතුරු කරලා, දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑ. ලංකාවේ සාක්ෂරතාව සියයට 98යි. ඇයි තමුන්නාන්සේලා මේවා ගැන හිතන්නේ නැත්තේ? තමුන්නාන්සේලා ඒ ගැන සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ දූෂණය, නාස්තිය. ඒක නැති කරන්න ඕනෑ. ඒක කොහොමද කරන්නේ කියන එක අපි වෙනම වෙලාවක කථා කරමු.

අනෙක් පැත්තෙන් මට පොඩි කතන්දරයක් කියන්න තිබෙනවා. ඒවාත් කියන්න එපායැ. නැත්නම් හොඳ නැහැ නේ. අපේ රාජිත සේනාරත්න ඇමතිතුමා කියපු කාරණයකට මම පොඩි විරුද්ධත්වයක් ප්‍රකාශ කරනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට එතුමා කිව්වා, 2009 වර්ෂය වන කොට ධීවරයින්

779ක් අත් අඩංගුවට පත් වෙලා සිටියා කියලා. සම්පූර්ණ අසත්‍යයක්. මෙම අමාත්‍යාංශයේ 2009 කාර්ය සාධන වාර්තාව තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඇති ගිහිල්ලා බලන්න. ඒ කාර්ය සාධන වාර්තාව අනුව 2009 වසර තුළ විදේශ රටවල අත් අඩංගුවට පත් වුණු යාත්‍රා 170ක් තිබුණා. ඒ 170න් 164ක් අපි නිදහස් කර ගත්තා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා-

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මේක අහ ගන්න කෝ. ධීවරයෝ 779ක් අත් අඩංගුවට අරගෙන තිබුණා. ඒ අයගෙන් 763ක් අපි නිදහස් කර ගත්තා. අපි ඒකට ක්‍රමවේදයක් හැදුවා. අපේ හිටපු ලේකම්තුමාව මම පත් කළා නිල නොලත් තානාපති වශයෙන් කොචින්වලට. තව හිටියා පියසේන රණේපුර කියලා මහත්මයෙක්. එයාව චෙන්නායිවලට පත් කෙරුවා. පතිරණ කියලා මහත්මයෙක් මාලදිවයිනට පත් කෙරුවා. එතකොට ඒ ගොල්ලන්ට මහ ආණ්ඩුවට යන්නේ නැතුව එතැනින්ම බේරා ගන්න පුළුවන්කම තිබුණා. ඒකයි ඇත්ත. මට අසත්‍යයට ගොදුරු වෙන්න බැහැ නේ. මම කරපු සේරම වැඩ යටපත් කරන්නත් කාටවත් බැහැ නේ. මේ අවස්ථාවේදී මම පැහැදිලිව කියනවා ඒ සත්‍යතාවන් ලේඛනගත වෙලා තිබෙනවා කියන එක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයකට තමයි මම ඒ උත්තර දුන්නේ.

කෙසේ වෙතත් අපි කියන්න කැමැතියි, අද මේ රටේ ගොවිතැන් කරන්නේ බිලියන 02ක ජනතාවක් පමණක්ය කියන එක. ලොකු ලූනු, මිරිස්, මාළු මේවා ආනයනය කරනවා. මාළු ආනයනයට රුපියල් 30ක බද්දක් පනවා තිබෙනවා. මා ධීවර ඇමති වශයෙන් හිටපු කාලයේදී මුහුදෙන් තුනෙන් දෙකක් අපට අයිතිව තිබුණේ නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කළා. කල්පිටිය ඉඳලා කිරින්දට යනකම් මුහුද භූගෝලීය වශයෙන් උතුරු සහ නැඟෙනහිරටයි අයිති වෙලා තිබුණේ. එල්ටීටීඊ එකට නොවෙයි, උතුරු සහ නැඟෙනහිරටයි අයිති වෙලා තිබුණේ. උතුරු සහ නැඟෙනහිරට අයිති වෙලා තිබුණු මුහුද පාලනය කළේ එල්ටීටීඊ එකයි. එතකොට මේ ප්‍රදේශයේ මාළු සම්බන්ධයෙන් ලොකු හිඟයක් තිබුණා. ඒ නිසා මම කැබිනට් පත්‍රිකාවක් දමලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, කෙළවල්ලා, තෝරා, සවරා ආදී මාළු වර්ග හතරක් සතයක්වත් බදු නැතිව නොමිලේ ආනයනය කරන්න ඉඩ දෙන්නය කියා. නමුත් අපි ඒක balance කර ගත්තා. කොහොමද balance කර ගත්තේ? අපනයනයට සමගාමීව ආනයනය අඩු කර ගත්තා. කොයි වෙලාවේදීවත් ආනයනය අපනයනයට වඩා වැඩි වුණේ නැහැ. ඒ විධියට ඒක balance කර ගත්තා. නමුත් දැන් ඒක අවශ්‍ය නැහැ. දැන් මුහුදේ අයිතිය මුළුමනින්ම අපට තිබෙනවා. එතකොට ආණ්ඩුවට පුළුවන්, රුපියල් 5ක් තව අඩු කරලා ඒ ලැබෙන සහනය නැවත වරක් පාරිභෝගිකයාට ලබා දෙන්න. රුපියල් 35ට තිබෙන එක රුපියල් 25 කළත් කමක් නැහැ. මොකද, ඒ හරහා අපරාදේ මිල උච්චාවචනය වෙන්න පුළුවන්. රුපියල් 225ට තිබුණු එක දැන් රුපියල් 550යි. ඒක වෙනම කතාන්දරයක්. කෙසේ වෙතත් මම කියන්න කැමැතියි -[බාධා කිරීමක්] තමුන්නාන්සේලා වාගේම ආණ්ඩු පක්ෂයේ හිටියත් අපිත් යම් යම් දේවල් කතා වෙනවා. අපට විපක්ෂයක් ඕනෑ නැහැ. අපි අතරේ විපක්ෂයක් තිබෙනවා. මොකද, ජනාධිපතිතුමා අපට සවන් දෙනවා. කැබිනට් එකේදී අපට කතා කරන්න පුළුවන්. [බාධා කිරීමක්] අනුර දිසානායක මන්ත්‍රීතුමාත් කැබිනට් එකේ හිටියා නේ. මට මතකයි ඔබතුමා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කැබිනට් එකේ හිටපු කාලයේදී නිර්භයව ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කළ බව. ඔබතුමා මගේ seat එකට අල්ලපු seat එකේයි හිටියේ. එතැනදී ඒ විධියට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය තිබෙනවා. ඔබතුමා ඒ අයිතිය පාවිච්චි කළා. ඒ අයිතිය හැමෝම පාවිච්චි කරනවා. ඒ අයිතිය පාවිච්චි කරනකොට නායකත්වය ඒ අයිතියට සවන් දෙනවා. ඒ සවන් දීම තුළ තමයි විශාල බිම් ප්‍රමාණයක් -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, please wind up now.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. ප්‍රශ්නවලට උත්තර දෙන්න තිබෙනවා. තව වෙලාව තිබෙනවා නේ. ඒ සවන් දීම තුළ තමයි අද විපක්ෂය ක්ෂය වීගෙන යන්නේ. [බාධා කිරීමක්] අද මේ පැත්තට විශාල පිරිසක් ඇවිල්ලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ පක්ෂයෙනුත් කොටසක් මේ පැත්තට කඩා ගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අද සියලු දෙනාම ආබාධිතයන් වෙලා තිබෙනවා. ඒ නිසා ආබාධිතයන් බලන්න අද මට අමාත්‍යාංශයකුත් දීලා තිබෙනවා. සියයට 7ක් ආබාධිතයන් ඉන්නවා. මම හිතන හැටියට පාර්ලිමේන්තුවේ දැන් සියයට 5කටත් වඩා ආබාධිත වෙලා. මුළු විරුද්ධ පක්ෂයම දැන් ආබාධිත වෙලා. එහෙම ආබාධිත වෙන එක හොඳයි. නමුත් ආබාධිත අයට ප්‍රතිකාර කරන්න අපට තිබෙනවා, උපදේශනය - counselling - කියා එකක්. මගෙන් අහන්න. මම උපදේශනයක් දෙන්නම්. කෙසේ වෙතත් අපි තමුන්නාන්සේලාට එකක් කියන්න ඕනෑ. මේ රජය ඉතාමත්ම හොඳ ක්‍රියා මාර්ග රැසක් අරගෙන තිබෙනවා. එහෙම නම් මම මේ කාරණයත් කියවන්නම්. මෙහි සඳහන් කර තිබෙන්නේ මෙන්න මෙහෙමයි.

"2011 වසරේදී ආර්ථිකයේ සිදු වූ ධනාත්මක බලපෑම ආනයනය අපනයනය අතර පරතරය අධික වීමයි. සමස්ත අපනයනය ඩොලර් මිලියන 7084යි. 2010 දී එය ඩොලර් මිලියන 8307ක් වෙලා තිබෙනවා. සියයට 10කින් වැඩි වෙලා තිබෙනවා. 2011 මුල් මාස 10ට ඩොලර් මිලියන 8202ක් සසඳා බලන විට මෙවරද තවත් සියයට 20කින්, 25කින් වැඩි වෙන්න පුළුවන්."

මේ විධියට මේ balance එක වැඩි වෙන්න හොඳ නැහැ. එහි තවදුරටත් තිබෙනවා, මෙන්න මෙහෙම:

"2011 ඔක්තෝබර් මාසයේ සිට වර්ධනය ඇණ හිට තිබෙනවා. අනෙක් අතට අපේ ආනයන දෙස බැලූ කළ 2008 දී එය ඩොලර් මිලියන 10,206ක් විය. 2010 දී එය ඩොලර් මිලියන13,511කින් එහෙම නැත්නම් සියයට 32කින් වැඩි වෙලා තිබෙනවා."

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව තත්පරයක් දෙන්න.

එහි තවදුරටත් මෙසේ කියා තිබෙනවා:

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

"2011 පළමුවන මාසය තුළ එය ඩොලර් මිලියන 16,436ක් විය."

2011 දී එය ඩොලර් මිලියන 20,000ක සීමාව ඉක්මවා යනවාය කියා තිබෙනවා. එහෙම වුණාම වර්ධනය සියයට 46යි. මේකෙන් පෙනෙන්නේ අපේ අපනයනයේ වර්ධනය මෙන් දෙගුණයකට ආසන්නයෙන් වැඩි වෙන ගමන් ආනයනයත් වර්ධනය වෙනවාය කියන එකයි. අපනයනයත් වර්ධනය වෙලා තිබෙනවා. ආනයනයත් වර්ධනය වෙලා තිබෙනවා. එතකොට imports වැඩි වෙලා exports අඩු වුණොත් ඒකෙන් ආර්ථිකයට ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා මෙතැනදී භාණ්ඩාගාරය විසින් පියවරයන් රැසක් ගත යුතුමයි. නිකම් දෙනවා නම් ඕනෑම දෙයක් ගනීවි. මහන්සි වෙලා, දුක් විඳලා වවන්න පුළුවන් දේවල් වවා ගන්න ඕනෑ. දැන් අපේ ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා "දිවි නැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය ගෙවතු ඒකක දස ලක්ෂයක් හැදුවා.

ඒකේ ක්ෂණික ප්‍රතිඵල ලැබුණා. එළවලු මිල පහත බැස්සා. රුපියල් දෙසීයට, තුන්සීයට තිබුණු එළවලු මිල පහළ බැස්සා. එසේ මිල පහළ බැසීමට හේතුව කුමක්ද? හේතුව තමයි, ඒ ගැන ජනතාව දැනුවත් කිරීම. ඇයි එළවලු ඔය ගණන්වලට ගන්නේ? වවන්න පුළුවන්නේ. මේ පොළවේ වැවෙනවානේ. ගෙදරම එළවලු ටික හදා ගන්නට පුළුවන්නේ. විකුණන්නට නොවෙයි. කන්නට හදා ගන්නට කියලා එළවලු මල් පෝච්චිවල වැව්වා. වැඩියෙන්ම එළවලු වවා තිබුණේ කොළඹ හතේ අයයි. එළවලු වගාවට ඉස්සෙල්ලාම දායකත්වය දුන්නේ ඒ අයයි. ගෙදර තිබුණු මල් පෝච්චිවල මල් ටික ගලවා දමා ගෝවා හිටුවන්නට පටන් ගත්තා. ගෙදර තිබුණු මල් පෝච්චිවල මල් ටික ගලවා දමා මිරිස් ටික හිටුවන්නට පටන් ගත්තා. එම නිසා මෙම ක්‍රමය පුරුදු කළොත් හොඳයි. 1960 දී අපේ කෘෂි කර්මාන්තය සියයට 60කින් වර්ධනය වෙලා තිබුණා. පසුව ඒක සියයට 29කට පහත බැස්සා. ඒ පහත බැසීමට හේතුව විවෘත ආර්ථිකය අප අනවශ්‍ය ලෙස, එසේම වැළඳ ගැනීමයි. නැවත වරක් අපේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කර ඕනෑම දුර්භික්ෂයකට මුහුණ දෙන්නට පුළුවන් රටක් විධියට අප ගොඩ නැඟෙන්නට ඕනෑ. එසේ ගොඩ නැඟෙනවා නම්, අපේ රටේ වවන්නට පුළුවන්, හදන්නට පුළුවන් දේවල් වවන්නට හදන්නට දිරි දීමක් වශයෙන් බදු පැන විය යුතුය කියන එකයි මගේ අදහස. "සීසර්ගේ දෙය සීසර්ට දෙන්නට ඕනෑ නිසා" බදු ගෙවීම කාටත් අයිතියි. තියෙන කෙනා ගෙව්වාම නැති කෙනා පෝෂණය කරන්නට පුළුවන්. තියෙන කෙනාගෙන් මොකුත් ගත්තේ නැත්නම් විප්ලව ඇති වෙලා, කරදර ඇති වෙලා මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්නට පුළුවන්. බොහොම ස්තුතියි.

[අ. භා. 3.19]

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1969 අංක 1 දරන ආනයන සහ අපනයන ( පාලන ) පනත යටතේ නියෝග හා 2011 විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම නියෝග පිළිබඳව සභාව කල් තැබීමේ අවස්ථාවේදී විවාද කෙරෙන මේ මොහොතේ මට ද අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. පසු ගිය නොවැම්බර් 21වන දා 2012 වර්ෂය සඳහා අය වැය වාර්තාව ඉදිරිපත් කරමින් අතිගරු ජනාධිපතිතුමා, මුදල් ඇමතිතුමා වශයෙන් අදහස් කිහිපයක් පැවසුවා. එයින් එකක් තමයි, ආහාර, කිරිපිටි, තිරිඟු, සීනි ආනයනය කරන්නට ඩොලර් මිලියන 1500ක් පමණ රජයට වැය කරන්නට සිදු වී තිබෙනවාය කියන එක. ඒ වාගේම රටෙන් පිටවෙන විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට ආයෝජන අවස්ථා වැඩි කර ගන්න අවශ්‍ය බවත් පැවසුවා. ආනයන වියදම් වාගේම අපනයන ආදායම වැඩි කිරීමටත් කටයුතු යොදන බව පැවසුවා. නමුත් අය වැය ලේඛනය ඉදිරිපත් කර මාස තුනක් වැනි සුළු කාලයක් ඇතුළත මේ ගෙනැවිත් තිබෙන ආනයන බලපත්‍ර සහ ගෙවීම් නියෝගවල අරමුණ අපට එතරම් පැහැදිලි නැහැ. මේ නියෝගවලින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? ආනයන වියදම අඩු කරන්නද? අපනයනයෙන් ලැබෙන ආදායම් වැඩි කර ගන්නද? එහෙම නැත්නම් දිනෙන් දින ඉහළ යන වෙළඳ ශේෂය අඩු කර ගන්නද? ආනයනකරුවන්ගේ කටයුතු ලිහිල් කරන්නද? එහෙම නැත්නම් මඟ නැඟුම, දිවි නැඟුම, ගම නැඟුම වැනි රජයේ සංවර්ධන ක්‍රියාවලියට අතහිත දීමද? එහෙම නැත්නම් ආනයන වියදම් වැඩි කරලා ආණ්ඩුවේ බදු අදායම වැඩි කර ගන්නද?

ආර්ථික විශේෂඥයන්ගේ මතයට අනුව අපේ රට දිනෙන් දිනම විශාල වශයෙන් ආර්ථික අර්බුදයකට ළඟා වෙන බව කියනවා. ඒ වාගේම දවසින් දවස වෙළඳ ශේෂය දිගටම පුළුල් වනවා. මේකට විසඳුමක් සෙවීමට දැනටමත් කල් ගත වී වැඩියි. ඉතාලිය ග්‍රීසිය වාගේ ප්‍රමුඛ රටවල් දැනටමත් ආර්ථික ප්‍රපාතයකට ඇද වැටී තිබෙනවා. ඒක වෙලා තිබෙන්නේ මේ වෙළඳ ශේෂය පාලනය කර ගන්නට අපොහොසත් වූ නිසායි. එවැනි බලවත් රටවල්වලට පවා පාලනය කර ගැනීමට අපහසු වූණු වෙළඳ ශේෂය අප වැනි කුඩා රටකට පාලනය කිරීම ඉතාමත් අසීරු කරුණක් බව අපේ රජයේ සිටින ආර්ථික විශේෂඥයන්ට කල්පනා කරන්නට කාලය ඇවිත් තිබෙනවාය කියා මා හිතනවා.

රටේ ආර්ථියේ සැබෑ තත්ත්වය පෙන්වා දීම මහ බැංකුවේ යුතුකම කියායි මා හිතන්නේ. මහ බැංකුව සත්‍ය ප්‍රකාශ කරන්නේ නැත්නම් මේ රටේ එම ආයතනය ගැන තිබෙන විශ්වාසය බිඳ වැටෙනවා. ආනයනය, අපනයනය ගැන කථා කරන විට අප මූලික වශයෙන් කථා කරන්නට ඕනෑ, මේ රටේ අර්ථිකය ගැනයි. අලුතෙන් දැන් කියන කථාව තමයි, " IMF එකෙන් දෙන ණය අප ගන්නේ නැහැ. අපට එපා. අවසාන වාරිකය -මිලියන 800- අපට එපා." කියන එක. අපිට ඒ මුදල අවශ්‍ය නැහැ කියනවා. ඒ කාරණය මතක් වුණේත් IMF එකේ නියෝජිත පිරිස ලංකාවට ආවාට පසුවයි. "අපට ඒ මුදල අපේ විදේශ සංචිතවලින් පියවා ගන්න පුළුවන්, ඒ තුළින් අපේ වැඩ කටයුතු කර ගන්න පුළුවන්, මේ ණය මුදල ගත්තොත් අපේ පොලී අනුපාතය වැඩි වනවා, ඒ නිසා ඒ මුදල අවශ්‍ය නැහැ" කියලා ප්‍රකාශ කරන්න පටන් ගත්තා. නමුත් මහ බැංකුව පෞද්ගලික ආයතනවලින් සියයට හය, හත වාගේ විශාල පොලියකට ණය අරගන්නවා. අපනයන ආදායම පහළ වැටීම හා ආනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් රජය රුපියල අවප්‍රමාණයට ලක් කළා. එහෙම කරපු එක හොඳයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එහෙම කරන්න උපදෙස් දුන්නා. නමුත් මහ බැංකුව ඒ උපදෙස් පිළිගන්නේ නැතුව සංචිතවල තිබුණු ඩොලර් විකුණා විකුණා රුපියලේ අගය කෘත්‍රිමව රඳවා ගන්න උත්සාහ කළා. රටේ මුදල් ඒකකය ශක්තිමත්ව තියා ගැනීම ඉතාම වැදගත් දෙයක්. නමුත් මුදල අවප්‍රමාණය වෙච්ච ගමන්ම වන්නේ රටට ආනයනය කරන භාණ්ඩවල මිල ඉහළ යෑමයි. ඒ මඟින් රටේ උද්ධමනය වැඩි වනවා. එයට විසඳුම ලෙස අපි කළ යුත්තේ රටේ අපනයනය වැඩි කිරීමයි; දේශීය නිෂ්පාදනය වැඩි කිරීමයි. එහෙම නැතුව ඩොලර් වෙළෙඳ පොළට විකිණීමෙන් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. නමුත් රජය හිතුවේ රුපියලේ අගය අවප්‍රමාණය කිරීමෙන් විදේශවලින් ගෙන්වන භාණ්ඩවල මිල වැඩි වෙලා ඒවාට තිබෙන ඉල්ලුම අඩු වෙයි කියලායි.

අද අපි ආනයනය කරන්නේ මොනවාද? අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේ සාමාන්‍ය ජනතාවට අවශ්‍ය සීනි, පරිප්පු, කිරි පිටි හා අනෙකුත් ආහාර වර්ග, ඖෂධ වර්ග තමයි අපි ආනයනය කරන්නේ. ඒ වාගේම අපට අත්‍යවශ්‍ය ඛනිජ තෙල්, රසායනික පොහොර, ඇඟලුම් නිෂ්පාදනයට අවශ්‍ය අමු ද්‍රව්‍ය,

යන්ත්‍රෝපකරණ ආදියත් ආනයනය කිරීමට සිදු වී තිබෙනවා. ඒවා නොවැළැක්විය හැකි දේවල්. නමුත් අපේ රටේ නිෂ්පාදනය කළ හැකි දේවල් පවා අපි ආනයනය කරනවා. මා අද බඩු මිල දර්ශනය දැක්කා. නුවරඑළියේ අර්තාපල් කිලෝවක මිල රුපියල් 90යි. ආනයනය කරන අර්තාපල් කිලෝවක මිල 45යි. එතකොට මිනිස්සු ආනයනය කළ රුපියල් 45 අර්තාපල් මිලදී ගන්නවා. දේශීයව නිෂ්පාදනය කරන අර්තාපල් මිලදී ගන්නේ නැහැ. අපේ රටේ නිෂ්පාදනය කළ හැකි දේවල්ද කිසිම සැලැස්මක් නැතිව ආනයනය කරන නිසා රටේ ජීවත් වන මහජනතාවට උසුලා ගැනීමට නොහැකි තරමට බදු බර පැටවෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෑතකදී රජය විසින් හදිසි පනතක් ලෙස කඩිමුඩියේ ගෙන ආ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත එහෙම නැත්නම් ලාභ ලබන ආයතන මංකොල්ලකෑමේ පනත නිසා රටේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති වුණා. ඒ නිසා විදේශීය ආයෝජකයන් පමණක් නොවෙයි, දේශීය ආයෝජකයන්ද මේ රටේ ආයෝජනය කිරීම නැවතුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගරු සභාව වෙත ඉදිරිපත් කර ඇති මෙම නියෝග යටතේ ආනයනය කළ හැකි භාණ්ඩ ලැයිස්තුවක් පළමුවන උපලේඛනයේ සඳහන් කර තිබෙනවා. මේ ලැයිස්තුව පටන් ගන්නේ සජීවී ගවාදී සතුන්ගෙන්. මේ ලැයිස්තුව, සජීවී ඌරන්, සජීවී බැටළුවන්, එළුවන්, ක්ෂීරපායින්, තල්මසුන්, මුහුදු ඌරන්ගෙන් සමන්විත වී අවසන් වන්නේ උරගයන්ගෙන්. ඊළඟට මෙම ලැයිස්තුවේ දැක්වෙන්නේ මනුෂ්‍යයන් ආහාරයට ගන්නා වර්ගයේ කුරුල්ලන්, ගවාදී සතුන්ගේ මස්, මළ දේහ, ඌරු, බැටළු, එළු, අශ්ව, බූරුඅශ්වතර හෝ කොටළුවන්ගේ කෑමට සුදුසු අවයව, දිවවල්, අක්මා, වානරයන්ගේ තල්මසුන්ගේ උරගයින්ගේ මස් හා කෑමට සුදුසු අවයව, කටු සහ අංවල බඩ, උරුලෑ සට්ටම, සතුන්ගේ අතුණු, මුත්‍රාශ හා ආමාශ යන මාංශ ද්‍රව්‍ය.

ඇත්තටම ගරු ජනාධිපතිතුමාට මේ ගෙන්වන ඒවා සම්බන්ධව උපදෙස් දුන්නේ කවුද කියලා මට තේරෙන්නේ නැහැ. මා මේ ගැන දැන ගන්න අමාත්‍යාංශයට කථා කළා. ඒ අය කිව්වා, හදිසි අවශ්‍යතාවකට මේවා ගෙනෙන්න පුළුවන්, නමුත් මේ වාගේ නියෝගයක් පැනෙව්වාම ගොඩක් මිනිස්සු මේවා වැරදියට තේරුම් ගන්නවා කියලා. මේ ලැයිස්තුවේ ගෙන්වන්න අවශ්‍ය නැති දේවල් තිබෙනවා. ඒවා ලැයිස්තුවෙන් අයින් කරන එක වෙනුවට, ඒවා ගෙන්වීමට අවසර දීම සම්බන්ධයෙන් නැවත වාරයක් උපදෙස් ගත්තොත් හොඳයි කියලා මා හිතනවා.

කිසියම් රටකට යම් දෙයක් ආනයනය කිරීමට බලාපොරොත්තු වන කොට ඒ සඳහා යම් කිසි නීති රීති පද්ධතියක් අවශ්‍යයි. ඒ රටේ සංස්කෘතියට, මහජනතාවගේ අවශ්‍යතාවට ගැළපෙන භාණ්ඩ තමයි ආනයනය කරන්න ඕනෑ. මේ උපලේඛනයේ සඳහන් මා විසින් පෙන්වන ලද භාණ්ඩ මෙයින් කුමන වර්ගයට අයිති වේද කියා සිතා ගන්නවත් බැහැ. ඕනෑම රටක් තම පරිසරයට අහිතකර, සෞඛ්‍යයට හානිකර, ආර්ථිකයට විනාශකාරී, රජයේ සංවර්ධන ප්‍රයත්නයට නොගැළපෙන භාණ්ඩ ආනයනය කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ උද්ධමනය වැඩි වනවා. අපේ රටේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටලු ඇති වී තිබෙනවා. අපේ රට ආහාර හිඟයකට මුහුණ දෙනවා. අපේ ආර්ථිකය වර්ධනය වීම ඇනහිට තිබෙනවා. නොයෙක් වසංගත රෝග වාගේම හෘදයාබාධ, දියවැඩියාව, පිළිකා වැනි රෝග රටේ සාමාන්‍ය දේවල් බවට පත් වෙලා තිබෙනවා. ඩෙංගු නිසා දවසකට රෝගීන් දස දෙනෙකු මිය යනවා. රෝග නිවාරණය අපේ සෞඛ්‍ය ක්‍රමයෙන් ඈත් වෙලා තිබෙනවා. මේ නිසා අපේ රට තුළට ගලා එන ආනයන භාණ්ඩ ගැන අපි මීට වඩා සැලකිලිමත් විය යුතුයි කියලා මම කියා සිටිනවා.

පසු ගිය දිනවල ආසනික් මිශ්‍ර පොහොර හා රසායන ද්‍රව්‍ය පිළිබඳ රටේ ලොකු ආන්දෝලනයක් ඇති වුණා. නමුත් මේ නියෝගවලින් ඊට සමාන දේවල් ආනයනය කිරීමටත් රුකුල් දෙනවා. ඇත්තටම මේ නියෝගවලින් මිහි මත සිටින ඕනෑම සතෙකුගේ මස් සහ අවයව ආහාරය සඳහා ආනයනය කිරීමට අවසර දීලා තිබෙනවා. ගොඩබිම, දිය මත සහ අහසේ යන ඕනෑම තැනක ජීවත් වන ක්ෂීරපායී, පියාඹන, පීනන හෝ බඩගා යන සෑම සතෙකුම මෙම නියෝගවල උපලේඛනයට ඇතුළත් කරලා තිබෙනවා. මෙම සතුන්ගේ කොටස් ශීත කරලා, පිටි කරලා හෝ ලුණු දමා හෝ කුමන ක්‍රමයකින් හෝ ආනයනය කළ හැකි බව මේ නියෝගවල සඳහන් වෙනවා.

ඇත්තටම අපේ රට සර්ව ආගමික රටක්. එක් එක් ආගම්වලින් ප්‍රතික්ෂේප කරන මස් වර්ග තිබෙනවා. තවත් අතකින් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය ආගම බුද්ධාගම කියලා සඳහන් වෙනවා. තවත් පැත්තකින් අපේ ගරු මන්ත්‍රීවරු, ඇමතිවරු අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ කර ගෙන මල් වට්ටි පුරවාගෙන, සුදෝ සුදු වතින් සැරසී පන්සල් යනවා. සමහරු සිල් ගන්නවා. අපේ සංස්කෘතිය පැත්තෙන් එහෙම කළාට අපේ සෞඛ්‍යයට හා පෝෂණයට නොගැළපෙන බොහෝ භාණ්ඩ මේ ආනයනය කරන ආහාර ලැයිස්තුවට ඇතුළත් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] පන්සලට යනවා. මම කියන්නේ ආහාර ගැනයි. පන්සල ගැන නොවෙයි. [බාධා කිරීමක්] උපලේඛනයේ ඒවා තිබෙනවා නේ. ඔබතුමා අහ ගෙන ඉන්න කෝ. [බාධා කිරීම්] අපි කියන්නේ මෙකේ තිබෙන වැරදි දේවල් අයින් කරන්න කියලායි. [බාධා කිරීම්] දන්නවා, දන්නවා. අපිත් ගියා. මෙම ආහාර සම්බන්ධයෙන් සෞඛ්‍යය හා පෝෂණයට අදාළ නිලධාරින්ගෙන් උපදෙස් අර ගෙන සොයා බලන්න කියලා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ආහාරවලට අමතරව මෙම උපලේඛනයට පොල්, කජු, සහල් සහ බඩ ඉරිඟු ඇතුළත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු ආර්ථික සංවර්ධන ඇමතිතුමා ගැමි ආර්ථිකය නංවාලීමට ගැමි දිරිය, ගම නැඟුම, දිවි නැඟුම වාගේ යෝජනා ක්‍රම මුළු දිවයින පුරාම ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයක් පිහිටුවා තිබෙනවා. පොල් නිෂ්පාදනය වැඩි කරන්න පොල් සංවර්ධන මණ්ඩලය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය නමින් ආයතන තුනක් තිබෙනවා. ඒ අතරම අමාත්‍යවරු පොල් පැළ බෙදනවා. නමුත් අපේ වෙළෙඳ අමාත්‍යතුමා පොල් ආනයනය කරලා මුහුදට විසි කරනවා. ඒ වාගේම කජු නිෂ්පාදනය වැඩි කරන්න කජු සංස්ථාවක් තිබෙනවා. ඒ නිසා සමස්ත ආර්ථිකයටම බලපාන මෙවැනි ආහාර ද්‍රව්‍ය ආනයනය කරන්න ඉඩ දෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)
එතකොට ඔබතුමිය කොහොමද spirit ආනයනය කළේ?

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
Spirit ආනයනය කළේ off-season එකේ වැඩ කරන්නයි. ඔබතුමා ඒක දැන ගන්න. ඔබතුමා ඒ ගැන දන්නේ නැහැ නේ. දන්නේ නැති දේවල් කථා කරන්න එපා. [බාධා කිරීමක්] Spirit ආනයනය කරන්න පුළුවන් කියලා මේ නියෝගයේ තිබෙනවා.

[ගරු අනෝමා ගමගේ මහත්මිය]

එහෙම නම් ඔබතුමන්ලා ඇයි ඒවා ගෙන්වන්නේ? ඔබතුමාට ඒක මේ ලැයිස්තුවෙන් අයින් කරන්න තිබුණා නේ. ඇයි ඒක මේ ලැයිස්තුවේ තිබෙන්නේ? එහෙම නම් මේ ලැයිස්තුවෙන් ඒක අයින් කරන්න. බලන්න. ඔබතුමා මේ ලැයිස්තුව බලලා නැහැ. ඔබතුමා මොනවත් දන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා මේ ලැයිස්තුව බලලා කථා කරන්න. Molasses ගෙන්වූවේ වැඩ නැති කාලයේදී molassesවලින් spirit හදන්නයි. අපි spirit ගෙනාවේ නැහැ. Molasses ගෙනාවේ spirit හදන්නයි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
සීනි නිෂ්පාදනය අඩු කරලා molasses -

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
සීනි නිෂ්පාදනය අඩු කරලා molasses හදලා නැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඇයි නැත්තේ?

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ඔබතුමා දන්නේ නැහැ. තුන් පාරක් පමණක් සෙවණගලට ගිය ඔබතුමා මොනවාද දන්නේ? උක් ගස් ඇඹරුවාම ඉස්සෙල්ලාම වැඩිම සාන්ද්‍රණයෙන් සීනි ටික අයින් වෙනවා. ඉතිරි ටික තමයි molasses විධියට එන්නේ. ඒ molassesවලින් සීනි හදන්න බැහැ. ඒ molasses කොටසකින් අපට spirit හදන්න පුළුවන්. ඉතිරි ටික bagasse විධියට යනවා. ඒ bagasse දහනය කරලා තමයි අපි තාපය ලබා ගන්නේ. [බාධා කිරීමක්] මම කියන එක පොඩ්ඩක් අහ ගෙන ඉන්න. අපි පොල් මිරිකුවාම කිරි ගත්තාට පස්සේ ඉතිරි පොල් කුඩු සත්ව ආහාර වාගේ නොයෙක් දේවලට ගන්නවා. ඒ වාගේ තමයි මේකත්. [බාධා කිරීමක්] ඔබතුමා මගේ කථාව ඉවරතුරු කම් ඉන්න. මම දැන් ඔබතුමාට කිව්වා නේ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඇයි ඔබතුමිය molasses ගෙනාවේ?

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
අපි molasses ගෙනාවේ ඇයි කියලා මම කිව්වා නේ. Molasses ගෙනාවේ මාස හයක් factoryය වැඩ කරන්නේ නැති කාලයේ වැඩ කරන්නයි. ඒ කාලයට molasses ගෙනැල්ලායි spirit හදන්නේ. මොකද, ආණ්ඩුව පිට රටින් spirit ගෙන්වනවා. Import කරන බඩුවක්. Import කරන්නේ ඉතින් තහනම් ද්‍රව්‍යයක්- [බාධා කිරීමක්] මම කියන එක පොඩ්ඩක් අහගන්න. Import කරන දෙයක් තමයි ගෙනාවේ. දැන් රජයෙන් හම්බන්තොට දමන්න යනවා අලුත් තැනක්. එතැන කරන්න හදන්නේ raw sugar and molasses ගෙනැල්ලා spirit හදන එක. එතකොට ඇයි රජයට ගෙනෙන්න පුළුවන් නම්- [බාධා කිරීමක්] අපි කරලා තිබෙන්නේ වැරදි වැඩක් නොවෙයි නේ. අපි molasses ගෙනාවේ spirit හදන්න තමයි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමිය අවසර දෙනවා නම් මම පුංචි ප්‍රශ්නයක් අහන්නම්.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
අහන්න.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමිය කරපු ප්‍රකාශයක්, වාර්තා ගත කරපු එකක් මගේ ළඟ තිබෙනවා. ඔබතුමිය ප්‍රකාශ කර තිබෙනවා, molasses ගෙන්වූවේ සීනි හදන්නය කියලා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
නැහැ, නැහැ. Molassesවලින් කොහොමද සීනි හදන්නේ? Molassesවලින් සීනි හදන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඔබතුමියගේ කඩ හඩ දැන් ඔප්පු කරලා පෙන්නුවොත් ඔබතුමිය මොකක්ද ගන්න තීන්දුව?

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
මම වැරදිලා කියන්න ඇති. නමුත් molassesවලින් සීනි හදන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
වැරදීමක් නොවෙයි. ඔබතුමිය පැහැදිලිව කිව්වා, molasses ගෙන්වූවේ සීනි හදන්නය කියලා. මේ ඔබතුමිය කියාපු දේ. මම නොවෙයි කිව්වේ.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
Molassesවලින් සීනි හදන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
එතකොට මම අහන්නේ මේකයි. ඔබතුමිය සීනි හදන්න molasses ගෙන්වූවා කිව්වා. මාර කථාවක්නේ මේ-

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු ඇමතිතුමනි, molassesවලින් සීනි හදන්න බැහැ. මම කිව්වානේ, මට වැරදිලා එහෙම කියැවෙන්න ඇතියි කියලා. නමුත් molassesවලින් සීනි හදන්න බැහැ. [බාධා කිරීම්] හරි, හරි. දැන් නවත්වන්න. මගේ වෙලාවත් කෑවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ උපලේඛනයට ඇතුළත් කර තිබෙනවා, චන්ද්‍රිකා ඇතුළුව අභ්‍යාවකාශ යානා, උපකක්ෂ යානා සහ අභ්‍යාවකාශ යානා ගුවන්ගත කරන වාහන. ඒවාත් ගෙන්වන්න අවසර දීලා තිබෙනවා. අපේ රට ආසියාවේ ආශ්චර්යය කරා ගමන් කිරීම ගැන අපි සතුටු වෙනවා. මේවා ඇත්තටම ලංකාවේ ආර්ථික සංවර්ධනයට අවශ්‍යයිද කියන එකත් අපට ලොකු ප්‍රශ්නයක්.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, මෙම නියෝග මෙම ගරු සභාවට ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීමේ අරමුණ පැහැදිලිව සඳහන් කළයුතු බව. එමෙන්ම පළමුවන උපලේඛනයේ ඇතුළත් වන භාණ්ඩ පිළිබඳව සෞඛ්‍ය අධිකාරියෙන්, පෝෂණ විශේෂඥයන්ගෙන්, පර්යේෂණ ආයතනවලින් අදහස් විමසලා නැවතත් පරීක්ෂා කර බලන්නය කියලා මා ඉල්ලනවා. මොකද, මේ උපලේඛනයේ සඳහන් භාණ්ඩ ආනයනය රටට හා මහජනතාවට අහිතකර ලෙස බලපාන බව පැහැදිලියි. එමෙන්ම සියලු අංශවලින් විමසා බලා මෙම භාණ්ඩ ලැයිස්තුව පිළියෙල කළ බවක් නොපෙනෙන නිසා ඒ ගැන සැලකිලිමත් වන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ නොවුණහොත් මහජනතාවගේ විරෝධය පමණක් නොව, පාරිසරික විද්‍යාඥයන්ගේ, සෞඛ්‍ය අධිකාරියේ, ආර්ථික විශේෂඥයන්ගේ අවඥාවට ලක්වීමට ඉඩ තිබෙනවා. ඒ සැමටම වඩා ආණ්ඩුවට, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට චෝදනා ඉදිරිපත් වීමට ඉඩ තිබෙනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ කරුණු ඉදිරිපත් කළේ ඇත්තටම විවෘත වෙළෙඳ ප්‍රතිපත්තියට විරුද්ධව නොවෙයි කියන එක. මා මේ කියාපු කරුණු ගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. ඇත්තටම ඕනෑම පුද්ගලයකුගේ ශරීර සෞඛ්‍ය හොඳ නම් බෙහෙත් බොන්න අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත් යම් අසනීපයක් ඇති වුණොත් එයට අනිවාර්යයෙන්ම බෙහෙත් බොන්න අවශ්‍යයි. මුලින්ම බෙහෙත් ගත්තොත් ඉක්මනට සනීප වෙන්න පුළුවන්. තමන්ගේ ශරීර සෞඛ්‍ය හොඳයි කියලා බෙහෙත් ගන්නේ නැතිව හිටියොත් ලෙඩේ අසාධ්‍ය වෙන්න ඉඩ තිබෙනවා. ඒ වාගේම සැර බෙහෙත් බොන්නත් වෙනවා. ඒ වාගේම ඊට වඩා අමාරු දේවල් වෙන්නත් පුළුවන්. ඒ නිසා ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් බිහි කරන්න යන ගමනේ කුමන හෝ ආශ්චර්යකින් රටේ ආර්ථිකය යහපත් අතට හැරේවි කියලා බලා ගෙන ඉන්නේ නැතිව ඒ ගැන ක්‍රියා කරන්නය කියලා මා ඉල්ලනවා.

අවසාන වශයෙන් ඇල්බට් අයින්ස්ටයින් විද්‍යාඥයාගේ කියමනක් ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා. [බාධා කිරීමක්] ගරු අස්වර් මන්ත්‍රීතුමා, අහගෙන ඉන්නකෝ. මේක ඔබතුමාටම තමයි හරි යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇල්බට් අයින්ස්ටයින් විද්‍යාඥයා ප්‍රකාශ කර තිබෙනවා, "ලෝකයේ හෝ සමාජයේ වැරදි කරන්නේ ඉතාම සුළු පිරිසකි. එහෙත් අනෙක් සියලු දෙනා ඒ දෙස නොබලා නොදුටුවා සේ අහක බලාගෙන සිටිති. වඩාත් අහිතකර වන්නේ වැරදි කරනවුන්ට වඩා වරද දුටු තැන අහක බලා ගෙන මඟ හරින අයයි." කියලා. ඒ කියන්නේ අර අත් ඔසවන කට්ටිය. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Vasudeva Nanayakkara. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Vasudeva Nanayakkara, you have 20 minutes.

[අ. භා. 3.36]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී පෙන්සිල්ඩ් සමාගමට කන්තලේ සීනි කර්මාන්තායතනය දීලාය කියලා කිව්වා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Yes.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම කියනවා, නැහැයි කියලා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම කියනවා, දුන්නා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඉන්න කෝ. දුන්නාය කියලා ඔබතුමා ඔතැන උඩ පැන්නාට හරි යන්නේ නැහැ.

මම කියන එක අහගන්නකෝ. මේ අර්පණය භාර ගන්නවාද නැද්ද කියලා බලන්න - ඒ offer එක භාර ගන්නවාද නැද්ද කියලා බලන්න - අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාවක් පත් කළා. ඒ කොන්දේසිය බලනවා. කැබිනට් අනු කාරක සභාව පෙන්සිල්ඩ් සමාගමේ අර්පණය ප්‍රතික්ෂේප කළා. ඒ අනුව අද පෙන්සිල්ඩ් සමාගමත් ආණ්ඩුවත් අතර ගිවිසුමක් ඇති වන්නේ නැහැ. යම් Memorandum of Understanding කියන එකක්- චේතනා ප්‍රකාශනයක්- තිබුණා නම් ඒකත් අවලංගු වනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම මේ කියන්නේ කැබිනට් මණ්ඩලයේ තොරතුරක්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමා මම මේ ලේඛනය සභාගත කරනවා. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, නැහැ. ඔබතුමා සභාගත කරන්න ඕනෑ නැහැ.[බාධා කිරීමක්] නැහැ, ඕක ඕනෑ නැහැ. මම මේ කරන ප්‍රකාශයෙන් පස්සේ ඔබතුමා ඕනෑ එකක් සභාගත කරන්න. මම කැබිනට් අනු කාරක සභාව ගැන ප්‍රකාශයක් කළේ. [බාධා කිරීමක්] දැන් ඒක කරන්න බැහැ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Minister is not giving way. -[*Interruption.*]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක කරන්න බැහැ නේ. ඔයගොල්ලන් කථා කරන කොට ඔයගොල්ලන්ගේ ඒවා ඉදිරිපත් කරන්න. අපි කථා කරන කොට කරුණාකරලා ඔයගොල්ලන්ගේ ඒවා ඉදිරිපත් කරන්න එපා. අපේ එක අස්සේ ඔයගොල්ලන්ගේ එක ගහන්න එන්න එපා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔයගොල්ලන්ගේ එක අස්සේ අපේ ඒවා ගහන්න එන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම නම් වාඩිවන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
What I am saying is -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You do not have to say it. I cannot give way. You have no right.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you carry on with your speech.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Parliamentary procedure demands that a Member must give way.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Let us conduct a beautiful debate.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
A Member must give way. That is the procedure. When I say, "I do not give way", you have to understand that.

දැන් මම කිව්වේ පෙන්සිල්ඩ් එක ගැන කථාවයි. එතැනින් මගේ පැත්තේ ප්‍රකාශය ඉවරයි. දැන් ඉතින් හර්ෂ මන්ත්‍රීතුමාගේ පැත්තෙන් තවදුරටත් ඒ ගැන ප්‍රකාශයක් කළ හැකියි. ඒකෙන් තවදුරටත් යථාර්ථය තේරුම් ගනීවි. ඇත්තටම ඒ සමාගම ඒකේ හිමිකම් භුක්ති විඳිනවා. එතකොට ඒ ගැන තවදුරටත් කථා කරන්න පුළුවන්. දැනට මේ මට්ටමින් අපේ ප්‍රකාශයන් දෙකක් තිබෙනවා.

එතුමා හිඟුරාන සීනි සමාගම ගැන කිව්වා. හිඟුරාන සීනි සමාගමේ කොටස්වලින් ආණ්ඩුවට සියයට 49ක් තබා ගෙන එල්ඕඑල්සී එකටයි, බ්‍රවුන්ස් එකටයි සියයට 51ක් දුන්නා.[බාධා කිරීමක්] ඔව්, සියයට 51ක් දුන්නා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, සියයට 49යි දුන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හරි, සියයට 49ක් දුන්නා. සියයට 51ක් ආණ්ඩුව තබා ගත්තා. එසේ කළේ ඒවායේ මිල අගය කිරීමක් කරලායි. අපි ඒ ආයතනයේ තිබුණ වටිනා භාණ්ඩ රුපියල් මිලියන 549කට අගය කළා. ඒක ආණ්ඩුවට අයත්- එකතු කිරීමක්- හැටියටයි එතැන තිබෙන්නේ. ඒ අතර අපි අලුත් සමාගම භාර ගත් අයගෙන් රුපියල් මිලියන 500ක ආයෝජනයක් ඉල්ලුවා. ඒ ගොල්ලන් ඒක කළා. මේක රජයත්, පෞද්ගලික අංශයත් අතර ගෙන යන හවුල් පාලනයක්. හවුල් පාලනයේ සියයට 51ක් රජයට තිබෙනවා. ඒ අතර ඒ තිබුණා වූ දේවල අගය මිලකරණය කළා. තමුන්නාන්සේලා අර කෝනල් පෙරේරාට දුන්නා වාගේ දුන්නේ නැහැ. අපි දීපු ඒවා අගය කිරීමක් කරලායි. [බාධා කිරීමක්] කෝනල් පෙරේරාට දුන්නේ Hotel Developers (Lanka) Limitedවල බෝනස් කොටස්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කවුද දුන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ප්‍රේමදාසගෙන් අහන්න, කවුද කියලා. ප්‍රේමදාසගේ පුතා දන්නවා ඇති.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ කාලයේ එයා පොඩියි නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, මම කිව්වේ එයාගෙන් අහලා බලන්න කියලායි. මම කිව්වේ ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ දුන්න ඒවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ. "පෙරේරා" කියලා මගේ නම තිබෙන නිසායි ඇහුවේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම නැකමක් නැහැයි කියලායි මම හිතන්නේ. මම කියන්නේ මේකයි. නිකම් එක එක තැන් උළුප්පලා පෙන්වලා scoring points වලින් වැඩක් නැහැ නේ. සමස්ත ඇත්ත කථාවට බහින්න. සමස්ත ඇත්ත කථාවට බැස්සා නම් පෙනේවි හවුල් ව්‍යාපාරයක් තිබෙනවා, ඒකට ඒ කොම්පැනිය රුපියල් මිලියන 500ක් ආයෝජනය කරලා තිබෙනවා, ඒ වාගේම ආණ්ඩුව මේ හවුල් ව්‍යාපාරයේ සියයට 51ක බලයක් තියා ගෙන ඉන්නවා, මෙන්න මේ කොන්දේසි මතයි මේවා දීලා තිබෙන්නේ කියලා. ඒ නිසා හර්ෂ මන්ත්‍රීතුමා ඇවිල්ලා "ශත පහක්වත් ගත්තද, ශත පහක්වත් ගත්තද, සියයට 49ක කොටස් දීලා" කියනවා. මොනවද හලෝ? [බාධා කිරීම්] ඔහොමද කථා කරන්නේ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Let him have his say.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ තොරතුරු ඔක්කොම වහලා [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Members, please do not disturb the Hon Minister.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අනෙක් පැත්තෙන් කියනවා, "ශත පහක්වත් දුන්නාද, ශත පහක්වත් දුන්නාද," කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Molasses ගැන කියන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඊළඟට මම molassesවලට එන්නම්. ඔබතුමන්ලා කොච්චර වැරදි ගහකටද බුර බුරා ඉන්නේ කියලා බලන්න. මේ molasses පිළිබඳ ප්‍රශ්නයේදී ආණ්ඩුව මේ රටේ සැර බීම නිෂ්පාදනය පිළිගන්නවා. ඒ සැර බීම නිෂ්පාදනයෙන් අපි ලොකු ආදායමක් ආණ්ඩුවට ගන්නවා. සැර බීම මේ රටේ මිනිස්සුන්ට පාවිච්චි කරන්න තියෙන අයිතියත් අපි පිළි ගන්නවා. සැර බීම නිෂ්පාදනය කරන්න පුළුවන් නම්,හොඳ පොල් අරක්කු හැදුවොත් ඒවාත් අපට අපනයනය කරන්න පුළුවන් වෙයි. ඒක ගැනත් හිතුවාට කමක් නැහැ කියලායි මා හිතන්නේ. අපේ හොඳ පොල් අරක්කු ගෙනිච්චාම විදේශයන්වල ඉන්න මිනිස්සුත් විස්කි පැත්තකින් තියලා අරක්කු බොන්න පටන් ගන්නවා. ඒ තරම් වටිනවා අපේ අරක්කු. මම කියන්නේ මේකයි. මේ අරක්කුවල කිසිම දෝෂයක් මා දකින්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
"මතට තිත."

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
"මතට තිත" කියන්නේ ඔය මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන "බේබද්දන්ට තිත" කියන එකයි. එහෙම නැතිව, "අඩියක් ගහන මිනිසුන්ට තිත" කියන එක නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක හරි, ඒක හරි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ නිසා බේබද්දන් දුරු කරමින් මේක කරන්න ඕනෑ. ඊ ළඟට molasses කතාව ගනිමු. දැන් ඉක්ෂු පාක ගෙන්වනවා මේ රටේ ප්‍රමාණවත් ඉක්ෂු පාක නැති නිසා. ඉක්ෂු පාක ගෙන්වලා spirit හදනවා. මේක අද-ඊයේ කරන දෙයක් නොවෙයි. මේ ලැයිස්තු තියෙනවා නේ. මේ ලැයිස්තු ජාත්‍යන්තර standardized ලැයිස්තු. එහෙම නැතිව මේවා මෙහාට විතරක් වලංගු ලැයිස්තු නොවෙයි. මේ ඔක්කොම දානවා. දැම්මාය කියලා ඔක්කොම ගෙන්වන්නේ නැහැ. ඔක්කොම ගෙන්වන්න අවසර නැවත ගන්න ඕනෑ. මේවාට තියෙනවා standard අවසරයක්. ඊ ළඟට ඒක import කරන්න නම් ඒකට අලුත් අවසරයක් ගන්න ඕනෑ. මේවා internationally standardized ලැයිස්තු. මේවායේ කෑලි කෑලි අරගෙන පෙන්වලා,"මෙන්න ගෙන්වන්න යන ඒවා; මෙන්න ගෙන්වන්න යන ඒවා" කියනවා. මේවා ගෙන්වන්න යනවා නොවෙයි. අපේ රේගුව හරහා ගෙන්වීමට අයිතිය තිබෙනවා. නමුත් එසේ ගෙන්වීමට import licence එකක් ගන්න ඕනෑ. මේවා නිකම්ම ගෙන්වන්න බැහැ. Import licence එකක් උඩ ගෙන්වන්න ඕනෑ. දැන් වෙලා තිබෙන කාරණාව මේක නේ. අපි ආනයන අපනයන පාලනය කරනවා. තමුන්නාන්සේලා කිව්වා "අපෝ! ඒක නම්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කරන්න එපා, මේ නිදහස් වෙළෙඳ පොළට නිර්බාධක වෙළෙඳ පොළක් තියෙන්න ඕනෑ"ය කියලා. ඔය licence ක්‍රම මොකක්වත් එපා. අපට නියාමනයත් ඕනෑ නැහැ. අපට තියෙන්න ඕනෑ නිදහස් වෙළෙඳ පොළක්, ඕනෑ දෙයක් ගෙන්වන්න; ඕනෑ දෙයක් යවන්න; ඕනෑ විධියකට ඒවා භාවිතා කරන්න. ඒවාත් එක්ක තමයි ලංකාවට කුඩු ආවේ. මතක තියා ගන්න. 1977ත් එක්ක තමයි ලංකාවට කුඩු ආවේ. ඕනෑ දෙයක් ගෙන්වන කාලයේ ඒවා අස්සේ පෙට්ටිවල තවත් දේවල් ආවා. ඒවාට import කරන්න කිසිම ලේඛනයක් අනුව බලයක් තිබුණේ නැහැ. නමුත් molasses ගැන දැන ගත යුතු දේ මෙයයි. අපේ ආණ්ඩුව පිළි ගන්නවා, spirit හදන්න ඕනෑය, spiritවලින් සැර බීම හදන්න ඕනෑය කියලා. ඒ ඔක්කොම හරි. නමුත් සුමාන දෙකක් යවලා අඹරන්න බැහැ. සුමාන දෙකක් යවලා ඇඹරුවාම වැඩියෙන් එන්නේ molasses. එතකොට සීනි හදන්න පුළුවන් වන්නේ අඩු ප්‍රමාණයක්. එතකොට වැඩි ප්‍රමාණයකින් spirit හදන්න පුළුවන්.

මෙන්න මේ සුමාන දෙක ගත වෙන්න ඇරලා මේවා ඇඹිරීම නිසා සීනි නිෂ්පාදනය අප බලාපොරොත්තු වූ ආකාරයට වැඩි වුණේ නැහැ; අඩු වුණා. ඒ නිසා අප කල්පනා කළා සීනි නිෂ්පාදනයට කියලා අර ගත්ත ඒ ආයතන සීනි නිෂ්පාදනයටම හරවන්න. ඒ සඳහා රජය මැදිහත් වනවා. මේවා රජයේ දේපළ. මේවා කාගේවත් අයිතියට දීලා නැහැ. මේවා දීලා තිබෙන්නේ තාවකාලිකව, භාරකාරයන් හැටියට. ඔය වතු දීලා තිබෙන්නේ භාරකාරයන් හැටියට. වවන්නේ නැත්නම් ඒ අක්කර තිස්හත්දාහ ගන්නවා. අරගෙන අපි වවනවා. මේවා රජයේ දේපළ. මේ රජයේ දේපළ පරිහරණය කිරීමේදී ඒවා කොහොමද පරිහරණය කළ යුතු කියලා අප බැලිය යුතුයි.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු ඇමතිතුමනි,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I am giving way.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
උක් ගස් ගෙනැල්ලා සුමාන දෙකක් පරක්කු කරලා ගන්නවාය කිව්වා spirit හදන්න ඕනෑ නිසා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම එහෙම කිව්වේ නැහැ.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
නැහැ, ඔබතුමා දැන් කිව්වේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමිය තොප්පිය දා ගත්තා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
නැහැ, නැහැ. මට නේ කිව්වේ. තොප්පිය දා ගන්නේ නැහැ මම. තොප්පිය ගලවා ගන්න විධියයි මම කල්පනා කරන්නේ. මම කියන දේ අහ ගන්න. ඔබතුමා අපේ වාර්තාවල් අරගෙන බලන්න. අපි දන්නවා පැය හයක් පරක්කු වුණොත් සුක්රෝස් සියයට දෙකක් පහළ බහිනවාය කියලා. ඒ නිසා අපි කවදාවත් දවසක් පරක්කු කරන්න දෙන්නේ නැහැ. ඔබතුමා වාර්තා අරගෙන -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ සීනිවලට ආදරයක් ඇති අය.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ඒ වාගේම අද උක් දෙන ගොවියාට අපි හෙට සල්ලි දෙන්න ලෑස්ති කරලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Now, you are not clarifying it; you are going into a speech. I cannot give way for that.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you carry on with your speech.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක එතුමියගේ පැහැදිලි කිරීම. අප දන්නවා සුමාන දෙකක් පහු වුණාම උක්වල සීනි නිෂ්පාදන හැකියාව බහින බව. ඒ නිසා උක් ගස් ගෙනාපු හැටියේ අඹරන්නයි අප බලාපොරොත්තු වන්නේ. මම කිව්වේ නැහැ එතුමියලා එහෙම කළා කියලා. ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමිය තමයි නැඟිටලා උත්තර දුන්නේ, "අප එහෙම කරන්නේ නැහැ" කියලා. ඒක එතුමියගේ පැහැදිලි කිරීම. ඔබතුමන්ලාට ඕනෑ නම් එතුමිය කියපු දෙය භාර ගන්න පුළුවන්. නමුත් සෙවනගලත්, පැල්වත්තේත් සීනි නිෂ්පාදනය වැඩි කරන්න ඊළඟ අදියර කීපයක් තිබුණා. නමුත් ඒ අදියරවලට ගියේ නැති බව කවුරුත් දන්නවා. ඒ කෙසේ වෙතත්, අපට -ආණ්ඩුවට- පෙනී ගියා, මේක හරියට පාවිච්චි වන්නේ නැති බව. ඒ නිසා ආණ්ඩුව ආණ්ඩුවේ දේපළ තමන්ගේ භාරයට නැවත ගත්තා. ඕක ගැන ඒ තරම් අඬන්න දෙයක් නැහැ. ඔච්චර තණ්හාවක් ඇති කර ගන්න ඕනෑත් නැහැ. ඒවායින් ලැබුණු සීනි තොගවලත්, fixed depositsවල තිබුණු මුදලුත් මතක් කර ගත්තාම ඔච්චර කඳුළු බේරෙන්නෙත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ කාරණය කියන්න කැමැතියි. වල් බූරු නිදහසක් දෙන වෙළෙඳ පොළ ක්‍රමයක් වෙනුවට නියාමනය කරන වෙළෙඳ පොළක් ගැන තමයි අප විශ්වාසය තබන්නේ. මහින්ද චින්තනයේ දිගටම කියා තිබෙනවා, "අප වෙළෙඳ පොළ පාලනය කරනවා" කියලා. වෙළෙඳ පොළ සමාජයට අහිතවත් නම් සමාජයේ යහපත උදෙසා වෙළෙඳ පොළ රජය පාලනය කළ යුතුයි. ඒක තමයි අපේ ස්ථාවරය. ඒ නිසා වෙළෙඳ පොළ අපට ලොකු නැහැ. අපට ලොකු සමාජයයි. ඒ වාගේම ප්‍රාග්ධනයටත් වඩා අපට ශ්‍රමය ලොකුයි. ඒ අනුව තමයි විවිධ අවස්ථාවල අපේ රජය ඊට මැදිහත් වන්නේ.

අපේ අලුත් මන්ත්‍රීතුමා -අකිල විරාජ් කාරියවසම් මැතිතුමා- කිව්වා ඔය පොත්වල කිව්වාට, ඉලක්කම් පෙන්නුවාට කිසිම දෙයක් වර්ධනය වෙලා නැහැ කියලා. එහෙම කියා ගෙන යන එක හොඳයි. ඒක ප්‍රචාරක රැළියක කරන කථාවක් පමණයි. බඩ ඉරිඟු නිෂ්පාදනය කොච්චර වර්ධනය වුණාද කියලා ඉලක්කම්වලින් හා ප්‍රදේශගත -ස්ථානගත- විමර්ශනයකින් කිව්වා නම් ඊට වඩා හොඳයි. ඉදිරි වර්ෂයේ අපට බඩ ඉරිඟු ආනයනය කරන්න අවශ්‍ය නැති පමණට අප බඩ ඉරිඟු වගාව වර්ධනය කරගෙන තිබෙනවා. ඉතින් මේ ඉලක්කම් වාගේම සැබවින්ම ලෝකයේ සිදු වන දෙයක් තිබෙනවා. මොකද ඒක අපේ ප්‍රතිපත්තිය. අපේ ප්‍රතිපත්තිය වුණේ ඕනෑ දෙයක් ආනයනය කිරීම නොවෙයි. ආනයනය කිරීම නිසා දේශීය දේවල්වලට ඒකෙන් හානියක් වුණත් ආනයනය කරලා ඒවා අඩු මිලට දෙන්නයි එදා කටයුතු කළේ. ඒකට අප විරුද්ධයි. අප කියන්නේ අඩු මිලට දෙන එකට වඩා දීර්ඝකාලීනව මේවා අප වවා ගන්න එක වැදගත් කියලායි. බදු දැමීම වැඩි කරලා ආනයනය කරන දේවල මිල වැඩි කිරීම තුළින් අප යම් ආකාරයකට දිරි ගන්වන්නේ දේශීය නිෂ්පාදනයයි. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. ඒ ප්‍රතිපත්තිය උඩයි අප යන්නේ. ඒ ආදේශන ප්‍රතිපත්තිය එදා ඉඳලා ගෙනෙන එකක්. අප ඒක වර්තමානයට ගැළපෙන විධියට අදත් ක්‍රියාත්මක කරනවා.

ඊළඟට මෙතුමන්ලා අර්තාපල් අල ගැන කිව්වා. අපේ අල එක වර්ගයක් අද රුපියල් අනූවට විකුණනවා. අනික් ඒවා රුපියල් හතළිහයි. මා හිතන්නේ රුපියල් අනූවේ අල විකිණෙනවා. මොකද ඒවා හොඳ අල. මිල විතරක් නොවෙයි, මේවායේ ගුණයත් බලන්න ඕනෑ. ගුණය බැලුවාම රුපියල් අනූවට විකුණන අල ඉල්ලන කට්ටිය කොච්චර ඉන්නවාද? ඒ රුපියල් අනූවක් දෙන්න පුළුවන් අය. රුපියල් අනූව දෙන්න බැරි කට්ටිය රුපියල් හතළිහේ අල අරගෙන යනවා. ඇත්තටම ඒ රුපියල් අනූවට විකුණන නුවරඑළියේ, නැත්නම් වැලිමඩ ප්‍රදේශයේ අර්තාපල් අලවල තිබෙන රසය, ගුණය අනික් ඒවායේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නියෝගවල අරමුණ කුමක්ද කියලා ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමිය ඇහුවා. මේ නියෝගවල ප්‍රධාන අරමුණ අපේ රටට පොදු වශයෙන් හිතකර ආකාරයට, අපේ රටේ නිෂ්පාදනයට හිතකර ආකාරයට, අපේ රටේ දීර්ඝ සංවර්ධනයට හිතකර ආකාරයට ආනයන අපනයන පාලනය කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප සති තුනක devaluation එකක් කළා. ඒකෙන් විශාල අලාභයක් වෙලා තිබෙන බව අප පිළිගන්න ඕනෑ. ඒකෙන් ආනයනය කරන හැම දේකම මිල වැඩි වෙලා තිබෙනවා. අපට ගෙවන්න තිබෙන ණයවල පොලිය වැඩි වෙලා එය ඉහළ ගිහින් තිබෙනවා. ඒ විධියට ලොකු අලාභයක් වෙලා තිබෙනවා.  මේ සති තුන තුළ රුපියල වටිනාකමින් අඩු කළාට මම ඇත්තටම විරුද්ධයි. නමුත් අපේ භාණ්ඩාගාරයේ එක මතයක් තිබෙනවා. "නැහැ, ඒක කළේ නැත්නම් මේ ලෝකයේ මුදල් අතර තිබෙන හුවමාරුව අපේ මුදලේ ඇත්ත වටිනාකමට ගළපන්න බැරි වෙනවා" කියන එක තමයි ඔවුන් තර්කයකට කියලා තිබෙන්නේ. මට මතකයි, ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා මුදල් ඇමති හැටියට හිටපු කාලයේ එතුමා කිව්වා, "මුදලේ අගය අඩු කරන්නට යන ප්‍රතිකර්මය භයානක ප්‍රතිකර්මයක්, ඒක නිකම් උණකාරයාට වතුර දෙනවා වාගේ වැඩක්" කියලා. දීලා ඉවරයක් වෙන්නේ නැහැ. අපේ අපනයනකරුවෝ හැම දාම ඉල්ලන්නේ, "අනේ, මේ රුපියලේ අගය අඩු කරන්න" කියලායි.  එතකොට අපට වැඩියෙන් රුපියල් එනවා.

ඔවුන් අතට රුපියල් වැඩියෙන් දෙන්න අපි මොකක්ද කරන්න ඕනෑ?  මේ රටේ ඉන්න බහුතර ජනතාවකට ආනයනය කරන බඩු වෙනුවෙන් වැඩියෙන් මිල ගෙවන්නට සලස්වන්නට ඕනෑ. ආනයනය කරන බඩුවලට වැඩි මිලක් ගෙවන කොට දේශීය නිෂ්පාදනයේත් මිල වැඩි වනවා. ඇයි? ඒවා මිලදී ගන්න කොට මුකුණුවැන්න මිටියේත් මිල වැඩි වනවා; දෙහි ගෙඩියේත් මිල ඒ ප්‍රමාණයට වැඩි වනවා. ඒ නිසා රුපියලේ වටිනාකම අඩු කිරීමට යෝජනා කිරීම අපට කිසිසේත්ම ඔරොත්තු දෙන ප්‍රතිකර්මයක් නොවන බව මම කිව යුතුයි. මෙහි අරමුණ වී තිබෙන්නේ ආනයන භාණ්ඩවල එක්තරා අඩු වීමක් ඇති කිරීමයි. නමුත් අඩු කරන්න බැරි භාණ්ඩ තිබෙනවා. ඒ අන්තර් භාණ්ඩයි. පෙට්‍රෝලියම්, යෙදවුම්, නිෂ්පාදනයට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ, ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය රෙදි වාගේ ඒවා තිබෙනවා. අන්තර් භාණ්ඩ හා අපේ ආයෝජන භාණ්ඩ දෙක එකතු කළාම අපේ නිෂ්පාදනයෙන් සියයට77ක් පමණ වනවා. සියයට 55ක් විතර අන්තර්භාණ්ඩ, සියයට 22ක් විතර ආයෝජන භාණ්ඩ. එතකොට පාරිභෝගික භාණ්ඩවලට සියයට 23ක් විතර වාගේ තමයි ඉතුරු වෙලා තිබෙන්නේ. එයිනුත් ආදේශන වැඩි කර ගැනීම තුළින් හා අපේ අපනයනය සංවර්ධනය කිරීම තුළින් තමයි  අපේ රටේ සංවර්ධනයේ පළල් රාමුව ගොඩනඟන්න අපි බලාපොරොත්තු වන්නේ. ඒ අනුව තමයි මේ නියමයන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. අරමුණ ඒකයි. මේ අනුව තමයි ආනයනය සහ අපනයනය එක්තරා විධියකට හසුරුවන්න අපි බලාපොරොත්තු වන්නේ. ඒක හසුරුවන්න පුළුවන් ඇත්ත නිෂ්පාදනයෙන්; මූර්ත ආර්ථිකයෙන්. නමුත් මිල සූත්‍රය අනුවත්, රුපියලේ අගයේ මිල සූත්‍රය අනුවත් එය හැසිරවීම යම් කෙටි කාලීන ආකාරයකට අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්.

වෙළෙඳ පරතරය පියවීමේ කටයුත්තේදී මෝටර් රථ වාහන ගැන අපට කල්පනා කරන්නට වනවා. මෝටර් රථ වාහන ආනයනය හුඟක් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඛනිජ තෙල් පරිභෝජනයත් වැඩි වෙලා තිබෙනවා. ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේදී  ඛනිජ තෙල් මිල වැඩි වෙලා තිබෙනවා.  ඒ වාගේම වාහන ආනයනය කරන ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. මිල වැඩි වීම මත ආනයනයේ වටිනාකමත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපට නැවත කල්පනා කරන්නට වනවා, සුඛෝපභෝගී වාහන මේ තරම් ගෙන්වීමෙන් මේ රටේ තෙල් පාවිච්චිය වැඩි වීම ගැන. ඒ වාගේම මේ තරම්  වාහන ගෙන්වීමෙන් තෙල් පාවිච්චිය වැඩි වනවා. ඒ නිසා අපට කල්පනා කරන්නට වනවා, ආනයන බදු අඩු වුණත්, ආනයන බදු අඩු වෙලා  ආණ්ඩුවේ ආදායම අඩු වුණත් මේ මෝටර් රථ  ආනයනයේ යම් සීමාවක්  ඇති කළ යුතු බව. මොකද, මෝටර් රථ ආනයනය තව ආනයනයන් කීපයකට බලපානවා. ඛනිජ තෙල්වලට බලපානවා. ඒ වාගේම අමතර කොටස්වලට -spare partsවලට-  බලපානවා. ඒවායේ නඩත්තුවට බලපානවා. ඒවාට අවශ්‍ය කරන අනෙකුත් ද්‍රව්‍ය ගෙන්වන්න බලපානවා. ඒ නිසා මෝටර් රථ ආනයනය ගැන අපට නැවත හිතන්නට, කල්පනා කරන්නට වනවා. සුඛෝපභෝගී මෝටර් රථ ගෙන්වීම නම් ඉතාමත්ම බරපතළ කාරණයක් හැටියට අපි සැලකිය යුතු වනවා.

එක පැත්තකින් අපි මේ වෙළෙඳ පරතරය ගැන කථා කරනවා. වෙළෙඳ පරතරය වැඩි වෙලා තිබෙනවා. ඒක කවුරුත් දන්නවා. එයට ප්‍රධාන හේතුව අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩයි. පාරිභෝගික භාණ්ඩ නොවෙයි. ඒ තත්ත්වයන් යටතේ අපේ ආර්ථික වර්ධනය සියයට 8ක පවත්වා ගෙන යන්නේ කොහොමද? මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8ක් ලෙසට පවත්වා ගෙන යන්නේ කොහොමද? අන්තර් භාණ්ඩ  ආනයනය, ඒවායේ යෙදවුම්, ආයෝජන භාණ්ඩ ගෙන්වීම යන මේවායින් තමයි මේ වර්ධනය පවත්වා ගෙන යන්නේ. වෙළෙඳ පරතරයත් අපි අඩු කර ගන්න ඕනෑ. ඒකට අපි අපනයනය වැඩි කර ගන්න ඕනෑ; විදේශ රටවල රැකියා කරන අයගෙන් අපට ලැබෙන මුදල් ප්‍රමාණය වැඩි වන්නට ඕනෑ. එහෙම නැතුව අපට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ආනයනය නොකර ඉන්න බැහැ, මේ රටේ නිෂ්පාදනය කරන තෙක්. මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් ඒවා  නිෂ්පාදනය කරන්න  ඕනෑ. පරිප්පු වාගේ නිෂ්පාදනය කරන්න බැරි දේවල් ආනයනය කරන්නම ඕනෑ. අත්‍යවශ්‍ය ආහාර

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ද්‍රව්‍යවලට බදු නොදමන්න කියලා මම වුණත් ආණ්ඩුවෙන් නිතර නිතර ඉල්ලා සිටිනවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට බදු නොදමන්න කියන ඉල්ලීම -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට නියමිත වේලාව අවසන්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතනවා, ආනයනය සහ අපනයනය පාලනය කිරීම මඟින් අපේ රටට දීර්ඝ කාලීන සංවර්ධනය අත් පත් කර ගැනීමට අපේ විදේශ මුදල්වල සංරක්ෂණය ඉතාම වැදගත් වනවා කියා. වෙළඳ පරතරය වැඩි වීම, අපනයනයේ සහ ආනයනයේ ඇති වන්නා වූ පරතරය වැඩි වීම පමණක් නොවෙයි, මේ රටට එන්න තිබෙන විදේශ මුදල් ඒ ලැබිය යුතු ප්‍රමාණයෙන් එන්නේ නැත්නම්, අප අපනයනය කරන භාණ්ඩ මිල පහළ මට්ටමක දක්වලා under-invoicing කරලා මේ රටින් පිට කරනවා නම්, current account එකේ මේ තිබෙන තත්ත්වය තුළ ඕනෑ දෙයක් මේ රටින් පිට රට යවලා ඒ ලැබෙන මුදල් තමන් කැමැති නම් ගෙන්වීමේ අභිමතය දීලා තිබෙන තුරු විදේශ මුදල් අපේ රටට අපේ අයිතියේ හැටියට ලැබීම, අප යවන භාණ්ඩවලට අපට ලැබිය යුතු මුදල් සම්පූර්ණ වශයෙන් නොලැබීම මේ වෙළඳ පරතරය පිළිබඳ ප්‍රශ්නයට තවත් අතකින් බලපානවා. මේ සියල්ල ගැන එකට කල්පනා කර බලමින් අප දැනට සම්මත කර තිබෙන ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ නියෝග පිළිබඳව බරපතල ලෙස කල්පනා කළ යුතුය කියන තැනට, විපක්ෂය අද ඉදිරිපත් කරලා තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මඟින් අපව යොමු කර තිබෙනවා. නමුත් විපක්ෂයේ තමුන්නාන්සේලා කිසිවකු අතරින් බරපතල ලෙස කල්පනා කරන්නට තරම් කිසිම යෝජනාවක් ඉදිරිපත් වුණේ නැති බව කියමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට තිබෙන්නේ මිනිත්තු පහයි.

[අ.භා.3.58]

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ නියෝග පිළිබඳව කථා කරන වෙලාවේ ඊට සම්බන්ධ වන්නට මටත් විනාඩි දෙකතුනක අවස්ථාවක් හරි ලැබීම ගැන සතුටු වෙනවා. මේ රජය ආනයනය සහ අපනයනය සම්බන්ධයෙන් බදු පිට බදු ගහමින් මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැරි මට්ටමකට මේ රටේ ආර්ථිකය හසුරුවන අවස්ථාවේ ජනතාවගේ මුදල් තව තවත් සූරා කෑමේ වැඩසටහනේ එක් අදියරක් හැටියට තමයි අප මෙය දකින්නේ. දේශීය ව්‍යාපාරිකයා මට්ටම් කරන යුගයක තමයි අප අද ඉන්නේ. මට පෙර කථා කරපු අපේ ඇමතිතුමාත් කිව්වා molasses ගැන. එතුමා සෙවනගල සීනි කර්මාන්තය පවරා ගැනීම පිළිබඳව කථා කරමින් ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමියට චෝදනා කළා. අපි දන්නවා, දේශීය ව්‍යාපාරිකයකු හැටියට දයා ගමගේ මැතිතුමා ඒ ව්‍යාපාරය කර ගෙන යන අවස්ථාවේ පනත් ගෙනැල්ලා එය බලහත්කාරයෙන් උදුරා ගත් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරල වශයෙන්ම කිව්වොත්, ඒ පවරා ගැනීම අප නම් දකින්නේ, ඒ ව්‍යාපාරයේ තිබෙන molasses ගැන හරි, spirit ගැන හරි දොළ දුක හිතපු කෙනකුට, දොළ දුක දන්නා කෙනකුට ඒක ලබා දෙන්න කරපු දෙයක් හැටියටයි. එහි තර්කයක් නැහැ. විපක්ෂයේ කෙනකුගේ හෝ වේවා, කාගේ හෝ වේවා එහෙම ව්‍යාපාර දැක්කාම තමන්ට අවශ්‍ය නම් රාජ්‍ය බලය යොදා ගෙන පාර්ලිමේන්තුවට අණ පනත් ගෙනැල්ලා ඒ අණ පනත් තුළින් තමන්ගේ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්නා කාල පරිච්ඡේදයක් මේ රටේ අද උදා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට ආශ්චර්යයක් කරා යන ගමනේදී ආණ්ඩුව අද එක පැත්තකින් ව්‍යාපාරික ක්ෂේත්‍රයට, අපනයන ක්ෂේත්‍රයට බදු ගහනවා. අනෙක් පැත්තෙන්, ආනයන ක්ෂේත්‍රය දෙස දවස ගණනේ බදු ගහනවා. අද ආයාත නිර්යාත කරන වෙළඳ ව්‍යාපාරිකයෝ, එම භාණ්ඩ පරිභෝජනය කරන පාරිභෝගිකයෝ මේ රටේ අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. එහෙම ආශ්චර්යයක් ගැන තමයි අද කථා කරන්නේ. එහෙම කථා කරන අතරේ තමයි අණ පනත් ගෙනැල්ලා මේ ගරු මන්ත්‍රීතුමියගේ සෙවනගල ව්‍යාපාරය බලහත්කාරයෙන් පවරා ගෙන molasses ගැන කථා කරන්නේ, spirit ගැන කථා කරන්නේ. මේ පාර්ලිමේන්තුවේදී අවංකවම කථා කරනවා නම් ඒ පවරා ගැනීම ගැන කියන්න තිබෙන්නේ මොකක්ද? ඔය හැමෝම දන්නවා සෙවනගල ව්‍යාපාරය පවරා ගත්තේ ඒ molasses ටික, එහෙම නැත්නම් spirit ටික දැකලා බව. වෙන කිසි හේතුවක් නිසා නොවෙයි. එය දියුණු කරන්න හදන කතන්දරයක් නිසා නොවෙයි. කාට හරි හිතවතකුට දෙන්නයි එහෙම කළේ. අපට ඒක බලා ගන්න පුළුවන් අනාගතයේදී. ඒක තවත් කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ වන විට යුද්ධය නිම කරපු ඒ රණ විරුවා සිරගත කොට අවුරුදු දෙකක් පිරුණා. මීට අවුරුදු දෙකකට ඉස්සර වෙලා අද වාගේ දිනක, හැන්දෑවක ඒ රණ විරුවා අර ගෙන ගියා. එතැන ඇමති ආරක්ෂක අංශයේ හතර දෙනෙක් සිටියා. වර්තමාන අධිකරණ ඇමතිතුමාගේ ඇමති ආරක්ෂකයෝ පිරිසක් සිටියා. ඒ වාගේම මනෝ ගනේෂන් හිටපු මන්ත්‍රීතුමාගේ ආරක්ෂකයෝ පිරිසකුත් සිටියා. ඒ අය සිටිද්දී හමුදා ඇඳුම් ඇඳ ගෙන, හමුදාවේ බලතල පාවිච්චි කරලා බලහත්කාරයෙන් එතුමාව ඔසවා ගෙන ගියා. බලහත්කාරයෙන් කකුල් දෙකෙන් ඇද ගෙන ගියා. අපි අහන්න කැමැතියි මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ඇමති ආරක්ෂක අංශයෙන් ආරක්ෂකයන් දීලා තිබෙන්නේ මොන පදනමක් යටතේද කියලා. ඕනෑ එකෙකුට ඇවිල්ලා, ඕනෑ මිනිහෙකුට ඇවිල්ලා තමන්ගේ uniform එකේ බල පුළුවන්කාරකමෙන් මන්ත්‍රීවරයකු ඩැහැ ගෙන යන්න ඉඩ දෙන ඇමති ආරක්ෂක අංශයක්ද මේ තිබෙන්නේ?

මේකට වග කියන්න ඕනෑ ඇමති ආරක්ෂක සේවයේ අධ්‍යක්ෂවරයා සහ පොලිස්පතිවරයායි. ඒ විධියට බලහත්කාරයෙන් උස්සා ගෙන යන්නේ කොහොමද? මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න ඕනෑ, ඇමති ආරක්ෂක අංශයෙන් අපේ ආරක්ෂාවට දීලා ඉන්න නිලධාරින් මොන පදනමක් යටතේද අපේ ආරක්ෂාව සඳහා යොදවලා තිබෙන්නේ කියලා. එතුමා හිර ගෙට දාලා අද වන විට අවුරුදු 2ක් සපිරෙනවා. සුදු කොඩි නඩුව සම්බන්ධයෙන් එතුමා ඉදිරිපත් කළ අභියාචනය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් පසු මහාධිකරණයෙන් එතුමාව අවුරුදු තුනකට හිරේ දැම්මා. අද නඩු පිට නඩු පටලවලා තිබෙනවා.

යුද්ධය ඉවර කරපු මේ රටේ යුද්ධය නැහැයි කියන රටේ, ආශ්චර්ය කරා යනවාය කියන මේ රටේ අපි සාමකාමී උද්ඝෝෂණයක් කරන කොට ඊයේ පිටකොටුවේ බෝම්බ තවානක් දමා තිබුණා. එක පාරක බෝම්බ 7යි, තව පාරක බෝම්බ 2යි. ප්‍රවෘත්තිවලට කියනවා, කොළඹ නගරයේ පාරවල් දෙකකින් බෝම්බ 9ක් අල්ලලා තිබෙනවා; තවත් සොයමින් ඉන්නවා

කියලා. එහෙම නම් මේ වන කොට මේ නගරය අනාරක්ෂිත අවදානම් නගරයක් බවට පත් වෙලා තිබෙනවා; මේ රට අවදානම් රටක් බවට පත් වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, අපේ සාමකාමී උද්ඝෝෂණයට විරුද්ධව නියෝග ගන්න අද උදේ මහේස්ත්‍රාත් උසාවියට යනවා; අපේ පක්ෂ කාර්යාලයට ඇවිල්ලා ඡායාරූප ගන්නවා. උසාවියෙන් දෙන්න බැහැ කිව්ව තහනම් නියෝගය ගෙනැල්ලා දෙනවා. ගෙවල් check කරනවා. අද මේ ආණ්ඩුව, ආණ්ඩුවේ ඉන්න හෙන්චයියලා, ආණ්ඩුවේ නිලධාරින් එවැනි තත්ත්වයකට පත් වෙලා මේ මර්දනකාරී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා. ඊයේ හම්බ වුණු බෝම්බ මේ රටට කිව්වේ මොකක්ද? මේ රටේ ජනතාව කොළඹට එයි කියලා, ඔවුන් බිය වැද්දීමයි එයින් බලාපොරොත්තු වුණේ. අධිකරණයට ගිහිල්ලා මොනවාද කිව්වේ? මේ සාමකාමී උද්ඝෝෂණය නවත්වන්න කිව්වා. ප්‍රජාතන්ත්‍රවාදී රජයක් හැටියට ක්‍රියා කරනවා නම් මේ දේශපාලන හෙන්චයියලා, එහෙම නැත්නම් පොලීසියේ හෙන්චයියලා යොදවලා මේ කටයුතු කරන්නේ ඇයි? මේ වාගේ යෝජනා ගේන්නේ ඇයි? මේ රටේ ජනතාව මෝඩයෝ කියලා හිතනවා ඇති. ජනතාව අන්දවන්න පුළුවන් කියලා හිතනවා ඇති; රවට්ටන්න පුළුවන් කියලා හිතනවා ඇති. බෝම්බ හත අටක් ඇල්ලුවා කියන්නේ, මොකක්ද මේ රටේ තිබෙන ආරක්ෂාව? කොළඹ නගරයෙන් බෝම්බ හත අටක් අල්ලන කොට, තවාන් කරපු බෝම්බ තිබෙන කොට මේ රටට ආයෝජකයෝ එයිද? විදේශිකයෝ මේ රටට එයිද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)
ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා මේ රටේ යුද්ධය ඉවර කරලා, මේ රටේ තිබුණු ත්‍රස්තවාදය ඉවර කරලා අද මේ රටේ ජනතාවට නිදහසේ එහා මෙහා යන්නට පුළුවන් වාතාවරණයක් ඇති කරලා දුන්නා. තමන්ගේ ලේ මස් නහර මේ පොළොවට පතිත කරලා තමයි එතුමා ඒ යුද්ධය කළේ. අද එතුමා සිරගත වෙලා ඉන්නවා. මේ රටේ ජනතාවට අද නිදහසේ ගමන් කරන්න පුළුවන් වාතාවරණය සකස් කරලා එතුමා හිර කූඩුවට වෙලා ඉන්නවා. ඒ නිසා අපි එතුමාට අපේ පාර්ලිමේන්තුවේ උත්තමාචාරය මේ අවස්ථාවේදී පුද කරනවා. රට වෙනුවෙන් තමන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කරපු එතුමාට මේ ජාතියේම ගෞරවය හිමි විය යුතුයි කියා මතක් කරමින්, එතුමාට ඉක්මනින්ම නිදහස ලැබේවා කියලා නැවතත් ප්‍රාර්ථනා කරමින් මම නතර වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු (ආචාර්ය) සරත් අමුණුගම ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 20ක කාලයක් තිබෙනවා.

[අ. භා. 4.03]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ( ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කල් තැබීමේ යෝජනාව යටතේ අපි සාකච්ඡා කරන්නේ මේ රටේ ආනයන හා අපනයනවලට සම්බන්ධ ප්‍රශ්න පිළිබඳවයි. යුරෝපයේ ඇති වෙලා තිබෙන ආර්ථික අර්බුදය නිසා අපේ රටේ අපනයනයන් කෙරෙහි කිසියම් බලපෑමක් ඇති වෙනවා, ඒ වාගේම ඒ බලපෑම් නිවැරදිව කළමනාකරණය නොකළහොත් අපේ ආර්ථිකයට පසු බෑස්මක් ඇති වෙනවා කියලා මේ යෝජනාවේ සඳහන් වෙනවා. ඒ විධියට විරුද්ධ පක්ෂයෙන් එක්තරා අනතුරු ඇඟවීමක් කරලා තිබෙනවා. අපට පළමුවෙන්ම කියන්න තිබෙන්නේ අපේ රජයේ ආර්ථික කළමනාකරණය ඉතාම හොඳ මට්ටමක තිබෙනවා කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ ගෝලීය ආර්ථික අර්බුද තිබෙන අවස්ථාවේ අර්ථ ශාස්ත්‍රය විග්‍රහ කරන සඟරාවල සඳහන් වෙනවා ඔබතුමා දකින්නට ඇති, අපේ රටේ ආර්ථික වර්ධන වේගය දිහා බලපුවාම අද ලෝකයේ ඉතාම ඉක්මනින් දියුණු වන රටවල් හතර පහ ඇතුළට ශ්‍රී ලංකාවත් සම්බන්ධයි කියලා. ඒක අපට ප්‍රකාශ කරන්න පුළුවන්.

අපි මුලින්ම කියන්න ඕනෑ, හොඳ ස්ථාවර පදනමක ඉඳන් තමයි අපි මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කියලා. ඒකෙන් මම කියන්නේ නැහැ, අභියෝග නැතෙයි කියලා. ආර්ථික කළමනාකරණය කියන්නේ, දේශීය වශයෙන් වෙන්න පුළුවන්, විදේශීය වශයෙන් වෙන්න පුළුවන් ඒ වෙනස් වෙන ආර්ථික තත්ත්වයන්, දේශපාලන තත්ත්වයන් අනුව අපේ සම්පත් කළමනාකරණය කරමින් අපේ ඉදිරි මාර්ගය සකස් කිරීමයි. කළමනාකරණය ගැන තමයි අද අපි මේ සාකච්ඡාව කරන්නේ. තමුන්නාන්සේලා කියනවා, ඒක හරියට කළමනාකරණය කරන්නේ නැහැයි කියලා. අපි කියනවා, හරියට කළමනාකරණය කරනවාය කියලා. එතකොට මේ මතභේදය තුළ අපේ තර්කය අපි සනාථ කරන්නේ කොහොමද? පළමුවෙන්ම අපේ සංවර්ධන වේගය පෙන්වා දෙන්න පුළුවන්. ඒ වාගේම අපේ ආර්ථිකය විග්‍රහ කරන කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා කියන ක්ෂේත්‍රයන් තුනේම සංඛ්‍යාලේඛන අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක අපි පසු ගිය අය වැය විවාදයේදී ඉදිරිපත් කළා. ඊට පසුව ඇති වුණු විවාදවලදීත් ඉදිරිපත් කළා. විවිධ ප්‍රකාශනවලත් අපි කියලා තිබෙනවා, ඒ ක්ෂේත්‍රයන් තුන තුළම සැලකිය යුතු වර්ධනයක් තිබෙනවාය කියලා. දැන් අපි බලන්නට ඕනෑ, මේ වර්ධනය ජාත්‍යන්තර ආර්ථික පරිසරය තුළ අපි රැක ගන්නේ කොහොමද කියලා.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා යුරෝපයේ තිබෙන ආර්ථික අර්බුදය ගැන කථා කළා. අපි දන්නවා, අද ග්‍රීසියේ අර්බුදයක් තිබෙනවාය කියා. ඒ වාගේම පෘතුගාලය, ස්පාඤ්ඤය, ඉතාලිය ආදී රටවලට ඔවුන්ගේ ආර්ථික වර්ධනය පිළිබඳව එක්තරා විධියක අභියෝගයක් ඇවිල්ලා තිබෙනවා. මේක බොහෝ දුරට නිෂ්පාදනය සහ ඒ ගොල්ලන්ගේ ආර්ථික පදනම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. පළමුවෙන්ම මම ඒ ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. බොහෝදුරට ඒ රටවල තිබෙන්නේ මූල්‍යමය ප්‍රශ්නයක්. හොඳ ස්ථාවර ආර්ථිකයක් තිබෙන රටකට වුණත් මූල්‍යමය ප්‍රශ්න තිබෙන්න පුළුවන්. එතකොට මොකක්ද ඒ රටවල තිබෙන මූල්‍යමය ප්‍රශ්නය? ඒ ප්‍රශ්නය තමයි, ඒ ගොල්ලන්ගේ ආදායමට වැඩිය වියදම් වැඩි එක. ඒ වියදම් විශාල වුණාම ඒ පරතරය පියවන්න බැංකුවලින් සල්ලි ගන්න සිද්ධ වෙලා තිබෙනවා. බැංකුවලින් සල්ලි ඉල්ලා ගෙන තමයි ඒ ගොල්ලන්ගේ අය වැය ලේඛනය සකස් කරන්නේ. එතකොට හොඳ ශක්තියක් තිබෙන බැංකු ක්‍රමයක් තිබෙනවා නම් ඒ තිබෙන අභියෝගය කළමනාකරණය කර ගන්න පුළුවන්. නමුත් ලෝක බැංකු ක්‍රමය-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Will an Hon. Member propose that the Hon. Gayantha Karunatileka do take the Chair?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Sir, I propose that the Hon. Gayantha Karunatileka do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. GAYANTHA KARUNATILEKA *took the Chair.*

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඇමෙරිකන් බැංකු ක්‍රමයෙන් පටන් ගත්ත ගෝලීය බැංකු ක්‍රමයේ තිබෙන ඒ අර්බුදය තුළ ඒ ඒ රටවලට තමන් ලබා ගත්ත ඒ ණය ප්‍රමාණය - සලාකය වෙන්න පුළුවන්, මුළු ණය ප්‍රමාණය වෙන්න පුළුවන්- ඉතාම සාර්ථක ලෙස ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ බැංකු ක්‍රමය හොඳ ශක්තිමත් තත්ත්වයක තිබුණා නම් ඒ අර්බුදයට පිළියම් හොයා ගන්න පුළුවන්. යම් යම් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත් පිළියම් හොයා ගන්න පුළුවන්. දැන් ඒ බැංකු තමන්ගේ ණය ආපසු ඉල්ලන කොට ඒ රටවලට ඒ මුදල ලබා දෙන්නට බැරි තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා.

අද Eurozone එකට, European Union එකට තර්ජනයක් ඇති වෙලා තිබෙනවා. මොකද, එක පැත්තකින් මේවා ඇමෙරිකන් බැංකුවලින් ගත්තු ණය. ඒ වාගේම ජර්මනිය සහ ප්‍රංශයේ බැංකුවලින් ගත්තු මේ විශාල ණය ප්‍රමාණය ගෙවා ගන්න බැරි තත්ත්වයක් මේ රටවල්වලට තිබෙනවා. ඒ රටවල වියදම් වැඩියි. එක පැත්තකින් ණය ගෙවා ගන්න බැහැ වාගේම, අනෙක් පැත්තෙන් රැකියා අවස්ථා අඩු කිරීම, ආරක්ෂක වියදම් කැපීම, විශාල වශයෙන් පඩි නඩි කැපීම් ආදිය නැතිව අය වැයක් හදා ගන්නට බැරි තත්ත්වයකට ඒ රටවල් පත්වෙලා තිබෙනවා. ඒකයි ඒ රටවල වර්තමාන තත්ත්වය.

අපි සාමාන්‍යයෙන් බලාපොරොත්තු වුණා, අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඒ යුරෝපීය ආර්ථිකය දෙස මීට වඩා සුබවාදීව බලයි කියලා. මොකද, ඒ ගොල්ලන්ගේ ලිබරල් ඉතිහාසය අනුව, මේ රටවල්වල ආර්ථිකය කොහොම හරි ආපසු පණගස්වා ගනියි කියලා හිතන නිසා. මා හිතනවා එතුමන්ලා එහෙම විශ්වාස කරනවා කියලා. ඒකේ වරදක් නැහැ. It is too big to fail. ඒ රටවල් කියනවා මේ විධියට ආර්ථිකයට කඩා වැටෙන්න ඉඩ දෙන්න බැහැ කියලා. ඇත්ත වශයෙන්ම දැන් මොකක්ද වෙන්නේ? බොහොම අමාරුවෙන් සාකච්ඡා කරලා, සාකච්ඡා කරලා, යුරෝපයේ ධනවත් රටවල්, විශේෂයෙන්ම ජර්මනිය සහ ප්‍රංශය වැනි රටවල් ටිකෙන් ටික, ටිකෙන් ටික හෙට්ටු කරමින් එකඟ වෙනවා, bailout එකකට. ඒ රටවල් දැන් විශාල fund එකක් හදන්න සූදානම් වනවා, මේ වාගේ අමාරු තත්ත්ව තිබෙන රටවල්වලට IMF එකෙන් සල්ලි දෙන්න. අපි වාගේ පුංචි රටකට දෙනවා වාගේ රුපියල් බිලියන 2.6ක් දීලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ රටවලට විශාල මුදලක් අවශ්‍යයි. ඒ නිසා IMF එකෙන් මුදල් ගන්න හදනවා. ජර්මනියේ සල්ලි තමයි හුඟක්ම මේ අර්බුදකාරී රටවල්වල තිබෙන්නේ. ඒ නිසා දැන් ඒගොල්ලන් ඒ ගැටලුව සමනය කරනවා.

බලන්න, දැන් ඉතාලියේ මුදල් ඇමති වෙනස් වෙලා. ස්පාඤ්ඤයේ සහ වෙනත් රටවල ආර්ථික ප්‍රතිපත්ති වඩාත් දරදඬු වනවා. නමුත් අවසානයේදී ඒ ගොල්ලන් මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්න ඉඩ තිබෙනවා. අපට එහෙම හිතන්න පුළුවන්. මා හිතන හැටියට තමුන්නාන්සේලාගේ දර්ශනය අනුවත් අනාගතයේදී තමුන්නාන්සේලාත් ඒක පිළිගනීවි. අලුත්ම සංඛ්‍යා ලේඛන අනුව අපට පෙනෙන්නේ යුරෝපීය සහ ඇමෙරිකන් මිලදී ගැනීම් හරහා ඒ ගොල්ලන්ගේ වෙළෙඳ පොළ නැවතත් සක්‍රීය වීම තුළින් කඩා වැටුණු කර්මාන්ත ටිකෙන් ටික, ටිකෙන් ටික ඉහළට එන බවයි. ඒ නිසා අපේ අජිත් පෙරේරා මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ගැන ගොඩක්ම භය වෙන්න ඕනෑ නැහැ. ඇත්ත වශයෙන්ම අපේ රටේ සංඛ්‍යාලේඛන දිහා බැලුවාම අපේ අපනයන ඒ තරම් ප්‍රශ්නයකට ලක් වෙලා නැහැ.

අපේ ඇඟලුම් කර්මාන්තය ගත්තොත්, ඒ වෙළෙඳාම සියයට 30කින් වැඩි කර ගෙන තිබෙනවා. GSP Plus අපෙන් ගිලිහී ගිය වෙලාවේ අපි බය වුණා, ඒක දැඩි ලෙස අපේ ඇඟලුම් කර්මාන්තයට බලපායිද කියලා. නමුත් ඇත්ත වශයෙන් එහෙම දෙයක් වෙලා නැහැ, වර්ධනයක් වෙලා තිබෙනවා. අද ඇඟලුම් කර්මාන්තයේ අපිත් එක්ක තරග කරන රටවල්වල ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්තයේ ඉහළම තැනක් තිබුණු රටක් තමයි ඊජිප්තුව. ඊජිප්තුවේ ඒ කර්මාන්තය සම්බන්ධ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. බංගලාදේශයේත් ඒ කර්මාන්තයේ ප්‍රශ්න තිබෙනවා. ඒ තරගකාරී රටවල අද උද්ගත වෙලා තිබෙන ප්‍රශ්න නිසාත් අපේ ඇඟලුම් කර්මාන්තයේ වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. මා අවංකවම කියන්න ඕනෑ, අපේ පෞද්ගලික අංශයේ දක්ෂ ඇඟලුම්කරුවන් මේ අභියෝගයට හුඟක් හොඳට මුහුණ දීලා තිබෙන බව. මා පසු ගිය දවස්වල බංගලාදේශයේ සිටියා. මට හමුවුණ සියලුම මුදල් ඇමතිවරු කිව්වා, ඉන්දියාව වැනි රටකට ඇඟලුම් කර්මාන්තයට මෙච්චර සාර්ථකව මුහුණ දෙන්න බැරි වෙලා තිබෙනවා, නමුත් ලංකාව ඇඟලුම් කර්මාන්තයට සාර්ථකව මුහුණ දීලා තිබෙනවා කියලා. ඉතින් ඒ නිසා අපි භය වෙන්න ඕනෑ නැහැ. සාමාන්‍යයෙන් අපේ invisible exports කියලා කියන්නට පුළුවන් දේවල්, අපේ අපනයන ලේඛනයට නොවැටෙන දේවල් අපේ රටට ආදායම් ගෙනැවිත් දෙනවා.

එක පැත්තකින් බලන්න, අපේ සංචාරක ව්‍යාපාරය දෙස. අපේ සංචාරක ව්‍යාපාරය ඉතාම සාර්ථක විධියට දියුණු වේගන එනවා. ඒ ගැන අපි සියලු දෙනාම සතුටු වන්න ඕනෑ. අපේ රටට එන සංචාරකයන්ගේ වාර්තාගත වැඩි වීමක් වෙලා තිබෙනවා. අපිත් එක්ක තරග කරන වෙනත් සංචාරක මධ්‍යස්ථානවල අර්බුද තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා, අද මාලදිවයිනේ දේශපාලන සහ වෙනත් අර්බුද තිබෙන බව. ඒ වාගේම අපිත් එක්ක තරග කරන තායිලන්තයේ ගමනාන්තයක් - destination එකක් - ගැන පසු ගිය මාස කිහිපය තුළ අර්බුද තිබෙනවා. දැනට අවුරුද්දකට, දෙකකට පෙර බාලි දූපතේ අර්බුද තිබුණා. මා හිතන හැටියට ලංකාව ක්‍රම-ක්‍රමයෙන් ඉතාම සුරක්ෂිත සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් වේගන එනවා. ඒක අපි රැක ගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපේ විදේශ සේවකයන් එවන මුදල් ප්‍රමාණය, ඒ සංචිතය දිනපතා වැඩි වනවා. තමුන්නාන්සේලා දන්නවා, පසු ගිය මාසයේ කටාර් රාජ්‍යයේ එමීර්තුමා මේ රටට ආව බව. ඊට ඉස්සෙල්ලා ඒ අගමැතිතුමා ආවා. ඒ අගමැතිතුමාගේ පරිවාර ඇමතිතුමා හැටියට මායි කටයුතු කළේ. එතුමන්ලා ඉතාම සුභදව කිව්වා, "අපි මේ වාගේ දෙ ගුණයක් ලාංකිකයන් ගන්න කැමැතියි. අපි ලංකාවට කැමැතියි. ලංකාවේ ආයෝජනය කරන්න කැමැතියි" කියලා. තමුන්නාන්සේලා දන්නවා, කටාර් රාජ්‍යය කල්පිටියේ හෝටල් තුනක් ඉදි කරන බව. මීගමුවේ සිට, එහෙම නැත්නම් කටුනායක සිට කල්පිටිය දක්වා අධිවේගී මාර්ගයක් ඉදි කිරීම ගැන හෙට හෝ අනිද්දා අපි සාකච්ඡා කරනවා. ඒ මාර්ගය ඒ ගොල්ලෝ වියදම් කරලා හදනවා. ඒ වාගේම convention centre

එකකුත් හදනවා. කොළඹ ලොකු හෝටලයක් සහ mall එකක් හදන්න අපෙන් site එකක් ඉල්ලා තිබෙනවා.

ඉතාම වැදගත් දේ තමයි යම් රටක ආර්ථිකය කෙරෙහි විශ්වාසයක් තිබෙනවාද, නැද්ද කියන එක. Eurozone අර්බුදය නිසා කඩා වැටෙන ග්‍රීසිය, ඉතාලිය, ස්පාඤ්ඤය, පෘතුගාලය යන රටවල ආර්ථිකය තිබෙන්නේ ආර්ථික පදනමක් මත නොවෙයි, විශ්වාසය මත. රටක ආර්ථිකයට ඉදිරියට යන්න පුළුවන් ශක්තියක් තිබෙනවාද, ඒකට හොඳ පදනමක් තිබෙනවාද, ඉදිරියට යන්න පුළුවන් කර්මාන්ත තිබෙනවාද, සංචාරක කර්මාන්තය, කෘෂි කර්මාන්තය වැනි අංශ ඉදිරියට යනවාද, නැද්ද කියන එක ගැන ජාත්‍යන්තර විශ්වාසයක් තිබෙනවාද, නැද්ද කියන එක තමයි ආර්ථිකයක් රැක ගන්නා ප්‍රධානම කාරණාව. මේ ආර්ථික අර්බුදයේ මුහුණුවර තමයි ඒ රටවල ආර්ථික අනාගතය ගැන විශ්වාසයක් නැති වීම. ඒ රටවල ආර්ථික කළමනාකරණය ගැන විශ්වාසයක් නැහැ. දේශපාලන වශයෙන් ඉල්ලීම්වලට යටත් වෙලා, යටත් වෙලා ග්‍රීසි රාජ්‍යය දේශපාලන ගුණ්ඩු කොයි තරම් දෙන්න පටන් ගත්තාද කිව්වොත්, ඒ ආර්ථිකය සමබර තත්ත්වයකින් ගෙන යන්න බැරි වුණා.

දැන් අපි බලමු, අපේ රජය කෙරෙහි විශ්වාසය තිබෙනවාද, නැද්ද කියන එක. ඒකට සාධක තිබෙන්න ඕනෑ. අපට නැඟිටලා නිකම් කියන්න බැහැ, "විශ්වාසයක් නැහැ, විශ්වාසයක් නැහැ" කියලා. ඒක කවුරුත් පිළිගන්නේ නැහැ. ඒකට සාධක තිබෙන්න ඕනෑ.

බලන්න, අපේ ආර්ථිකය කෙරෙහි විශ්වාසය තබන මේ සාධක දිහා. පළමුවන සාධකය හැටියට මා තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, රටවල තිබෙන rating agenciesවල තත්ත්වය. අපේ රටවල ආර්ථික තත්ත්වය ගැන, අනාගතයට මුහුණ පාන්න තිබෙන ශක්තිය ගැන ඒ ගොල්ලෝ ඉතාම දැඩි ලෙස, සමහර විට කෲර විධියට කියන්න පුළුවන්. ඉස්සර අපි කියනවා, "බලන්න, මේ ගොල්ලෝ කොච්චර හොඳට ඇමෙරිකාවට ලකුණු දෙනවාද, යුරෝපීය රටවලට ලකුණු දෙනවාද" කියලා. අපි ඉස්සර පුරුදු වෙලා සිටියේ එහෙම නේද? Rating agencies ඒ රටවල ආර්ථිකයට දේවත්වයෙන් පිදුවේ. නමුත් අද ඔබාමා rating agenciesවලට බණිනවා, "අපේ ඇමෙරිකාව මෙච්චර අසාර්ථකයි කියලා ඔබතුමන්ලා කියන්නේ ඇයි?" කියලා. එහෙම නේද මන්ත්‍රීතුමා? ඔබාමා අහනවා, "ඇයි, මට මෙච්චර නරක rating එකක් දීලා තිබෙන්නේ" කියලා. Eurozone එකේ ratings බින්දුවටම බැහැලා, negative territory එකට යනවා. නමුත් ලංකාවේ එහෙම නැහැ. අපි, B plus. ඉස්සර තත්ත්වයත් එක්ක බැලුවාම දැන් අපි ඊට වඩා හුඟක් ඉහළට ඇවිල්ලා තිබෙනවා. අපේ sovereign rating එක විතරක් නොවෙයි, රජයක් හැටියට අපට තිබෙන ආයතනවල ratings පවා ඉහළට ගිහින් තිබෙනවා. බලන්න, අපේ බැංකුවල ratings කොපමණ ඉහළට ගිහින් තිබෙනවාද කියලා. බලන්න, අපේ ලොකු කොම්පැනිවල ratings ඉහළට ගිහින් තිබෙනවාද, නැද්ද කියලා. ඉතින් මේ සාධක අනුව තමයි අපි අපේ ආර්ථිකය දිහා බලන්න ඕනෑ.

ඊ ළඟට IMF එක ගැන බලන්න. IMF එක මුදල් දෙන එක එක කාරණයක්. ඒ ගොල්ලන්ගේ surveillance function වන විධියක් තිබෙනවා. ඒ ගොල්ලන්ගේ විමර්ශන අංශයක් තිබෙනවා. අපි ඒ ගොල්ලන්ගෙන් සල්ලි ගත්තත්, නැතත් ඒ විමර්ශන අංශය එක්ක අපි අත්සන් කරලා යම් කරුණුවලට එකඟ වෙලා තිබෙනවා. ලෝකයේ ඔක්කොම රටවල් ඒ විධියට අත්සන් කරලා තිබෙනවා. IMF එක කිව්වා, යුරෝපයේ රටවල් හොඳට වැඩ කරන්නේ නැහැ කියලා. IMF එක කිව්වා, ඇමෙරිකන් ආර්ථිකය හොඳට වැඩ කරන්නේ නැහැ කියලා. ඒක ඒ ව්‍යවස්ථාව යටතේ ඒ ගොල්ලන්ගේ යුතුකම. ඒ ගොල්ලෝ ලංකාව ගැන මොකද කියන්නේ? ලංකාව ගැන ඉතාම හොඳ සහතිකයක් දුන්නා. අපි දෙගොල්ලන් අතර යම් යම් ප්‍රශ්න ඇති කරන්න පුළුවන්. හොඳ විවාදයක් ඇති කර ගන්න පුළුවන්. මතභේද තියා ගන්න පුළුවන්. තමුන්නාන්සේ කොහොමද කියන්නේ? IMF එක මගෙත් එක්ක පුද්ගලිකව සාකච්ඡා කරලා තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒවා පුද්ගලික සාකච්ඡා?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පුද්ගලික කියන්නේ, IMF කණ්ඩායම මගෙත් එක්ක නිල වශයෙන් සාකච්ඡා කරලා මටම වාර්තා කළා, මේ ආර්ථිකය ගැන ඒ ගොල්ලෝ හිතන්නේ කොහොමද කියලා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම නම් සල්ලි දෙන්න ඕනෑ නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
සල්ලි ප්‍රශ්නය ගැන මම තමුන්නාන්සේලාට කියන්නම්. ඇත්ත වශයෙන්ම අපි දැන් කල්පනා කර ගෙන යනවා IMF එකේ අන්තිම tranche දෙක, නැත්නම් අන්තිම සලාක දෙක අපි ගත යුතුද, නැද්ද කියලා. ඒ තීරණය අපිට ගන්න පුළුවන්. It is a sovereign decision.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
No.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපේ රටේ අපට ගන්න පුළුවන්. [බාධා කිරීමක්] ඔව්. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක අපේ තිබුණා. කරුණාකරලා අහ ගන්න. මම තේරුම් කරලා දෙන්නම්. තමුන්නාන්සේලා අර්ධ වශයෙන් දන්න අය. අපි මුළු කථාවම දන්න අය. අපි IMF එක - [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අපි දන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම කියන දේ අහ ගන්න කෝ. මම IMF එක සමඟ නිල වශයෙන් සාකච්ඡා කරපු කෙනෙක්. මේ වැදගත් පාර්ලිමේන්තුවට මම ඒ කාරණාව ඉදිරිපත් කරනවා. ඒ වගකීම මම ගන්නවා. මොකක්ද ඒ ගොල්ලෝ කියන්නේ? We have to unbundle it. මේකේ එක එක කෑලි තිබෙනවා. පළමුවැනි කෑල්ල තමයි තමුන්නාන්සේලා ලොකුවට සද්ද කරන මේ අන්තිම tranche දෙක අපි ගත යුතුද, නැද්ද කියන එක. අපි 2009 වර්ෂයේත් 2010 වර්ෂයේත් මේ මුදල ගැන සාකච්ඡා කරන වෙලාවේ අර මම මුලින්ම කියපු විශ්වාසය පිළිබඳ ප්‍රශ්නය තමයි ආවේ. අපිට අවශ්‍ය

[ගරු ආචාර්ය) සරත් අමුණුගම මහතා]

වුණා රටක් හැටියට සැලකිය යුතු මුදලක් අපේ account එකේ තියා ගන්න. ඒක පාවිච්චි කළත් නැතත්, අපිට ලෝකයට කියන්න පුළුවන් වුණා, "we are creditworthy; we are not a risk" කියලා. මොකද, අඩු ගණනේ ඇමෙරිකන් ඩොලර් බිලියන 2.6ක් අපිට ගන්න පුළුවන්. ඒ හින්දා අපිව විශ්වාස කරන්නය කියලා. ඔක්කෝම විශ්වාස කළා. අපේ sovereign bondsවලට අපිට සල්ලි හම්බ වුණා. අපේ සංචාරක ව්‍යාපාරයෙන් සල්ලි හම්බ වුණා. විදේශවල වැඩ කරන අයගේ සල්ලි හම්බ වුණා. ඇත්ත වශයෙන්ම අපේ අපනයන ප්‍රමාණය වැඩි වුණා. ඊට වඩා වැඩි වුණා නම් අපි සතුටු වෙනවා. නමුත් ඒක වැඩි වුණා. අපේ සේවා අංශය වැඩි වුණා. එතකොට අපි හිටියේ 2009 වර්ෂයේ සල්ලි ගන්න වෙලාවේ හිටපු තත්ත්වයේ නොවෙයි. ඒ කාලයේ අපි දුප්පත් කියලා කියන්න පුළුවන්. දැන් අපි පොහොසත්. දුප්පත් මිනිසෙකු ණය දිහා බලන විධියට පොහොසත් මිනිසෙකුට බලන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේලා ආයෝජනයක් කර ගෙන යනවා නම් ඒ ආයෝජනයෙන් ආදායම් ලැබෙනවා නම්, එතකොට බැංකුවකට වුණත් අනවශ්‍ය පොලියක් ගෙවන්න ඕනෑ නැහැ කියලා අපිට කියන්න පුළුවන්. ඒක ගැන අපි තවම අවසාන තීරණයක් අරගෙන නැහැ. අපි සාකච්ඡා කරලා බලලා තීරණයක් ගන්නවා. මොකද, ඒකෙ ඇතුළේත් යම් යම් ප්‍රශ්න තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව මිනිත්තු දෙකක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මට තව විනාඩි කිහිපයක් හම්බ වෙනවා අපේ පැත්තෙන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එතකොට අපි ඒකට ගියාම අපිට වැඩි පොලියක් ගෙවන්න වෙනවා. ඒක තමයි ඒකේ ක්‍රමය. පොලී අනුපාතය වැඩි වන එක. ඒකත් අපි සාකච්ඡා කරලා බලන්න ඕනෑ.

අනෙක් එක අපි බලන්න ඕනෑ, අපිට එහෙම ණය අවශ්‍යද, නැද්ද කියලා. අවශ්‍ය වෙන්නත් පුළුවන් නැති වෙන්නත් පුළුවන්. අපි සාකච්ඡා කරනවා. නමුත් කරුණාකරලා හිතන්න එපා කිසියම් මතභේදයක් මත ඒකේ අනාගතය තීරණය වෙයිද නැද්ද කියලා. එහෙම නොවෙයි. මොකද, IMF එක කියන්නේ තමුන්නාන්සේලා හොඳට දන්නවා, we have to take ownership. ඒ ලැබෙන රට ඒක ගැන තමන්ගේ අයිතිය ප්‍රකාශ කරන්න ඕනෑ. “Take ownership” ඒක තමයි අද IMF එකේ යටින් හැම වෙලාවේම ලියන දේ. එතකොට අපිට කියන්න පුළුවන් ඒක ඕනෑද, නැද්ද කියලා. එතකොට ඒ ප්‍රශ්නය විශ්වාසය පිළිබඳවයි. තව දේවල් තිබෙනවා. අපේ බැඳුම්කර ගත්තොත්, කරුණාකරලා බලන්න බැඳුම්කරවල පොලිය. ඒ වාගේම තිබෙනවා trust funds. මේ රටේ stock market එකේ වෙන්න පුළුවන්, එක්කෝ වෙන විධියකට ආයෝජනය කරන අය- [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කෝටි දෙකහමාරක් අරගෙන.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ ගොල්ලොත් බලනවා මේවා ගැන විශ්වාසයක් තියන්න පුළුවන්ද කියලා. දැන්- [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Hon. Minister -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉන්න මම කියන්නම්. - [*Interruption.*] I will explain it.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
There is a massive drop - [*Interruption.*]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් මේකයි තත්ත්වය. Stock market එක - [බාධා කිරීමක්] බැහැපු එක අභියෝගයක්. මම නැහැයි කියන්නේ නැහැ. අප තව ඒක පරීක්ෂා කර බලන්නට ඕනෑ. නමුත් මා තමුන්නාන්සේලාට මෙය කියන්න ඕනෑ. අපේ රට හොඳ ස්ථාවරයක තිබෙනවා. ආර්ථික වශයෙන් විශ්වාසයක් තිබෙනවා. නමුත් අපට අනාගතයේදී අර්බුද තිබෙනවා. අර්බුද දිහා බලා ගෙන ඒවා කළමනාකරණය කරන්නට මහන්සි වන්නට ඕනෑ. මොනවා ද අපට තිබෙන ඉදිරි තර්ජන? අපට විතරක් නොවෙයි. ලෝකයටම ඉදිරි තර්ජන තිබෙනවා. පළමු වන එක තමයි තෙල් මිල. දැන් අප සැලසුම් හදනවා. සමහරවිට තෙල් බැරලයක මිල ඩොලර් අනූවක් වෙයි. උපරිමයකට ගියොත් ඩොලර් සියයක් වෙයි කියා අප ගණන් හදනවා. අප විතරක් නොවෙයි. ලෝකයම ගණන් හදනවා. ඉන්දියාවත් ගණන් හදනවා. චීනයත් ගණන් හදනවා. ජපානය අපට වඩා ගණන් හදනවා. හැම රටක්ම ගණන් හදනවා. නමුත් අද මැද පෙරදිග අස්ථාවර තත්ත්වයක් තිබෙනවා. පෙරේදා මම පුවත්පත් සාකච්ඡාවක් අහගෙන හිටියා. එක පුවත්පත් ලේඛකයෙක් Arab Union එකේ Secretary-General ගෙන් අහනවා, ලිබියාවට එක විධියකටත් සිරියාවට තවත් විධියකටත් සලකන්නේ ඇයි කියලා. Arab Union එකේ Secretary-General ගෙන් අහනවා, ඔහුගේ මතයේ හැටියට එහෙම සලකන්නේ ඇයි කියලා. Arab Union එකේ Secretary-General කියනවා, ලිබියාවේ තෙල් තිබෙනවා; සිරියාවේ තෙල් නැහැයි කියලා. මෙන්න ඔහු දුන්න උත්තරය. මෙහෙම කියන්නේ නිකම් අහක යන කෙනෙක් නොවෙයි Arab Union එකේ Secretary-General. එතකොට අද මුළු ලෝකයටම තෙල් ප්‍රශ්නයකට මුහුණ දෙන්නට වෙලා තිබෙනවා. අපට නැහැයි කියන්නට බැහැ. අපටත් මුහුණ දෙන්නට වෙනවා. අප ඒක කළමනාකරණය කරන්නට ඕනෑ. ඒක එක කාරණයක්.

දෙවන කාරණාව, අප ආර්ථික වශයෙන් හොඳ තැනක ඉන්නවා, විශේෂයෙන්ම අපේ රජය කෘෂිකර්මාන්ත අංශයෙන් ආයෝජනය කළ නිසා. අද වෙනත් රටවල් තෙල් අර්බුදයට

අමතරව ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙනවා. ඒ තමයි ආහාර ප්‍රශ්නය. ඉන්දියාව අරගෙන බලන්න. අප්‍රිකාවේ රටවල් ඔක්කොම අරගෙන බලන්න. ඒ හැම රටකටම එක පැත්තකින් තෙල්වලින් පහර කන්නට වෙනවා. අනෙක් පැත්තෙන් ආහාර ප්‍රශ්නය. ආහාර ප්‍රශ්නය හුඟක් දුරට සමනය කරන්නට පුළුවන් රටක් අපේ රට. අපේ රටේ අද සහල් ප්‍රශ්නයක් නැහැ.

අපේ හිතවත් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ කාලයේ විශ්වවිද්‍යාලයේ හෝ ඉස්කෝලයේ ඉන්නට ඇති. අපේ ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමාට නම් හොඳට මතක ඇති. ඒ කාලයේ ලංකාවේ දේශපාලනය කියන්නේ හාල් දේශපාලනය. හාල් වැඩියෙන් දෙන්නේ කවුද එයා දිනනවා. අන්න ඒ වාගේ තත්ත්වයක මේ රටේ දේශපාලනය තිබුණා. ඉස්සර ඕනෑම පක්ෂයක manifesto එකක් හදනකොට ඉස්සෙල්ලාම අංක 1ට දමන්නේ, හාල්. දැන් එහෙම දෙයක් නැහැ. පක්ෂයක් හැටියට නොවෙයි, ඒ ගැන අප සියලු දෙනාම සතුටු වන්නට ඕනෑ. මේ රට ස්වයංපෝෂිත රටක්. මේ අවුරුද්දේ අප සහල් පිට රට යවන්නටත් ලැහැස්ති වෙනවා. ඒ ගැන අප ආඩම්බර වන්නට ඕනෑ. අපට හාල් ප්‍රශ්නයක් තිබුණා නම් තමුන්නාන්සේලාට හිතා ගන්නට පුළුවන්, කොයි තරම් අර්බුදයක් ඇති වෙයිද කියලා.

අද ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කරමින් කිව්වා, අපේ රටේ සල්ලි පිට රටට ඇදී ගෙන යනවාය කියා. ඇත්ත තමයි අපේ රටේ සල්ලි සමහර අනවශ්‍ය දේවලට ඇදී ගෙන යනවා. එකක් තමයි පිටි කිරි. අපේ මුදල්වලින් විශාල ප්‍රමාණයක් පිටි කිරිවලට පිට රටට ඇදී යනවා. මා ළඟ සංඛ්‍යාලේඛන තිබෙනවා. සීනි, පිටි කිරි අද අත්‍යවශ්‍ය දේවල් හැටියට සලකනවා. අර ඉස්සර සහල්වලට තිබුණු තැන තමුන්නාන්සේලා දැන් මහන්සි වෙලා කොහොම හරි පිටි කිරිවලට හෝ සීනිවලට කරකවලා දමනවා. රැස්වීම්වල ගිහින් කථා කරන්නේ මොනවා ද? තමුන්නන්සේලා කියනවාද මේවා ගෙන්වන එක වහාම නවත්වන්නය කියලා. තමුන්නාන්සේලා එකඟද අප දේශීය නිෂ්පාදන වැඩි දියුණු කරන්නටය කියා පිටිකිරි සහ සීනිවලට තහනමක් දමනවාට? නැහැ. වේදිකාවල බෙරිහන් දෙනවා. එක කාලයක් අපට මතකයි, -ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමාට හොඳට මතක ඇති.- එක්සත් ජාතික පක්ෂයේ වේදිකාවල පාන් රාත්තල් ගෙනැවිත් වීසි කළා. ඒ රැස් වුණු ජනයා අතරට පාන් රාත්තල්වලින් දමා ගැහුවා. මොකද, පාන් දේශපාලනය. තමුන්නාන්සේලාට මත දෙකක් කියන්න බැහැ. එක්කෝ- [බාධා කිරීමක්] දෙකෙන් එකයි කියන්න පුළුවන්. එක්කෝ කියන්න, ඕනෑ මුදලක් දාලා, බද්දක් ගහලා - [බාධා කිරීමක්] එක්කෝ කියන්න, ඕනෑ දෙයක් කරලා අපේ දේශීය නිෂ්පාදනය වැඩි කරන්නය කියලා. එහෙම නැත්නම් මේවා අඩු කරන්නය කියලා කෑ ගහන්න. ඒ මත දෙකම එක වෙලාවේ කියන්න බැහැ. තමුන්නාන්සේලාගේ කොටස් තිබෙන බව අප දන්නවා. එක කොටසක් පාන් අඩු කරන්නය කියලා කියන්න පුළුවන්. තව කොටසක් වැඩි කරන්නය කියලා කියන්න පුළුවන්. තව කොටසක් තහනම් කරන්නය කියලා කියන්න පුළුවන්. ඔළු ගෙඩි හතරක් පහක් තියෙනකොට ඒ එක එක ඔළු ගෙඩියෙන් මොනවා කියනවාද කියා අප දන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය අප දන්නේ නැහැ.

අපේ ප්‍රතිපත්තිය නම් පුළුවන් තරම් දේශීය වශයෙන් අපේ රටේ හදා ගන්න පුළුවන් දේවල් රැක ගන්නා එකයි. විශේෂයෙන්ම අපට මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කර ගන්න බැහැ. තමුන්නාන්සේලාගේ යාළුවෝ බොහොම ඉස්සර පක්ෂයට දුන්නු සල්ලිවලින් එක සිරිකොතක් නොවෙයි සිරිකොතවල් 10ක් හදන්න තිබුණා. නවසීලන්තයෙන්, ඕස්ට්‍රේලියාවෙන් කිරිපිටි ගෙන්වන අය තමයි, ඒ. දැන් නම් ටිකක් ඒ අය තරහ වෙලයි ඉන්නේ. ඉස්සර මේ රටේ කිරිපිටි monopoly එක තිබුණේ කාටද? ඇන්කර් ගෙන්නුවේ කවුද? පොන්ටෙරා කාගේද? ඒ අය ඉස්සර තමුන්නාන්සේලාගේ ගජ මිතුරෝ නේද? දැනුත් තවම කණ්ඩායමක ගජ මිතුරෙක් නේද? එහෙම තමයි. අපි යථාර්ථයට මුහුණ දෙන්න ඕනෑ. කිරිපිටි ගෙන්වනවාට අකැමැති අය ගොඩක් හිටියා. නමුත් අපේ ප්‍රතිපත්තිය ඒක නොවෙයි. අපේ ප්‍රතිපත්තිය පුළුවන් තරම් මේ රට කෘෂිකාර්මික අංශයෙන් දියුණු කරන එකයි. අපි සහල්වලින් ස්වයංපෝෂිත වුණා වාගේම කිරිපිටි සහ සීනි ආදී දේවලුත් පුළුවන් තරම් මේ රටේ නිෂ්පාදනය කරනවා. තමුන්නාන්සේලාට මතක ඇති, ඉස්සර ජේ.ආර්. ජයවර්ධන මහත්මයා, ඩඩ්ලි සේනානායක මහත්මයාට හිනා වුණා, මොනවාද මේ කරන්නේ කියලා. දැනුත් ඇතුළේ එක එක දේවල් ඇති. නමුත් අපේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එක අපි කියන්න ඕනෑ. ඒ, ආහාර ප්‍රශ්නය ගැනයි. තෙල් ප්‍රශ්නයේදී අපි අසරණයි. ආහාර ප්‍රශ්නයේදී අපි අසරණ නැහැ. ඊළඟ එක තමයි මූල්‍යමය ප්‍රශ්නය. [බාධා කිරීමක්] ඒකට මුහුණ දෙන්නේ කොහොමද? ඉන්නකෝ පොඩ්ඩක් මම කියනකම්. ඒක නේ කියන්න හදන්නේ. අපි හංගන්නේ නැහැ. අපේ ප්‍රතිපත්ති පැහැදිලිව අපට කියන්න පුළුවන්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමනි, ඔබතුමා අහගෙන හිටියේ නැහැ නේ, සියයට 80ක් හාල් පිටි දමලා පාන් හදනවාය කියන -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

තමුන්නාන්සේ මම කියන දේවලුත් අහගන්නකෝ. පොතේ තිබෙන දේවල් විතරක් කියලා බැහැ. තමුන්නාන්සේට මම ලෙනින්ගේ පාඨයක් කියන්නම්. ලෙනින් කිව්වා, "හුඟ දෙනෙකුට පොතෙන් ඇහෙන හඬ ඇහෙනවා. නමුත් වීදියෙන් ඇහෙන හඬ ඇහෙන්නේ නැහැ. - You can hear the sound of the book, but you are not sensitive enough to know the sound of the street". කියා. තමුන්නාන්සේලා ඔක්කොටම පොතේ හඬ හොඳින් ඇහෙනවා. නමුත් මේ රටේ වීදියේ දූ දරුවන්ගේ අනාගතය ගැන හඬ ඇහෙන්නේ නැහැ. අන්න ඒකයි වෙනස. අන්න ඒකයි තමුන්නාන්සේලාගේ පක්ෂයේ වෙනස. අර්බුදය ඒකයි. පොත හරි. හඬ වැරදියි. වීදියෙන් එන හඬ අවබෝධ කර ගන්න බැහැ. දැන් අපේ මූල්‍යමය ප්‍රතිපත්ති ගැනත් කියන්න ඕනෑ. එක එක රටේ වෙන වෙනම ස්වරූප තිබෙනවා. ඒවා ආර්ථිකයේ සුවිශේෂ ලක්ෂණ. එක පැත්තකින් අපේ තෙල් මිල. අපේ exchange rate එක අනුව තෙල් සඳහා විශාල මුදලක් ගෙවන්න වෙනවා. තවත් පැත්තකින්, ණය කොටස් ගෙවනකොට අපේ exchange rate එක මොකක්ද කියා බලන්න ඕනෑ. මේ රටට බඩු ගෙන්වනකොට exchange rate එක මොකක්ද කියා බලන්න ඕනෑ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, හොඳින් හිතේ තියා ගන්න අපේ රට අවුරුදු 30ක යුද්ධයකින් පසුව හදන රටක්. මේ රටේ මිනිස්සුන්ටත් සහනයක් තිබෙන්න ඕනෑ. අවුරුදු 30ක් motorbike එකක් ගන්න බැරුව හිටපු මිනිහෙක් motorcycle එකක් ගත්තාම මොකක්ද තිබෙන වැරැද්ද? මැදපෙරදිග ගිහින් හම්බ කර ගත්තු ඒ මිනිහා සම්පූර්ණයෙන්ම කපා දමන්නය කියාද කියන්නේ? යම්කිසි විධියක සහනදායී ප්‍රතිපත්තියකට අපි යන්න ඕනෑ. ඔබතුමන්ලාගේ වීරයෙක් ඉන්නවා, රොනල්ඩ් රීගන් කියලා. මොනවාද එතුමා කිව්වේ? "We never had it so good". යුද්ධයකින් පසුව අපිත් ටිකක් අපේ ජනතාවට ඉන්න ඉඩ දෙන්න ඕනෑය කිව්වා. හොඳින් කාලා, හොඳින් ඇඳලා, motorcycle එකක ගිහිල්ලා, three-wheeler එකක් අරගෙන, telephone එකක් අරගෙන ජීවත් වෙන්න ටිකක් අවස්ථාව දෙන්න ඕනෑ. අපේ බදු ක්‍රමය තුළින් අපි ඒ අයට එක්තරා සහනයක් ලබා දෙන්න ඕනෑ. අනික් අතට ඔබතුමන්ලා කියනවා වාගේ යථාර්ථයට මුහුණ දෙන්නත් ඕනෑ. මේ දෙක balance කර ගෙන තමයි අපි යන්න හදන්නේ. අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අපි මේ ප්‍රශ්නය

[ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා]

හොඳින් විග්‍රහ කරමින්, සංවාදයකට යමින් විවිධ මත ඉවසමින් තමයි අපේ ප්‍රතිපත්ති හදන්නේ. [බාධා කිරීමක්] සමහර විට ඔබතුමා මට වැඩිය ඒ ගැන හොඳින් දන්නවා.

මේ ආර්ථික ප්‍රශ්න ගැන නිතර සාකච්ඡා කරන්න ඕනෑ. විවිධ මත එකිනෙකට ගැටෙන්නට ඉඩ දෙන්න ඕනෑ. මම විශේෂයෙන්ම exchange rate එක සම්බන්ධයෙන් මහ බැංකුවේ නිලධාරින් හම්බ වුණු වෙලාවේ මේක කිව්වා. අපි මේකට නිකම් තර්ක කරන්නේ නැතිව සංඛ්‍යා ලේඛන අනුව බලමු. මේ ගණනට තිබුණොත් මෙන්න අපට වැඩියෙන් ගෙවන්න තිබෙන ප්‍රමාණය; අපේ ණය හැටියට මෙපමණ ගෙවන්න වෙනවා; තෙල්වලට අපට වැඩියෙන් මෙපමණ ගෙවන්න වෙනවා; අපනයන-ආනයන බඩුවලට මෙපමණ ගෙවන්න වෙනවා කියා ඒ සංඛ්‍යා ලේඛන අපට බලන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අපි කල්පනය කරන්න ඕනෑ. අපට කල්පිතව කියන්න පුළුවන් අපේ අපනයන භාණ්ඩවලට, -exports- අඩු exchange rate එක ආවොත්, -වාසිදායක වුණොත්- අපට තව මෙපමණ ලබා ගන්න පුළුවන්ද කියලා. ඒ වාගේම පිට රටවලින් සහ tourismවලින් ලබා ගෙන මේවා වැඩි කර ගන්න පුළුවන්. තමුන්නාන්සේලා දන්නවා, ඒ විධියට සංඛ්‍යා ලේඛන විද්‍යාව අනුව අපට යම් කිසි හෝඩුවාවක් ගන්න පුළුවන් බව. මේ ප්‍රතිපත්ති අනුව මේ විධියට exchange rate එක තිබුණොත් අපට මේ තරමට වාසි අවාසි වෙයි. ඊ ළඟ rate එකට ආවොත් මෙපමණ වාසි අවාසි වෙයි. ඒවා අපි සොයලා බලන්න ඕනෑ. එහෙම නැතිව නිකම්ම මේසයක් උඩට නැඟලා අරක කරන්න ඕනෑ, මේක කරන්න ඕනෑ කිව්වාට කරන්න බැහැ. නමුත් අපි පිළිගන්නවා real economy එක. සංඛ්‍යා ලේඛන වාගේ දේවල් තිබෙනවා. ඒ අතරතුරේ අපි රටේ නියම ආර්ථිකය මොකක්ද කියලා බලන්න ඕනෑ. නියම ආර්ථිකයේ පදනම තමයි exports. මට මතකයි, මම මාසයකට විතර ඉස්සෙල්ලා අමාත්‍යාංශයෙන් සම්මේලනයකට ගියා. එහිදී Nobel Prize එක දිනලා තිබෙන අර්ථ ශාස්ත්‍රඥයකු මට හමු වුණා. හැබැයි ඉන්දියාව ගැන. ඉන්දියාව සහ චීනය අපිත් එක්ක සංසන්දනය කරන්න බැහැ. එතුමාගෙන් ඇහුවා, මොකක්ද ඉන්දියාවේ ආර්ථික අරමුණ වෙන්න ඕනෑ කියලා. එතුමා කිව්වා, "export, export, export" කියලා. එච්චරයි. ඔන්න විසඳුම. ඉන්දියාවට තිබෙන එකම විසඳුම ඒකයි කියලා කිව්වා. අපිත් ඒක ඉගෙන ගන්න ඕනෑ. නමුත් ඔබතුමාම කිව්ව විධියට අපි පුංචි රටක්; පුංචි අභ්‍යන්තර වෙළෙඳ පොළක්. එතකොට අපි මේ තුළ සැලසුම් කරලා, කොහොමද ලෝකයට යන්නේ කියලා සලකා බලන්න ඕනෑ. මම ඔබතුමාත් සමඟ සියයට 100ක් එකඟ වෙනවා. අපේ ආර්ථිකය රට තුළ විතරක් නිකම් බලකොටුවක් වාගේ හදා ගෙන ඒක ඇතුළේ ඉන්න බැහැ. ප්‍රංශය අපිට වඩා ලොකු ආර්ථික ඉතිහාසයක් තිබෙන රටක්. ඒ කාලය ඒ අයගේ ආර්ථික ප්‍රතිපත්තිය තමයි "Fortress France". හැම දේම මේ රටේ නිෂ්පාදනය කරමු, විකුණමු කියන එකයි ඒ අයගේ ප්‍රතිපත්තිය වුණේ. අපිට වඩා ලොකු අභ්‍යන්තර වෙළෙඳ පොළක් තිබුණ රටක්. නමුත් ඒ අයට කරන්න බැරි වුණා. ඉන් පසුව තමයි ඒ අය European Union එකට බැඳුණේ. "Fortress France" කියන ප්‍රතිපත්තිය අසාර්ථක වුණා. ඒ නිසා අපටත් පිළිගන්න වෙනවා. අපේ කර්මාන්තකරුවන්ට, අපේ නිෂ්පාදකයින්ට ලෝකයට යන්න ඉඩ දෙන්න ඕනෑ. තමුන්නාන්සේලා නැහැ කිව්වාට අපි ඉඩ දීලා තිබෙනවා. මම එකින් එක කියන්නම්. අද Damro බලන්න. අද Damro ඒ අයගේ උප ශාඛා හැටකට වඩා ඉන්දියාවේ හදලා තිබෙනවා. ඒ වාගේම අද Aitken Spence බලන්න. ඒ අය අද කොපමණ හෝටල් ප්‍රමාණයක් ඉන්දියාවේ manage කරනවාද? ඒ වාගේම අද Hettigoda Industries (Pvt.) Limited එක බලන්න. කොපමණ දේවල් විකුණනවාද? Hairstyles වාගේ වෙනත් වෙනත් දේවල් ගැන ඔබතුමත් කිව්වා නේ. අපි ඒවාට යන්න ඕනෑ. ඉන්දියාව කියන්නේ ලෝකයේ ලොකුම වෙළෙඳ පොළක්. අපි ඒකට යන්න පුළුවන් ප්‍රතිපත්ති හදන්න ඕනෑ. නමුත් අපට ඊට වඩා අවශ්‍යම දේ තමයි අපි ඒ අයගේ supply chain එකට ඒකාබද්ධ වෙන්න ඕනෑ. ඔබතුමා දන්නවා, චෙන්නායි කියන්නේ අද ආසියාවේම ලොකුම කාර් කර්මාන්ත මධ්‍යස්ථානයක් බවට පත් වෙ ගෙන යන නගරයක් බව. "Detroit of Asia" කියලායි දැන් ඒ අය කියන්නේ. අද Mercedes-Benz, Ford and Chevrolet වාගේ ඔක්කොම හදනවා චෙන්නායිවල. ඉස්සර මද්‍රාසිය. එතකොට අපට ලේසියි, අපට ඒකට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ අයගේ ටයර් කර්මාන්තයට අපේ රබර් සම්බන්ධ කරන්න පුළුවන්. අපේ විවිධ කර්මාන්තවලට ඒවාට සම්බන්ධ වෙන්න පුළුවන්.

අද අපේ construction industry එක ඉතාම ඉහළ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි විවෘත අපනයන ආර්ථිකයට යෑම ඉතාම අවශ්‍යයි. ඒක කරන්න පුළුවන්. අපේ ජනතාව ගැන, business කරන අය ගැන, ව්‍යාපාරිකයෝ ගැන අපි හොඳ විශ්වාසයක් තියන්න ඕනෑ. අන්න ඒකට අපි යනවා. අපට යන්න පුළුවන්. මොකද, ඒ අයට එහේ ගිහින් වැඩ කරන්න අපට විදේශ විනිමය තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් small and medium enterprises. මේ රටේ ජනතාවට දියුණු වෙන්න හුඟක් අවස්ථා ලබා දෙනවා. තමුන්නාන්සේලා දන්නවා, ගිය අවුරුද්දේ අපේ ණය ප්‍රමාණය සියයට 33කින් වැඩි වුණු බව. අපි ණය ලබා දුන්නා. දැන් ණය ප්‍රමාණය අඩු කරන්න හදනවා. ඒ ණය නිසා නේද පොඩි boutiques, shops අරවා මේවා හදලා තිබෙන්නේ. ඒක ඔබතුමා පිළිගන්නවා නේ. කොළඹ ඕනෑ තැනකට ගිහින් බලන්න. [බාධා කිරීමක්] ආණ්ඩුවේ ඒවාටත් ණය දීලා තිබෙනවා. නව නිපැයුම්වලට, නව සාප්පුවලට, නව වෙළෙඳ පොළවලට අපි ණය දීලා තිබෙනවා. ඒවා නැහැ කියන්න බැහැ.

ලංකාව ලස්සන තැනක්. හොඳ ලස්සන කඩ තිබෙනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා මම මේ සභාවට ආවේ තල් ගස් ගැන, තුත්තිරි ගස් ගැන, දෙල් ගස් ගැන කථා කරන්න නොවෙයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට තුත්තිරි ගස්වල එල්ලෙන්න කාලය ඇවිත් තිබෙනවා. තමුන්නාන්සේලාට තුත්තිරි ගස් ඉතාම අවශ්‍යයි. මොකද, එල්ලෙන්න දෙයක් නැහැ නේ. තුත්තිරි ගහේ හරි එල්ලෙන්න ඕනෑ. [බාධා කිරීමක්] අපට තුත්තිරි ගස් ඕනෑ නැහැ. අපි මෙතැනට ඇවිත් සිටින්නේ තුත්තිරි ගස් ගැන කථා කරන්න නොවෙයි. ඒවා තමුන්නාන්සේලාට අවශ්‍යයි, ඒවායේ එල්ලෙන්න ඕනෑ.

අද බැංකු ගැන බලන්න. අද බැංකුවලට කොච්චර හොඳ ratings ලැබිලා තිබෙනවාද? අද වෙන රටවල බැංකුවලට ලොකු ප්‍රශ්න තිබෙන වෙලාවක් මේ. අප රටේ හොඳ ශක්තිමත් බැංකු ක්‍රමයක් ඇති වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ට තවත් නීතිරීති දමලා තිබෙනවා.

අවසාන වශයෙන් මා මූලික තේමාවට එනවා. මේ සභාව කල් තැබීමේ විවාදයේ ප්‍රධාන දේ මේ රටේ ආර්ථිකය ගැන, අපේ කළමනාකරණ ශක්තිය ගැන විශ්වාසයක් තිබෙනවාද නැද්ද කියන එකයි. මා අද ඉදිරිපත් කරපු සියලුම සාධක පෙන්වන්නේ විශ්වාසයක් තිබෙනවා කියායි. අපිට විකල්පය හැටියට ඉන්නේ තමුන්නාන්සේලා නේ. අද තමුන්නාන්සේලා තමුන්නාන්සේලාම විශ්වාස කරන්නේ නැහැ. අද තමුන්නාන්සේලා නායකයා කියන කෙනා ඇවිත් කියනවා බේරුවලට වෙන කෙනෙක් - [බාධා කිරීමක්] අපි කියන්නේ අතීතය ගැන නොවෙයි, අද තත්ත්වයයි. කරුණාකර, මට කියන්න තමුන්නාන්සේලා අද විශ්වාස සහගත විකල්පයක්ද කියා. අවංකව හදවතට තට්ටු කර අහන්න. මේ රටේ දුප්පත් මිනිහෙකුට තමුන්නාන්සේලා වාගේ කැඩුණු බිඳුණු කොටසක් විශ්වාසවන්ත විකල්පයක් හැටියට සලකන්න බැහැ. [බාධා කිරීමක්] ඒවා කරයි. මම නැහැ කියන්නේ නැහැ. නමුත් මගේ ප්‍රධාන තර්කය වන්නේ you are not a credible alternative to this Government කියන එකයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Do not say that.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
That is a fact. You may dream. මේ ගරු සභාව තුළ ඕනෑම කෙනෙකුට හීන දකින්න ඉඩ තිබෙනවා. මම නැහැ කියන්නේ නැහැ. අගමැති වන්න එක්කෙනෙකු හීන දකින්න පුළුවන්. මුදල් ඇමති වන්න තව කෙනෙකු හීන දකින්න පුළුවන්. මහ බැංකුවේ අධිපති වන්න තවත් කෙනෙකු හීන දකින්න පුළුවන්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දේශපාලනඥයන්ට කවදාවත් මහ බැංකුවේ අධිපති වන්න ඉඩ දෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක හැම කෙනෙකුගේම අයිතියක්. මේක නිදහස් රටක්. රෑ වෙන කොට තමුන්නාන්සේලා මොනවා කරනවාද කියා අපි දන්නේ නැහැ. නමුත් හීන දකින්න පුළුවන්. ප්‍රධානම දේ තමුන්නාන්සේලා මේ රටේ විකල්පයක් නොවෙයි කියන එකයි. මම නොවෙයි, ඡන්දයකට ගියාම මේ රටේ හැම කෙනාම ඒක ප්‍රකාශ කරනවා. සිරිකොතට ගියාම හැම එක්කෙනාම ප්‍රකාශ කරනවා. බේරුවලට ගියාම හැම එක්කෙනාම ප්‍රකාශ කරනවා. මාළිගාවට ගියාම හැම දෙනාම ප්‍රකාශ කරනවා. මහ නායකවරු හමු වන විට ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලා පසු ගිය සුමානේ පත්තරේට කියලා තිබුණා සම්මේලනය කල් දමලාය කියා. සම්මේලනය ගැනවත් විශ්වාසයක් නැති පක්ෂයකට රටේ විකල්පයක් ගැන හිතන්න පුළුවන්ද? ඒ නිසා සෙල්ලම් කරන්න එපා. තමුන්නාන්සේලා කවුද? තමුන්නාන්සේලා අර කොනිත්තලා යන ජාතියක්. ඕනෑ තැනක යනකොට, බස් එකේ යනකොට කවුරු හරි කොනිත්තනවා. අපි සංවර්ධනය සඳහා ඉදිරියට යනවා. එතකොට ටිකක් කොනිත්තනවා. කොනිත්තන විට සමහර අයට ලොකු සතුටක් ඇති වනවා. නමුත් කවදාවත් තමුන්නාන්සේලා credible Opposition එකක් නොවෙයි. ඒ නිසා අපේ රජය ගැන සියලු දෙනාගේම විශ්වාසයක් ඇති වන විධියට ඉදිරියට කටයුතු කර ගෙන යනවා කියා ආත්ම විශ්වාසයකින් සඳහන් කරමින් වගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 4.45]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ගැන මා කථා කරන අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් දහ දෙනෙකු සිටීම ගැන, එකසිය හැටකින් දහ දෙනෙකුවත් මා කියන දේ අහ ගන්න පැමිණිලා තිබෙන එක ගැන මා හුඟක් සන්තෝෂ වෙනවා. [බාධා කිරීමක්] විපක්ෂයේත් අඩුයි. නමුත් රජයට වැඩිය විශාල ප්‍රතිශතයක් සිටින බව කියන්න අවශ්‍යයි.

ඒ විතරක් නොවෙයි. මම මුලින්ම කියන්න කැමැතියි, මේ රජයට පාර්ලිමේන්තුවට පනත් ගෙන ඒමේ න්‍යාය පත්‍රයක් නැති බව. අපි පසු ගිය මාස 06 ගැන කල්පනා කළොත්, ඇත්තටම අපට මතක් වෙනවාද මේ රජය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගත්ත එක පනතක් ගැනවත්. මතක් වුණොත් මතක් වෙන්නේ අර ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත පමණයි. ඒක නම් මතක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක හැරෙන්නට වෙන එක පනතක් ගැනවත් අපේ සිහියට එන්නේ නැහැ. රෙගුලාසියක් ගෙනාවොත් මුළු දවසක්ම ඒක ගැන මෙතැන අපි විවාද කරනවා. නමුත් න්‍යාය පත්‍රයක් මේ රජයට නැහැ. කිසිම න්‍යාය පත්‍රයක් නැහැ. මේ රජය පනත් කෙටුම්පත් හයක් විතර ඉදිරිපත් කළා, පසු ගිය අවුරුද්ද තුළදී. ඒ හයම වාගේ ඉල්ලා අස් කර ගන්නත් සිදු වුණා. ඉතින් න්‍යාය පුස්තකය බැලුවොත් අනාගතයේදීත් අපට කථා කරන්න පුළුවන් පනතක් නැහැ කියලා කනගාටුවෙන් වුණත් කියන්න අවශ්‍යයි.

අපි ආර්ථිකය පිළිබඳව සාකච්ඡා කරන මෙවැනි අවස්ථාවකදීවත් මුදල් ඇමතිවරයකු පාර්ලිමේන්තුව තුළ නැති බව සම්පූර්ණයෙන්ම පැහැදිලි වෙනවා. එක එක මන්ත්‍රීවරු නැඟිටලා මුදල් ඇමතිතුමා වෙනුවෙන් කථා කරනවා. ඊට පස්සේ අපට කියනවා, "ඒක රජයේ ප්‍රතිපත්තිය" කියලා. නමුත් ඒක ඇත්තටම රජයේ ප්‍රතිපත්තියද, නැද්ද කියලා අපට දැන ගන්න විධියක් නැහැ. විනාඩි ස්වල්පයකට ප්‍රථමයෙන් ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා කථා කරලා කිව්වා, එතුමා මේ රජයේ විනිමය අනුපාතය පිළිබඳව තිබෙන ප්‍රතිපත්තිය එක්ක එකඟ නැහැ කියලා. එතුමා හිතනවා කිව්වා, ස්ථිර විනිමය අනුපාතයක් තිබෙන්න ඕනෑය කියලා. ගරු සරත් අමුණුගම වාගේ ඇමති කෙනෙකුගෙන් මම දැන ගන්නට කැමැතියි, එතුමාත් ඒ ප්‍රතිපත්තිය තුළම ද සිටින්නේ කියලා. මොහොතකට ප්‍රථම එතුමාගේ පැහැදිලි කිරීමෙනුත් අපට දැන ගන්නට ලැබුණු විධියට එතුමා ඒ ස්ථාවරයේම නොවෙයි සිටින්නේ. එතුමා කිව්වා, මේවා ගැන හොයලා බලලා, ගණන් හිලව් බලලා අපි යම් කිසි තීරණයකට එනවාය කියලා. අපි තව ඇමති කෙනෙකුගෙන් ඇහුවොත්, විදේශ විනිමය අනුපාතය පිළිබඳව තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද කියලා, ලැබෙන පිළිතුර වෙනස් එකක්. ඒ ආකාරයෙන් අපි පස් දෙනෙකුගෙන් ඇහුවොත් පිළිතුරු පහක් ලැබෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මා පැමිණියාට පසු අය වැය විවාද තුනක් තිබුණා. ඒ තුනේදීම අපි සාකච්ඡා කරන කොට කිව්වා, පාර්ලිමේන්තුව තුළ මුදල් ඇමති කෙනෙකු සිටිය යුතුයි කියන එක. මොකද, ආර්ථිකය ගැන කථා කරන කොට පැහැදිලි සාකච්ඡාවක් ලබා ගන්න, වාද විවාදයකට ඇතුළු වෙන්න, ප්‍රශ්නයකට පැහැදිලි පිළිතුරක් ලබා ගන්නට අපහසුතාවක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවෙන් සාකච්ඡා කරන්නේ, ලෝක ආර්ථිකයේ යම් කිසි කඩා වැටීමක් තිබෙන නිසා ඒක ලංකාවට ආනයන, අපනයන අතින් බලපාන්නට යන්නේ කොහොමද කියන කාරණයයි. යම් කිසි කඩා වැටීමක් එනවා. මේ රටේම ව්‍යාපාරිකයන් ගිය අවුරුද්දේ ජූලි මාසයේදී යම් කිසි survey එකක් කළා. මේ survey එක කළේ වාණිජ මණ්ඩලය - Chamber of Commerce - විසිනුයි. නීල්සන් සමාගමත් මේ වාගේ සමීක්ෂණයක් කළා. කෘෂිකර්මය, කර්මාන්ත, සේවා, නිෂ්පාදන සියල්ලක්ම මේකට ඇතුළු කළා. බැංකු හා මූල්‍ය ක්ෂේත්‍ර, ගමනාගමන හා සංචාරක, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය, BPO අංශය, තේ, රබර්, පොල් වැනි වතු ක්ෂේත්‍රය, කුඩා වෙළෙඳාම, ආහාරපාන මේ සෑම එකක්ම මේ සමීක්ෂණයට ඇතුළත් වුණා. ඒ අවස්ථාවේදී, ඇහුවා ලෝක ආර්ථිකයේ දැන් තිබෙන තත්ත්වය මොකක්ද කියලා. ඔවුන් කිව්වා, සියයට 30ක් විතර පසුබෑමක් සිදු වෙන්න යනවා කියලා. නමුත් දෙසැම්බර් මාසය වන කොට ඒ ප්‍රශ්නයම ඔවුන්ගෙන් ඇහුවාම පනස් දෙනෙකු විතර කිව්වා, සියයට 50ක

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

විතර පසු බෑමක් වෙන්න යනවා කියලා. ශ්‍රී ලංකා ආර්ථිකය ගැන අහන කොට කිව්වා, ශ්‍රී ලංකා ආර්ථිකය ඇත්තටම දියුණු වෙයි කියලා ජූලි මාසයේදී. නමුත් දෙසැම්බර් මාසයේ ඒ කට්ටියගෙන්ම ඒ ප්‍රශ්නය ඇහුවාම සියයට 21ක් කිව්වා, දියුණු වෙයි කියලා. ඉස්සරවෙලා කිව්වා සියයට 60ක් කියලා. මාස හයක කාලයක් තුළ දී විශාල පසුබෑමක් සිදු වී ගෙන යනවා.

අපි මේ සභාව කල් තැබීමේ යෝජනාව සාකච්ඡා කරන්නේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න නොවෙයි. මේ රටේ ආර්ථිකය ගැනත්, මේ රටේ සාමාන්‍ය ජනතාව ගැනත්, ඔවුන්ගේ ආර්ථිකය ගැනත් අපටත් යම් කිසි හැඟීමක් තිබෙන නිසායි. කඩා වැටීමක් පෙනි පෙනී තිබෙන කොට ඒ ගැන කථා කරන්නේ කවුරුවත් අපහසුතාවට දමන්න නොවෙයි. ඒ තුළින් රජයට යම් කිසි පියවර ගන්න කියන අදහසින් තමයි අපි මේ දේවල් ඉදිරිපත් කරන්නේ. මේ සමීක්ෂණයේදී අපි ඔවුන්ගේ මිල දර්ශකය ගැන ඇහුවාම තුනෙන් එකක් විතර කිව්වා මිල දර්ශකය වැඩි වෙයි කියලා. අද සියයට 70ක්ම කියනවා මිල දර්ශකය වැඩි වෙමින් පවතිනවා; මුළු අලෙවි ප්‍රමාණය අඩු වනවා කියලා. සියයට 8ක් කිව්වා ආයෝජනය කරන්නේ නැහැ කියලා. දැන් සියයට 20ක් කියනවා ආයෝජනය කරන්නේ නැහැ කියලා. ඔවුන් කියපු ප්‍රධාන කරුණුවලින් එකක් තමයි නීති, රෙගුලාසි, පිළිවෙත් නොමැතිව හදිසි වෙනස්වීම් නිසා ඔවුන්ට ආයෝජනය කරන්න අපහසුතාවක් තිබෙනවාය කියන එක. ඒ වාගේම සුදුසු හැකියාවන් සහ පුහුණුව සහිත මානව සම්පත රට තුළ නැහැයි කියන එක දෙවැනි කරුණ හැටියට ඔවුන් එහි සඳහන් කර තිබෙනවා.

තුන්වැනි කරුණ හැටියට සඳහන් කර තිබෙන්නේ රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති අපැහැදිලියි, අස්ථාවරයි කියන එකයි. හතරවැනි කරුණ හැටියට නිලධාරිවාදය නිසාත් ඒ ආයෝජනයට යම් කිසි අවහිරතාවන් රාශියක්ම තිබෙනවා කියලා සඳහන් කර තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ගැන. ඒ පනතේ බලපෑම ගැන ඇහුවාම සියයට 73ක් කිව්වා, මේ පනත ආයෝජනයට අහිතකරයි කියලා. අපි මේ පනත ගැන කථා කරන්නේ කාගේවත් පෞද්ගලික ව්‍යාපාර නිසා නොවෙයි. අපි මේ පනත ගැන කථා කරන්නේ ලංකාවේ ආයෝජනයට ඒක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන නිසායි. විශ්වාසය කඩා වැටිලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා, "ඔබ ආයෝජනය කරන්න තීරණය කරපු දේවල් කර ගෙන යනවාද, නැද්ද" කියලා. ඒ අයගෙන් තුනෙන් එකක් කිව්වා "අපි ආයෝජනය කරන්න යන එක වහාම අත් හිටුවනවා" කියලා. සියයට 27ක් කිව්වා "ඒක නැවත සෝදිසි කරලා, කල්පනා කරලා බලන්න අවශ්‍යයි" කියලා. ඒ පනත සම්මත කිරීම නිසා පසු ගිය දෙසැම්බර් මාසය තුළ සියයට 60ක වෙනස් වීමක් ඇති වෙලා තිබෙනවා. අපි මේ කරුණු නැවත නැවත කියනවා. මම හිතන්නේ මේවා වැදගත් නැහැයි කියලා, අද ගරු සරත් අමුණුගම ඇමතිතුමා ලොකු විග්‍රහයකට ගියා. ඒ විග්‍රහය තුළ එතුමා නොයෙකුත් දේවල් කිව්වා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ගැන නොයෙකුත් ප්‍රශ්න කිව්වා. මම සාමාන්‍යයෙන් ඒ දේවල් සාකච්ඡා කරන්න අකැමැතියි. නමුත් මම යමක් කියන්න අවශ්‍යයි. අපි ඡන්දයකින් අපේ පක්ෂයේ නායකත්වය තෝරා ගත්තා. නායකයා විතරක් නොවෙයි, අපි නියෝජ්‍ය නායකයාත් ඡන්දයකින් තෝරා ගත්තා. මම අහන්න කැමැතියි, මේ රටේ හෝ දකුණු ආසියාවේ ප්‍රධාන දේශපාලන පක්ෂයකින් මෙවැනි දෙයක් සිදු වුණාද කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඉතාම දූෂිත ඡන්දයක්. ලංකාවේ දේශපාලනයේ දූෂිතම ඡන්දය.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

කවුරු හරි ඈත ගම්මානයකදී නායකයකුට "හූ" කිව්වා කියලා ඒ ගැන අපි කලබල වන්න අවශ්‍ය නැහැ. නමුත් ජනාධිපතිතුමාට "හූ" කියන්න බැහැ. සුදු වැන් තිබෙන රටක, සුදු වැන් තිබෙන සංස්කෘතියක ජනාධිපතිතුමාට "හූ" කියන්න කාටවත් බැහැයි කියන එක මතක් කරන්න අවශ්‍යයි.

විශේෂයෙන්ම අද මේ සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් එතුමා නොයෙකුත් දේවල් කථා කරන්න පටන් ගත්තා. ඒ වාගේම අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කන්තලේ කර්මාන්තශාලාව පෙන්ෆීල්ඩ් ආයතනයට ගත්තා කියලා සඳහන් කළා. ඒ ගැන ජනවාරි මාසයේ 07වැනි දා "Daily Mirror" පත්‍රයේ මේ විධියට සඳහන් කර තිබෙනවා. I quote:

"…the most suitable bid was chosen thereafter by a cabinet appointed negotiation board, it was revealed."

ඉතින් මේක වැරදියි කියලා ඇමතිවරයෙක් නැඟිටලා කියනවා නම් අපි ඒක පිළිගන්නවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Give me five minutes.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

I have only one minute more.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

On the basis of a Cabinet decision, today we have held a subcommittee meeting and decided to change it completely: to call for fresh applications and also to go on a new model, setting aside about 300 acres to be the nursery and all other acres to be given on the basis of outsourcing. So, this is an authoritative statement.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Thank you very much for the explanation.

ඒ කියන්නේ අද යම් කිසි වෙනස්වීමක් වුණා කියලා ඇමතිතුමා ඒ කියපු විග්‍රහයම අපි පිළිගන්නවා. අද අපි කථා කරන්නේ යුරෝපයේත්, ඇමෙරිකාවේත්, බටහිර ලෝකයේත් යම් කිසි ආර්ථික කඩා වැටීමක් තිබෙනවා කියන එකයි. ඒ ගැන තර්කයක් නැහැ. කඩා වැටීමක් තිබෙනවා. අපි ඒ රටවල්වලට අපනයනය කරනවා. ඒ නිසා අපට තිබෙන ප්‍රශ්නය මේකයි. අපේ අපනයන ඒ රටවල්වලට විකුණා ගන්නට බැරි වුණොත් ඒක මේ රටේ සේවකයාට බලපානවා; මේ රටේ රැකීරක්ෂා කරන අයට බලපානවා. ඒ විතරක් නොවෙයි. විදේශ විනිමය අනුපාතය නැත්නම් ලංකාවේ රුපියල බොහොම ඉහළ මට්ටමකින් තිබෙනවා කියලා කීප දෙනෙක්ම සඳහන් කරලා තිබෙනවා. නමුත් මේක ගැන රාජ්‍ය ස්ථාවරය පැහැදිලි නැහැ. ඒ නිසා මේකෙනුත් අපනයනයට ප්‍රශ්නයක් වෙනවා. මොකද තරගකාරී ලෙස අපනයනය කරන්නට බැහැ. ඊට පස්සේ අප දන්නවා, පොලී අනුපාතයත් වැඩි කළාය කියලා. ඒකෙන් ව්‍යාපාරිකයන්

අපනයනය කරන ද්‍රව්‍ය, භාණ්ඩ, සේවාවන්වල මිලත් ඉහළට යනවා. ඉතින් කවුරු හරි ප්‍රශ්න කරලා අහනවා, ඒ නිසා මේ ගැන කරන්න පුළුවන් මොනවාද කියලා. ඇයි? මේවා පරස්පර දේවල්. ආර්ථිකමය වශයෙන් කරන්න පුළුවන් මොනවාද කියලා අහනවා.

අපි ඉස්සෙල්ලාම පිළි ගන්න අවශ්‍යයි අපට අපනයන අවශ්‍යයි කියලා. මොකද අපි වෙළෙඳාම බැලුවොත් ආනයනයයි, අපනයනයයි අතර පරතරය වාගේම විදේශ විනිමය ශේෂය තුළත් විශාල කඩා වැටීමක් තිබෙනවා. අගෝස්තු මාසයේ බිලියන 9ක් තිබුණා. අවුරුද්ද අන්තිමට එන කොට -දෙසැම්බර් මාසය වන කොට- බිලියන 6.5ට බැහැලා තිබෙනවා.

අපි රුපියලේ අනුපාතය ආරක්ෂා කරන්න ඕනෑ. අය වැය ලේඛනය සාකච්ඡා කළාට පස්සේ ඩොලර් බිලියනයකට වැඩිය අපි විකුණලා තිබෙනවා. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා. මේ ශේෂයත් අපි අපේ ආර්ථිකයෙන්ම ගොඩ නඟපු ශේෂයක් නොවෙයි. අපි පිට රටවල්වලින් ණයට ගත්ත මුදල් තමයි වැඩි ප්‍රමාණයක් මේ ශේෂය තුළ තිබෙන්නේ.

ඉතින් අපේ සැබෑ ආර්ථිකය ගැන යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේ විදේශ විනිමය අනුපාතය තරගකාරි අනුපාතයක් වෙතට ගෙන යා යුතුයි කියන ස්ථාවරයේ අපි හිටියේ අද-ඊයේ නොවෙයි. අපි ඉස්සර ඉඳලාම ඒ ස්ථාවරයේ තමයි හිටියේ. නමුත් මොනවාද කළේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇවිල්ලා අපට ණය මුදලක් දුන්නා. ඩොලර් බිලියන 1.8ක් අපි ඒකෙන් ගත්තා. ඒ මුළු මුදලම අපි වියදම් කරලා තියෙන්නේ මේ කෘත්‍රිම විදේශ විනිමය අනුපාතය ආරක්ෂා කරන්නයි. ගරු සරත් අමුණුගම ඇමතිතුමා මොනවා කිව්වත් ඔවුන් කොන්දේසි දෙකක් දැමුවා. ඔවුන් කිව්වා,"රුපියල වෙළෙඳ පොළ අනුපාතයට තිබිය යුතුයි" කියලා. ඔවුන් ඊට අමතරව කිව්වා, "යම් කිසි කාල පරාසයක් තුළ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ තිබෙන අලාභය නැති කරන්න අවශ්‍යයි" කියලා. මේ දෙකම සිදු වෙලා නැහැ. මේ දෙකම සිදු වෙලා නැති නිසා ඔවුන් ඒ මුදල දෙන්න ලැහැස්ති නැහැ. රජය කියනවා දෙන්න ලැහැස්තියි කියලා. දෙන්න ලැහැස්ති නම් ඇයි ගන්නේ නැත්තේ? ඊට පස්සේ කියනවා,"නැහැ. ඒක ගත්තොත් අපට සියයට තුනක් ගෙවන්න වෙනවා"ය කියලා. ඒ ගෙවන්න තිබෙන පොලී අනුපාතය අපි චීනයෙන් ගන්න ණය මුදල්වලට ගෙවන පොලී අනුපාතයට වැඩිය කොච්චර අඩුද? එහෙනම් මේක ඉස්සෙල්ලාම ගන්න එපායැ. නැහැ. මොකක් හරි මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය නිසා තමයි අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මේ මුදල ලබා ගන්නට බැරි. මේ රජයට ප්‍රතිපත්තියක් නැහැයි කියලා කියන්න අවශ්‍යයි. මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙක් කියනවා, "මේ විදේශ විනිමය අනුපාතය තරගකාරි විය යුතුයි" කියලා. මහ බැංකුවේ අධිපති කියනවා, "එහෙම වෙන්න අවශ්‍ය නැහැ" කියලා. ඉතින් මේ ආකාරයට නිලධාරින් දෙදෙනෙක් අතර වාදයක් තිබෙනවා. ඇමති කෙනෙක් නැහැ, අපට ඇත්තටම මේ ගැන කියන්න. ඇයි මේක මෙහෙම තීරණය කරන්නට බැරි? හැදියාවටයි, හැකියාවටයි වැඩිය මේ රජය ලැදියාවට තමයි තැන දීලා තිබෙන්නේ. හැකියාවටයි, හැදියාවටයි වැඩිය ලැදියාවට තමයි තැන දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි නිශ්චිත තීරණ ගන්න අමාරු. නිශ්චිත තීරණවලට එන්න බැරි ඒ නිසායි. රජයේ ආර්ථික දර්ශනය මොකක්ද කියලා අපි අහනවා.

අපි දන්නවා අවුරුදු සියයකට වැඩි කාලයක් තිස්සේ තේ, රබර්, පොල් විකුණලා වතු ආර්ථිකයක් තුළ මේ රට පැවතුණු බව. 1977න් පස්සේ ආපු විවෘත ආර්ථිකය ප්‍රතිපත්ති නිසා අපි අපනයන වැඩි කරලා මේ රටේ අද තිබෙන ස්ථානයට ආර්ථිකය ගොඩ නැංවුවා. ඒ අතර ඇඟලුම් කර්මාන්තය තමයි අද අපට මුදුනින්ම පෙන්වන්න පුළුවන්. අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමාත් මොහොතකට පෙර ඒක කිව්වා. "ඉන්දියාවටත් වැඩිය අපේ ඇඟලුම් කර්මාන්තය තරගකාරීයි, ලෝක ආර්ථික අර්බුදයක් තිබෙන කොටත් අපේ ඇඟලුම් ආර්ථිකය නැඟී සිටිනවා" කියලා එතුමා කිව්වා. නමුත් මම අහන්න කැමැති ප්‍රශ්නය මේකයි. මොකක්ද අද අපනයන සම්බන්ධව අපට තිබෙන දර්ශනය? අපි අපනයනය කරන්න යන්නේ මොන භාණ්ඩද? අපනයනය වෙනුවෙන් අපි පාවිච්චි කරන්න යන තාක්ෂණය මොකක්ද? අපට ඒ දර්ශනය ගැන කියන්න.

ඔබතුමන්ලා කථා කරන හැම වෙලාවකම කියන්නේ සංචාරක ව්‍යාපාරය ගැනයි. සංචාරක ව්‍යාපාරය දියුණු වෙන කොට අපට බොහොම සන්තෝෂයි. අපේ මේ කුඩා රටේ තිබෙන සෞන්දර්යය ලෝකයේ වෙන කිසිම රටකදී බලන්නට නැහැ. ස්වභාව ධර්මයෙන් අපට ලැබුණු දෙය අපි ලෝකයට පෙන්වන්න අවශ්‍යයි. ඒක වැදගත්. අපි ඒ ගැන බොහොම සන්තෝෂ වෙනවා. නමුත් සංචාරක ව්‍යාපාරය තුළින් පමණක් මේ රට ගොඩ ගන්නට බැහැ. දළ දේශීය නිෂ්පාදනය එක්ක බැලුවාම -සංසන්දනය කළාම - ප්‍රතිශතයක් හැටියට සංචාරක ව්‍යාපාරයෙන් අපට ලැබෙන ඒ එකතු වීම -වැඩි වීම- බොහොම ස්වල්පයයි කියලා අපට පෙනෙනවා.

ඒ නිසා නව දර්ශනයක් අපට අවශ්‍යයි. ඒ දර්ශනයක් නැති නිසා මේ රටේ මානව සම්පතට මොනවාද වන්නේ? ඒ දර්ශනය නැති නිසා, ඒ කර්මාන්ත නැති නිසා, ඒ රැකී රක්ෂා නැති නිසා ඒ අයට මේ රට අත හැරලා යන්න වෙනවා. ඒ ගොල්ලන්ගේ දැනුම, ඉගෙනුම, හැකියාව අරගෙන මැද පෙරදිග රටවලට හා ඇමෙරිකාව වැනි දියුණු රටවලට ගිහිල්ලා ඒ රටවල වැඩ කරන්න ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය වෙනුවෙන් නොවෙයි, වෙනත් රටවල දළ දේශීය නිෂ්පාදනය වෙනුවෙන් තමයි අපේ මානව සම්පතට වැඩ කරන්න සිදු වෙලා තිබෙන්නේ. මේ රටේ ප්‍රධානම සම්පත වන මානව සම්පත ගොඩ නඟන්න අපට දර්ශනයක් අවශ්‍යයි. අපි දිගින් දිගටම කියනවා යටිතල පහසුකම් විතරක් දියුණු කරලා මේ කටයුත්ත කරන්න බැරි බව. පාරවල් දියුණු කරලා විතරක් මේ කටයුත්ත කරන්න බැහැ. පාරවල් වෙනුවට ප්‍රවාහන විසඳුම් අපට අවශ්‍යයි. පාරවල් දියුණු කිරීමෙන් සමාජයේ යම් කිසි කොටස්වලට පමණයි ප්‍රයෝජනය ලැබෙන්නේ. පොදු ජනතාවට ඒකෙන් ලැබෙන ප්‍රයෝජනය බොහොම සීමිතයි. ඒ නිසා ප්‍රවාහන විසඳුම් අවශ්‍යයි. අපට ඒකට දර්ශනයක් අවශ්‍යයි. මේ රටේ මානව සම්පතේ අධ්‍යාපනය, උසස් අධ්‍යාපන හැකියාව දියුණු කිරීමට මුල් තැන දෙන්න. අපේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාත් මේ ගරු සභාවේ දැන් සිටිනවා. මම හැම තිස්සේම කල්පනා කරන්නේ මේකයි. එතුමා බොහොම අපහසුතාවෙන් සිටින්නේ. එතුමා යම් කිසි ප්‍රතිසංස්කරණයක් කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. නමුත් කොහොමද ඒ ප්‍රතිසංස්කරණය කරන්නේ? අධ්‍යාපන අංශයටයි, උසස් අධ්‍යාපනයටයි, රජයේ දැන් තිබෙන විශ්වවිද්‍යාලවලටයි විශාල පරිමාණයෙන් ආයෝජනය කළේ නැත්නම් රට තුළ ඉබේටම විරුද්ධතාවක් පැන නැඟෙනවා. ඒ නිසා මූලිකව මෙතැන හැරීමක් තිබෙන්න ඕනෑ. මානව සම්පත මුල් කර ගෙන ඉදිරියට යන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමෙක් කිව්වා, "විපක්ෂයේ මන්ත්‍රීවරු නැඟිටලා කථා කළා, නමුත් කොහොමද යුරෝපයේ අර්බුදයට මුහුණ දෙන්නේ, මොනවාද කළ යුත්තේ, මොනවාද නොකළ යුත්තේ කියලා ඇත්තටම එතුමන්ලා යෝජනා කළේ නැහැ" කියලා. මම ඒක ප්‍රතික්ෂේප කරනවා. එක එක මන්ත්‍රීවරු එක එක යෝජනා ගෙනාවා. නමුත් මට ලැබී තිබෙන සීමිත කාලය තුළ මම කියන්න අවශ්‍යයි, මෙතැන තිබෙන්නේ plaster එකක් ගහලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවන බව. අප දන්නවා ජූලි මාසය විතර වෙන කොට මේ රටේ තිබෙන ආර්ථික අර්බුදය මීට වැඩිය උග්‍ර වෙන බව. ඒ නිසා තමයි මේ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරලා අපි මේ ගරු සභාව තුළ කථා කරන්නේ. තෙල් මිල මීට වැඩිය ඉහළ යන්න පුළුවන්.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ඒ වාගේම අපි දන්නවා ඉරානයේ තිබෙන ප්‍රශ්නය. ඒ ගැන අපට දුක හිතෙන්න පුළුවන්. ඉරානයත් සමඟ අපේ මිත්‍රකමක් තිබෙන්න පුළුවන්. ඒක ගැන කිසිම වාද විවාදයක් නැහැ. නමුත් අපට ඉරානය ගැන තිබෙන ප්‍රශ්නය මේකයි. මේ රටට අපි ආනයනය කරන තෙල්වලින් සියයට අසූවයි, සියයට අනූනුනයි අතර ප්‍රමාණයක් එක රටකින් පමණයි ගෙනෙන්නේ.

අපි කල්පනා කරන්න අවශ්‍යයි, මේක විශාල අවදානමක් බව. අපට ප්‍රතිපත්තියක් තිබෙන්නට ඕනෑ, මේ වාගේ අවදානමක් නොතබන්න. අපි එක රටකින් පමණක් නෙවෙයි, වෙන වෙන රටවල්වලිනුත් තෙල් ගෙන්වන්න අවශ්‍යයි. සිරියාවේ ප්‍රශ්නය ගැන සරත් අමුණුගම ඇමතිතුමා කථා කළා. මැද පෙරදිග ප්‍රශ්නය ගැනත් එතුමා කථා කළා. ඒ ප්‍රශ්න නිසා තෙල් මිල ඉහළ තත්ත්වයක තිබෙන්න පුළුවන්. බොර තෙල් බැරලයක මිල ඩොලර් සියයකට වඩා ඉහළට ගියොත්, තව මාස හයකින් අපි හිතනවාට වැඩිය විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්නට අපට සිද්ධ වනවා. ඇත්තටම අපට මේ විදේශ විනිමය අනුපාතය සකස් කර ගන්නට තිබුණේ මීට අවුරුද්දකට ඉහතදී. එසේ ක්‍රමානුකූලව එය සිදු කළා නම් අද මුහුණ දෙන්නට යන ආර්ථික අර්බුදයට අපි මුහුණ දෙන්නේ නැහැ. නමුත් අපි ඒක කළේ නැහැ. මොකද, මහ බැංකුවේ අධිපතිතුමාගේ දැනුම අනුව තමයි දැන් වන තෙක් ආර්ථිකය ගෙන ගියේ. ඒ නිසා අපි ඒක කළේ නැහැ. ඒ නිසා අපි දැන් ප්‍රශ්නයකට මුහුණ පානවා. අද විනිමය අනුපාතය තරගකාරී ලෝක වෙළෙඳ පොළේ අනුපාතයට ගැළපෙන පරිදි ගෙනිච්චත් වෙන්නේ මොකක්ද? එහෙම කළත් අපනයනය වෙනුවට ආනයනය තමයි වැඩි වෙන්නේ. අපනයනය ඉහළ යන්නට කල් යනවා. මේ කියන විධියට J-curve effect එකක් නැත්නම් hockey stick effect එකක් ඇති වෙන්න යනවා. ආනයන හා අපනයන පරතරය විශාල වන්නට යනවා. අපේ ආර්ථිකය යහ මාර්ගයට ගන්නට ප්‍රථම මීට වැඩිය අමාරු තත්ත්වයකින් මාස ගණනාවක්ම අපේ ආර්ථිකයට ගමන් කරන්න වෙයි. මේ සඳහා රජයට තිබෙන්නේ විකල්ප දෙකයි. එක්කෝ අද ඒ වෙනුවෙන් යමක් කරන්න ඕනෑ. නැත්නම් මොනවාවත් කරන්නේ නැතුව ඉන්න ඕනෑ. අපි මාස හයක් ඉඳලා බලමු, මොනවාද වෙන්නේ කියලා. එතකොට සමහර විට රෝගියා මැරෙන්න පුළුවන්. ඒ නිසා අද වුණත් අපි ආර්ථික මූලධර්ම - මේවා බටහිර හෝ නැඟෙනහිර මූලධර්ම නොවෙයි, ආර්ථික මූලධර්ම- අනුව ක්‍රියා කරන්න අවශ්‍යයි.

මම කථාව අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම නැවත මතක් කරන්න අවශ්‍යයි, පළමුවෙන්ම, අපේ වාගේ රටක් සංවර්ධනය කරන්නට මුදල් ඇමති කෙනෙක් පාර්ලිමේන්තුවේ සිටිය යුතු බව. ඒ වාගේම රටට ආර්ථික දර්ශනයක් තිබිය යුතු බව. ඒ විතරක් නොවෙයි, මේ කල් තැබීමේ යෝජනාව ගැන කථා කරන නිසා කියන්නට අවශ්‍යයි අපේ විදේශ විනිමය අනුපාතය තරගකාරී අනුපාතයක් විය යුතු බවත්.

ආර්ථිකය පාලනය ගැන සරත් අමුණුගම ඇමතිතුමාගේ අදහසට සම්පූර්ණ වෙනස් අදහසක් මට තිබෙන්නේ. එතුමා කිව්වා, මේ රටේ හොඳ ආර්ථික කළමනාකාරිත්වයත් තිබෙනවා කියලා. මම එයට පොඩ්ඩක්වත් එකඟ වන්නේ නැහැ. මම කියනවා, ආර්ථික කළමනාකාරිත්වය මීට වැඩිය දියුණු වන්න අවශ්‍යයි කියලා.

අද වැඩිදුර කථා කරන්න වෙලාවක් නැහැ. මේ මුදල් අනුපාතය ගැන විතරක් නොවෙයි, මහ බැංකුවෙන් එන ලේඛන ගැන විතරක් නොවෙයි, අර්ථසාධක අරමුදල ගැනත්, එතැන තිබෙන මහා පරිමාණයේ හොරකම, කොල්ලකෑම ගැනත් සොයා බලන්න. මම මීට ප්‍රථමයෙනුත් පාර්ලිමේන්තුවෙන් ඉල්ලා තිබෙනවා, පාර්ලිමේන්තුවෙන් ඒ සම්බන්ධව පරීක්ෂා කර බලන්න අවශ්‍යයි කියලා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.09]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් මාතෘකාවක් යටතේ, අපේක්ෂා කළාට වඩා උසස් මට්ටමක විවාදයක් මේ ගරු සභාවේ සිද්ධ වුණා. එහිදී ලංකාවේ ආර්ථිකය පිළිබඳව අදහස් කීපයක් වග කීමෙන්, නිල වශයෙන් ඉදිරිපත් කරපු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමාට මගේ ගෞරවය පළමුව පිරිනමනවා. එතුමා සිවිල් සේවයේ හිටපු ඉතාම දක්ෂ නිලධාරි මහත්මයෙක්. අවුරුදු 20ක් 25ක් විතර ආර්ථිකය පිළිබඳව රාජකාරි කරපු ඉතා වැදගත් මහත්මයෙක්. සමබර අදහස් දරන එතුමා වර්තමාන ආර්ථික තත්ත්වය ගැන ඉතා යහපත් විග්‍රහයක් කළා. ඒ සම්බන්ධයෙන් මම එතුමාට ගෞරව කරනවා.

2012 වර්ෂය ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් වර්ෂයක් හැටියට ගණන් ගන්නවා. ජැක්ස් නෙකර් කියන දක්ෂ මුදල් ඇමතිවරයා 1789 ජූනි මාසයේ ප්‍රංශයේ පාර්ලිමේන්තුවට අය වැය ලේඛනයක් ඉදිරිපත් කළා.

ඒ අය වැය ලේඛනය පිළිබඳව එදාම පැවැති වාදයෙන් තමයි ප්‍රංශ මහා විප්ලවය ආරම්භ වුණේ. සියලුම ප්‍රගතිශීලී මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවෙන් එළියට බැහැලා ඒ අසල තිබුණු ටෙනිස් පිට්ටනියකට එකතු වෙලා, "අපට අය වැයක් නොවෙයි, අලුත් ව්‍යවස්ථාවක් ඕනෑ." කියලා සපථ කරලා ප්‍රංශ මහා විප්ලවය ආරම්භ කළා. තමුන්නාන්සේලා ඇතුළු අප කවුරුත් දැන ගත යුතුයි, අවුරුදු ගණනක් විරාජමාන වූ යුරෝපීය කාසි, මුදල් ක්‍රම පළමුවැනි වතාවට එකින් එක බිඳ වැටුණු බව. ජර්මනියේ තිබිච්ච ආඩම්බරකාර මාර්ක් කාසිය අද කානුවට වීසි කරලා. ප්‍රංශයේ තිබිච්ච ෆ්‍රෑන්ක් කාසිය කානුවට වීසි කරලා .ඉතාලියේ තිබිච්ච ලීරා කාසිය කානුවට වීසි කරලා. නෙදර්ලන්තයේ තිබිච්ච ගිල්ඩර් කාසිය කානුවට වීසි කරලා. ස්පාඤ්ඤයේ තිබිච්ච පෙසෙටෝ අහකට වීසි කරලා. ඒ වෙනුවට නිර්මාණය කළා 'යූරෝ' කියලා අලුත් කාසියක්. අවුරුදු 10යි තවම වයස. ඒක අද හොල්මනක් බවට; ආර්ථික හොල්මනක් බවට පත් වෙලා. කිසිම වටිනාකමක් නැති, එකිනෙකාගේ පිටවල් කසා ගන්න බැරි අසරණ තත්ත්වයකට අද යුරෝපයේ රටවල් 14ක් පත් වෙලා තිබෙනවා. බැංකු තිබෙනවා; මුදල් නැහැ. නෝට්ටු ගහන්න අවසර නැහැ. මේ තත්ත්වය යටතේ 2012 වර්ෂය අතිවිශිෂ්ට වර්ෂයක් හැටියට ඉතිහාසගත වෙනවා.

අප බලාපොරොත්තු වෙච්ච යුරෝපයේ කඩා වැටීම, ඇමෙරිකාවේ කඩා වැටීම, සුද්දන්ගේ කඩා වැටීම ආරම්භ වුණා. කිසිම දවසක, රුසියාවේ හැර වෙන රටක "down with capitalism" කියන වචනය කිව්වේ නැහැ. "ධනවාදය භංග වේවා!" කියලා, රුසියාවෙන්, චීනයෙන් පිට පළමුවැනි වතාවට කියන්න පටන් ගත්තේ ඇමෙරිකාවේ හා යුරෝපයේයි. අද මා මේ කථා කරන මොහොතේ ස්ථාන 900ක ධනවාදයට විරුද්ධව කඳවුරු බැඳ ගෙන. බැංකු ඉදිරියේ, පාර්ලිමේන්තු ඉදිරියේ, ගොඩනැඟිලි ඉදිරියේ විශාල ජන සන්නිපාතයක් ලෝකය පුරා දැවැන්ත විප්ලවයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ තත්ත්වය යටතේ තමයි අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ යෝජනාවේ යුරෝපයේ අර්බුදය ගැන කියැවුණා. මම අහනවා ප්‍රශ්නයක්. ලෝකයේ නොබෙල් ත්‍යාග ලාභීන්ගෙන් සියයට 72ක් ඉන්නවා ඇමෙරිකාවේ. ඉතාම ප්‍රසිද්ධ විශ්වවිද්‍යාල හතරක් තිබෙනවා යේල්, හාර්වඩ්, ඔක්ස්වර්ඩ් සහ කේම්බ්‍රිජ් යනුවෙන්. මෙවැනි අර්බුදයක් ආවාම විසඳුමක් දෙන්න බැරි මහාචාර්යවරුන්, ආචාර්යවරුන් -මේ මැටි හරක්- මොකටද කියලා අප ප්‍රශ්න කළ යුතුයි. කෝ, ඇමෙරිකාවේ ඉන්න නොබෙල් ත්‍යාගලාභීන්? ඒ එක්කෙනෙකුටවත් පුළුවන්ද අද උත්තර දෙන්න? ගෝලීය ආර්ථිකය බිඳ වැටුණාට පසුව ආර්ථික විද්‍යාව කියලා ඉතිරි වෙලා තිබෙන්නේ කුමක්ද කියන එක

සම්බන්ධයෙන් ලංකාවේ එක් කෙනකුට හෝ එක පොතක් ලියන්න කියලා මම අභියෝග කරනවා. ගෝලීය ආර්ථිකය බිඳ වැටුණාට පසුව ආර්ථික විද්‍යාවේ ඉතිරි වෙලා තිබෙන්නේ කුමක්ද? දැන් ආර්ථික විද්‍යාවේ වටිනාකම යනු කවරේද? මේවා ගැන අද එක උත්තරයක්වත් දෙන්න බැහැ. ඇමෙරිකාව අනාථයි. නොබෝදා ඇමෙරිකාවේ ජනාධිපති ඔබාමා තනිවම කථා කරලා කිව්වා, "මම විවෘත ආර්ථිකය -වෙළඳ පොළ ආර්ථිකය- භාර ගත්තා. යුරෝපය භාර ගත්තා. නමුත් මම බලාපොරොත්තු වුණා ඇඩම් ස්මිත් කියාපු අදිසි හස්තය - invisible hand of the market - ඇවිල්ලා මාව බේරා ගනීවි කියලා." යනුවෙන්. ඔබාමා අහන්න පටන් ගෙන තිබෙනවා, "Mr. Adam Smith, where is your

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

invisible hand?" කියලා. ඒක රනිල්ට තේරෙන්නේ නැහැ. රනිල් කියන්නේ අද කැබැලි වෙච්ච පක්ෂයක පාවෙන අවාසනාවන්ත පුද්ගලයෙක්. එතුමාට ඒ පක්ෂය එක්කාසු කර ගන්න ලැබේවායි කියලා මම අවංක හදවතින්ම ප්‍රාර්ථනා කරනවා. නමුත් එතුමා දැන ගත යුතුයි, රුසියාව බිඳ වැටුණේ 1991 දෙසැම්බර් මාසයේ 21වැනිදා. එදා ඉඳලා අවුරුදු 20ක් ලෝකයේ සුපිරි තනි බලවතා හැටියට ඇමෙරිකාව හිටියා. මම සන්තෝෂයි, ඊයේ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ආරක්ෂක සභාවේ සිරියාවට විරුද්ධ යෝජනාව ආපුවාම අවුරුදු 20කට පස්සේ පළමුවැනි වතාවට චීනයයි රුසියන්කාරයයි veto බලය -නිෂේධ බලය- පාවිච්චි කරලා ඇමෙරිකාවේ හොම්බට ඇන්නා. පළමුවැනි වතාවට ජාත්‍යන්තරයේ සමබර තත්ත්වයක් ඇති වෙගන යනවා. එය ආර්ථික න්‍යායෙන් නොවෙයි. සෝවියට් රුසියාව හා චීනය නිෂේධ බලය පාවිච්චි කළා. ඇමෙරිකාවට කිව්වා, " උඹලාට මෙච්චර කල් දඟලන්න දුන්නා, මීට පස්සේ අපි එහෙම දෙන්නේ නැහැ. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය උඹලාගේ තනි ආයුධයක් නොවෙයි. ඒක ජාත්‍යන්තර ආයුධයක්." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒ පරිසරය උඩ තියලා ලංකාව ගැන කථා කරන්න ඕනෑ. මුළු ලෝකයම අරන් බැලුවොත් මේ අර්බුදයට සම්බන්ධ වෙච්ච නැති රටවල් 10ක්වත් නැහැ. අපේ රට මේ අර්බුදයට සම්බන්ධ නැහැ. අපි බේරිලා ඉන්නවා. අපි බේරිලා හිටියේ මේ කියාපු එක තර්කයක්වත් උඩ නොවෙයි. "ආහාර ස්වයංපෝෂිතභාවය ජාතියේ ආරක්ෂාවේ පළමුවැනි පදනමයි" කියන එකයි අපේ රජයේ විශ්වාසය. ෆ්ලොරිඩා හාල් ගනිල්ලා කියලා ඇමෙරිකාව බල කරන කොට ජපානය ඇමෙරිකාවට කිව්වා, කොරියාව ඇමෙරිකාවට කිව්වා, ආහාර සුරක්ෂිතභාවය ගැන. අපේ වී ඇටය උඩයි අපේ ශක්තිය තිබෙන්නේ. ආහාර සුරක්ෂිතභාවය උඩ ජාතියේ ආරක්ෂාව තිබෙනවා. අද තමුන්නාන්සේලාට ආඩම්බරයෙන් කියන්න ඕනෑ, අපි සහල්වලින් ස්වයංපෝෂිතයි. මම පසු ගිය සතිය පුරා ඒ ප්‍රදේශවල ඇවිද්දා. බඩඉරිඟුවලින් අපි ස්වයංපෝෂිතයි. එළවලු නිෂ්පාදනය ලංකාව පුරා පස් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. කොළඹ municipal සීමාව ඇතුළේ ඉන්න කොළඹ කාක්කෝ ඒක දන්නේ නැහැ. ඒ ගොල්ලෝ කොළඹින් එළියට යන්නේ නැහැ. කොළඹ කාක්කෝ ටිකක් ඉන්නවා. ඕනෑ වෙලාවක ෂැන්ග්‍රි-ලා, ගෝල්ෆේස්, අරක මේක සූරා ගෙන කනවා මිසක් නගර සභා සීමාවෙන් එළියට ගිහිල්ලා බලන්නේ නැහැ. ඒ අයගේ තුනටියට දම්වැලක් දාලා යකඩ කූරු තිබෙන කූඩුවක දාගෙන රට වටේ අරගෙන ගිහින් පෙන්වන්න ඕනෑ සිද්ධ වෙලා තිබෙන දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම අපේ සිතියමේ ඔයාමඩුව කියන තැන ලකුණු කරලා නැහැ. මම සිතියමේ බොහොම අමාරුවෙන් සොයා ගත්තේ. මම ඒ ප්‍රදේශයට ගියා. ගල්කිස්ස වාගේ සම්පූර්ණ නගරයක් අහසින් ගෙනිහිල්ලා පතිත කරලා නවීකරණය, නවීනත්වය, නවීන ශිෂ්ටාචාරය එතැනට දීලා තිබෙනවා. ඒවා දකින කොට කොළඹ ඉන්න පරංගින්ට වේදනායි. කොළඹ ඉන්න පරංගි, කපුටන් ආස නැහැ මේවා වෙන අය කරනවාට. ගමත් නගරයත් සමබර කරලා මුළු ලංකාවේම සමබර ආර්ථිකයක් හදලා තිබෙනවා.

අපි ආර්ථිකය සමබර කරනවා, අපේ රටේ ආහාර ස්වයංපෝෂිතභාවය මත ජාතික ආරක්ෂාව ගොඩ නඟනවා. ඩී.එස්. සේනානායක මහත්මයා ලංකාව භාර ගන්න කොට ජනගහනය ලක්ෂ 70යි හිටියේ. අද ලංකාවේ ජනගහනය ලක්ෂ 205යි. ඒ ලක්ෂ 205න් සෑම උදෑසනකම ලක්ෂ 45ක් ළමයි uniform ඇඳගෙන, සපත්තු දාලා, පොත් බෑග් එක කරේ එල්ලා ගෙන පාසල් යනවා. මළ පොතේ අකුරක් දන්නේ නැතිව හිටි, ලංකාවේ සර්වජන ඡන්දය ඔස්සේ, නිදහස් අධ්‍යාපනය ඔස්සේ සෑම උදෑසනකම ලක්ෂ 45ක් ළමයි පාසල් යවන තත්ත්වයකට අපි ඇවිල්ලා තිබෙනවා. අද අනාගත ලංකාව කියන්නේ ඒකයි. එතැනයි අනාගතය තිබෙන්නේ.

මම ආඩම්බරයෙන් කියන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔස්ට්‍රේලියාව පිටින් ගත්තු ණය ගෙවන්නේ මිදි සහ ඇපල් පිට රට යවලායි. නැව්වල පටවලා මිදි සහ ඇපල් යවනවා. පාකිස්තානය පිට රටින් ගන්න ණය ගෙවන්නේ ජමනාරම් පිට රට යවලායි. කොළඹ පිටකොටුවට යන්න, පාකිස්තාන ජමනාරම් තිබෙනවා. ඊශ්‍රායලය අය වැයෙන් භාගයක් පියවන්නේ "Jaffa oranges" කියලා දොඩම් වර්ගයක් යුරෝපයට යවලායි. අපට තව අවුරුදු තුනක් දෙන්න. මම අවුරුදු තුනක් කියලා කියන්නේ සංඛ්‍යා ලේඛන බලලයි. තව අවුරුදු තුනකදී අපි පිට රටින් ගත්ත ණය ගෙවන්නේ පිපිඤ්ඤා, මඤ්ඤොක්කා,පැණිකොමඩු පිට රට යවලාය කියලා මම තමුන්නාන්සේලාට ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා. ඒ තත්ත්වයට අපි ඇවිල්ලා තිබෙනවා. නුවරඑළියේ අර්තාපල් කීයද, මෙහේ කීයද, පොල් ගෙඩිය කීයද කියලා අහපු ඒ යුගය ඉවරයි. තේ කෝප්පය ඇතුළේ කුණාටු මැව්ව යුගය ඉවරයි. මුළු ලංකාවම දැන් අලුත් ක්‍රමයකට ඇවිල්ලා.

මම මේ සුමාන දෙකේ අනුරාධපුරයේ ඔයාමඩුව සහ යාපනය ආදි ප්‍රදේශවලයි හිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටම පුදුම හිතුණා, අපි කොළඹ ඉඳලා කරන බොරුවේ තරම ගැන. අපි ලොකු ව්‍යාජ ලෝකයකයි ජීවත් වෙන්නේ. කොළඹ ඉඳලා හැතැක්ම 25ක් එහාට යන්න. අද ගමට ගිහින් බලන්න. පහේ විභාගයේ ප්‍රතිඵල දිහා බලන්න. ගණිතය විභාගයෙන් දිවයිනේ හපනා ඉන්නේ යාපනයේ කෙළවරේයි. ගම්බද ප්‍රතිඵල ලැයිස්තුව අරන් බැලුවාම ගමේ දියුණුව පෙනෙනවා. අපි අධ්‍යාපනය විතරක් නැඟිට්ටෙව්වා නොවෙයි, පවුල නැඟිට්ටෙව්වා. "ළමයා හදලා රට හදමු" කියන සංකල්පය අපි නැඟිට්ටෙව්වා. "ළමයා හදලා, පවුල හදලා, ගම හදලා, අලුත් ලංකාවක් හදමු" කියන සංකල්පය අපි අරගෙන ආවා. අන්න, ඒ උත්තම අදහස ක්‍රියාත්මක වෙනවා. ගරු අමුණුගම ඇමතිතුමනි, මම හරි ප්‍රීතියෙන් මුළු දවසක් පුරා ඔයාමඩුවේ තිබෙන "දැයට කිරුළ" ප්‍රදර්ශන භූමියේ ඇවිද්දා. මම අවුරුදු 20දිවත්, විශ්වවිද්‍යාලයේදිවත් ඔය වගේ දෙයක් දැක්කේ නැහැ, ගරු ඇමතිතුමනි. අපි ඉස්කෝලේ ගියාට අපේ පාසල්වල එහෙම තත්ත්ව තිබුණේ නැහැ. පුදුමාකාර ශිෂ්ටාචාරයක් අපේ ළමයි ඉදිරියේ ඇවිල්ලා තිබෙන්නේ. මට විශ්වාසයි, මේ සංවර්ධනය ගැන. කොළඹ අය දෙයියන්ගේ පිහිටෙන් කොළඹම හිටපල්ලා. අනෙක් පැත්තට ගිහිල්ලා ලංකාවට විෂබීජ දාන්න එපා. කොළඹ ඉඳ ගෙන මේ කථාව කිව්වට කමක් නැහැ.

එක්සත් ජාතික පක්ෂය ගැන මම කනගාටු වෙනවා. එක්සත් ජාතික පක්ෂය කාකු බෝධියක් හැටියටයි අද ලංකාවේ නම් කරලා තිබෙන්නේ. කාක්කෝ ලගින හින්දා වඳින්න බැහැ; බෝධියක් හින්දා කපන්න බැහැ. ඔන්න, එක්සත් ජාතික පක්ෂයට ලැබිලා තිබෙන ඓතිහාසික ඉරණම. අද ඒ පක්ෂය කාකු බෝධියක් වගෙයි. ඒ ගොල්ලන් ඔහොම හිටපුවාවේ. ඒ ගොල්ලන්ගේ යුද්ධය ඔහොම කරගෙන ගියාවේ. මේක කොළඹ

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

කාක්කන්ගේ අරගලයක්. මේක municipal සීමාවෙන් එහාට යන දෙයක් නොවෙයි. මේක ගැන කිසිම බයක් වෙන්න ඕනෑ නැහැ. අපි 21වන ශත වර්ෂයේ මහා දැවැන්ත විප්ලවයක් දියත් කරලා ඒ විප්ලවය ඉස්සරහට අරන් යනවා. ගරු අමුණුගම ඇමතිතුමනි, මට ලොකු විශ්වාසයක් තිබෙනවා, තව අවුරුදු 10ක් ඇතුළත අතිවිශිෂ්ට ළමයා අපේ පාසලෙන් එළියට එනවා, අතිවිශිෂ්ට දුවණිය අපේ පාසල් පද්ධතියෙන් එළියට එනවාය කියලා. මේ රටේ නිලතලවල ඉහළම තැන්වලට එන්න පුළුවන් හපන්, දක්ෂ, තාක්ෂණ විප්ලවයේ රන් කිරි කට ගා ගත්ත ළමා පරම්පරාවක් දැනටමත් එළියට ඇවිල්ලා. ඒ අයත් එක්ක අපි අත් වැල් බැඳ ගෙන අලුත් ශිෂ්ඨාචාරයකට යනවා. මේක කියලා හරවා ගන්න පුළුවන් කට්ටියක් නොවෙයි කොළඹ කට්ටියට. තමුන්නාන්සේලා ඔතැනම වැජඹෙන සේක්වා! අපට අපේ මේ ගමන යන්න අවසර දෙන්න. සියලු දෙනාගෙන්ම මම මේ ඉල්ලීම කරන්න කැමැතියි. මේ නව ශිෂ්ටාචාරය ඔස්සේ අපි නොගිය මහක අපේ ළමයි අරන් යමු. අපේ ළමයි නොලැබූ අවස්ථා ලබා දෙමු. අපේ ළමයින්ගේ ඉටු නොවුණු අපේක්ෂා ඉෂ්ට කර දෙන අලුත් ලංකාවක් හදමු යි කියමින් මගේ කථාව සමාප්ත කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

කරුණාකර ඊට පෙර ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමාව මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,"ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. GAYANTHA KARUNATILEKA *left the Chair, and* THE HON. J.R.P. SOORIYAPPERUMA *took the Chair.*

[අ. භා. 5.26 ]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කියා සිටින්නේ, විශේෂයෙන්ම අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා හැටියට පසුගිය නොවැම්බර් මාසයේ දී ඉදිරිපත් කළ අයවැයේ දී සහ ඉන් අනතුරුව ඒ හා අදාළව නිකුත් කරන ලද ගැසට් නිවේදන තුනක් ඒකාබද්ධ කර පසුගිය මාසයේ ඉදිරිපත් කර අනුමත කර ගත් එම ගැසට් නිවේදනය පිළිබඳව විරුද්ධ පක්ෂය විසින් අද මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන බවයි. අදාළ විවාදය තුළින් ආනයනය සඳහා ගෙවීම් ක්‍රම විධිමත් කිරීම සඳහා වූ ඒ අලුත් ක්‍රමවේදය ඉදිරිපත් කර තිබෙනවා. එම ගැසට් නිවේදනයට අන්තර්ගත කරන ලද ඒ සියලු දෑත් සමඟ අද දින විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද කල්තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයේ දී මෙතෙක් කරුණු දැක් වූ සියලුම මන්ත්‍රීවරුන්ටත්, අපේ අමාත්‍යවරුන්ටත් මගේ ස්තුතිය විශේෂයෙන්ම පුද කරන්නට ඕනෑ.

මා දීර්ඝව කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ විවාදය පටන් ගත් වේලාවේ ඉඳලා විවිධ අදහස්, විවිධ මත දෙපැත්තෙන්ම ප්‍රකාශ වුණා. අපේ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා ගරු අමාත්‍යතුමා ඒ පිළිබඳ පැහැදිලි විග්‍රහයක යෙදිලා රජය වෙනුවෙන් ප්‍රකාශයක් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඉතා සාරගර්භ කථාවක් තුළින් ජාත්‍යන්තරයත්, මෙහි ඉතිහාසයත්, මෙහි ඇතුළාන්තයත් පිළිබඳ විශාල විග්‍රහයක යෙදුණා. අන්න ඒ නිසා මා දීර්ඝව කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් විපක්ෂයෙන් කථා කළ සියලුම දෙනාම මේ ගමන පිළිබඳ විවේචනාත්මකව, ඉතාම වේගවත් ස්වරූපයකින් තමයි කථාවේ යෙදුණේ. ඒ චෝදනාව පිටුපස සමහරවිට වෛරයක් ගමන් කරන හැටියක් අපට පෙනෙනවා. ඒ චෝදනාව පිටුපස අලුත් බලාපොරොත්තුවක් පිළිබඳ තිබෙන හදිසියක්, ඔවුන් මවාගත්තු සිහිනයක් පෙනෙනවා. ජාත්‍යන්තරය දෙස බලලා, රූපවාහිනිය දෙස බලලා, රූපවාහිනියෙන් විප්ලවයක් මවා ගත්තු අලුත් ජවයක් ඔවුන් අත තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඔබතුමා කියපු ඔයාමඩුවේ ජනතාවට එවැනි අවශ්‍යතාවක් නැතැයි කියන ටික ඊයේ පැමිණි දස ලක්ෂය ඉක්මවපු ඒ මහා ජනා ගංගාවත් සමඟ අපි දැක්කා. ඒ ප්‍රදේශයේ ජනතාවට මේ ආර්ථිකයේ ප්‍රතිලාභ සහ ආර්ථිකය ගමන් ගන්නා මාර්ගය පිළිබඳ අනුමැතිය මේ වනකොට ලැබිලා තිබෙනවාය කියන ටික අපි මතක් කර දෙන්නට ඕනෑ. ඒ නිසා අනුරාධපුරයෙන් ඔබ්බට විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඔයාමඩුව ප්‍රදේශය ඇතුළු රජරට සියලු ජනතාව මේ අලුත් ආර්ථිකයේ ප්‍රතිලාභ ගලා එන්නට සකස් කරපු ඒ "දැයට කිරුළ" ප්‍රදර්ශනයත්, ඒ වාගේම නිදහස පිළිබඳ අලුත් කථාවත් මේ මොහොතේත් භුක්ති විඳිනවාය කියන ටික අපි මතක් කර දෙන්නට ඕනෑ. 2009 වර්ෂයේ දී සියයට 3 ½ ක අවම මට්ටමේ තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 8කට වැඩි ප්‍රමාණයකින් ඉහළට නංවන්නට අපට හැකි වුණා. අඛණ්ඩව අවුරුදු දෙකක් එම වර්ධන වේගය තබා ගෙන යන්නට පුළුවන් වුණු කළමනාකාරිත්වය පිළිබඳවයි අපේ ආචාර්ය අමුණුගම අමාත්‍යතුමා පැහැදිලි කළේ.

ඒ තුළ ඇති වෙලා තිබෙන අලුත් විශ්වාසය, අලුත් බලාපොරොත්තු සහ පෞද්ගලික අංශයේ අලුත් ක්‍රියාකාරිත්වය වෙළෙඳ ශේෂයේ පරතරය කෙරෙහිත් බලපානවා. ඒ තුළ තමයි අපනයනවලට ඒ බලපෑම ඇවිල්ලා තිබෙන්නේ කියන ටික අපි මතක් කරලා දෙන්න ඕනෑ. ඒ වාගේම ඒ තුළ ඉතා පැහැදිලි ඉඟියක් කර තිබෙනවා, මේ රජයෙන් කරපු ආයෝජනවලත්, එලෙසම පෞද්ගලික අංශයේත් මහා විශාල වර්ධනයක් තිබෙන බවට. ඒකත් අපි මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම වාණිජ පාරිභෝගික අංශයේ සියයට 44ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අන්තර් භාණ්ඩවල සියයට 50ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ආයෝජන භාණ්ඩවලත් සියයට 56ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. මේ සඳහා කරන ආයෝජනය තුළින් දිගු කාලීන සහ කෙටි කාලීන වශයෙන් අපට ප්‍රතිලාභ ගලා එනවාය කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඒ තුළින් වෙළෙඳ ශේෂයේ පරතරය

අපි සීමා කරන්නට උත්සාහ දරනවා. ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ සඳහාත් ඒ තුළ අන්තර්ගත වුණු කොටසක් තිබෙනවාය කියන එක අද කවුරුත් පිළිගන්නවා. තමුන්නාන්සේලා අද මේ කරන විවේචනය සාධාරණ විවේචනයක් නම්, ආණ්ඩුව කරන හැම දෙයම විවේචනය නොකර මේ රටේ ජනතාව එයින් භුක්ති විඳින ප්‍රතිලාභ පිළිබඳව සන්තෝෂ වන්න ඕනෑ. ඒ ප්‍රතිලාභ පිළිබඳව මෙහි පැහැදිලි ඉඟියක් තිබෙනවාය කියන එක අපි මතක් කරන්නට ඕනෑ. ඒ ආයෝජනයන් තුළින් අධිවේගී මාර්ග ඇතුළු මාර්ග පද්ධතියේ මහා සංවර්ධනයක් ඇති වී තිබෙනවා. හම්බන්තොට, කොළඹ, ඔලුවිල්, ත්‍රිකුණාමලය, යාපනය සහ ගාල්ල යන වරායන්වල සංවර්ධනය අපේ ඇස්වලට පෙනෙනවා; අපි ගමනේ යන කොට අපේ ඇඟට දැනෙනවා. මෙය ඉතා පැහැදිලිව ප්‍රතික්ෂේප කරන්නට බැරි එක්සත් ජාතික පක්ෂය අද එය වහලා, මේ සිදු කෙරෙන්නේ මහා අපරාධයක්ය කියලා එය වෙනත් අතකට යොමු කරන්නට හදනවා. නමුත් ඒ ප්‍රතිලාභය තමන් වෙත ගලා ඒම පිළිබඳව ජනතාවගේ ඉතා පැහැදිලි උද්‍යෝගයක් සහ වුවමනාවක් තිබෙනවා. අන්න ඒකයි රජය හැටියට අපට තිබෙන වගකීම. මේ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභය බස්නාහිරෙන් ඈත එපිට ඔයාමඩුවට වාගේ, ඈත එපිට මොනරාගලට වාගේ ඈත එපිට ගම්මානවලට ගමන් කරන්නට පුළුවන්ය කියන එක අපි මතක් කරලා දෙන්න ඕනෑ.

මා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපට එකක් අමතක වනවා. එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනා කථා කරන කොට කිව්වා, අපේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් කිව්වා, මානව සම්පත දියුණු කරන්න ඕනෑය කියලා. ගරු මන්ත්‍රීවරුනි, මානව සම්පත දියුණු කරන්නට ජීවිතයක් තිබෙන්නට ඕනෑ. අවුරුදු 30ක මහා ව්‍යසනය තුළ ජීවිතය පිළිබඳ විශ්වාසයක් තිබුණේ නැහැ. තමන්ගේ ජීවිතය අවසන් වන්නේ කොතැනද, කොයි වෙලාවේද කියන එක තීරණය වුණේ, එල්ටීටීඊ මෙහෙයුම භාරව හිටපු ප්‍රභාකරන්ගේ මහපටැඟිල්ල යට තිබුණු බොත්තම තද කරපු වෙලාවටයි. එවැනි අවිශ්වාසයක් තමයි තම ජීවිතය පිළිබඳව තිබුණේ. මේ පාර්ලිමේන්තුව තුළ හිටපු අයට, කැබිතිගොල්ලෑව කෙළවරේ ගම්මාන තුළ ජීවත් වූ අයට, කොළඹ නගරයේ ජීවත් වූ අයට, කෝච්චියේ -දුම්රියේ- බස් රථයේ ගමන් කරපු අයට, මහ පාරේ ගමන් කළ අයට, පොළට ගිය අයට තම ජීවිතය පිළිබඳ විශ්වාසයක් තිබුණේ නැහැ. පාසලට ගිය දරුවා පිළිබඳ විශ්වාසයක් දෙමවුපියන්ට තිබුණේ නැහැ.

අද මානව සම්පත ගැන කථා කරනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් දෙන ලද නායකත්වය තුළ මේ රටේ අවුරුදු 30ක් තිස්සේ තිබුණු මහා ව්‍යසනය අවසන් කරලා, එල්ටීටීඊ ත්‍රස්තවාදයේ මහා ප්‍රහාරයන්ට ගොදුරු වුණු ජනතාව එයින් මුදා ගෙන, මානව සම්පත පිළිබඳ විශ්වාසයක් ඇති කරලා, ජීවිතය පිළිබඳ අලුත් වටිනාකමක් ලබා දීලා, උතුරේ සහ නැඟෙනහිර ජීවත් වුණු ජනතාවටත් ඒ නිදහස එක සේ භුක්ති විඳින්නට පුළුවන් අලුත් පරිසරයක් අපි ගොඩ නඟා තිබෙනවා.

ඒ ඇති කර ගත්තු සාමකාමී වාතාවරණය තුළ අද ආයෝජන ගලා එන්නට පුළුවන් පරිසරය අපි දිනා ගෙන තිබෙනවා. ඇමෙරිකාවේ කඩා වැටීම, යුරෝපයේ කඩා වැටීම සමඟ ආසියාවේ ඇති වී තිබෙන අලුත් ආර්ථික ප්‍රබෝධයේ, පිබිදීමේ කොටස්කරුවන් වන්නට අපට අවස්ථාව උදා වී තිබෙනවා. අද ඒ පරිසරය තුළයි ලංකාව ගමන් කරන්නේ කියන ටික අපි මතක් කරලා දෙන්නට ඕනෑ. අපට පාලනය කරන්නට බැරි, ඔබටත් පාලනය කරන්නට බැරි මැද පෙරදිග අනාගතය පිළිබඳව අප කාටත් අනාවැකි පමණයි කියන්නට පුළුවන්. එයට වගකිව යුත්තේ බටහිරයි. එහි අවසාන ප්‍රතිඵලය පිළිබඳව, ලෝක ජනතාවට ඇති වන මහා විනාශය පිළිබඳව වග කියන්න ඕනෑ ඇමෙරිකාවයි, යුරෝපයයි. ඒ වාගේම බටහිර ගන්නා වූ ඒ තීරණවලට උඩගෙඩි දෙන එක්සත් ජාතික පක්ෂයත් එයට වග කියන්නට ඕනෑ.

නොබැඳුණු ජාතීන් සමඟ ගමන් කරන, සාර්ක් සංවිධානය සමඟ ගමන් කරන අපි, ප්‍රජාතන්ත්‍රවාදී රාමුවේ ගමන් කරලා මේ රටේ මහා ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යන්න පුළුවන් පරිසරයකට සහ ගමනකට ප්‍රවේශ වෙලා හමාරයි. අඛණ්ඩව අවුරුදු 2ක් සියයට 8කට වැඩි ආර්ථික වර්ධන වේගයකින් රට ගමන් කිරීම තුළින් අපි එය ඔප්පු කරලා තිබෙනවා. අපි තෙල් ආනයනය කරන රටක් හැටියට ජාත්‍යන්තර පරිසරයේ ඇති වන මහා බලපෑමට අපට මුහුණ දෙන්න වනවා. එයින් ඇති වන ප්‍රතිඵලය අපි සැම දෙනාටම භුක්ති විඳින්න වනවා.

මේ ආර්ථික ගමන් මඟ තුළ ඩොලර් 2,800කට වැඩි ඒක පුද්ගල ආදායමක් ලබන රටක් හැටියට ඉන්න අපට 2016 වන කොට ඒක පුද්ගල ආදායම දෙගුණ කරන්න පුළුවන් ගමන් මඟකට යන්නට පුළුවන් ආර්ථික පරිසරය අද ගොඩ නැඟිලා තිබෙනවාය කියන ටික අපි මතක් කරලා දෙන්නට ඕනෑ. දේශීය නිෂ්පාදකයන්ට, දේශීය කර්මාන්තකරුවන්ට, දේශීය ව්‍යාපාරිකයන්ට හා මේ රටේ ආනයන අපනයන ක්ෂේත්‍රයේ ව්‍යාපාරවල යෙදිලා ඉන්න සියලු දෙනාට පහසුකම් සහ දිරිගැන්වීම් ලබා දීම තුළින් අප බලාපොරොත්තු වන්නේ ඒ ටිකයි කියන එක මතක් කරලා දෙන්න ඕනෑ. එයට අවශ්‍ය පසුබිමයි මේ ගොඩ නැඟිලා තිබෙන්නේ.

අපි ආයෝජකයන්ට එන්න පරිසරය නිර්මාණය කරනවා වාගේම, අපේ දේශීය සම්පත් දියුණු කර ගන්නවා වාගේම, අපේ මානව සම්පත දියුණු කරන්නත් අපිට පුළුවන්. ඒ සඳහා අපේ උසස් අධ්‍යාපන ඇමතිතුමා දරන උත්සාහය අපි අගය කළ යුතුයි. එතුමා විශ්වවිද්‍යාල සිසුන්ට අලුත් විෂය ධාරා හදාරන්නට පුළුවන් අවස්ථා නිර්මාණය කර තිබෙනවා. ඒ අනුව විශ්වවිද්‍යාලවලින් පිට වන උගත් සිසුන්ට නව තාක්ෂණය හරහා අලුත් මාර්ගවලට ප්‍රවේශ වන්නට පුළුවන්. එවිට මේ අපනයන කර්මාන්ත මඟින් අපට ගෝලීය ආර්ථිකයත් සමඟ තරග කරන්නට පුළුවන්. අද අපේ ඇඟලුම් කර්මාන්තය මේ සියලු අර්බුද මධ්‍යයේ දැවැන්ත වර්ධනයකින් යුරෝපයටත්, ඇමෙරිකාවටත් අපේ අපනයන ඉදිරිපත් කරමින් ගමන් කර තිබෙනවාය කියන ටික අපි පැහැදිලිව දන්නවා. ඒ වාගේම මේ වර්ධනය තවත් ශක්තිමත් කරන්නට පුළුවන් තාක්ෂණය අපේ උගත් දරුවන්ට ඇති කර ගන්න පුළුවන් අනාගතයයි මහින්ද චින්තනය තුළින් අපි සකස් කර තිබෙන්නේ කියන ටික මතක් කරලා දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝව කථා කරන්නේ නැහැ. නමුත් මේ තුළ තවත් හස්තයක් ක්‍රියාත්මක වන බව මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. මේ සියල්ලටම හේතුව ලංකාව තුළ තිබෙන මහා සම්පතයි. ලංකා භූමියේ තිබෙන මහා සම්පත, ලංකාව වට කර ගත්තු, අපට අයිති වර්ග කිලෝමීටර් මිලියන 1.2ක් වූ මහ මුහුදේ කිලෝමීටරයක් උසට තිබෙන මහා සම්පතටයි මේ මහා කුමන්ත්‍රණය තිබෙන්නේ. මේ වාණිජ කේන්ද්‍රය හසුරුවන්නට උත්සාහ දරන බටහිර ලෝකයේ කුමන්ත්‍රණයේ ඉත්තන් හැටියට, ඔවුන්ගේ හඬ තමයි මෙලෙස කියා පාන්නට උත්සාහ දරන්නේ. අන්න එයටයි අතිගරු ජනාධිපතිතුමා මේ දිනා ගත්ත නිදහස, මේ දිනා ගත්ත සාමය සහ මේ දිනා ගත්ත ආර්ථික වර්ධනය ආරක්ෂා කර ගෙන අපේ දරුවන්ටත්, අනාගත පරම්පරාවටත් එය දායාද කරන්නට කටයුතු කරන්නේ. උතුර, නැඟෙනහිර, දකුණ, බටහිර සහ මධ්‍යම කියන මේ සියලු ප්‍රදේශවල වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජන කොටස්වලට මේ මහා සම්පත -භූමියේ සහ සමුද්‍රය පතුලේ තිබෙන මේ මහා සම්පත- මේ ආර්ථික ප්‍රතිලාභ භුක්ති

[ගරු ගීතාංජන ගුණවර්ධන මහතා]

විඳින්න පුළුවන් අවස්ථාවක් දායාද කරන්නයි මේ කැප වෙලා තිබෙන්නේ කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා ඒ දරුවන්ට ලබා දෙන අනාගත මහා ප්‍රතිලාභවල දායාදයන්ට ලේබල් ගහලා, ඒවාට මඩ ගහලා, ඒවා කෑලිවලට කඩලා ඒ දරුවන්ගේ බලාපොරොත්තු සුණු විසුණු කරන්නට දරන උත්සාහයන්ට උඩ ගෙඩි දෙන්නේ නැතුව අපේ අනාගත පරම්පරාව වෙනුවෙන් මේ මහා ක්‍රියාදාමයට එකතු වෙලා මේ මහා කුමන්ත්‍රණය පරාජය කරමුය; මේ දිනා ගත්ත සාමයත්, මේ දිනා ගත්ත නිදහසත් තහවුරු කරන්නට සියලු දෙනා එකතු වෙමුය කියා ආරාධනය කරනවා. අවසාන වශයෙන් සුභ අනාගතයක් සහ සුභ නිමිත්තකින් මේ ආර්ථික ගමන් මඟෙහි ප්‍රතිලාභ දිනා ගන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.45ට, 2012 පෙබරවාරි මස 09 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 5.45 மணிக்கு பாராளுமன்றம், 2012 பெப்ரவரி 09, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 5.45 p.m. until 1.00 p.m. on Thursday, 09th, February, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.